SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

නව ප්‍රවේශයක්

වාර්ෂික වාර්තාව 2021



ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

පටුන

අප ගැන 2

විධායක සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය 4

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ කෙටි විශ්ලේෂණයක් 8

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය 13

කොමිෂන් සභා සාමාජිකයින් 19

විස්තීරණ, ක්‍රියාව නැඹුරුවූ, ප්‍රායෝගික සහ මිනිය හැකි ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ග 2020 - 2025 23

ප්‍රධාන නියාමන සහ සංවර්ධන උපායමාර්ග 24

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 26

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණියන් 27

කළමනාකරුවන් සහ කළමනාකාරිණියන් 28

කාර්යමණ්ඩලය 29

වසරේ විශේෂ අවස්ථා 36

මෙහෙයුම් සමාලෝචනය

මෙහෙයුම් සමාලෝචනය..... 40

අතිරේක තොරතුරු 72

මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව..... 77

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 80

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 81

සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 82

මුදල් ප්‍රවාහ ප්‍රකාශය..... 83

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්..... 85

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව..... 99

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 101

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 102

සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය 103

මුදල් ප්‍රවාහ ප්‍රකාශය.....104

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්.....105

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව..... 110

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 112

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 113

වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය..... 114

මුදල් ප්‍රවාහ ප්‍රකාශය..... 115

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්..... 116

පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව.....121

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 123

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 124

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය 125

මුදල් ප්‍රවාහ ප්‍රකාශය.....126

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්.....127

සාංගමික තොරතුරු.....පිට කවරයේ ඇතුළු පැත්ත

න ව
ප්‍ර වේ ශ ය ක්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැබවින්ම නවෝත්පාදන සහ ධනාත්මක වෙනස්කම් මත ගොඩනැගුණු ආයතනයකි. වසර ගණනාවක් පුරා, වර්ධනයට හිතකර කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් පවත්වාගෙන යාමේ අපගේ මෙහෙවර තුළ, පාර්ශවකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා හඳුනාගෙන ඒවා සාර්ථකව ඉටු කිරීම සඳහා අප අඛණ්ඩව පරිණාමය වෙමින් හා පරිවර්තනය වෙමින් සිටිමු.

2021 අංක 19 දරන නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත හඳුන්වාදීමත් සමඟම විප්ලවීය වෙනසක් සඳහා වූ අපගේ උත්සාහය, අප අඛණ්ඩව බෙදාහදා ගත්තෙමු. සියලුම ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් හරහා පරිවර්තනීය ක්‍රියාමාර්ග වෙත අප යොමු වූ අතර එමගින් ආර්ථික වර්ධනය, නවීකරණයෙන් යුත් ව්‍යූහයන් සහ සාමූහික ප්‍රගතියක් සහිත අනාගතයක් අපේක්ෂා කරන්නෙමු.

අප පැරණි දේ අලුත් දේ සමඟ ප්‍රතිස්ථාපනය කරමින්, විප්ලවීය අදහස් සහ ප්‍රබල කාර්ය සාධනයක් මත පදනම් වූ සමෘද්ධිමත් නව යුගයක් ආරම්භ කරන්නෙමු.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වශයෙන් අප අනාගතය සඳහා නව වෙනසක් නිර්මාණය කරන්නෙමු.

SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

අප ගැන

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, 1987 අංක 36 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කරන ලද අතර එය දැන් අවලංගු කර 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් ප්‍රතිස්ථාපනය කර ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය නියාමනය කිරීමට සහ පහසුකම් සැළසීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිතව බලය ලබා දී තිබෙන අතර වර්තමානයේදී එය මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.

දැක්ම

ඵලදායී, කාර්යක්ෂම හා ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනයේ දකුණු ආසියාවේ ප්‍රමුඛ පෙළේ නියාමකයා බවට පත්වීම.

මෙහෙවර

සාධාරණ, කාර්යක්ෂම, ක්‍රමානුකූල හා විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම

නව
මිනුම් ලකුණ

විධායක සමාලෝචන

4 සභාපතිතුමාගේ සමාලෝචනය | 8 නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ කෙටි විශ්ලේෂණයක් | 13 අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය
19 කොමිෂන් සභා සාමාජිකයින් | 23 විස්තීරණ, ක්‍රියාව නැඹුරුවූ, ප්‍රායෝගික සහ මිනිය හැකි ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ග 2020 - 2025
24 ප්‍රධාන නියාමන සහ සංවර්ධන උපායමාර්ග | 26 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 27 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණියන්
28 කළමනාකාරුවන් සහ කළමනාකාරිනියන් | 29 කාර්යමණ්ඩලය | 36 වසරේ විශේෂ අවස්ථා

සභාපතිතුමාගේ සමාලෝචනය



දිගු කලක් බලා සිටි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (2021 අංක 19 දරන පනත) 2021 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමත් සමඟ 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අවලංගු විය. හොඳින් සිතා බලා හඳුන්වා දෙන ලද මෙම නව නීති මගින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ලැබෙන ආදායම් පුළුල් කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොළ නවීකරණය කිරීම සහ ආර්ථික වර්ධනයට සහ නවෝත්පාදනයන්ට සහාය වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරයි.

2021 වසර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ දක්ණට ලැබුණු හොඳම වසරවලින් එකක් ලෙස සැළකිය හැකිය. කොළඹ කොටස් වෙළෙඳපොළ දර්ශකවල සහ වෙළෙඳපොළ කාර්යසාධනය යන දෙඅංශයෙන්ම අවධානය යොමු කිරීමේදී පෙර නොවූ විරූ ඉහළ අගයක් වාර්තා කළේය. අභියෝග මධ්‍යයේ වුවද, සුරුකුම්පත් වෙළෙඳපොළ ශක්තිමත් වර්ධන වේගයක් පෙන්නුම් කරමින්, සියලු කොටස් මිල දර්ශකය 80.5%ක් ලෙස සටහන් වූ අතර 2010 වසරෙන් පසු වාර්තා වූ ඉහළම පිරිවැටුම ද එය වේ. එමෙන්ම S&P SL20 දර්ශකය 60.5%කින් ඉහළ ගොස් ඇති අතර එය කොළඹ කොටස් වෙළෙඳපොළ ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අගය ද වේ. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය ද රු. ට්‍රිලියන 5.5 ක් වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 36.7% කි.

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව Covid-19 වසංගතය මධ්‍යයේ මනා වූ නියාමනයක් පවත්වාගෙනයාමේ වැදගත්කම අවධාරනය කරන ලද අතර වෙළෙඳපොළ ස්ථාවරත්වය සහ අඛණ්ඩතාව ඇති කිරීම සඳහා වඩා නම්‍යශීලී සහ කාලෝචිත නියාමන ප්‍රතිචාර දැක්වීම කෙරෙහි සිය අවධානය නැවතත් යොමු කරන ලදී.

හැරවුමට වඩා ඉදිරියෙන් සිටීම

පසුගිය දශක දෙක තුළ, සුරුකුම්පත් වෙළෙඳපොළ, එහි ව්‍යුහය, වෙළෙඳපොළ සහභාගිවන්නන් සහ නියාමනය කටයුතු වේගවත් වෙනස්කම්වලට මුහුණ දී ඇත. 1991, 2003 සහ 2009 පනත් සංශෝධන මගින් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි පැවති හිඩැස් පුරවා යල් පැන ගිය ප්‍රතිපාදන යථා තත්ත්වයට පත් කිරීම හා පවතින සුරුකුම්පත් නීතිවලට පුළුල් ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව මෙම වර්ධනයන් තුළින් සංඥා කළේය.

දිගු කලක් බලා සිටි සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (2021 අංක 19 දරන පනත) 2021 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවේදී සම්මත කිරීමත් සමඟ 1987 අංක 36 දරන සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අවලංගු විය. හොඳින් සිතා බලා හඳුන්වා දෙන ලද මෙම නව නීති මගින් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ලැබෙන ආදායම් පුළුල් කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොළ නවීකරණය කිරීම සහ ආර්ථික වර්ධනයට සහ නවෝත්පාදනයන්ට සහාය වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරයි.

හොඳින් සිතා බලා හඳුන්වා දෙන ලද මෙම නව නීති මගින් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ලැබෙන ආදායම් පුළුල් කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොළ නවීකරණය කිරීම සහ ආර්ථික වර්ධනයට සහ නවෝත්පාදනයන්ට සහාය වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරයි.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දැනට පවතින නීති රීති, රෙගුලාසි සහ ප්‍රමිති සමාලෝචනය කරමින් නව නීතිවල ඇති විධිවිධානවලට අනුකූලව එය ඵලදායී ලෙස බලාත්මක කිරීමට හැකි වන පරිදි ප්‍රායෝගික ක්‍රියාමාර්ග හඳුන්වාදීමට කටයුතු කරමින් සිටී.

ඩිජිටල් තාක්ෂණය පුළුල් ලෙස යොදා ගැනීම

වසංගතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස අගුලු දැමීම් හේතුවෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළ ඇතුළු ආර්ථිකයේ සියලුම අංශවල ඩිජිටල් භාවිතය වේගවත් විය. ගෝලීය ආචාරධර්ම වලට අනුකූලව ඩිජිටල්කරණ ක්‍රියාවලියේ දෙවන අදියර දියත් කිරීමට සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුව සහ කර්මාන්තය සමඟ කටයුතු කළේය. මෙමගින් දේශීය සමාගම් සඳහා අන්තර්ජාල ගිණුම් විවෘත කිරීම් සඳහා වැඩි නම්‍යශීලී බවක් ලබාදුන් අතර, මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි (CDS) විද්‍යුත් සබැඳි (E-connect), විද්‍යුත් මූලික කොටස් නිකුතු (E-Initial Public Offerings), ආයතනික ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය මෙන්ම ස්මාර්ට් ෆෝන් සහ අනෙකුත් උපාංග හරහා පහසුකම් පුළුල් කරන ලදී.

සත්‍ය වශයෙන්ම, සමාලෝචිත වර්ෂය තුළ, වාර්තාගත ගිණුම් විවෘත කිරීම් සංඛ්‍යාවක් සමඟින් සුළු පරිමාණ ආයෝජකයින්ගේ සහභාගීත්වය ඉහළ ගොස් තිබේ. සක්‍රීය ආයෝජක පදනම 63,000 දක්වා ඉහළ ගිය අතර නව ගිණුම් විවෘත කර ඇති සංඛ්‍යාව 37,000ක් විය.

ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා ආයෝජක අධ්‍යාපනය සහ අරමුදල් රැස් කිරීම

අපගේ ආයෝජකයින් ඩිජිටල් පාදක ආයෝජක අධ්‍යාපන ක්‍රියාකාරකම් වෙත යොමු වී ඇත. ශ්‍රී ලංකාව පුරා කොටස් වෙළෙඳපොළ ආයෝජනය ප්‍රචලිත කිරීම සඳහා අපි කොළඹ කොටස් හුවමාරුව සමඟ හවුල් වී ප්‍රධාන වශයෙන් සමාජ මාධ්‍ය වේදිකා, බලපෑම් අලෙවිකරණය, බ්ලොග් සටහන් සහ කොළඹ කොටස් වෙළෙඳපොළ ජංගම යෙදුම් (CSE මොබයිල් ඇප්) ප්‍රචාරණ ඇතුළු ඩිජිටල් අලෙවිකරණ නාලිකා හරහා අධ්‍යාපන වැඩසටහනක් ආරම්භ කළෙමු. සමස්ත වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වේගවත් වීමත් සමඟ දිනකට මුළු වෙළෙඳාම් සැළකිය යුතු ලෙස වැඩි විය. 2021 දී වෙළෙඳපොළ දෛනික ගණුදෙනු 32,000 කට වඩා අසාමාන්‍ය වර්ධනයක් වාර්තා කළේය.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කරන ලද නියෝජනවල ප්‍රතිඵලයක් ලෙස, වසර තුළ ලැයිස්තුගත කිරීමට අපේක්ෂා කරන සමාගම් සඳහා 2021 අයවැයෙන් යෝජනා කරන ලද බදු සහන තුළින් 2021 දී ලැයිස්තුගත කිරීමට සමාගම් කිහිපයක් පොළඹවන ලදී. මේ අනුව නව ලැයිස්තුගත කිරීම් 28 ක් සමඟින් පෙර නොවූ විරූ ලෙස කොළඹ කොටස් හුවමාරුව තුළින් සමාගම් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමක් දැක ගත හැකි වූ අතර 2021 වර්ෂයේදී සමාගම් විසින් රැස්කර ගත් වාර්තාගත ප්‍රාග්ධනය රු. බිලියන 124 කි. මේ අතර, පවුල් ව්‍යාපාර සම්බන්ධ කර ගැනීම සහ විශේෂයෙන් පවුලේ පාලනය රඳවා තබා ගනිමින් ලැයිස්තුගත කිරීම සම්බන්ධව ඇති වැරදි වැටහීම් නිරාකරණය කිරීම සඳහා "Founder to family - Leveraging Going Public" නමින් කොටස් නිකුත් කිරීමට හැකියාව ඇති ව්‍යාපාරිකයන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුව මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළට ප්‍රවේශ වන්නේ කෙසේද යන්න පිළිබඳව වඩා හොඳ අවබෝධයක් මෙන්ම කොළඹ කොටස් හුවමාරුවෙහි ඇති විවිධ අරමුදල් සම්පාදන විකල්ප පිළිබඳව සමාගම්වලට මනා අවබෝධයක් ලබා දුන්නේය.

සභාපතිතුමාගේ සමාලෝචනය

සංචාරක සීමාවන් ලිහිල් කිරීමත් සමඟ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව විදේශීය (ඩයස්පෝරා) ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ඩුබායි හි "Invest Sri Lanka" සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

සාංගමික වගවීමේ භූ දර්ශනයෙහි හැඩගැසීම

දේශීය හා විදේශීය ආයෝජන ඉහළ නැංවීම සඳහා අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ කෙරෙහි වැඩි විශ්වාසයක් ඇති කිරීම ඉතා වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගත්විට, ශ්‍රී ලංකාවේ සාංගමික පාලන රාමුව සමාලෝචනය කිරීම සඳහා ශාස්ත්‍රඥයින්, නීති ප්‍රජාව සහ ලැයිස්තුගත සමාගම් අතර පුළුල් සංවාදයක් පැවැත්වීමට සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දරන උත්සාහය මීට දශකයකට පමණ පෙර සිදු කර ඇති පූර්ව ප්‍රතිසංස්කරණවලට වඩා කාලෝචිත විය නොහැක. සමාලෝචිත වර්ෂයේදී, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇති සමාගම්වලට අදාළ වන සාංගමික පාලන රීති සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගෙන් අදහස් සහ යෝජනා ලබා ගැනීම සඳහා මහජන උපදේශනයක් පවත්වන ලදී. ඉන් අනතුරුව, මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැළකිල්ලට ගෙන සියලුම පාර්ශ්වකරුවන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් නව සාංගමික පාලන නීති සකස් කිරීම සම්බන්ධයෙන් පත් කරන ලදී. කොමිෂන් සභාව විසින් දැනට සකස් කරමින් පවතින ලයිස්තුගත කිරීමේ රීතිවලට ඇතුළත් කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව වෙත යොමු කරන ලද කෙටුම්පත් කළ නීතිවල යම් යම් වෙනස්කම් සිදු කරන ලදී.

එවැනි නීතිරීති සකස් කර අවසන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ලයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල කාන්තා නියෝජනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කාන්තා සාංගමික අධ්‍යක්ෂවරියන් විසින් නියෝජනයන් ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් කර්මාන්තයේ අදහස් ලබා ගැනීම සඳහා, සියලුම පාර්ශවකරුවන් නියෝජනය කරන කීර්තිමත් පුද්ගලයින්ගේ රැස්වීමක් මා විසින් කැඳවන ලද අතර, ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල කාන්තා නියෝජනය වැඩි කිරීමට දිරිගැන්වීමට සහ සුදුසු ප්‍රතිපාදන ඇතුළත් කිරීමට සලකා බලන ලෙස කොළඹ කොටස් හුවමාරුවෙන් පසුව ඉල්ලා සිටියේය.

මූල්‍ය ඇතුළත් කිරීම දිරිගැන්වීමේ ජාතික උපාය මාර්ගය

ශ්‍රී ලංකාව පුරා මූල්‍ය ඇතුළත් කිරීම් වැඩිදියුණු කිරීම සඳහා වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවය (IFC) ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව රටේ පළමු ජාතික මූල්‍ය ඇතුළත් කිරීම් උපාය මාර්ගය (NFIS) ඇති කරන ලදී. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඇතුළු විවිධ ආයතන විසින් ගනු ලබන විවිධ මූල්‍ය ඇතුළත් කිරීමේ ප්‍රයත්නයන් තනි වේදිකාවකට පෙළගස්වීමට ජාතික මූල්‍ය ඇතුළත් කිරීම් උපාය මාර්ගය අපේක්ෂා කෙරේ. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන අතර ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ආර්ථික වර්ධනයට දායක වීමේ අරමුණින් ජාතික මූල්‍ය ඇතුළත් කිරීම් උපාය මාර්ගයෙහි කාලානුරූපී ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් ලෙස හොඳින් ව්‍යුහගත මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් අඛණ්ඩව පවත්වනු ලබයි. ජාතික මූල්‍ය ඇතුළත් කිරීම් උපාය මාර්ගය දියත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාව ලොව පුරා සමාන උපාය මාර්ග දියත් කර ඇති රටවල් 60කට අධික සංඛ්‍යාවකට සම්බන්ධ වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධව එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවති වැඩමුළුව

Covid වසංගතය විසින් හඳුන්වාදී ඇති සංචාරක සීමාවන් හේතුවෙන්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ ආයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව විදේශගත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ඔන්ලයින් රැස්වීමක් පැවැත්වීය. මෙමගින් විවිධ රටවල්වලට අයත් විදෙස්ගත ආයෝජක ප්‍රජාවට ශ්‍රී ලංකාවේ ආයෝජන සම්බන්ධයෙන් පවතින අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමට හැකියාව ලැබුණි. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, සිංගප්පූරුව, ස්විඩනය, අබුඩාබි සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල තානාපති කාර්යාල/මහ කොමසාරිස් කාර්යාලවල කාර්ය මණ්ඩලය සඳහා මෙම ඔන්ලයින් සම්මන්ත්‍රණය පවත්වන ලදී.

සංචාරක සීමාවන් ලිහිල් කිරීමත් සමඟ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව විදේශීය (ඩයස්පෝරා) ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ඩුබායි හි "Invest Sri Lanka" සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. ඩුබායි හි වෙසෙන ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකිකයන් බහුවිධ කර්මාන්ත හරහා දක්නට ලැබුණු ප්‍රබල සහභාගීත්වය ශක්තිමත් සාංගමික ඉපැයීම් සහ ආකර්ෂණීය තක්සේරු කිරීම් පිළිබිඹු කරයි.

ගෙවීම්වලට එදිරිව බේරුම් කිරීමේ යාන්ත්‍රණය (DVP)

වසර තුනකට වැඩි කාලයක් ප්‍රමාද වෙමින් තිබූ ගෙවීම්වලට එදිරිව බේරුම් කිරීමේ යාන්ත්‍රණය 2021 අගෝස්තු මාසයේදී හඳුන්වා දෙන ලදී. මෙය සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ කොටස් තැරැව්කාර ප්‍රජාවගේ සහයෝගීතාවයේ උත්සාහයකි. මෙම වැදගත් වෙළෙඳපොළ යටිතල පහසුකම් ව්‍යුහය නවීකරණය කිරීම සහ බේරුම්කරණ අවදානම අවම කිරීම අපේක්ෂා කරන අතරම හුවමාරුව තුළ ගණුදෙනු වන නව වෙළෙඳපොළ උපකරණ සක්‍රීය කර එමඟින් ගෝලීය කොටස් හුවමාරු ආචාරධර්ම සමඟ අපව සම තත්ත්වයට පත් කරයි.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා කටයුතු කිරීම

රත්රන් සෑම විටම ආරක්ෂිතම ආයෝජන වත්කම් පන්තියක් ලෙස සැලකේ. පාර්ශවකරුවන්ගේ යෝජනා රාශියක් සලකා බැලීමෙන් පසු, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළින් බැහැර ගණුදෙනු (Over The Counter -OTC) වේදිකාව හරහා කඩදාසි රත්රන් (Paper Gold-PG) වෙළෙඳාම් කිරීම පහසු කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙමින් කඩදාසි රත්රන් (PG) වෙළෙඳාම් කිරීමට පහසුකම් සලසා ඇත. දැනට, වෙළෙඳපොළින් බැහැර ගණුදෙනු වේදිකාව හරහා කඩදාසි රත්රන් වෙළෙඳාම් කිරීම හඳුන්වාදීමේ රාමුව කොළඹ

වසර තුනකට වැඩි කාලයක් ප්‍රමාද වෙමින් තිබූ ගෙවීම්වලට එදිරිව බේරුම් කිරීමේ යාන්ත්‍රණය 2021 අගෝස්තු මාසයේදී හඳුන්වා දෙන ලදී.

කොටස් වෙළෙඳපොළ විසින් අවසන් කරමින් පවතින අතර එමඟින් වෙළෙඳපොළ සඳහා නව ආයෝජන වත්කම් පන්තියක් සැපයීමට සහ රජයට නව බදු ආදායම් මාර්ගයක් උත්පාදනය කිරීමට අපේක්ෂා කරයි.

ඉස්ලාමීය නිෂ්පාදන සඳහා මූලික අනුමැතිය සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව ලබා දී ඇති අතර, එය හඳුන්වාදීම සඳහා වන ප්‍රතිපත්තිමය රාමුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හරහා ආසියානු සංවර්ධන බැංකුව සපයන තාක්ෂණික සහයෝගය සමඟ කොළඹ කොටස් හුවමාරුව විසින් මේ වන විට අවසන් කරමින් පවතී. ඒ හා සමානව, විනිමය හුවමාරු ව්‍යුත්පන්න වෙළෙඳපොළේ සංවර්ධනය සඳහා කළ හැකි පළමු පියවරක් ලෙස ව්‍යුහගත බලපත්‍ර හඳුන්වාදීම සඳහා වන ප්‍රතිපත්ති සහ නියාමන රාමුව සකස් කිරීමේ ක්‍රියාවලියෙහි ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිරතව සිටී. ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහය ලබාගෙන ඇත. විශේෂ කාර්ය අත්පත් කර ගැනීමේ සමාගම් (SPACs) සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ද ලබා දී ඇති අතර, අවශ්‍ය ප්‍රතිපත්ති සහ නියාමන රාමුව අවසන් කරන ලෙස කොළඹ කොටස් හුවමාරුව වෙතින් ඉල්ලා ඇත. සාමූහික හිමිකම් අරමුදල් (Equity Crowd Funding) සඳහා කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත. කොළඹ කොටස් හුවමාරුව විසින් සකස් කර ඇති රාමුව මේ වන විට පාර්ශ්වකරුවන්ගේ උපදේශනය සඳහා ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත. කොළඹ කොටස් හුවමාරුවෙහි විදේශ මුදල් වලින් යුත් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම, වෙළෙඳාම් කිරීම සහ පියවීම සඳහා පහසුකම් සැලසීම සඳහා කොළඹ කොටස් හුවමාරුව වෙත අනුමැතිය ද ලබා දී ඇති අතර, එය ක්‍රියාත්මක කිරීමට දැනට පියවර ගනිමින් පවතී. හරිත බැඳුම්කර හඳුන්වාදීමට පියවර ගැනීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තවත් කාර්යයකි.

තවද, කොළඹ කොටස් හුවමාරුවෙහි OTC ගනුදෙනු වේදිකාව හරහා සාංගමික ණය සුරැකුම්පත් සඳහා ප්‍රති මිලදී ගැනීම් ගනුදෙනු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත. හිඟ විකුණුම්, කොටස් ණයට ගැනීම සහ ණයට දීම සම්බන්ධ ප්‍රතිපත්තිය ද කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අතර කොළඹ කොටස් හුවමාරුව ඒ හා සම්බන්ධ මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියකට යාමට අපේක්ෂා කරයි.

ව්‍යුත්පන්න වැනි ආයෝජන උපකරණ හඳුන්වා දීමට නම් මධ්‍යම ප්‍රතිපාර්ශව යාන්ත්‍රණයක් (CCP) තිබීම අත්‍යවශ්‍ය වේ. මධ්‍යම ප්‍රතිපාර්ශව යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට ප්‍රමුඛත්වය දිය යුතු බව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවබෝධ කර ගෙන ඇත. ඒ අනුව 2022 වසර අවසන් වීමට පෙර කොටස් වෙළෙඳපොළ සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශව යාන්ත්‍රණයක් ඇති කර ගැනීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ ඒකාබද්ධ කමිටුවක් පත් කිරීමට පියවර ගන්නා ලදී. මෙම කාලසීමාව තුළ ලේකම් කාර්යාලයේ කාර්යක්ෂමතාව විධිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ද ගන්නා ලදී. ආවේක්ෂණ අංශය සඳහා අවශ්‍ය විශ්ලේෂණ මෙවලම් ලබා ගැනීම ද මෙයට ඇතුළත් විය.

ඉදිරි දැක්ම

සමාලෝචිත වර්ෂය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා හැරවුම් ලක්ෂයක් විය. නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අපගේ සියලුම පාර්ශවකරුවන් සඳහා නියාමන අවශ්‍යතාවලට අනුව පුළුල් කාර්යභාරයක් ඉටු කරනු ඇත. අපගේ පුළුල් වූ බලතල යොදා ගනිමින් සහ ස්ථිර කැපවීමක් තුළින් සාධාරණ, කාර්යක්ෂම සහ පාරදෘෂ්‍ය ප්‍රාග්ධන වෙළෙඳපොළක් සඳහා පහසුකම් සැලසීමට සහ ප්‍රවර්ධනය කිරීමට අප බලාපොරොත්තු වෙමු.

අද සහ ඉදිරි වසරවලදී අප මුහුණ දෙන අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හොඳ සූදානමක පසු වන බව මම විශ්වාස කරමි. අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, ගරු මුදල් අමාත්‍යතුමාට, භාණ්ඩාගාරයේ ලේකම්තුමාට සහ මුදල් අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන්ටත් ඔවුන් ලබාදුන් සහයෝගය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙමි. කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ අමිල දායකත්වය වෙනුවෙන් ද මාගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල් චින්තක මෙන්ඩිස් මහතා කැපවීමෙන් කළ සේවයටත්, පසුගිය වසර තුළ වෙහෙස මහන්සි වී වැඩ කළ අධ්‍යක්ෂවරුන් ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයන්ටත් අයටත් මගේ ස්තුතිය පුද කරනවා. අපගේ පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය නොවන්නට අපගේ කාර්යය පහසු නොවනු ඇති අතර ඔවුන්ටද මාගේ කෘතඥතාවය පුද කිරීමට ද කැමැත්තෙමි.



ජනාධිපති නීතිඥ, විරාජ් දයාරත්න
සභාපති

2022 අප්‍රේල් 18

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ කෙටි විශ්ලේෂණයක්

2021 අංක 19 දරන නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ගරු කථානායක තුමන් විසින් 2021 සැප්තැම්බර් 21 දින සහතික කර ඇති අතර එදින සිට එය බලාත්මක වේ. ඒ සමඟම 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අවලංගු වී ඇත.

දීර්ඝ කාලයක් තිස්සේ සම්පාදනය කරමින් තිබූ මෙම පනත තුළ වෙනත් රටවල්වල සුරැකුම්පත් වෙළෙඳපොළවල දක්නට ලැබෙන නවතම අංගයන් හා ප්‍රතිපාදන ඇතුළත් වන අතර ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති මූලධර්ම හා ප්‍රමිතීන්ට ද අනුකූල වේ. එමඟින් වෙළෙඳපොළ සංවර්ධනය පහසු වන අතරම ශක්තිමත් නියාමනයකට ද ඉඩ සැළසේ. එසේම ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළෙඳපොළේ වර්තමාන මෙන්ම අනාගත අවශ්‍යතා ද සපුරාලනු ලබයි.

නව පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය

වෙනත් රටවල පවත්නා නීති සමඟ කරන ලද සංසන්දනයකින් පසුව නව නීතියක් සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය 2007 වර්ෂයේදී ආරම්භ විය. මෙම වැඩපිළිවෙළට ලෝක බැංකුවේ මෙන්ම ලංකාවේ ප්‍රවීණයන්ගේ ද තාක්ෂණික සහාය ලැබී ඇත. පළමු කෙටුම්පත 2013 දී අවසන් කර ඒ වන විට පැවති කොමිසම විසින් අනුමත කර තිබූ නමුත් එය ඉන් ඉදිරියට ගෙනගොස් නොතිබුණි. එම කෙටුම්පත වැඩිදියුණු කර කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු, 2018 දී පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නමුත් එය විවාදයට ගැනීමට නොහැකි වී ඇත. 2018/2019 කාලය තුළදී එම පනත් කෙටුම්පත තවත් වෙනස්කම්වලට භාජනය කර තිබුණි. නව පනත සකස් කිරීම සම්පූර්ණ කිරීමේ දී, පෙර කෙටුම්පත්වල වල තිබූ මූලික විධිවිධාන රඳවා තබා ගනිමින්, වර්තමාන කොමිසම එම පනත ක්‍රියාත්මක කිරීමේදී දුෂ්කරතාවයන් ඇති නොවන ආකාරයට නොපැහැදිළි තැන් පැහැදිළි කිරීමට පියවර ගෙන තිබේ. මෙම දිගු කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී විවිධ පාර්ශවකරුවන් මෙන්ම මහජනතාව සමඟද දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇති අතර මෙම නීතිය සම්පාදනය කිරීමේදී ඔවුන්ගේ දායකත්වය අතිමහත් වූ බව පිළිගත යුතුය.

නව පනතේ ව්‍යුහය

නව පනත කොටස් හතකින් සමන්විත වන අතර ඒවා පරිච්ඡේද ගණනාවකට බෙදා ඇත. එහි වැදගත් ලක්ෂණයක් වන්නේ එක් එක් කොටස ආරම්භයේදී එම විශේෂිත කොටසේ පරමාර්ථය සහ අරමුණ කුමක්ද යන්න පුළුල් ලෙස විස්තර කර තිබීමයි. එම කොටසේ අඩංගු ප්‍රතිපාදන තුළින් සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන්නේ කුමක්ද යන්න මෙයින් පැහැදිළි වනු ඇත.

පනතේ යෙදුම සහ පරමාර්ථය සහ අරමුණ, කොමිසම පිහිටුවීම සහ එහි බලතල, යුතුකම් හා කාර්යයන් මෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ කොමිසමේ කාර්ය මණ්ඩලයට අදාළ කරුණු ආදී මූලික දේ පළමුවන කොටසේ සඳහන් වේ. වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන නමින් හැඳින්වෙන II කොටසේ, කොටස් හුවමාරු, නිෂ්කාශනාගාරයක් සහ මධ්‍යම තැන්පතුගාරයක් ස්ථාපිත කිරීම පිළිබඳව විස්තර කෙරේ. 'සුරැකුම්පත් නිකුත්කිරීම්' නමින් හැඳින්වෙන III වන කොටසින් සුරැකුම්පත් පිළිබඳ පොදු අර්පණයන්, වෙළෙඳපොළ අතරමැදියන් සහ ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීම පිළිබඳව සාකච්ඡා කරයි. IV වන කොටස ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් ගනුදෙනු කිරීම පිළිබඳව විස්තර කෙරෙන අතර 'වෙළෙඳපොළ විමසුම්කාරය' නමින් හැඳින්වෙන V කොටසේ තහනම් හැසිරීම් සහ අභ්‍යන්තර තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම ගැන සාකච්ඡා කෙරේ. VI වෙනි කොටසේ කොමිෂන් සභාවේ මුදල් සම්බන්ධ ප්‍රතිපාදන අඩංගු වන අතර VII කොටස මඟින් පනත ක්‍රියාත්මක කිරීම සහ දඬුවම් සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් වැනි පොදු කරුණු අන්තර්ගත වී ඇත.

නව පනතේ කැපී පෙනෙන ලක්ෂණ

රටේ සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනයේ කාර්යක්ෂමතාව, පුරෝකථනය සහ අනුකූලතාව සහතික කරන බොහෝ වැදගත් ප්‍රතිපාදන නව පනතෙහි අඩංගු වේ. තවද, එමඟින් නවීනතම යටිතල පහසුකම් භාවිතා කිරීමට ඉඩ සළසන අතර ආයෝජකයින් හට ඔවුන්ගේ අවදානම් ප්‍රතිලාභ මත පදනම් වන පුළුල් ආයෝජන අවස්ථා තෝරාගැනීමක් සිදුකළ හැකි ආකාරයේ විවිධ ගනුදෙනු උපකරණ හඳුන්වා දීම මෙන්ම නිකුත් කරන්නන් හට ඔවුන්ගේ විවිධ අරමුදල් රැස් කිරීමේ අවශ්‍යතා සපුරා ගැනීමට අවස්ථාවක් සැළසෙනු ඇත.

වෙළෙඳපොළ සහ වෙළෙඳපොළ ආයතන

වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන සඳහා විශේෂයෙන් වෙන් වූ II කොටස නව පනතේ සැළකිය යුතු කොටසක් වන අතර එහි අඩංගු විධිවිධාන මඟින් මෙම වැදගත් ආයතන සිය කාර්යයන් නිසියාකාරව ඉටු කරන බවට වග බලා ගනී. තවද එමඟින් සුරැකුම්පත් වෙළෙඳපොළ ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියා කිරීම මෙන්ම පද්ධතිමය අවදානම් අවම කිරීමට ද හැකි වනු ඇත.

මෙම විධිවිධාන මඟින් කොටස් හුවමාරුවක, නිෂ්කාශනාගාරයක සහ මධ්‍යම තැන්පතුගාරයක අයිතිවාසිකම් සහ යුතුකම්, බලපත්‍රයක් ලබා ගැනීමට සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා, බලපත්‍රයක් අවලංගු කළ හැක්කේ කුමන අවස්ථාවකදී ද, මෙම වෙළෙඳපොළ ආයතන වල රීතිවල බලපෑම, අධ්‍යක්ෂවරුන් පත් කිරීම, විගණකවරයෙකුගේ කාර්යභාරය ආදිය සඳහන් කර ඇත.

මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවකට තමන්ගේ සුරැකුම්පත් තම හුවමාරුව තුළ ලැයිස්තු ගත කළ හැකි වීමයි. මධ්‍යම ප්‍රතිපාර්ෂව ආයතනයක් (CCP) ලෙස කටයුතු කරන නිෂ්කාශනාගාරයක් සම්බන්ධයෙන් සඳහන් වන අතර මධ්‍යම ප්‍රතිපාර්ෂව ආයතනයක් යනු කුමක්ද යන්න පැහැදිළිව නිර්වචනය කර ඇත. තවද, නිෂ්කාශන සාමාජිකයෙකුට තම යුතුකම් ඉටු කිරීමට නොහැකි වූ අවස්ථාවකදී එය සපුරාලීම සඳහා පැහැර හැරීම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ රීති හා ක්‍රියාමාර්ග විස්තරාත්මක ලෙස සඳහන් කර ඇත.

වෙළෙඳපොළ අතරමැදියන්

නව පනත මඟින් වෙළෙඳපොළ අතරමැදියනී යන්න අර්ථනිර්වචනය කර ඇති අතර ඊට තවත් පුද්ගල කාණ්ඩ කිහිපයක් එකතු කර ඇති බව ද සැළකිල්ලට ගත යුතුය. ආයතනික මූල්‍ය උපදේශක, වෙළෙඳපොළ සාදන්නා,

ව්‍යුත්පන්න තැරැව්කරු සහ ව්‍යුත්පන්න අලෙවි නියෝජිත යන පුද්ගලයින් ඊට ඇතුළත් කර ඇත. ගැනුම්කරුවන් සහ විකුණුම් කරුවන් අතර සුරැකුම්පත් අබණ්ඩව හා කාර්යක්ෂමව හුවමාරු කර ගැනීමට උපකාරවීම සඳහා වෙළෙඳපොළ අතරමැදියෙකු වශයෙන් වෙළෙඳපොළ සාදන්නන් හඳුන්වා දීම පෙන්වා දිය හැක.

වෙළෙඳපොළ සම්බන්ධයෙන් මෙන්ම බලපත්‍රයක් ලබාගැනීම හා අළුත් කිරීම සඳහා ඉටු කළ යුතු අවශ්‍යතා, බලපත්‍රයක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීමට හේතු, වෙළෙඳපොළ අතරමැදියන් විසින් සුරැකුම්පත් ගණුදෙනු කිරීම, විගණකවරයෙකුගේ කාර්යභාරය යනාදි කරුණු වෙළෙඳපොළ අතරමැදි ආයතන සම්බන්ධයෙන් බලපාන්නේ කෙසේද යන්න ඉතා සවිස්තරාත්මකව දක්වා ඇත.

වෙළෙඳපොළ අතරමැදියන් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. වෙළෙඳපොළ අතරමැදියන් වෙළෙඳපොළේ ඉදිරිපෙළ කාර්යභාරයක් සිදු කරන බැවින් සහ ආයෝජකයින් සමඟ සෘජුවම සම්බන්ධ වන හෙයින් ඔවුන්ගේ විශ්වසනීයත්වය සහතික කිරීම අත්‍යාවශ්‍ය ය. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙන්ම ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ සේවාවන් කාර්යක්ෂමව ලබා දීම සහතික කිරීම සඳහා, වෙළෙඳපොළ අතරමැදියන් සුරැකුම්පත් සම්බන්ධයෙන් තමන්ට ඇති යම් යම් සම්බන්ධතා හෙළිදරව් කළ යුතු බව සඳහන් කර ඇති අතර යම් ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ස්ථාපිත කර ඒ සම්බන්ධ වාර්තා පවත්වා ගත යුතු යැයි පනත මඟින් නියම කර ඇත. මෙම කරුණු ඔවුන්ගේම අවදානම අවම කිරීම, නිරාවරණයන් සහ අනුකූලතාව නිරීක්ෂණය කිරීම උදෙසා හඳුන්වාදී ඇති ප්‍රතිපාදන වන අතර ඒවා අමතර කාර්යභාරයක් හෝ වියදමක් දැරීමට සිදු වන පියවර නොවේ. කලින් කල කොමිසම විසින් හඳුන්වා දෙන ලද රීති හා ප්‍රමිති ස්වරූපයෙන් වර්තමානයේදී පවා එවැනි අවශ්‍යතා දකින්නට ඇත. පෙර පනත හා බලන කල නව පනත මඟින් පනත තුළම වෙළෙඳපොළ අතරමැදියන් සම්බන්ධයෙන් නිශ්චිත අවශ්‍යතා ඇතුළත් කර ඇති බව පෙනී යයි.

ආයෝජකයින්ගේ සුභසිද්ධිය සුරක්ෂිත කිරීමේ අරමුණින් හඳුන්වා දී ඇති නව අංගයක් වන්නේ "ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීම" සම්බන්ධ ප්‍රතිපාදනයි.

වෙළෙඳපොළ අතරමැදියන්ට අමතරව, සේවාදායකයින් සමඟ ගනුදෙනු කරන සහ වෙළෙඳපොළ අතරමැදියෙකු වෙනුවෙන් කටයුතු කරන්නන්, ලියාපදිංචි කිරීම සුදුසු යැයි කොමිසම කල්පනා කරන්නේ නම් එය සිදු කිරීමට පනත මඟින් බලය ලැබී තිබේ. මෙම පනත මඟින් ක්‍රියාකාරීන්, භාරකරුවන් සහ තක්සේරුකරුවන් වැනි පරිපූරක සේවා සපයන්නන් ද හඳුන්වා දී ඇති අතර අනාගතයේ දී කොමිසමේ යම් අධීක්ෂණයකට ලක් කළ හැකි නිසා එමඟින් මහජන විශ්වාසය තහවුරු කෙරෙනු ඇත.

සුරැකුම්පත් නිකුත් කිරීම සහ යහපත් සාංගමික ආචාරධර්ම රැකගැනීම

තුන් වන කොටසෙහි විස්තර කර ඇත්තේ සුරැකුම්පත් නිකුත් කිරීම පිළිබඳ කරුණු වන අතර එහි අරමුණ වනුයේ ලැයිස්තුගත පොදු සමාගම් විසින් කාලානුරූපව මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සහ යහපත් සාංගමික ආචාරධර්මවලට අනුකූල වීමයි.

මහජනතාවගෙන් රැස්කරන අරමුදල් වල වගවීම සහතික කිරීම සඳහා, යම් ආකාරයක පොදු අර්පණයන්ට පෙර ලැයිස්තුගත නොකළ සමාගම් විසින් සිය අනුමැතිය ලබා ගත යුතු යැයි කොමිෂන් සභාව සළකන්නේ නම්, තම අවසරය ලබා ගත යුතු බවට කොමිෂන් සභාව රීති මඟින් නියම කළ හැකිය. සුරැකුම්පත් පරිමාව, සුරැකුම්පත් කාණ්ඩය, ආයෝජකයින්ගේ සංඛ්‍යාව සහ වර්ගය, නිකුත් කරන්නාගේ ස්වභාවය හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ ස්වභාවය යන කරුණු සැළකිල්ලට ගනිමින් එවැනි අවශ්‍යතාවක් හඳුන්වා දිය හැකිය.

මහජනයාට කරන හෙළිදරව් මත පදනම්ව, යම් වරදක් අනාවරණය වුවහොත්, ලැයිස්තුගත සමාගම් වලින් තොරතුරු ලබාගැනීමට කොමිෂන් සභාවට හෝ වෙළෙඳපොළ ආයතනවලට අයිතියක් ඇත. නිසි විමර්ශනයකින් හෝ පරීක්ෂණයකින් පසු ලැයිස්තුගත සමාගම් පනතේ රෙගුලාසි, රීති හෝ නියෝගවල සඳහන් කිසියම් විධිවිධානයක් කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකළ බව සොයා ගත හොත් සුදුසු යැයි සළකන ඕනෑම බලාත්මක කිරීමේ පියවරක් ගැනීමට කොමිසමට බලය ඇත. මෙය කොළඹ කොටස් වෙළෙඳපොළ සහ කොමිෂන් සභාව සිය සාංගමික කටයුතු අංශය මඟින් ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා සිදු කරන අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියේම කොටසක් බව මෙහිදී නැවතත් අවධාරණය කරන අතර අලුත් දෙයක් නොවන බවද සිහිපත් කළ යුතුය. මෙමඟින් සිදු කර ඇත්තේ යහපත් සාංගමික ආචාරධර්ම පිළිපැදීම සහතික කිරීම උදෙසා විධිවිධාන පනත තුළම ඇතුළත් කර තිබීමයි.

වෙළෙඳපොළ ආයතනයක අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී හෝ ප්‍රධාන නියාමන නිළධාරී තනතුරු බාර ගැනීමට පෙර යම් පුද්ගලයෙකු කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු අතර එවැනි අනුමැතියක් ලබා නොදෙන්නේ කුමන හේතු මතද යන්න පැහැදිලි කර ඇත. තවද, ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා විසින් කොමිසමේ නියමයන් හෝ කොමිසම විසින් අනුමත කරන ලද හුවමාරුවක නියමයන් අනුව යෝග්‍ය සහ නිසි නිර්ණායකයන්ට අනුකූල වීම අවශ්‍ය වේ. තවත් නව විශේෂාංගයක් නම්, ලැයිස්තුගත සමාගම්, වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන්ගේ විගණකවරුන් තම සාමාන්‍ය කාර්යභාරය ඉටු කිරීමේදී ඔහු දැනුවත් වන යම් යම් අක්‍රමිකතා වාර්තා කිරීමට බැඳී සිටීමයි. ඒවා මොනවාද සහ එය වාර්තා කළ යුත්තේ කාටද යන්න විශේෂයෙන් දක්වා ඇත.

එම ආයතන තුළ නිසි සාංගමික පාලනයක් සහතික කිරීම සඳහා සහ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ඔවුන් ඉටු කරන වැදගත් කාර්යභාරය සැළකිල්ලට ගෙන පද්ධතිමය අවදානම අවම කිරීම සඳහා මෙම අවශ්‍යතා හඳුන්වා දී ඇත. මේ වන විට සකස් වෙමින් පවතින සාංගමික පාලන රාමුවේ කොටසක් ලෙස මෙම භාවිතයන් බොහෝමයක් ව්‍යාපාරික ප්‍රජාව

නව සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ කෙටි විශ්ලේෂණයක්

විසින් පිළිගෙන ඇති අවස්ථාවක, තම ව්‍යාපාර කටයුතු සුමටව කරගෙන යාමට ඒවා බාධාවක් යැයි සිතිය නොහැක.

ප්‍රධාන වෙළෙඳපොළ වරදවල්

නව පනතේ V කොටස තුළ ප්‍රධාන වෙළෙඳපොළ වරදවල් විස්තර කරන අතර එය රටේ සුරුකුම්පත් වෙළෙඳපොළ නියාමනය කිරීම සඳහා ගත් ප්‍රගතිශීලී පියවරක් ලෙස සැලකිය හැකිය.

ප්‍රධාන වෙළෙඳපොළ වරදවල් ඇතුළත් මෙම කොටස "තහනම් හැසිරීම්" සහ "අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම" ඇතුළත් පරිච්ඡේද දෙකකට බෙදා ඇත. තහනම් හැසිරීම් යටතේ වරදවල් පහක් හඳුන්වා ඇත. ඒවා නම් ව්‍යාජ වෙළෙඳාම් කිරීමේ සහ වෙළෙඳපොළ මිල ගණන් කෘතිම ලෙස උස් පහත් කිරීමේ ගණුදෙනු, කොටස් වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම, අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශ, සුරුකුම්පත් ගණුදෙනු කිරීමට වංචනික ලෙස තැනැත්තන් පෙළඹවීම සහ අයුතු ලෙස හැසිරවීමේ සහ රැවටිලි සහගත උපක්‍රම භාවිතා කිරීම යි.

"වෙළෙඳපොළ ව්‍යාජ ලෙස හැසිරවීම" ලෙස පොදුවේ හඳුන්වන මෙම අපරාධ කාණ්ඩය අතුරින් වැදගත් වරදවල් දෙකක් 130 සහ 131 වගන්ති වල දක්නට ලැබෙන වරදවල් දෙකයි. 130 වෙනි වගන්තිය මඟින් කිසියම් පුද්ගලයෙකු වෙළෙඳපොළ මිල හෝ සුරුකුම්පත් පරිමාව ඉහළ නැංවීමේ හෝ අඩු කිරීමේ බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති, ව්‍යාජ හෝ නොමඟ යවනසුළු ප්‍රකාශයක් සිතා මතා සිදු කිරීම හෝ තොරතුරක් බෙදාහැරීම වලක්වන අතර 131 වගන්තිය මඟින් පුද්ගලයෙකු කිසියම් නොමඟ යවන සුළු, වංචනික හෝ රැවටිලිකාර අනාවැකියක් ප්‍රකාශ කිරීමෙන් හෝ වෙනත් පුද්ගලයෙකු වෙළෙඳාමට පොළඹවා ගැනීමට පෙළඹවීම හෝ උත්සාහ කිරීම වලක්වාලනු ලබයි.

තහනම් කර ඇති හැසිරීම් මොනවාද යන්න ඉතාමත් පැහැදිලි ලෙස සඳහන් කර ඇත. එබැවින් මෙම කොටස යටතේ වරදක් සිදු කර ඇති බවට තහවුරු කිරීම සඳහා තිබිය යුතු සාධක හෝ ගුණාංග මොනවාද යන්න තේරුම් ගැනීම අපහසු නැත.

2 වන පරිච්ඡේදයෙන් අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම ගැන විස්තර ඇතුළත් කර ඇත. යම් පුද්ගලයෙක් අභ්‍යන්තරිකයෙක් ලෙස සැළකෙන්නේ කුමන අවස්ථාවකදීද යන්න පැහැදිලිව නිර්වචනය කර ඇති අතර එවැනි පුද්ගලයෙකුට තහනම් කර ඇති දේ මොනවාද යන්න නිශ්චිතව දක්වා ඇත. ඊට අමතරව, එවැනි තොරතුරු සාමාන්‍යයෙන් ලබා ගත හැකි වන්නේ කෙසේද, තොරතුරු ලෙස සැළකෙන්නේ කුමක්ද, සුරුකුම්පත් වල මිලට හෝ වටිනාකමට වැදගත් ලෙස බලපාන තොරතුරු මොනවාද, තොරතුරු සන්තකයේ ඇතැයි සැළකෙන අවස්ථා මොනවාද, සහ අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීමේ චෝදනාවකට අදාළව ඇති සුවිශේෂී ව්‍යතිරේක සහ නිදහසට කරුණු මොනවාද යන්න ඉතා පැහැදිලි ලෙස විස්තර කර ඇත.

උද්ගතවිය හැකි කිසියම් අවිනිශ්චිත භාවයක් හෝ අපැහැදිලි බවක් ඉවත් කිරීමේ අරමුණින් සහ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වන්නන්ට අවසර දී ඇත්තේ කුමන හැසිරීම් සඳහාද සහ තහනම් කර ඇත්තේ කුමන හැසිරීම් ද යන්න පිළිබඳව දැනුවත්භාවයක් ඇතිකිරීමේ අරමුණින් මෙම විධිමත් ප්‍රතිපාදන ඇතුළත් කර ඇත. තවද, එවැනි ඕනෑම වරදක් සිදු කිරීමට අදාළව දැඩි දඬුවම් පැනවීමෙන් අවධාරණය කරනුයේ වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ ක්‍රියාකාරකම් දුෂ්කර කිරීමේ හෝ අධෛර්යමත් කිරීම නොවන අතර වරදවල් සිදුකිරීම මැඩපැවැත්වීමයි.

පෙර පැවති පනත යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා ගොනු කළ යුතුව තිබූ නමුත් මෙතැන් සිට මෙම වරදවල් මහාධිකරණයේදී විභාග කිරීමට නියමිතය. එවැනි වරදකට වරදකරු වන ඕනෑම අයෙකුට රුපියල් මිලියන දහයකට නොඅඩු දඩයක් හෝ අවුරුදු 10 නොඉක්මවන සිර දඬුවමක් හෝ එවැනි දඩයක් හා සිර දඬුවම් යන දෙකම පැනවීමට හැකියාවක් ඇත.

නඩු පැවරීමේදී කොමිසම සතු බලතල සහ අභිමතයන්

අපරාධ නඩු කටයුතු

කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන විමර්ශන අවසන් කිරීමෙන් පසුව, V කොටස යටතේ වරදක් සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි පවතින බව කොමිසමේ අදහස වන්නේ නම් අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීමට පියවර ගනු ඇත. අපරාධ නඩු විභාගය මහාධිකරණයේ සිදුකළ යුතු හෙයින් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ (අල්ලස් පනතේ දක්වා ඇති ව්‍යතිරේකයට යටත්ව) දක්වා ඇති පරිදි නීතිපතිවරයාට පමණක් ඉදිරිපත් කළ හැකි 'අධිචෝදනා පත්‍රයක්' යටතේ චෝදනා ගොනු කෙරේ. එලෙස අධිචෝදනා පත්‍රය ගොනු කිරීම සඳහා කොමිසම නීතිපතිවරයා වෙත යොමු කරන අතර පැමිණිල්ල මෙහෙයවීම නීතිපතිවරයා විසින් සිදු කරනු ඇත. පෙර පනත යටතේ සියලුම වරදවල් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයට චෝදනා ගොනු කිරීමට නියමිතව තිබියදීත්, චෝදනා සකස් කිරීම සහ පැමිණිල්ල මෙහෙයවීම නීතිපතිවරයා විසින් සිදු කරන ලදී.

V කොටසේ අඩංගු කරුණු හැර අනෙකුත් වරදවල් මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග කළ යුතු වේ.

සිවිල් නඩු කටයුතු

නව පනතින් හඳුන්වා දී ඇති නව අංගයක් වන්නේ අලාභ අයකර ගැනීම සහ සිවිල් දණ්ඩනයක් පැනවීම සඳහා වාණිජ මහාධිකරණය ලෙස පොදුවේ හැඳින්වෙන සිවිල් අධිකරණ බලය ඇති මහාධිකරණය ඉදිරියේ සිවිල් නඩු කටයුත්තක් ආරම්භ කිරීම සඳහා කොමිසම වෙත පැවරී ඇති අභිමතයයි. මෙම පනත මඟින් වාණිජ මහාධිකරණයට මෙම අධිකරණ බලය විශේෂයෙන් පවරා ඇත. ඕ කොටස යටතේ වරදක් සිදු කළ පුද්ගලයෙකුට එරෙහිව එවැනි නඩු කටයුත්තක් පැවරිය හැකිය. එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධව කොමිසමේ තීරණය රඳා පවතින්නේ උල්ලංඝනය කිරීමේ ස්වභාවය සහ ආකාරය, එය වෙළෙඳපොළ කෙරෙහි ඇති කරන බලපෑම සහ ආයෝජකයෙකුට සිදු වී ඇති අලාභයේ

ප්‍රමාණය මතයි. කොමිෂන් සභාව විසින් අයකර ගත හැකි අලාභ මුදල වන්නේ ලැබුණු ලාභය හෝ වලක්වාගත් අලාභය මෙන් තුන් ගුණයක් වන අතර උල්ලංඝනය කිරීමේ බරපතලකම හා ප්‍රමාණය අනුව අධිකරණයට පැනවිය හැකි දණ්ඩනය රුපියල් මිලියන දහයකට නොඅඩු විය යුතු අතර රුපියල් මිලියන සියයකට වඩා නොවැඩි විය යුතුය.

V වෙනි කොටස යටතේ ඇති වන උල්ලංඝනය කිරීම් වලදී උපයාගත් මුදල්මය ලාභයේ හෝ වළක්වා ගත් අලාභයේ දළ ප්‍රමාණය මෙන් තුන් ගුණයකට සමාන මුදලක් ගෙවීමට වගකීම පිළිගැනීමකින් යුක්තව හෝ නොමැතිව ඕනෑම පුද්ගලයෙකු සමඟ ගිවිසුමකට එළඹීමේ අභිමතය ද කොමිසමට පැවරී ඇත. V වැනි කොටස යටතේ දක්වා ඇති වරදවල් හැර වෙනත් වරදවල් සඳහා එවැනි වරදකට ලබාදිය හැකි උපරිම දඩ මුදලින් අඩක් නොඉක්මවන මුදලක් අය කර ගෙන සමථයකට පත් කිරීමේ හැකියාවක් ඇත.

පරිපාලන දණ්ඩනයන්

මෙම පනත මගින් හඳුන්වා දී ඇති තවත් වැදගත් දෙයක් වන්නේ පරිපාලන දණ්ඩනයන් පැනවීමට කොමිසමට ඇති හැකියාවයි. වර්තමානයේදී, සියලු කඩකිරීම් අපරාධ වරදවල් ලෙස සළකනු ලැබුවද, දඩයක් හෝ වෙනත් පරිපාලන දණ්ඩනයන් පැනවීම සඳහා කොමිසමට පැහැදිලි බලයක් තිබුණේ නැත.

කෙසේ වෙතත්, මෙම විධිවිධානය මඟින් "උල්ලංඝනයේ ස්වභාවය සහ ආකාරය, අනුකූල නොවීම හෝ උල්ලංඝනය වීම සහ එහි බලපෑම" සැළකිල්ලට ගනිමින් කොමිෂන් සභාවේ අභිමතය පරිදි (V කොටස යටතේ ඇති වරදවල් හැරුණු විට) තරවටු කිරීම, දණ්ඩනයක් පැනවීම, ආපසු අයකර ගැනීම, තහනම් නියෝගයක් පැනවීම හෝ ගණුදෙනු තහනම් කිරීම වැනි විවිධාකාර පරිපාලන දණ්ඩනයන් යම් පුද්ගලයෙකු මත පැනවිය හැකිය. ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා වන පියවර සහ අධිකරණය වෙතින් යම් නියෝග ලබා ගැනීමේ අයිතිය ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම උදෙසා කොමිසමට යම් යම් පියවර ගැනීමට ඇති හැකියාව සහ විමර්ශන ක්‍රියාවලියේදී යම් නියෝග නිකුත් කිරීම සහ (දින හතක කාලයක් සඳහා වලංගු වන අනතුරුව වාණිජ මහාධිකරණය විසින් තහවුරු කළ යුතු) අවුරා තැබීමේ නියෝග නිකුත් කිරීමේ හැකියාව හඳුන්වාදීම තවත් විශේෂාංගයක් වේ. යම් කඩකිරීමක් සිදුකර ඇති අවස්ථාවක හෝ කඩකිරීමක් සිදු විය හැකි බවට විශ්වාස කරන අවස්ථාවකදී කොමිසම හට මහාධිකරණය ඉදිරියට ගොස් යම් සුරුකුම්පත් ගණුදෙනුවක් බල රහිත ලෙසට හෝ යම් සුරුකුම්පත් ගණුදෙනුවක් සිදු කිරීම වලක්වන ලෙසට නියම කෙරෙන නියෝගයක් ලබාගැනීමට හැකියාවක් ඇත.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා වැදගත් වන ප්‍රතිපාදන

වෙළෙඳපොළේ දියුණුවට දායක වන ප්‍රතිපාදන බොහෝමයක් නව පනතේ ඇත. වත්කම් කැපකිරීමේ අවදානම බොහෝ සෙයින් අවම කරන සහ නව ගනුදෙනු උපකරණ හඳුන්වා දීමට ද හැකි වන පරිදි, මධ්‍යම ප්‍රති පාර්ශවය වැනි අති නවීන යටිතල පහසුකම් භාවිතයට ඉඩ සළසා දී ඇත. ව්‍යුත්පන්නවල ආයෝජනය කිරීම (සළකා බලන වත්කමේ ස්වභාවය නොතකා අනාගතයන් සහ වරණයන් වැනි), කොටස් ණයට ගැනීම සහ ණයට දීම සහ නියාමනයට යටත් හිඟ විකුණුම් යනාදිය හඳුන්වාදීම සඳහා ප්‍රතිපාදන ද ඇතුළත් කර ඇත. මෙමඟින් වෙළෙඳපොළේ ද්‍රවශීලතා මට්ටම ඉහළ නංවන අතර දැනට පවතින ඒක පාර්ශවීය තත්ත්වය ඉවත් කර ප්‍රබල වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට උපකාරී වේ. මෙවැනි අවස්ථාවලින් දිගු කාලීන ආයෝජකයින්ට අවස්ථා ලැබෙනු ඇත.

ලයිස්තුගත නොකළ සුරුකුම්පත් වෙළෙඳාම් කිරීම සඳහා පහසුකම් සැළසෙන අතර ඒ සඳහා අතිරේක ගණුදෙනු වේදිකාවක් ද නිර්මාණය කිරීමේ හැකියාව ඇත. වෙළෙඳපොළ සාදන්නන්ට වෙළෙඳපොළ අතරමැදියෙකු ලෙස කටයුතු කිරීමට ඇති හැකියාව තුළින් ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතර සුරුකුම්පත් අඛණ්ඩව හා කාර්යක්ෂමව හුවමාරු කර ගැනීම සහතික කෙරේ. මෙමඟින් වෙළෙඳපොළ පුළුල් වන අතර විනිමය හුවමාරු අරමුදල් වැනි අරමුදල් පිහිටුවීම ද දිරිමත් කෙරෙනු ඇත.

තවද, නව පනත මඟින් ලොව පුරා පිළිගත් ප්‍රවණතාවයන්ට අනුකූල වන සුරුකුම්පත් ඇතුළත් කිරීමට හැකි වන පරිදි 'සුරුකුම්පත්' යන්න නැවත අර්ථ දක්වා ඇත. ඒ හා සමානව, ඒකක භාරයෙන් ඔබ්බට ගිය සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සඳහා ද ප්‍රතිපාදන සකසා ඇත. මෙම කාණ්ඩය යටතට ගැනෙන්නේ මොනවාද යන්න නිර්වචනය කර ඇත. මෙතුළින් නව ආයෝජන අවස්ථා සැළසෙනු ඇත.

දැනට වෙළෙඳපොළේ ඇති ගනුදෙනු උපකරණ පරාසය පුළුල් කිරීම සඳහා පිළිගත් ආයෝජකයින් ලෙස පුද්ගල කාණ්ඩයක් හඳුනාගෙන ඇත. මෙමඟින් සුළු පරිමාණ ආයෝජකයින්ගේ ආරක්ෂාව ලැබෙනවා පමණක් නොව, ඉහළ අවදානම් දැරීමට හැකි තත්ත්වයේ සිටින අය විසින් ප්‍රයෝජනයට ගත හැකි අධි අවදානම් සහිත ආයෝජන උපකරණ වෙළෙඳපොළට නිකුත් කිරීමට ද හැකි වනු ඇත.

වෙළෙඳපොළේ අක්‍රමිකතා මැඩපැවැත්වීම පහසු කරනු ඇතැයි යන අපේක්ෂාවෙන් ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම සඳහා වූ විධිවිධාන ඇතුළත් කර ඇත. මෙම ආරක්ෂාව නිෂ්ඵල ඉල්ලීම් සිදුකරමින් අනිසි ලෙස භාවිතා නොකිරීමට වගබලා ගැනීම වැදගත් වන අතර, එවැනි පද්ධතියකින් ලබා ගත හැකි ප්‍රතිලාභ අවතක්සේරු නොකළ යුතුය.

කොමිෂන් සභාවේ බලතල හා අභිමතය තුලනය කිරීම සඳහා අන්තර්ගත කර ඇති දේ

නියාමකයෙකු ලෙස එහි කාර්යයන් වඩාත් අර්ථවත් හා ඵලදායි ලෙස ඉටු කළ හැකි බව සහතික කිරීම සඳහා නව පනත යටතේ කොමිසමට පුළුල් බලතල හා අභිමතයක් පැවරී ඇත. කෙසේ වෙතත් මතක තබා ගත යුතු විශේෂ කරුණක් වන්නේ කොමිසම හට මුක්තියක් ලබා දී නොමැති බවත්, බලය හා අභිමතය පවරා ඇති වෙනත් ඕනෑම මහජන අධිකාරියක් මෙන්ම කොමිසමද නීතියට අනුව එවැනි බලය හා අභිමතය පාවිච්චි කළ යුතු බවත්, සෑම අවස්ථාවකදීම ස්වාභාවික යුක්ති මූලධර්ම අනුගමනය කළ යුතු බවත්ය. කොමිෂන් සභාව

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ කෙටි විශ්ලේෂණයක්



ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න
සභාපති

වෙත පැවරී ඇති බලය සහ අභිමතය තුලනය කිරීම උදෙසා යම් සීමාවන් පනවා ඇති අතර එමඟින් කොමිෂන් සභාවේ වගවීම හා කිසිඳු අවස්ථාවක එහි අධිකාරිය නොඉක්මවන ආකාරයට කටයුතු කරන බව සහතික කෙරෙනු ඇත.

කොමිෂන් සභාව තීරණයක් ගැනීමට පෙර අනෙක් පාර්ශවයට ඇහුම්කන් දිය යුතු බව, අභියාචනා කිරීමේ අයිතිය ලබා දීම, කොමිසම විසින් යම් තීරණ ගැනීමේදී එකී තීරණය සඳහා හේතු දැක්විය යුතු බවට වන සඳහන් කිරීම් මෙම සීමාවන් ලෙසට හැඳින් විය හැක. එමෙන්ම කොමිසම අධිකරණය ඉදිරියට ගොස් යම් නියෝග ලබා ගත යුතු බවට දක්වා ඇති ප්‍රතිපාදන සහ එවැනි නියෝග ලබාදීමට පෙර අධිකරණය අනෙක් පාර්ශවයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදිය යුතු බවට වන ප්‍රතිපාදන ද සාධනීය ඒවා ලෙස දැක්විය හැකිය.

තවද, අභියාචනාධිකරණයේ රිට් අයදුම්පත්‍රයක් ගොනු කිරීම මඟින් කොමිසමේ තීන්දුවක් අභියෝගයට ලක් කිරීම සඳහා වූ පොදු නීතිය ඉදිරියේ ඇති අයිතිය මෙම පනතින් නැවත අවධාරණය කර ඇති අතර එමඟින් අගතියට පත් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් ව්‍යවස්ථාපිතව තහවුරු කර ඇත.

අවසන් කිරීම

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ප්‍රගතිශීලී විධිවිධාන මඟින් ප්‍රාග්ධන වෙළෙඳපොළක අවසාන ඉලක්කය ලෙස සැළකෙන සියළුම වෙළෙඳපොළ සහභාගීවන්නන් තුළ විශ්වාසයක් ඇති කිරීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල නියැලීමට අවශ්‍ය පරිසරය ගොඩනැගීම සඳහන් කළ හැක. වෙළෙඳපොළ නියාමකයා වශයෙන් කොමිෂන් සභාව අධික ලෙස නියාමනය කිරීම සුදුසු නොවන බවට දැනුවත් අතර එම නිසා සෑම විටම නිවැරදි සමතුලිතතාවය ඇති කර ගැනීමට කැපවී සිටිය යුතුය. ඒ අතරම, සෑම වෙළෙඳපොළ සහභාගිවන්නෙකුම ස්වයං නියාමනයක් පිළිපදින්නේ නම් සහ නීතියේ සීමාවන් තුළ ක්‍රියා කරන්නේ නම්, මෙම පනතේ අඩංගු බොහෝ විධිවිධාන ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනඟින බව ද අවධාරණය කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමලෝචනය



එබැවින්, ආර්ථිකය ගොඩනැංවීමට සහ පෞද්ගලික අංශය පුනර්ජීවනය කිරීමට ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා කොටස් වෙළෙඳපොළට තීරණාත්මක කාර්යභාරයක් පැවරී ඇත. එම නිසා පළමුව ඩොලර් ආදායම් උපයන ලැයිස්තුගත සමාගම් අතරින් ඔවුන්ගේ හැකියාව, ඉදිරියට යාම සහ කැපවීම මත වඩා ක්‍රියාකාරී සමාගම් තෝරා ගැනීමට සහ දෙවනුව එම සමාගම් දිරිමත් කිරීම සහ පෝෂණය කිරීමට කාලය පැමිණ ඇත. තෙවනුව, අපේ රටේ සමස්ත ස්වරූපයම වෙනස් කරමින් ආර්ථික වර්ධනයේ ප්‍රගතියක් ලබාගැනීමට ගෝලීය දැවැන්තයින් සමඟ තරඟ කිරීමට මෙම සමාගම් වලට නිදහස ලබාදිය යුතු වේ. එමඟින් අපව ගතික ව්‍යවසායක රාජ්‍යයක් බවට පරිවර්තන කරනු ඇති අතරම රටෙහි සැබෑ විභවය අවබෝධ කරගැනීමටද එය උපකාර වනු ඇත.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමලෝචනය

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2021 වර්ෂය තුල ක්‍රියාවට නංවන ලද කාර්යයන්හි සමාලෝචනයක් ඉදිරිපත් කරන්නේ මා ඉතාමත් තෘප්තියකිනි.

වෙළෙඳපොළ කෙටියෙන්

2021 වර්ෂය දෙස නැවත හැරී බලන විට, අවිවාදයෙන්ම පැවසිය හැක්කේ එය ශ්‍රී ලංකා සුරුකුම්පත් වෙළෙඳපොළට ඉතාමත් සාර්ථක වසරක් බවයි. 2020 වසර සමඟ සසඳන විට, 2021 වසර තුළ සියලු කොටස් මිළ දර්ශකය 80% කට වඩා වැඩි සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කල බව පළමුවෙන්ම පැවසීමට කැමැත්තෙමි. මෙය 2011 වර්ෂයෙන් පසුව සියලු කොටස් මිළ දර්ශකය වාර්තා කල ඉහළම වර්ධන වේගය වේ. ඒ හා සමානවම S & P ශ්‍රී ලංකා 20 මිළ දර්ශකය ද 60% කට වඩා වැඩි වර්ධන වේගයක් පෙන්නුම් කරන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළ ලෝකයේ දෙවන හොඳම ක්‍රියාකාරී වෙළෙඳපොළ ලෙස පිළිගැනීමට මෙම වර්ධන වේගයන් හේතු විය. තවද, පසුගිය වර්ෂයේ වාර්තා කල රුපියල් බිලියන 1.8 ක සාමාන්‍ය දෛනික පිරිවැටුමට සසඳන විට මෙම වර්ෂය තුල සාමාන්‍ය දෛනික පිරිවැටුම රුපියල් බිලියන 4.8 ලෙස වාර්තා විය. කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එක්ව ක්‍රියාවට නංවන ලද වෙළෙඳපොළ ඩිජිටල්කරණයෙහි ප්‍රතිඵලයක් ලෙස නව මධ්‍යම තැන්පතු ගිණුම් විවෘත වීම සහ දේශීය ආයෝජකයින් සුරුකුම්පත් වෙළෙඳපොළ කෙරෙහි උනන්දුව වැඩි වීම සාමාන්‍ය දෛනික පිරිවැටුමෙහි දෙගුණයක වර්ධනයට හේතු විය.

තවද, සුරුකුම්පත් වෙළෙඳපොළ රටේ ආර්ථිකයට ලබාදී ඇති දායකත්වය මනාව පිළිඹිබු කරමින් පසුගිය වසර දහය තුල ප්‍රථම වතාවට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සියයට තිස් පහක් (35%) ඉක්මවා යන ලදී. වෙළෙඳපොළේ සාමාන්‍ය දෛනික පිරිවැටුම් මට්ටම් ඉහල යාම හේතුවෙන්, 2020 වසරේ වාර්තා කල සියයට දාසය (16%) හා සැසඳීමේදී මෙම වසර තුල වෙළෙඳපොළ පිරිවැටුමට වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට හතලිහක් (40%) දක්වා වර්ධනය විය. වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයේ සීඝ්‍ර වර්ධනයට ප්‍රධානතම හේතුව ලෙස දේශීය ආයෝජකයින්ගේ දායකත්වය ආරෝපණය කල හැකි අතර එය දළ වශයෙන් සියයට අනූ පහක් (95%) ක් පමණ වේ.

නිකුත් කරන්නන්ගේ මූල්‍ය රැස්කිරීමේ අවශ්‍යතා සපුරාලීම සහතික කිරීමෙහිලා ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රධාන භූමිකාවක් ඉටු කරන බව ඔබ දැන සිටිනවා විය හැකිය. ඒ නිසාම

> කෙසේ වෙතත්, මා මෙම සමාලෝචනය ඉදිරිපත් කරන මේ මොහොතේ අපේ රට ආර්ථික මෙන්ම සමාජයීය වශයෙන් පීඩනයට ලක්ව ඇති අතර වෙළෙඳපොළ තුලින්ද එය මනාව පිළිඹිබු වේ. අභියෝගයන්ට මුහුණ දෙමින් මෙම මූල්‍ය හා ආර්ථික දුෂ්කරතාවයෙන් මිදීම සඳහා කලයුතු දෑ තේරුම් ගැනීම සහ ඒවා ක්‍රියාවට නැංවීමට ඉක්මන් සහ දැඩි පියවර ගැනීම ඉතා වැදගත් වේ.

2021 වසර තුල කොටස් වෙළෙඳපොළ ප්‍රාථමික කොටස් නිකුතු (IPO) ප්‍රමාණයේ ඉතා ඉහල වර්ධනයක් පෙන්නුම් කල අතර මෙම වසර තුල ප්‍රාථමික කොටස් නිකුතු ප්‍රමාණය 13 ක් විය. ප්‍රාථමික කොටස් නිකුතු වල මෙවැනි වර්ධනයක් අවසන් වරට වාර්තා වූයේ 2011 වර්ෂයේදීය. මෙලෙස ප්‍රාථමික කොටස් නිකුතු ප්‍රමාණයේ ඉහල යාම 2021 දෙසැම්බර් 31 දිනට පෙර කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමට නියමිත දේශීය සමාගම් සඳහා සියයට පනහක (50%) බදු සහනයක් ලබාදීමේ යෝජනාව සහ එවැනි සමාගම් සඳහා ඉදිරි වසර තුන (3) තුල සියයට දාහතරක් (14%) වූ ආයතනික බදු අනුපාතයක් හඳුන්වාදීමේ යෝජනාව වැනි අයවැය යෝජනා කිහිපයක් හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉටුකළ ක්‍රියාකාරී භූමිකාවේ ප්‍රතිඵලයක් වේ. මේ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර තුල වෙළෙඳපොළ තුලින් ප්‍රාථමික කොටස් නිකුතු හරහා රුපියල් බිලියන 12.7 ක් රැස්කිරීමේ හැකියාව ලැබී ඇත. කොටස් වෙළෙඳපොළ පමණක් නොව ණය වෙළෙඳපොළ ද ප්‍රාග්ධනය රැස්කිරීම සඳහා පැහැදිලි දායකත්වයක් ලබාදී ඇති අතර සලකා බලන වර්ෂය තුල ප්‍රාථමික ණය නිකුතු තුලින් රුපියල් බිලියන 84 කට වඩා වැඩියෙන් රැස්කර ඇත. පසුගිය වසර පුරාවට කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් එම්පවර් පුවරුවේ ලැයිස්තුගත වීම කෙරෙහි වැඩි උනන්දුවක් දක්වනු අපි දුටුවෙමු. මෙම සංඛ්‍යාලේඛන සියල්ල තුලින් වර්ධන ප්‍රවණතාවයක් පෙන්නුම් කරන නමුත් වෙළෙඳපොළ ශුද්ධ විදේශ ගෙවීමක් වාර්තා කල අතර මෙම අවස්ථාවේ ඉදිරිපත් වූ දේශීය ආයෝජකයන්ගේ ක්‍රියාකාරීත්වය තුලින් එම ඍණාත්මක බලපෑම අවම කරගැනීමට හැකි විය. වෙළෙඳපොළ පිළිබඳ විමසා බැලීමේදී ආර්ථිකයේ පැවති අඩු පොලී අනුපාත තුලින් වෙළෙඳපොළ සහ එහි ක්‍රියාකාරීත්වය කෙරෙහි වූ ධනාත්මක බලපෑම නොසලකා හැරිය නොහැක.

කෙසේ වෙතත්, මා මෙම සමාලෝචනය ඉදිරිපත් කරන මේ මොහොතේ අපේ රට ආර්ථික මෙන්ම සමාජයීය වශයෙන් පීඩනයට ලක්ව ඇති අතර වෙළෙඳපොළ තුලින්ද එය මනාව පිළිඹිබු වේ. අභියෝගයන්ට මුහුණ දෙමින් මෙම මූල්‍ය හා ආර්ථික දුෂ්කරතාවයෙන් මිදීම සඳහා කලයුතු දෑ තේරුම් ගැනීම සහ ඒවා ක්‍රියාවට නැංවීමට ඉක්මන් සහ දැඩි පියවර ගැනීම ඉතා වැදගත් වේ.

එහෙත්, අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද පසුගිය වසර තුල ලැයිස්තුගත සමාගම් සමඟ කොටස් වෙළෙඳපොළ වාර්තාගත වර්ධනයක් ලබාගෙන ඇති බව අවධාරණය කල යුතුය. ඇත්ත වශයෙන්ම, පවතින අස්ථාවර ආර්ථික තත්වය පෞද්ගලික අංශය පුනර්ජීවනය කිරීමේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාම සඳහා අවස්ථාවක් කරගත හැකි අතර එය මේ මොහොතේ අවැසි විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා අවශ්‍ය ශක්තිමත් ක්‍රියාමාර්ග ගැනීම තුලින් රට නැවත ගොඩනැගීමට රුකුලක් වනු ඇත.

කෙසේ වෙතත්, රටේ ස්වභාවික සම්පත්, උපායමාර්ගික පිහිටීම, ඉහළ හැකියාවන්ගෙන් යුක්ත ශ්‍රම බලකාය, සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජනයට ඇති අවස්ථා, තොරතුරු තාක්ෂණ සක්‍රීය සේවා, සැපයුම්, ඉහළ අගය එකතු කල ඇඟලුම්, ආහාර සහ කෘෂිකර්මය යනාදී කිසිවක් වත්මන් තත්වය යටතේ කුමන ආකාරයකින්වත් වෙනස් වී නොමැත. එවන් පසුබිමක් තුල නිසියාකාර ප්‍රතිපත්ති සහ භාවිතයන් අනුගමනය කරමින් සමාගම් වලට තම අපනයන ශක්තිමත් කරගැනීමට සහ නිෂ්පාදනය නඟා සිටුවීමට සහයෝගය දක්වන්නේ නම් ඒ තුලින් රටට ආනයන බිල්පත් පියවීමට සහ වර්ධන ඉලක්ක කරා ළඟාවීමට හැකියාව ඇති අතරම එමඟින් රටේ විදේශීය ණය වඩාත් තිරසාර පදනමක් මත තැබීමට සහය ලැබේ.

එබැවින්, ආර්ථිකය ගොඩනැංවීමට සහ පෞද්ගලික අංශය පුනර්ජීවනය කිරීමට ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා කොටස් වෙළෙඳපොළට තීරණාත්මක කාර්යභාරයක් පැවරී ඇත. එම නිසා පළමුව ඩොලර් ආදායම්

උපයන ලැයිස්තුගත සමාගම් අතරින් ඔවුන්ගේ හැකියාව, ඉදිරියට යාම සහ කැපවීම මත වඩා ක්‍රියාකාරී සමාගම් තෝරා ගැනීමට සහ දෙවනුව එම සමාගම් දිරිමත් කිරීම සහ පෝෂණය කිරීමට කාලය පැමිණ ඇත. තෙවනුව, අපේ රටේ සමස්ත ස්වරූපයම වෙනස් කරමින් ආර්ථික වර්ධනයේ ප්‍රගතියක් ලබාගැනීමට ගෝලීය දැවැන්තයින් සමඟ තරඟ කිරීමට මෙම සමාගම් වලට නිදහස ලබාදිය යුතු වේ. එමඟින් අපව ගතික ව්‍යවසායක රාජ්‍යයක් බවට පරිවර්තන කරනු ඇති අතරම රටෙහි සැබෑ විභවය අවබෝධ කරගැනීමටද එය උපකාර වනු ඇත. එබැවින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට වෙළෙඳපොළ නියාමනය කිරීමේදී සාම්ප්‍රදායික භූමිකාවට සීමා විය නොහැකි අතරම ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට තවදුරටත් සාම්ප්‍රදායික ප්‍රවේශය භාවිතා කල නොහැකි වේ.

මෙම පසුබිම යටතේ, මෙවැනි ආර්ථික තත්වයක් තුල සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අත්පත් කරගත් ජයග්‍රහණ පිළිබඳව සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට ලැබීම මම ගෞරවයක් ලෙස සලකමි.

සුසමාදර්ශී වෙනසක්: 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීම

2021 සැප්තැම්බර් 21 වන දින කථානායකවරයා විසින් සහතික කිරීමෙන් පසුව, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කරමින් දීර්ඝ කාලයක් මුළුල්ලේ බලාපොරොත්තුව සිටි 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කරන ලදි (නව පනත). මෙම නව පනත බලාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනයෙහි කාර්යක්ෂමතාව, පුරෝකථනය කිරීමේ හැකියාව සහ අනුකූලතාවය ඉලක්ක කරගත් ඵලදායී නියාමනයක් සක්‍රීය කරනු ලබයි.

මෙම පනත අනාගතවාදී වේ. එමඟින් අනෙකුත් සංවර්ධිත වෙළෙඳපොළවල් වලට අනුකූල වූ වර්ධනයක් අපේක්ෂා කරනු ලබයි. නව පනත මඟින් ගෙන එන ලද නියාමන පාලන තන්ත්‍රය තුලින් වෙළෙඳපොළට අදාළ වන නීති සහ එහි ඇතුලත් කැපිපෙනෙන ලක්ෂණ පිලිබඳ වඩා පැහැදිලි බවක් ලබා දේ. මෙම නව නීතිය සමෝධානික වන අතර එමඟින් නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනය යන දෙඅංගයම එකසේ ප්‍රවර්ධනය කිරීම සහතික කරනු ලබයි.

වෙළෙඳපොළ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ රාශියක් අතුරින් ප්‍රතිපාර්ශවීය අවදානම්

මෙම නව නීතිය සමෝධානික වන අතර එමඟින් නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනය යන දෙඅංශයම එකසේ ප්‍රවර්ධනය කිරීම සහතික කරනු ලබයි.

අවම කරගැනීම සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණයක් ඇති කිරීම සහ සුරැකුම්පත් වෙළෙඳපොළ තුල වඩා හොඳ අවදානම් කළමනාකරණයක් සඳහා ප්‍රතිපාදන සැලසීම ප්‍රධාන වේ. ව්‍යුහගත ණය ගැනීම් හා ණය ලබාදීම් සහ නියාමනය කරන ලද හිඟ වෙළෙඳාම් යාන්ත්‍රණයක් (CCP) සඳහා පහසුකම් සලසමින් නව පනතේ ඇති ප්‍රතිපාදන තුලින් නිසැකවම වෙළෙඳපොළට අත්‍යවශ්‍යවම වන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා දායකත්වය ලබා දේ. තවද, නව පනත මඟින් වෙළෙඳපොළට නව ආයෝජන උපකරණ රාශියක් හඳුන්වාදීමේ හැකියාව ලැබී ඇත. නිදසුනක් ලෙස වෙළෙඳපොළ සාදන්නන් හඳුන්වාදීම තුලින් වෙළෙඳපොළ තුල ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් පවත්වාගෙන යාම සහතික කරයි.

නව පනත පිළිබඳ විශාල වශයෙන් සාකච්ඡාවට ලක්වූ නිසා එහි ඇතුලත් වන විශේෂ ලක්ෂණ පිළිබඳව ඔබ දැනටමත් දැනුවත් බව මම විශ්වාස කරමි. එසේ වුවත්, ඉහත සඳහන් කරුණු වලට අමතරව මෙම පනතේ සඳහන් යම් ප්‍රධාන ලක්ෂණ පිළිබඳව මා මෙම සමාලෝචනයේ සඳහන් නොකළහොත් එය අඩුවක් වනු ඇත. කොටස් VII කින් සමන්විත නව පනත තුල වෙළෙඳපොළ අතරමැදියන් සඳහා පමණක් නොව වෙළෙඳපොළ ආයතන සහ අතිරේක සේවා සපයන්නන් වැනි නව කාණ්ඩ ඇතුලත් වන අතරම අපරාධමය වැරදි සම්බන්ධයෙන් පැරණි පනතට වඩා වෙනස් ආකාරයේ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සඳහා පහසුකම් සලසනු ලබයි. මා එසේ පැවසීමට කරුණ නම් නව නීතිය තුල සියලුම ආකාරයේ වැරදි අන්තර්ගත වන අතර වරදක් විය හැකි හැසිරීම් පිළිබඳ ඉතා පැහැදිලිව සඳහන් කර ඇත. මේ හා සම්බන්ධව පැවති නීතියේ යම් අපැහැදිලිකමක් වේද ඒ සියල්ල ඉවත් කරමින් ව්‍යතිරේක සහ විත්තිවාචිකයන් ද නව නීතිය තුල පැහැදිලිව සඳහන් කර ඇත. "තහනම් හැසිරීම්" ලෙස වර්ග කර ඇති සියලුම වැරදි (ව්‍යාජ වෙළෙඳාම් කිරීමේ සහ වෙළෙඳපොළ මිල ගණන් කෘත්‍රිම ලෙස උස් පහත කිරීමේ ගනුදෙනු, කොටස් වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම්, අසත්‍ය හෝ නොමඟ යවනසුලු ප්‍රකාශ, සුරැකුම්පත් ගනුදෙනු කිරීමට වංචනික ලෙස තැනැත්තන් පෙළඹවීම සහ අයුතු ලෙස හැසිරවීමේ සහ රැවටිලි සහගත උපක්‍රම භාවිතා කිරීම) සහ අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් දැන් මහාධිකරණය විසින් අධිචෝදනා පත්‍රයක් නිකුත් කරනු ලබූ පසු නඩු විභාග කරනු ලැබිය යුතුය. නව පනතේ විධිවිධාන අනුව යම් තැනැත්තෙකු යම් වරදකට වරදකරු කරනු ලැබූ විට දී රුපියල් මිලියන දහයකට නොඅඩු දඩයකට හෝ වසර දහයක් (10) නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය.

තවද, පනතේ විධිවිධාන අනුව හානියට අදාළ මුදල් ආපසු අයකර ගැනීම සඳහා හෝ සිවිල් දණ්ඩන පැනවීම සඳහා වාණිජ මහාධිකරණයේ සිවිල් ප්‍රතිකර්ම පැනවීමටද පනත මඟින් හැකියාව ලැබී ඇති බව කිව යුතුමය. පනතේ " වෙළෙඳපොළ විෂමාචාරය" යන කොටස යටතේ උල්ලංඝනයක් සිදු කළ තැනැත්තෙකුට එරෙහිව එවැනි නඩු පැවරිය හැකිය. එසේ පැවසීමේදී, මෙවැනි නඩු පැවරීම සඳහා කොමිෂන් සභාව තීරණය කරනු ලබන්නේ පනතේ දක්වා ඇති පූර්වාදර්ශයන්ට එනම්, එම කඩ කිරීමේ ස්වභාවය සහ ආකාරය, ඉන් වෙළෙඳපොළට ඇතිවන බලපෑම සහ යම් ආයෝජකයෙකුට ඇති වූ පාඩුවේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන එසේ කිරීමට අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකන අවස්ථාවක බව අනිවාර්යයෙන්ම කිවයුතු වේ.

පනතේ තවත් කැපීපෙනෙන ලක්ෂණයක් වන්නේ පරිපාලනමය දණ්ඩන නියම කිරීමට කොමිෂන් සභාවට බලය හිමිවීමයි. මේ අනුව, උල්ලංඝනය කිරීමේ ස්භාවය සහ ආකාරය, එමඟින් වෙළෙඳපොළට ඇතිවන බලපෑම සහ ඕනෑම ආයෝජකයෙකුට ඇතිවන පාඩුවේ ප්‍රමාණය මත පරිපාලනමය දණ්ඩන එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පැනවීමේ බලය කොමිෂන් සභාව සතුවේ.

ඉහත සඳහන් කල කරුණු අතරට තවත් යමක් එකතු කරනවානම්, පනතේ ඇති වගන්ති ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කරමින් පවතින හෝ යම් තැනැත්තෙකු විමර්ශනයට ලක් කරමින් පවතින අවස්ථාවක අධිකරණයේ ස්ථීර කිරීමට යටත්ව නිකුත් කළ දින සිට වෙළෙඳපොළ දින හතක් දක්වා බලාත්මක වන අවුරා තැබීමේ නියෝග නිකුත් කිරීම මගින් ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පවරා ඇති අතර යම් ආසන්න කඩවීම් වැළක්වීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී උසාවි නියෝග ගැනීමේ බලයද පවරා ඇත.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමලෝචනය

ආයෝජකයින්ගේ විවිධ අවදානම් සහ ප්‍රතිලාභ පැතිකඩයන් සඳහා නව නීතිය මඟින් පහසුකම් සපයයි. නිදසුනක් වශයෙන් ප්‍රතීත ආයෝජකයින් හඳුන්වාදීම තුලින් නිකුත් කරන්නන්ට ඉහළ අවදානම් සහිත සුරැකුම්පත් නිකුත් කිරීමේ හැකියාව ලැබෙන අතර ඉහළ අවදානම් දැරීමට හැකි ආයෝජකයින්ට එවැනි නිකුත් කිරීම් තුලින් ප්‍රතිලාභ ලබාගැනීමට අවකාශ හිමිවේ. ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් සම්බන්ධ විධිවිධාන හඳුන්වාදීමද අවධානයට ලක්විය යුතු කරුණක් වන්නේ එය වෙළෙඳපොළ වැරදි සම්බන්ධයෙන් තොරතුරු සපයන්නන් ආරක්ෂා කිරීමට ක්‍රියා කරන බැවිනි. මේ සියල්ල තුළින් පවතින නීතිය සුමට ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලැබී ඇත.

කාර්යක්ෂම සහ විශ්වාසදායක වෙළෙඳපොළක් සඳහා මනා යටිතල පහසුකම්

ගෙවීම් වලට එදිරිව බේරුම්කිරීම (DVP) හඳුන්වාදීම තුලින් තැන්පතුගාර වල අවදානම් කළමනාකරණ රාමුව වැඩිදියුණු කිරීමට හේතු වනු ඇත. ගෙවීම් වලට එදිරිව බේරුම් කිරීම මඟින් වත්කම් කැපවීමේ අවදානම අවම කිරීම වෙළෙඳපොළ කෙරෙහි ආයෝජක විශ්වාසය වර්ධනය වීමට හේතු වේ. ගෙවීම් වලට එදිරිව බේරුම්කිරීම පිහිටුවීම තුලින් නැගී එන වෙළෙඳපොළවලට අනන්‍ය වූ එක් අංගයක් නැතහොත් අවශ්‍යතාවයක් සපුරාලන බව මා පවසන්නේ ඉතාමත් තෘප්තියකිනි. මින් ඔබ්බට ගමන් කිරීම සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණය (CCP) ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ කමිටුවක් පිහිටුවන ලදි. මෙම මූලපිරීමත් සමඟ සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර නුදුරු අනාගතයේදී මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණය පිහිටුවීම මල්පල ගැන්වෙනු ඇති බව මාගේ විශ්වාසයයි.

බහුවිධි මුදල් පුවරුව හඳුන්වාදීමත් සමඟ දේශීය සමාගම් වලට ඔවුන්ගේ අරමුදල් අවශ්‍යතා සපුරාගැනීමට විදේශීය වටිනාකම් සහිත සුරැකුම්පත් නිකුත් කිරීමේ හැකියාව ලැබී ඇති අතර එමඟින් අපනයන/ආනයන ක්ෂේත්‍රයන්ට සැලකිය යුතු නිරාවරණයක් ඇති සමාගම් වලට ඔවුන්ගේ මුදල් සම්බන්ධ අවදානම් වලින් ආරක්ෂා වීමට ඉඩ සැලසේ. රටේ පවතින වත්මන් තත්වය හමුවේ දේශීය ආර්ථිකයට විදේශ මුදල් ගලා ඒම සඳහා මෙම මූලපිරීම පහසුවක් වනු ඇති බව මාගේ විශ්වාසයයි.

කොළඹ කොටස් හුවමාරුවේ OTC වේදිකාව හරහා ණය සුරැකුම්පත් නැවත මිලදී ගැනීමේ ගනුදෙනු හා සම්බන්ධ ගිවිසුම් සඳහා අදාළ වන ප්‍රතිපත්ති ව්‍යුහය සකස් කිරීම අවසන් කිරීම තුලින් ආයෝජකයින්ට ඔවුන්ගේ ආයෝජන සිදු කිරීමේදී පුළුල් තේරීමක් ලබා දෙනු ඇත. එපමනක් නොව, ප්‍රාථමික නිකුතු ලැයිස්තුගත කිරීමේ රාමුව පුළුල් කිරීම ඵලදායී වූ බව මා ඉතා සතුටින් සහ තෘප්තියෙන් පවසන්නේ ඒසමඟ විවිධාංගීකරණය වූ ව්‍යාපාරික අවශ්‍යතා සහිත සමාගම් රාශියක් ලැයිස්තුගත වූ බැවිනි.

ඩිජිටල්කරණය සමඟින් ඉදිරියට

ඩිජිටල්කරණය යන මාතෘකාව දෙසට අවධානය යොමු කරනවානම්, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් කොමිෂන් සභා සාමාජිකයන් වන නරේෂ් අබේසේකර සහ මනිල් ජයසිංහ යන මහත්වරුන්ගේ මඟපෙන්වීම යටතේ පත්කරන ලද ඒකාබද්ධ කමිටුව මඟින් වෙළෙඳපොල තුල විප්ලවීය වෙනසක් සිදු කිරීමට පියවර ගෙන ඇති අතර එමඟින් කොළඹ කොටස් හුවමාරුවේ සියලුම මෙහෙයුම් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. දේශීය සමාගම් වලට නව ගිණුම් විවෘත කිරීම සඳහා CSE ජංගම දුරකථන මෘදුකාංගය හඳුන්වාදීම, CDS e-connect හඳුන්වාදීම සහ ඉලෙක්ට්‍රොනික ප්‍රාථමික නිකුතු හඳුන්වාදීම සිදු කරමින් ඩිජිටල්කරණයේ දෙවන අදියර අවසන් කර දැන් අපි තුන්වන අදියරට පැමිණ ඇත.

පනතේ තවත් කැපීපෙනෙන ලක්ෂණයක් වන්නේ පරිපාලනමය දණ්ඩන නියම කිරීමට කොමිෂන් සභාවට බලය හිමිවීමයි. මේ අනුව, උල්ලංඝනය කිරීමේ ස්භාවය සහ ආකාරය, එමඟින් වෙළෙඳපොළට ඇතිවන බලපෑම සහ ඕනෑම ආයෝජකයෙකුට ඇතිවන පාඩුවේ ප්‍රමාණය මත පරිපාලනමය දණ්ඩන එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පැනවීමේ බලය කොමිෂන් සභාව සතුවේ.

ආයෝජකයින්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීමේ අදහසින් Chat Bot සහ Google Assistant දෙවන අදියර යටතේ හඳුන්වාදෙන ලදී. මෙම මූල පිරීම් තුලින් ආයෝජකයෙකුට සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ පහසුව මත වෙළෙඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කරනු ඇති බවට මම විශ්වාස කරමි.

ඩිජිටල්කරණයේ තුන්වන අදියර යටතේ, CSE ජංගම යෙදුම තුලින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට සූදානම්ව සිටින විදේශීය පුද්ගලයන්ට සහ සහ විදේශ සමාගම් වලට කිසිදු අපහසුවකින් තොරව සුරැකුම්පත් ගිණුම් විවෘත කිරීමට හැකියාව ලැබෙනු ඇති බව අපි විශ්වාස කරමු. මා ඉහත පැවසූ කරුණු වලට අමතරව, තුන්වන අදියර යටතේ හඳුන්වාදීමට නියමිත තවත් විශේෂාංග පිළිබඳ සඳහන් කරනවානම්, ඉලෙක්ට්‍රොනික හිමිකම් නිකුත් කිරීම (e-right issue), ඉලෙක්ට්‍රොනික ප්‍රතිමිලදී ගැනුම්/අනිවාර්ය අර්පණ (e-repurchase/ mandatory offer), ආන්තික ණය සැපයුම්කරුවන් (වත්කම් පන්ති අතර බාධාවකින් තොරව අරමුදල් මාරු කිරීම) යනාදිය වේ.

ආයෝජකයින්ට සහ නිකුත්කරන්නන්ට තෝරාගැනීම් සමූහයක්

සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකික ආයෝජකයා රත්‍රන් සහ නිශ්චල දේපළ සඳහා විශාල වටිනාකමක් ලබා දෙන බව කවුරුත් දන්නා කරුණකි. මෑතකදී, කොළඹ කොටස් හුවමාරුවේ OTC පුවරුව හරහා රන් ආශ්‍රිත සුරැකුම්පත් (Paper Gold) ගනුදෙනු කිරීම සඳහා පහසුකම් සැලසීමට කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙන ලදි. මේ වන විට කොළඹ කොටස් හුවමාරුව මඟින් මෙම මූල පිරීම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රාමුව සකස් කරමින් පවතින අතර මෙම මූලපිරීමෙහි අරමුණ වනුයේ ආයෝජකයන්ට ආදායම් උපයාගත හැකි මූලාශ්‍රයක් ලෙස ක්‍රියාකරන අතරම රටට නව ආදායම් මාර්ගයක් ලෙස ක්‍රියා කිරීමයි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත්කිරීම මඟින් නිශ්චල දේපළ ආයෝජන භාර (REITs) පිළිබඳ රීති නීති ගත කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ආයෝජන මාර්ගයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට පාර්ශවකරුවන්ට අවස්ථාව ලබා දී ඇත.

2011 වර්ෂයේ ප්‍රකාශයට පත්කල ඒකක භාර සංග්‍රහය (Unit Trust Code) පුළුල් කරමින්, විනිමය හුවමාරු අරමුදල් සහ හෙජ් අරමුදල් වැනි පුළුල් පරාසයක යෝජනා ක්‍රම සඳහා පහසුකම්

කොටස් වෙළෙඳපොළ නියාමකයා ලෙස, අධි නියාමනයේ අන්තරායන් පිළිබඳව අපි දැනුවත්ව සිටින බැවින් අඛණ්ඩව මනා තුලනයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතරම ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට තිරසාරත්වය ඒකාබද්ධ කිරීමට කැපවී සිටින්නෙමු.

සැලසීම සඳහා සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රය (Collective Investment Schemes) කෙටුම්පත් කරමින් පවතී. මෙම සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රය බලාත්මක වීමත් සමඟ ආයෝජකයින්ට සහ නිකුත්කරන්නන්ට බොහෝ ආයෝජන මාර්ගවල ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

වෙළෙඳපොළ තුල නව ලැයිස්තුගත කිරීම් ඉහල නැංවීමේ අරමුණින් කොළඹ කොටස් හුවමාරුව සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් (Special Purpose Acquisition Companies) සඳහා වන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කරන ලදි. මේ වන විට කොළඹ කොටස් හුවමාරුව මේ සඳහා අවශ්‍ය වන නියාමන ප්‍රතිපත්තිය සකස් කරමින් පවතී.

සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහ ආරම්භක අවධියේ ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා ප්‍රාග්ධනය රැස්කිරීමේ මාර්ග වැඩි කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් සාමූහික අරමුදල් (Equity Crowd Funding Platform) සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙන ලද අතර මෙම මූලපිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ආසියානු සංවර්ධන බැංකුව මඟින් සපයනු ලබයි. සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට මේ සඳහා වේදිකා සපයන්නන් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවන් ලෙස පිළිගැනීමට හැකියාව ඇති අතර එවැනි ආයතන සඳහා පහසුකම් සැලසීම සඳහා නීති කෙටුම්පත් කරනු ලැබේ.

තිරසාර බව ලඟා කරගැනීමට සහ තිරසාර බව වටා ඇති අරමුණු ලඟා කර ගැනීමට රට මෙහෙවීම සඳහා, හරිත බැඳුම්කර (Green Bonds) සඳහා කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත. විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් මෙන්ම මෙම මූලපිරීම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදෙනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව මඟින් වන අතර එවැනි හරිත බැඳුම්කර වලින් ලැබෙන ආදායම පුනර්ජනනීය බලශක්තිය, තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති, භූමිය තිරසාර ලෙස භාවිතය (වන වගාව සහ කෘෂිකර්මය), පිරිසිදු ප්‍රවාහන පද්ධති සහ පිරිසිදු ජල ව්‍යාපෘති යනාදිය ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පමණක් යෙදවීමට නියමිතය.

මෙයට අමතරව, ආසියානු සංවර්ධන බැංකුවේ සහය ඇතිව සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ව්‍යුහාත්මක කොටස් බලපත්‍ර (Structured Warrants) සහ ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ (Islamic Capital Market Products) හඳුන්වාදීම දීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ නීතිමය රාමුව සකස් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.

සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බලාත්මක කිරීමේ යාන්ත්‍රණය

රටේ සුරකුම්පත් වෙළෙඳපොළ තුල ආයෝජනය කිරීමට කැමති ආයෝජකයින් ප්‍රමාණය ඉහළ යාමත් සමඟ එහි ප්‍රතිඵලයක් ලෙස ගණුදෙණු සංඛ්‍යාවේ කැපී පෙනෙන ඉහළ යාමක් දක්නට ලැබේ. මේ සමඟ වඩාත් දැඩි ආවේක්ෂණ සහ සුපරීක්ෂණ යාන්ත්‍රණයක අවශ්‍යතාවය මතු වී ඇත. මේ අවශ්‍යතාවයට අනුකූලව, පූර්ව ක්‍රියා කිරීම, වැළක්වීම සහ විචක්ෂණභාවය හරහා බලාත්මක කරමින් අවධානයට යොමු කර ඇති ඇති ඕනෑම විෂමචාරයක් සිදුවීමේ සම්භාවිතාව තුරන් කිරීමේ අරමුණින් ආවේක්ෂණ, සුපරීක්ෂණ සහ විමර්ශන අංශයන් ශක්තිමත් කිරීම සඳහා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගත හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත. නිදසුනක් ලෙස, ආවේක්ෂණ අංශය දෛනික ගනුදෙනු සියයකට වඩා අවධානයට යොමු කල අතර එම ගනුදෙනු සම්බන්ධයෙන් ආවේක්ෂණ වාර්තා සකස් කිරීම, අනුකූලතා නිලධාරීන්ට හෝ ඉහළ අධිකාරියකට දැනුම් දීම, ආයෝජන උපදේශකයන්ට අවවාද දීම, මාර්ගගත ගනුදෙනු කිරීමේ පහසුකම අත්හිටුවීම, හේතු දැක්වීමේ නිවේදන, සහ අපරාධ නඩු හෝ නඩු පැවරීම ඇතුළු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත. වෙළෙඳපොළ විෂමාචාර සැලකිය යුතු ලෙස අඩු කිරීම සඳහා එවැනි පූර්ව ක්‍රියාකාරී පියවරයන් ඉතා ඵලදායී බව සනාථ වන ලදි.

කොරෝනා වසංගතය සහ එහි ප්‍රතිවිපාක ගැන මම එතරම් සඳහන් කිරීමට අදහස් නොකරමි. රට තුල ක්‍රියාත්මක වූ එන්නත් වැඩසටහන් වල සහයෝගයෙන් වෛරසය ව්‍යාප්තිය මැඩලීමට රටක් ලෙස අපට හැකිවීම ඇත්තෙන්ම භාග්‍යකි. අනෙක් සියල්ලන් මෙන්ම ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපිද එහි ප්‍රතිඵල අත්විඳිමු. මේ අනුව, කාලයේ වෙනස්වීම් වලට අනුව හැඩගැසෙමින් දැනුම වැඩිදියුණු කිරීම සඳහා වන සමහර ක්‍රියාකාරකම්වල නියැලීමට ඒ හා සම්බන්ධ වැඩසටහන් අඛණ්ඩව කරගෙන යාමට අතත්‍ය වේදිකාවන් නිර්මාණය කිරීමට සිදුවිය. වෙළෙඳපොල සහභාගීවන්නන් දැනුවත් කිරීම සඳහා එවැනි වේදිකා භාවිතා කරන ලද අතර සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අඛණ්ඩව අදටත් එම වේදිකාව භාවිතා කරමින් පවතී.

වෙළෙඳපොළ සහභාගීවන්නන් නියාමනය කිරීම සඳහා නීති රීති සහ මාර්ගෝපදේශ

සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 183 වන කොටස අනුව, පනත යටතේ රීති සෑදීමට බලය දී ඇති හෝ මේ පනත යටතේ රීති සෑදිය යුතු යැයි සඳහන් කර ඇති හෝ නියම කර ඇති යම් කාරණාවක් සම්බන්ධයෙන් රීති සෑදීම සඳහා කොමිෂන් සභාවට බලය පවරා ඇති. එවැනි රීති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ යුතු අතර එසේ ප්‍රකාශයට පත්කල දිනයේ හෝ නියම කරන ලද පසු දිනයකදී ක්‍රියාත්මක විය යුතුය. මෙම විධිවිධානයට අනුකූලව වෙළෙඳපොළ අතරමැදියන්ට සහ වෙළෙඳපොළ ආයතන සඳහා අදාළ වන රීති කෙටුම්පත් කිරීමට පියවර ගෙන ඇත. මෙම රීති කෙටුම්පත් කිරීම අවසාන අදියරේ පවතින අතර 461 වෙනි කොමිෂන් සභා රැස්වීමේ අනුමත වීමෙන් අනතුරුව එය රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට හැකි බව මම ඉතා සතුටින් පවසමි. රීති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය මනා අවධානයක් යොමු කල යුතු ඉතා වෙහෙසකර කාර්යභාරයක් වන අතර පාර්ශවකරුවන් හා පැවැත්වූ සාකච්ඡා රැසකින් පසුව ඔවුන්ගේ ප්‍රතිපෝෂණ සඳහාද හැකිතාක් දුරට ඉඩ සලසන ලදි.

සුරකුම්පත් වෙළෙඳපොළේ ප්‍රධාන ආයතන වල ක්‍රියාකාරිත්වයට හිරණාත්මක වන මෙම රීති සමස්ත වෙළෙඳපොළ වර්ධනයටද වැදගත් කරුණක් වන බැවින් එම රීති වන තුල වන අන්තර්ගතයන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සැපයීම ඉතා වැදගත් වේ. අදාළ ආයතන බලපත්‍රයක් ලබාගැනීම සඳහා කොමිෂන් සභාවට අයදුම්පතක් ඉදිරිපත් කළ අවස්ථාවේ සිට එම ආයතනයේ මෙහෙයුම් අවසන් වන තෙක් වන ක්‍රියාවලිය සඳහා මෙම රීති වලින් පහසුකම් සපයයි.

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමලෝචනය

එහෙත්, අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද පසුගිය වසර තුල ලැයිස්තුගත සමාගම් සමඟ කොටස් වෙළෙඳපොළ වාර්තාගත වර්ධනයක් ලබාගෙන ඇති බව අවධාරණය කල යුතුය. ඇත්ත වශයෙන්ම, පවතින අස්ථාවර ආර්ථික තත්වය පෞද්ගලික අංශය පුනර්ජීවනය කිරීමේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාම සඳහා අවස්ථාවක් කරගත හැකි අතර එය මේ මොහොතේ අවැසි විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා අවශ්‍ය ශක්තිමත් ක්‍රියාමාර්ග ගැනීම තුලින් රට නැවත ගොඩනැගීමට රුකුලක් වනු ඇත.

මෙම රීතීන් සඳහාම සුවිශේෂී වන රීතියක් වනුයේ වෙළෙඳපොළ අතරමැදියන් සහ වෙළෙඳපොළ ආයතනයන්හි ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් එම ආයතනයන්හි ඉටු කරන භූමිකාවන් හා සම්බන්ධ වගකීම් ඉටුකිරීම සඳහා ඔවුන් සුදුසු සහ යෝග්‍ය බව සහතික කිරීම සඳහා වන යෝග්‍යතා සහ සුදුසුකම් පිලිබඳ වූ රීතියයි. ආයෝජකයින් සහ ඔවුන්ගේ වත්කම් ආරක්ෂා කිරීම මෙමඟින් අපේක්ෂා කරන අතර එතුලින් වෙළෙඳපොළ වගකීම් සහගතබව සහ විශ්වසනීයබව සහතික කරයි. මෙලෙසම, අනුකූලතා අත්පොතෙහි සහ අනුකූලතා වාර්තාවෙහි සඳහන් විය යුතු අවම අන්තර්ගතයන් සඳහන් කිරීමද සැලකිල්ලට ගැනීම වැදගත් වේ. මා මීට ඉහත බොහෝ වාරයක් ප්‍රකාශයට පත් කර ඇති පරිදි, අවසාන අරමුණ වනුයේ දේශීය සහ විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කරගත හැකි පරිදි අපේ වෙළෙඳපොළෙහි අඛණ්ඩතාව ඉහළ නැංවීමයි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විෂය පථය යටතට පැමිණෙන තවත් සේවා සපයන කාණ්ඩයක් නම්, අතිරේක සේවා සපයන්නන් වේ. පනතට අනුකූලව, අතිරේක සේවා සපයන්නන් සඳහා අදාළ වන මාර්ගෝපදේශ හෝ රීති සෑදීමට කොමිෂන් සභාවට බලය පවරා ඇත. එබැවින්, මේ වන විට, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අතිරේක සේවා සපයන්නන් පාලනය සඳහා වන මාර්ගෝපදේශ සැකසීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය : එහි වටිනාම වත්කම

සමාලෝචනය අවසන් කරන මේ මොහොතේ, කාර්යමණ්ඩලය විසින් ලබා දුන් දායකත්වය පිළිබඳ මා කෙතරම් තෘප්තිමත් දැයි පැවසිය යුතුමය. 2021 වසරේ ලඟා කරගත් සංධිස්ථාන රාශියක් අත්කර ගැනීමට ඔවුන්ගේ කැපවීම සහ උත්සාහය අතිශයින් වැදගත් විය. සෑමවිටම අපි අපගේ සේවකයන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීමට කැපවී සිටින අතර ඔවුන් මෙම ක්ෂේත්‍රයේ අනාගත නායකයන් බවට පත් කිරීමට කටයුතු කරන්නෙමු. ආයතනයක් ලෙස මුහුණ දීමට සිදුවූ අභියෝග මධ්‍යයේ වුවද මෙම වසර පුරාවට ඔවුන් ලබාදුන් උපරිම සහයෝගය සහ ඔවුන්ගේ කැපවීම කෙරෙහි කාර්යමණ්ඩලයට ස්තූතිය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. අවසාන වශයෙන්, සමස්තයක් ලෙස රටේ සුරැකුම්පත් වෙළෙඳපොළේ අභිවෘද්ධිය සහ පැවැත්ම සහතික කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අඛණ්ඩව කැපවී සිටින බව කිසිදු සැකයකින් තොරව පවසමි.

කොටස් වෙළෙඳපොළ නියාමකයා ලෙස, අධි නියාමනයේ අන්තරායන් පිළිබඳව අපි දැනුවත්ව සිටින බැවින් අඛණ්ඩව මනා තුලනයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතරම ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට තිරසාරත්වය ඒකාබද්ධ කිරීමට කැපවී සිටින්නෙමු. ඒ සම්බන්ධයෙන්, කොළඹ කොටස් හුවමාරුවේ කණ්ඩායමෙන් ලද විශිෂ්ට සේවය පිළිබඳ මා ඉතා සතුටු වන අතර විශේෂයෙන් එහි සභාපති දුමිත් ප්‍රනාන්දු මහතා, ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහතා, සහ ප්‍රධාන නියාමන නිලධාරී රේණුක විජේවර්ධන මහතාට ආයතන දෙක අතර සමීප සම්බන්ධතාව තහවුරු කරමින් ඔවුන් දැක්වූ විශ්වසනීය සහයෝගයට ස්තූතිය පළ කරන අතර අඛණ්ඩව ඉදිරියටත් ඔවුන් හා එක්ව කටයුතු කිරීමට මම බලාපොරොත්තු වෙමි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතා නිරන්තරයෙන් ලබාදුන් ඥානන්විත උපදෙස් සහ නොසැලෙන සහයෝගය පිළිබඳව මාගේ කෘතඥතාව පළ කරන අතරම අප කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් මම ඔහුට ආයතනය වෙනුවෙන් මෙන්ම පෞද්ගලිකවද අවංක ස්තූතිය පිරිනමමි. එමෙන්ම කොමිෂන් සභා සාමාජිකයන්ගේ නොසැලෙන සහයෝගය, වටිනා උපදෙස්, සාමූහික විශේෂඥතාවය සහ ආයතනය සම්බන්ධ කාර්යයන්හිදී ඔවුන්ගේ වෘත්තිමය සහ පෞද්ගලික කාලය කැප කිරීම වෙනුවෙන් සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ දැක්ම කරා ලඟා වීමට කොමිෂන් සභා සාමාජිකයින්ගේ නිරන්තර මඟ පෙන්වීම, සහයෝගය සහ දිරිගැන්වීම පිළිබඳ මම ඔවුන්ට ස්තූතිවන්ත වෙමි.

කඩාවැටී ඇති ආර්ථිකය නංවාලීමට සහ පුද්ගලික අංශය පුනර්ජීවනය කිරීම සඳහා ප්‍රාග්ධනය රැස් කිරීමට රටේ සුරැකුම්පත් වෙළෙඳපොළට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට ඇත. එබැවින්, අපගේ රට පරිවර්තනය කිරීමට සහ නැවත ගොඩනැංවීමට වෙළෙඳපොළ හරහා හැකියාව ඇති අතර මේ සඳහා වෙළෙඳපොළ සමඟ සම්බන්ධ වන ලෙස සෑම දෙනෙක්ටම මම ඉතා සතුටින් ආරාධනා කරමි.

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජනරාල්

2022 අප්‍රේල් 18

කොමිෂන් සභා සාමාජිකයින්



ජනාධිපති නීතීඥ විරාජ් දායාරත්න මහතා
සභාපති



මනිල් ජයසිංහ මහතා



ජනාධිපති නීතීඥ සුහද ගමිලත් මහතා



ආර් එම් පී රත්නායක මහතා



සිසිර රත්නායක මහතා



සුනිල් ලංකාතිලක මහතා



සන්ජය බණ්ඩාර මහතා



සංජීව දිසානායක මහතා



එන් ඩබ් ජී ආර් ඩී නානායක්කාර මහතා

කොමිෂන් සභා සාමාජිකයින්

ජනාධිපති නීතීඥ විරාජ් දායාරත්න මහතා
සභාපති

ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා 2020 ජනවාරි 22 වන දින සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ධුරයට පත්විය. දයාරත්න මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් සහ වේල්ස් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළෙඳ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. 1989 දී ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වූ ඔහු 1992 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස බඳවා ගන්නා ලදී.

ඔහු 1993 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට රාජ්‍ය නීතිඥවරයෙකු ලෙස සම්බන්ධ වූ අතර 2018 මැයි මාසයේදී අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකු ලෙස පත්විය. එම වසරේම ජුනි මාසයේදී අතිගරු ජනාධිපතිතුමා විසින් ජනාධිපති උපදේශකයෙකු ලෙස පත් කරන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ සිය වෘත්තීය ජීවිතයේ පළමු වසර හය තුළදී, දයාරත්න මහතා අපරාධ අංශයට අනුයුක්තව සිටි අතර මහේස්ත්‍රාත් අධිකරණවල සහ මහාධිකරණවල නඩු පැවරීම් ද සිදු කර ඇති අතර, මහාධිකරණ විසින් නිකුත් කරන ලද නීන්දු වලට එරෙහිව අභියාචනා ක්ෂේත්‍රයේ අභියාචනාධිකරණයේ හමුවේ පෙනී සිටියේය. ඉන්පසුව, ඔහු සිවිල් හා වාණිජ නීති අංශයට යොමු වී, රජය රාජ්‍ය සංස්ථා සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන මෙන්ම අභියාචනාධිකරණ නියෝජනය කරමින් මූලික අයිතිවාසිකම්, පොදු නීතිය, වාණිජ නීතිය, බදු, බැංකු, රේගු සහ කම්කරු නීතියට අදාළ කටයුතුවල නිරතව වී ඇත. ඔහු ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වාණිජ අධිකරණ කිහිපයකම පෙනී සිටියේය. විවිධාකාර නීතිමය කාරණා සම්බන්ධයෙන් රජය, රාජ්‍ය සංස්ථා සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවලට උපදෙස් දීම ද ඔහුගේ කාර්යයට ඇතුළත් ය.

දයාරත්න මහතා ෆීජි ජනරජයේ අභියාචනාධිකරණයේ බාහිර විනිසුරුවරයෙකු වන අතර මැලේසියාවේ ආසියානු ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ (AIAC) විනිශ්චයකාර මණ්ඩලයේ විනිශ්චයකාරවරයෙකි. ඔහු ICLP බේරුම්කරණ මධ්‍යස්ථානයේ පීඨ මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ඉදිකිරීම් බේරුම්කරණය සහ විනිශ්චය පිළිබඳ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කරයි.

බේරුම්කරණ නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පරිපාලන නීතිය පිළිබඳ පරීක්ෂකවරයෙකු වූ ඔහු ඉන්ෆෝමටික් ඉන්ස්ටිට්යුට් ආයතනය විසින් පවත්වන ලන්ඩන් නීතිවේදී උපාධි පාඨමාලාවේ කොන්ත්‍රාත් නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු ලෙස ද සේවය කළේය.

දයාරත්න මහතා 2009 සිට 2011 දක්වා වසර දෙකක කාලයක් ඕමාන් සුල්තාන් රාජ්‍යයේ ආරක්ෂක අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් හා නීති කටයුතු අධ්‍යක්ෂ කාර්යාලයේ නීති විශේෂඥයෙකු ලෙස සේවය කළේය. ඔහු රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මෙන්ම ශ්‍රී ලංකා (PERC) අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති උපදේශකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනිසුරු නීතිපති ලෙස ද කටයුතු කළේය.

ඔහු මහවැලි මිනි ජල විදුලි ව්‍යාපෘතිය සඳහා BOO / BOOT පදනම මත සහ ව්‍යාපෘති පදනම මත කිලිනොච්චි දිස්ත්‍රික් විදුලිබල ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ගිවිසුම් කෙටුම්පත් කළ ව්‍යාපෘති කමිටුවල සාමාජිකයෙකු වූ අතර ශ්‍රී ලංකාව සහ ඕමානය අතර ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම සම්බන්ධ ශ්‍රී ලංකා රජයේ නියෝජිත කණ්ඩායමේ සාමාජිකයෙක් වශයෙන්ද කටයුතු කර ඇත. ඔහු බොහෝ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී රජය නියෝජනය කර ඇති අතර නීතිය හා සම්බන්ධ විවිධ විෂයයන් පිළිබඳ බොහෝ පලකිරීම්වලට ලිපි සපයමින් දායක වී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් ඔහුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස පත් කර ඇත.

මනිල් ජයසිංහ මහතා
මනිල් ජයසිංහ මහතා, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු හා රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණය පිළිබඳ වරලත් ආයතනයේ සාමාජිකයෙකි.

ඔහු වසර 40 කට වැඩි පෘතුල පළපුරුද්දක් ඇති අයෙකු වන අතර ශ්‍රී ලංකාව සහ මාලදිවයින යන රාජ්‍යයන්වල ඒර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයෙහි රාෂ්ට්‍ර කළමනාකාරණ හවුල්කරුවෙකු මෙන්ම බැංකු හා මූල්‍ය සේවා කටයුතු සම්බන්ධ ප්‍රධානී ලෙස කටයුතු කරයි.

වර්තමානයේදී ඔහු :

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපති හා කවුන්සිල සාමාජිකයකු වශයෙන්,
- ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස, ව්‍යවස්ථාපිත විගණන කමිටුවේ සාමාජිකයකු සහ තවත් බොහෝ කමිටුවල සාමාජිකයකු ලෙස,
- දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස,
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස,
- ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස,
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ කවුන්සිල සාමාජිකයකු,
- ලැයිස්තුගත සමාගම්වල විගණන කමිටුවල උපදේශකවරයෙකු ලෙස සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ විභාග කමිටුවේ සභාපති, පසුගිය වසරවලදී ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ විකල්ප සභාපති, ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ, ජාත්‍යන්තර ගිණුම්කරණ අධ්‍යාපන ප්‍රමිති මණ්ඩලයේ සාමාජිකයකු සහ මොරටුව විශ්වවිද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත.

ජනාධිපති නීතීඥ සුභද ගම්ලත් මහතා
ගම්ලත් මහතා හිටපු සොලිසිටර් ජනරාල්වරයකු වන අතර අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකි.

ආර්.එම්.පී. රත්නායක මහතා
ආර්.එම්.පී.රත්නායක මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර දැනට මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස කටයුතු කරයි. ඔහු වසර 25 කට ආසන්න කාලයක් විවිධ තනතුරු දරමින් රාජ්‍ය සේවයේ යෙදී සිටී.

රත්නායක මහතා නෝර්වේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇත.

1994 දී රාජ්‍ය සේවයට බැඳුණු ඔහු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව කටයුතු කරමින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හා බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) තනතුරු ගණනාවක් දරා ඇත. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ඔහු සංවර්ධන හවුල්කරුවන්, ණය දෙන ආයතන සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සමඟ සම්බන්ධීකරණය කිරීම, සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ මූල්‍ය බලමුලු ගැන්වීම සඳහා ද්විපාර්ශ්වික සාකච්ඡා වල නිරත වීම සහ කාලීන වශයෙන් විදේශ මුදල් සම්පාදනය සඳහා පහසුකම් සැපයීම වැනි කටයුතුවල වගකීම් දරා ඇත.

රත්නායක මහතා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) විකල්ප විධායක අධ්‍යක්ෂක, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති, මහජන බැංකුවේ අධ්‍යක්ෂ, පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ (PGIM) කළමනාකරණ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ (SPC) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ සහ ජාතික වෛද්‍ය නියාමන අධිකාරියේ සාමාජික යන තනතුරු රැසක් ද හොබවා ඇත.

රත්නායක මහතා විවිධ අංශයන් / විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ලිපි පළ කර තිබේ.

සිසිර රත්නායක මහතා

රත්නායක මහතා වසර 35 කට ආසන්න කාලයක් නීති ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව නියැලී සිටින අතර ශ්‍රී ලංකාවේ සිවිල් හා අපරාධ නීතිය පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ, ස්කොට්ලන්තයේ ඇබර්ඩීන් විශ්ව විද්‍යාලයෙන් වාණිජ නීතිය පිළිබඳ පැසසුම් ද සමඟ ශාස්ත්‍රපති උපාධියක් (බ.බ.ඒ.) ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ ශේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙසද කටයුතු කරයි.

රත්නායක මහතා මහේස්ත්‍රාත්වරයකු, දිසා විනිසුරුවරයෙකු, මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස සහ සිවිල් අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු ලෙස ශ්‍රී ලංකාවේ විවිධ අධිකරණවල සේවය කර ඇත. ඔහු 2013 - 2015 කාලය තුළ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස සේවය කර ඇත.

ඔහු 2007 - 2008 කාලය තුළ අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) ලෙස ද කටයුතු කර ඇත.

ඔහු අධිකරණ සේවා සංගමයේ සභාපති සහ උප සභාපති ලෙසත් සේවය කර ඇත. (JSA - දිවයිනේ සියලුම මහේස්ත්‍රාත්වරුන් හා දිස්ත්‍රික් විනිසුරුවන්ගෙන් සමන්විත සංගමය). ඔහු මහාධිකරණ විනිසුරුවන්ගේ සංගමයේ උප සභාපති සහ සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත. (HCJA - දිවයිනේ සියලුම මහාධිකරණ විනිසුරුවන්ගෙන් සැදුම්ලත් සංගමය)

හොංකොං හි පැවති "සමාගම් නීතියේ නවීන ප්‍රවණතා පිළිබඳ උසස් පුහුණු වැඩසටහන", සිංගප්පූරුවේ පැවති "2007 කලාපීය අධිකරණ සම්මන්ත්‍රණය", "ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ අධිකරණ සාමාජිකයින් සඳහා සිංගප්පූරුවේ පැවති ජාත්‍යන්තර බේරුම්කරණය සහ ඉදිකිරීම් නීතිය පිළිබඳ විධායක පුහුණු වැඩසටහන" ඇතුළු ජාත්‍යන්තර වැඩසටහන් රැසකට ඔහු සහභාගී වී තිබේ. "ශ්‍රී ලංකා විනිසුරුවන් සඳහා ඉන්දියාවේ අධ්‍යාපන වැඩසටහන", සිංගප්පූරුවේ සිවිල් සේවා විද්‍යාලයේ පැවති ''අධිකරණය සහ විශිෂ්ටත්වය පිළිබඳ අධ්‍යයන චාරිකාව'', දකුණු කොරියාවේ පැවති "කොයිකා පුහුණු වැඩසටහන" සහ "එක්සත් රාජධානියේ එඩින්බරෝහි පැවති UKELA වාර්ෂික සමුළුව" ආදී ජාත්‍යන්තර වැඩසටහන් රාශියකට ඔහු සහභාගී වී ඇත. ඔහු ඉන්දියාවේ පැවති අධිකරණ කළමනාකරණය, නඩු කළමනාකරණය, සිවිල් නීති ප්‍රතිසංස්කරණ සහ පවුල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ වැඩසටහන් ආදියට ද සහභාගී වී තිබේ.

දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් හි පැවති "ආසියානු අප්‍රිකානු නීති උපදේශන සංවිධානයේ 46 වන සැසිය", ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් හි පැවති "අධිකරණ කොලොකියම් වැඩසටහන", "INSOL / UNCITRAL / ද්‍රවශීලතාව පිළිබඳව ඇමෙරිකාවේ පැවති, ලෝක බැංකු ඒකාබද්ධ බහුජාතික අධිකරණ කොලොකියම් වැඩසටහන ඇතුළු ජාත්‍යන්තර වැඩසටහන් ගණනාවකදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වී ඇත.

සුනිල් ලංකාතිලක මහතා

සුනිල් ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයෙකි. ඔහු එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජ විද්‍යා පළමු පෙළ ගෞරව උපාධියක් ද හිමිකරගෙන ඇත. එමෙන්ම ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයෙන් කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධියක් ද ලබා ඇත.

ලංකාතිලක මහතා, ආර්ථික හා මිල ස්ථායිතාව, මූල්‍ය පද්ධති ස්ථායිතාව සහ නියෝජිතායතන කාර්යයන් යන අංශයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහා බැංකුවේ කටයුතු කර වසර 32 ට වඩා වැඩි අත්දැකීම් ලබා ඇති අයෙකි. 1986 දී මහ බැංකුවට බැඳීමට පෙර ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙසද සේවය කර ඇත.

ශ්‍රී ලංකා මහා බැංකුවේ වසර 32 ක සිය වෘත්තීය ජීවිතය තුළ, සාර්ව ආර්ථික කළමනාකරණය, සාර්ව ආර්ථික ආකෘති නිර්මාණය, මූල්‍ය වැඩසටහන්කරණය, වෙළෙඳ ප්‍රතිපත්ති, තරඟකාරිත්වය, ව්‍යාපෘති කළමනාකරණය, විදේශ ආයෝජන, උපායමාර්ගික සැළසුම්කරණය සහ කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය සහ සන්නිවේදන ප්‍රතිපත්ති යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය ආදී ආයතනවල පිළිගත් පුහුණුකරුවන් විසින් පවත්වනු ලැබූ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් රැසකට සහභාගී වී තිබේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ හිමිකම් රක්ෂණ අරමුදලෙහි කළමනාකරණ මණ්ඩලයේ, ජාතික කම්කරු උපදේශක කමිටුවේ සහ අනෙකුත් කමිටුවල සාමාජිකයෙකු ලෙස ද ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහා බැංකුව නියෝජනය කරමින් කටයුතු කර ඇත. තවද, ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහා බැංකුව වෙනුවෙන් රජයේ දූත මණ්ඩල කිහිපයක්ම නියෝජනය කර ඇති අතර විශේෂයෙන්ම බැංකු සබඳතා, ආයෝජන ප්‍රවර්ධනය සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා යන අංශයන් සම්බන්ධ කණ්ඩායම් ද නියෝජනය කර ඇත. ලංකාතිලක මහතා විශේෂයෙන්ම ආර්ථික ගැටළු, සුළු පරිමාණ කර්මාන්ත, ජාත්‍යන්තර වෙළෙඳාම, මැණික් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය යන ක්ෂේත්‍රයන් සම්බන්ධව බොහෝ ලිපි රචනා කර ඇති අතර ඒවා ජාත්‍යන්තර හා දේශීය සඟරා සහ ශ්‍රී ලංකා මහා බැංකුවේ ප්‍රකාශනවල ප්‍රසිද්ධ කර ඇත.

ලංකාතිලක මහතා විවිධ මට්ටම්වල සම්මන්ත්‍රණ පවත්වා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති ඇගයීම, සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රවල කීර්තිමත් සම්පත්දායකයෙකි. ආර්ථිකය සම්බන්ධ පුළුල් මාතෘකා ඔස්සේ විවිධ සම්මන්ත්‍රණවලදී දේශණ ගණනාවක් ද ලංකාතිලක මහතා විසින් පවත්වා ඇත.

කොමිෂන් සභා සාමාජිකයින්

එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා

නානායක්කාර මහතා දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය දරයි. විශේෂයෙන්ම බැංකු අධීක්ෂණය සහ නියාමනය, විදේශ සංචිත කළමනාකරණය සහ ජාත්‍යන්තර මෙහෙයුම්, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ඒ ආශ්‍රිත දේශීය මෙහෙයුම්, සාර්ව විචක්ෂණ නිරීක්ෂණ, ප්‍රාදේශීය සංවර්ධන සහ රාජ්‍ය ණය කළමනාකරණය යන ක්ෂේත්‍රවල මහ බැංකුවේ වසර 29කට වැඩි පළපුරුද්දක් ඔහු සතුව ඇත.

නානායක්කාර මහතා වොෂින්ටන් ඩීසී හි ඇමරිකානු විශ්වවිද්‍යාලයෙන් මූල්‍යය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (FCMA) සාමාජිකයෙක්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ACA) ආශ්‍රිත සාමාජිකයෙක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (CFSA) සහතිකලත් මූල්‍ය සේවා විගණකවරයෙකි.

සංජීව දිසානායක මහතා

සංජීව දිසානායක මහතා 1997 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ශේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු ලෙස ඇතුළත් කර බඳවා ගන්නා ලදී. ඔහු හොංකොං විශ්ව විද්‍යාලයෙන් මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (LL.M) ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර දැනට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරී කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් නිදහස් කර ඇත.

සංජීව දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන දෙඅංශයේම අත්දැකීම් ඇති අතර 2010 පෙබරවාරි සිට 2011 ජූලි දක්වා දූෂණයට එරෙහි ෆීජි ස්වාධීන කොමිෂන් සභාවේ අභිචෝදකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකි.

සංජය බණ්ඩාර මහතා

FCA, MBA (Col.) B.Sc ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය (USJP)

බණ්ඩාර මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සභාපති සහ ආසියානු පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (CAPA), දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. තවද ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ (UOK) සහ ශ්‍රී ලංකා ගිණුම් තාක්ෂණවේදීන්ගේ සංගමයේ පාලක සභාවේ සාමාජිකයෙකි.

ඔහු බී ආර් ද සිල්වා සමාගමේ (B.R De Silva & Co) හවුල්කරුවෙකු, වරලත් ගණකාධිකාරීවරයෙකු, (නෙක්සියා ඉන්ටර්නැෂනල් Nexia International) සමාගමේ සාමාජික ආයතනයක්) වන අතර රක්ෂණ සේවා සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ වසර 23ට වඩා වැඩි ප්‍රායෝගික අත්දැකීම් ඇත්තෙකි.

විස්තීරණ, ක්‍රියාව නැඹුරුවූ, ප්‍රායෝගික සහ මිනිය හැකි ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ග 2020 - 2025

ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතින



වගවීම සහ වෙළෙඳපොළ අධීක්ෂණය ඉහළ නැංවීම

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ නව නිෂ්පාදන සක්‍රීය කිරීම

ප්‍රායෝගික

මිනිය හැකි

නීතිමය සහ නියාමන රාමුව ශක්තිමත් කිරීම (සුරකුම්පත් සහ විනිමය පනත් කෙටුම්පත, කොළඹ කොටස් හුවමාරුව අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත)

දේශීය හැකියාවන් ගොඩනැංවීම

වෙළෙඳපොළ සහභාගීත්වය පුළුල් කිරීම සහ ද්‍රවශීලතාවය ඉහළ නැංවීම

ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ ප්‍රමිතීන් සහ නිපුණතා ඉහළ නැංවීම

විදේශීය අරමුදල් කළමණාකරුවන්ගේ වැඩි අවදානයක් ලබා ගැනීම

ක්‍රියාව නැඹුරුවූ

ප්‍රාග්ධන උත්පාදනය සඳහා සුදුසු සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළ MCSI වර්ගීකරණයේ "නැගී එන කොටස් වෙළෙඳපොළ" දර්ශකයට උසස් කිරීම

විස්තීරණ

පද්ධතිමය අවදානම් කළමනාකරණය සහ අවම කිරීම

කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණය කිරීම

ප්‍රධාන නියාමන සහ සංවර්ධන උපායමාර්ග

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ක්‍රියාවට නංවා ඇති

රටේ ආර්ථික සංවර්ධනය සඳහා පුද්ගලික අංශය දිරිමත් කිරීමට

- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත පාර්ලිමෙන්තුවට ඉදිරිපත් කිරීම.
- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති තක්සේරු කිරීම සහ සංශෝධනය.
- OECD විසින් නියම කරන ලද මූලධර්මයන්ට අනුකූලව සාංගමික යහපාලන සංග්‍රහය සමාලෝචනය කිරීම.
- කොටස් වෙළෙඳපොළ අතරමැදියන් හා සම්බන්ධ වූ සියලුම නීති සමාලෝචනය.
- ඒකක භාර සංග්‍රහය සමාලෝචනය.
- නව පවරා ගැනීම් සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ වැඩකටයුතු අවසන් කිරීම.
- සුරැකුම්පත්කරණයට අදාළ වූ නීතිමය ව්‍යුහය විධිමත් කිරීම.

- කොටස් වෙළෙඳපොළ ගනුදෙනු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා ආවේක්ෂණ පද්ධතියේ ක්‍රියාකාරිත්වයන් වැඩිදියුණු කිරීම.
- ලැයිස්තුගත සමාගම්හි මූල්‍ය ආවේක්ෂණ කටයුතු සඳහා පුළුල් විස්තීරණ රාමුවක් සකස්කිරීම.
- වගවීම සහතික කිරීම සඳහා අතිරේක සේවාවන් සපයන්නන් මත රාජකාරී පැවරීම.
- සියලුම ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයතන සහ අතරමැදියන් සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණය වැඩිදියුණු කිරීම.
- කොටස් වෙළෙඳපොළ අක්‍රමිකතා වැලැක්වීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් හඳුන්වාදීම.
- කොටස් වෙළෙඳපොළ වැරදි සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයන් සිදුකිරීම.

- ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයතන, අතරමැදියන් සහ ලැයිස්තුගත සමාගම් සඳහා වූ යෝග්‍යතා සහ නිසි ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම.
- වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ ලිපිගොනු තබාගැනීමේ ක්‍රමවේදය ප්‍රමිතිකරණය කිරීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීවනන්ට අදාළ වූ සුදුසුකම් නිර්ණායක සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ආයෝජනය කල හැකි සියලුම වත්කම් කාණ්ඩ සඳහා පහසුකම් සැලසීම සඳහා බහු ස්ථර බලපත්‍ර රාමුවක් සකස් කිරීම.
- ඒකක භාර කළමනාකරණ සමාගම් සහ ආයෝජන කළමණාකරුවන් සඳහා ගෝලීය ආයෝජන කාර්ය සාධන ප්‍රමිතීන් (Global Investment Performace Standards - GIPS) හඳුන්වාදීමට ඇති හැකියාව පිළිබඳ ශක්‍යතා ඇගයීම.
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පියවරක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් නියාමනය වන ආයතනයන්හි ගනුදෙනුකරුවන් හඳුනාගැනීම සඳහා වූ නිර්ණායකයන් (KYC requirements) වැඩිදියුණු කිරීම.
- මූල්‍යමය වශයෙන් අභියෝගයට ලක්වූ සමාගම් වර්ගීකරණය කිරීම සහ අනාවරණය කිරීම.
- නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව කොටස්වල අගය තක්සේරු කිරීමට මාර්ගෝපදේශයන් සකස් කිරීම.

- ගෙවීම්වලට එදිරිව බෙරුම්කිරීම (Delivery vs Payment) සහ මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණයක් (Central Counter Party) ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අවදානමට බර තබන ලද ප්‍රමාණවත් ප්‍රාග්ධන රාමුවක් සකස් කිරීම.
- නියාමන ආයතන පරිශ්‍ර වෙත ගොස් සිදුකරන අධීක්ෂණ සඳහා අවදානම මත පදනම් වූ තක්සේරු කිරීමේ රාමුවක් සකස් කිරීම.





- ප්‍රාග්ධන වෙළෙඳපොළට ප්‍රවේශ වීමට අවශ්‍ය විශාලත්වය, පරිමාණය සහ ද්‍රවශීලතාවය සහිත සමාගම් ලැයිස්තුගත කිරීම සඳහා අවකාශයක් නිර්මාණය කිරීම.
- සාංගමික ණය සඳහා වෙළෙඳපොළක් සංවර්ධනය කිරීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා යටිතල පහසුකම් සංවර්ධනය මූල්‍යනය කිරීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය කරුණු ඇතුලත් රාමුවක් හඳුන්වාදීම.
- නව වෙළෙඳපොළ කණ්ඩායම් සඳහා පහසුකම් සැපයීම සඳහා විකල්ප ලැයිස්තුගත කිරීමේ පුවරු හඳුන්වාදීම.
- ජාත්‍යන්තර ආයෝජන දර්ශකයක් වන මෝගන් ස්ටැන්ලි (Morgan Stanley Capital International - MCSI) දර්ශකයේ නැගී එන වෙළෙඳපොළ තත්වයට ඉහළ නැංවීම.

- කුඩා ආයෝජකයින්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ තුලට පිවිසිය හැකි මාර්ගයක් ලෙස ඒකක භාර වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ විශ්‍රාම වැටුප් අරමුදල් වල සහභාගීත්වය ඉහල නැංවීම.
- විදේශ ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම.
- හිඟ විකුණුම්, සුරැකුම්පත් ණයට ගැනීම සහ ණයට විකිණීම හඳුන්වාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.
- ද්‍රවශීලතාවය වැඩි කිරීම සඳහා මහජන හිමිකාරිත්ව අවශ්‍යතාවය ඉහල මට්ටමකට ගෙන ඒම.

- නියාමන වාර්තා සැකසීම සඳහා විද්‍යුත් ලිපිගොනුකිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම.
- සියලු කොටස් තැරැව්කාර ආයතන සඳහා එක හා සමාන වූ කාර්යාල දත්ත හා තොරතුරු ආරක්ෂණ පද්ධති සහ ඇණවුම් කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ඩිජිටල් ව්‍යාපාර වාර්තාකරණය සඳහා ප්‍රමිතිගත ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- දේපළ වෙළෙඳාම් ආයෝජන භාර (REITs) සහ විනිමය හුවමාරු අරමුදල් (ETFs) වැනි නව වෙළෙඳපොළ උපකරණ සඳහා ප්‍රතිපත්ති සහ නීති සකස් කිරීම.
- වෙළෙඳපොල අවදානමට ගලපන ලද නව ආයෝජන උපකරණ හඳුන්වාදීම සඳහා අවකාශයක් නිර්මාණය කිරීම.

- කොළඹ කොටස් හුවමාරුවේ මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය.
- කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය.
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු ඵලදායී, කාර්යක්ෂම සහ නියමිත කාල රාමුවක් තුළ ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවේ ප්‍රතිචාරාත්මක බව සහතික කිරීම.
- වෘත්තිමය ප්‍රවීනත්වයෙන් යුතු සේවකයන් බඳවා ගැනීම සහ රඳවා ගැනීම තුලින් නියාමකයාගේ නිපුණතා ගොඩනැගීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළට හා සම්බන්ධ සියලු පාර්ශවකරුවන්ගේ මූල්‍ය සාක්ෂරතාව සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම.
- ආයෝජක අධ්‍යාපන වැඩසටහන් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය



චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජනරාල්



අයන්ති අබේවික්‍රම මහත්මිය
අධ්‍යක්ෂිකා, නීති හා බලාත්මක සහ වැඩබලන අධ්‍යක්ෂිකා, විමර්ශන



තුෂාර ජයරත්න මහතා
අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන



ප්‍රභාෂ් වනිගතුංග මහතා
අධ්‍යක්ෂ, ආවෙක්ෂණ සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන



ප්‍රශාන්ති සබේසන් මහත්මිය
අධ්‍යක්ෂිකා, මානව සම්පත්



නිරෝෂා කොඩිකාර මහත්මිය
අධ්‍යක්ෂිකා, මූල්‍ය හා පරිපාලන



මනුරි වීරසිංහ මෙනවිය
සහකාර අධ්‍යක්ෂිකා, සාංගමික කටයුතු



සුනෙත් පෙරේරා
සහකාර අධ්‍යක්ෂ, අධීක්ෂණ



මධුගයනි බලපිටිය මෙනවිය
සහකාර අධ්‍යක්ෂිකා, විමර්ශන කටයුතු සහ තොරතුරු තාක්ෂණ



ඩී එම් ජී ප්‍රියන්ත මහතා
සහකාර අධ්‍යක්ෂ, විමර්ශන කටයුතු

නොපැමිණි: ධම්මික පෙරේරා මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

ජ්‍යෂ්ඨ කළමනාකාරිනියන්



සජීවනී බක්මීදෙණිය මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන



රනිමිණී ජයතිලක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, තොරතුරු තාක්ෂණ



හාමිලා පන්ඩිතරත්න මෙනවිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - නීති හා බලාත්මක කටයුතු



සෞමි කොඩිප්පිලි මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - සුපරීක්ෂණ

කළමනාකරුවන් සහ කළමනාකාරිනියන්



තක්ෂිලා ෆ්‍රැන්සිස් මහත්මිය
කළමනාකාරිනී- ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන



මේඛලා ජයපාල මෙනවිය
කළමනාකාරිනී - සාංගමික කටයුතු



නිමල් කුමාරසිංහ මහතා
කළමනාකරු, බාහිර සම්බන්ධතා



ලක්ෂ්මී වික්‍රමායක මහත්මිය
කළමනාකාරිනී, මුදල් සහ පරිපාලන



අශෝකා දයාරත්න මහත්මිය
කළමනාකාරිනී - මානව සම්පත්



අනුලා විජේසිංහ මහත්මිය
කළමනාකාරිනී විමර්ෂණ



පී එම් නිරෝෂිකා උදයංගනී මහත්මිය
කළමනාකාරිනී - නීති සහ බලාත්මක කටයුතු



ප්‍රතිභානී හේරත් මහත්මිය
කළමනාකාරිනී- සුපරීක්ෂණ

නොපැමිණි

ආර් කේ වසන්ත සුනිමල් මහතා, කළමනාකාරු - විමර්ෂණ, මංජුලා චන්ද්‍රරත්න මහත්මිය, කළමානාකාරිනී - සුපරීක්ෂණ, ෂීනා ගුණරත්න මෙනවිය, කළමනාකාරිනී - බාහිර සම්බන්ධතා

කාර්ය මණ්ඩලය

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අංශය



ඔලිවී සෝලංගආරච්චි මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



දසුන් පෙරේරා මහතා
සහකාර කළමනාකරු

සභාපතිතුමාගේ කාර්යාලය



ෂමිල්කා කරුණානායක මහත්මිය
සහකාර කළමනාකාරිනී

සාංගමික කටයුතු අංශය



ක්‍රිෂාන්ති මුතුතන්ත්‍රී මහත්මිය
ජ්‍යෙෂ්ඨ විධායක ලේකම්



එරංගා මන්ත්‍රීරත්න මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



මේරියන් ජී. සන්දනම් මෙනවිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



සේමිණි දයනිකා මෙනවිය
සහකාර කළමනාකාරිනී



සරනාෘ අනුතිනන් මහත්මිය
සහකාර කළමනාකාරිනී



තනිෂ්ක තිලකරත්න මහතා
සහකාර කළමනාකාරු

කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය



කේ එම් ශානිකා ගුණසිංහ මෙනවිය
සහකාර කළමනාකාරිනී



රෝමිනී පීරිස් මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



රසික වල්පිටගම මහතා
සහකාර කළමනාකාරු



කවීෂා කුඹුකගේ මහත්මිය
සහකාර කළමනාකාරිනී



රාධා ජී. ප්‍රතිභා මහත්මිය
සහකාර කළමනාකාරිනී



අෂාරා සෙනෙවිරත්න මෙනවිය
සහකාර කළමනාකාරිනී

බාහිර සම්බන්ධතා අංශය



නිශෝකා ජයතුංග මහත්මිය
විධායක ලේකම්

ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන අංශය



එම් ඒ ඉම්රාන් මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු



ජේ කේ ප්‍රියදර්ශනී මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී

මූල්‍ය හා පරිපාලන අංශය



ප්‍රීනිකා නිලක්ෂි පෙරේරා මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



දුලාරි මුහන්දිරම් මෙනවිය
සහකාර කළමනාකාරිනී



ගයාන් ලොකුගමගේ මහතා
සහකාර කළමනාකාරු



ඒ සී ඩයස් මහතා
නිළධාරී



ඇන් ක්‍රිශාන්ති මෙනවිය
පිළිගැනීමේ නිළධාරිනී හා දුරකථන ක්‍රියාකාරු



දනුෂි තල්පිට මහත්මිය
පිළිගැනීමේ නිළධාරිනී හා දුරකථන ක්‍රියාකාරු



එස් ඩී ධර්මසිරි මහතා



එල් ඩබ් එල් පියතිස්ස මහතා



සී සී නාගෙන්ද්‍රන් මහතා

කාර්ය මණ්ඩලය



ඩබ් ආරියරත්න මහතා



පැතුම් නිරෝෂණ මහතා



එම් ඒ සඳරුවන් විජේරත්න මහතා



බුද්ධික බලපිටිය මහතා



සමිත් ප්‍රේමරත්න මහතා



රජිත වරුණ මහතා

තොරතුරු තාක්ෂණ අංශය



සකුන්තලා දේවි මහත්මිය



රසංගි දිසානායක මහත්මිය
සහකාර කළමනාකාරිනී



රන්දික සිල්වා මහතා
සහකාර කළමනාකරු

විමර්ෂණ අංශය



බුද්ධිනී එන් හේරත් මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



ජී ඩී කපිල කුමාර මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු



රඹිත දිසානායක මහතා
සහකාර කළමනාකරු



ඩබ් එම් එස් දුලේන්ද්‍ර විජේවර්ධන මහතා
සහකාර කළමනාකරු



පී ජී එන් අෂානි ෆොන්සේකා මෙනවිය
සහකාර කළමනාකරිනී



කලෙයිවානි රාජකුමාරන් මෙනවිය
සහකාර කළමනාකරිනී

සුපරීක්ෂණ අංශය



මනීෂා සෙනරතාරච්චි මහත්මිය
සහකාර කළමනාකාරිනී



බිෂ්මා එලියාදුර මෙනවිය
සහකාර කළමනාකාරිනී



නොමානි සෙනෙවිරත්න මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී

කාර්ය මණ්ඩලය



සුධාරා වීරක්කොඩි මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



කෞෂල්‍යා ගුණවර්ධන මෙනවිය
සහකාර කළමනාකාරිනී



පූර්ණි වීරසේකර මෙනවිය
සහකාර කළමනාකාරිනී



සුරේකා ජයසේකර මහත්මිය
සහකාර කළමනාකාරිනී



චමිලා කරුණාරත්න මෙනවිය
සහකාර කළමනාකාරිනී



සචිත්‍ර වරුසවිතාන මහතා
සහකාර කළමනාකාරු

ආවේක්ෂණ අංශය



ලලින්ද දයාරත්න මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු



දශංක වර්ණකුලසූරිය මහතා
සහකාර කළමනාකාරු



රුවිකා සෙනෙවිරත්න මෙනවිය
සහකාර කළමනාකාරිනී



නිලංජනා සිවාජි මෙනවිය
සහකාර කළමනාකාරිනී



ඩබ් ඒ ජේ ගංගා ද කොස්තා මෙනවිය
සහකාර කළමනාකාරිනී

නොමැමිණි:

ජූලී අලගකෝන් මහත්මිය, සහස්‍ය ලේකම් බාහිර සම්බන්ධතා අංශය, **ලක්ෂ්මි අතපත්තු මහත්මිය**, රහස්‍ය ලේකම් සාංගමික කටයුතු අංශය, **සමන්ති ගුණවර්ධන මහත්මිය**, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී සාංගමික කටයුතු අංශය , **සී එරන්දති වෛද්‍යසේකර** මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනීනීති සහ බලාත්මක අංශය අංශය, **උදානී වික්‍රමරත්න මහත්මිය**, සහකාර කළමනාකාරිනී නීති සහ බලාත්මක අංශය, **කුමාරි සිරිවර්ධන මහත්මිය**, **හරසා ලේකම්**- නීති සහ බලාත්මක අංශය, **වයි ඩී සඳමාලි මහත්මිය**, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී මුදල් සහ පරිපාලන අංශය, **ක්‍රිස්ටොබල් සිල්වා මෙනවිය**, ජ්‍යෙෂ්ඨ විධායක ලේකම් සුපරීක්ෂණ අංශය, **ධනේෂා රාජපුර මහත්මිය**, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී මානව සම්පත් අංශය, **ප්‍රියන්ත හේරත් මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු**

වසරේ විශේෂ අවස්ථා





ඩිජිටල්කරණ වැඩසටහනේ දෙවන අදියර දියත් කිරීම





පවුල් ව්‍යාපාර සඳහා ලැයිස්තුගත කිරීම් සංසදය





නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ සාකච්ඡාව



නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ සංසදය





වසරේ විශේෂ අවස්ථා









විදේශගත ප්‍රජාව සඳහා ටෝකියෝහි පැවති මාර්ගගත සංසදය



ඩුබායිහි පැවති "Invest Sri Lanka" සංසදය



නව
දිශාවක්

මෙහෙයුම් සමාලෝචනය

මෙහෙයුම් සමාලෝචනය

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බල සීමාව පනත මගින් විස්තීරණය කර ඇත. පනත මගින්, සංස්ථාමය මූල්‍ය උපදේශක වරුන්, වෙළෙඳපොළ සාදන්නන්, ව්‍යුත්පන්න තැරැවුකරුවන් හා වෙළෙන්දන් වැනි නව වෙළෙඳපොළ අතරමැදියන් වර්ග කීපයක්ම නියාමනය කිරීමට පනත හරහා ප්‍රතිපාදන සලසා ඇත.

නියාමනය

සුරුකුම්පත් වෙළෙඳපොළේ අඛණ්ඩතාව, වර්ධනය සහ සංවර්ධනය සඳහා වඩා යහපත් සහ ඵලදායී නියාමනය වැදගත් වේ. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළේ සාධාරණත්වය, කාර්යක්ෂමතාව සහ ක්‍රමවත් බව සහතික කරනු ලබන නීති රීති ස්ථාපිත කිරීම මගින් වෙළෙඳපොළ නියාමනය කරයි.

නියාමනයට ලක් කරන ලද ආයතන

ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ආයතන විසින් නීතිමය අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව පහත සඳහන් ආයතන 2021 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියාමනය කරන ලදී. (සංඛ්‍යා සටහන 01)

සංඛ්‍යා සටහන 01 : බලපත්‍ර ලබාදීම සහ ලියාපදිංචි කිරීම

නියාමනයට ලක් වූ ආයතන වර්ගය	බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව
කොටස් හුවමාරු	01
කොටස් තැරැව්කාර සමාගම්*	29
කොටස් වෙළෙඳ සමාගම්	12
ආයෝජන කළමනාකරුවන්	24
ආන්තික ණය සපයන්නන්	20
ප්‍රාරක්ෂකයින්	08
ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන	03
නිෂ්කාෂණ ආයතන	01

* කොටස් තැරැව්කාර සමාගම් තුනක් (03) ව්‍යාපාර මෙහෙයුම් ස්වේච්ඡාවෙන් අක්‍රිය කර ඇත.

ප්‍රතිපත්ති මූලපිරීම්

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පාර්ලිමේන්තුවේ සම්මත වූ අතර 2021 සැප්තැම්බර් මස 21 වන දින සිට බලපැවැත්වේ. 2021 සැප්තැම්බර් මස 24 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පනත පලවිය.

පනත් කෙටුම්පත 2017 දී මුල්වරට ගැසට් පත්‍රයේ ඵල වූ අවස්ථාවේ සිට බාහිර මෙන්ම අභ්‍යන්තර කොටස්කරුවන් අතර විවිධ සාකච්ඡා වලින් අනතුරුව බොහෝ සංශෝධන යෝජනා වීමෙන් පසුව පනත බලාත්මක කිරීමේ ක්‍රියාවලිය ආරම්භ විය.

යම් යම් සීමාවන්ට යටත්ව ලයිස්තුගත මෙන්ම ලයිස්තුගත නොවූ මහජන අර්පණ ආවරනය කෙරෙන ලෙස ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බල සීමාව පනත මගින් විස්තීරණය කර ඇත. පනත මගින්, සංස්ථාමය මූල්‍ය උපදේශක වරුන්, වෙළෙඳපොළ සාදන්නන්, ව්‍යුත්පන්න තැරැවුකරුවන් හා වෙළෙන්දන් වැනි නව වෙළඳපළ අතරමැදියන් වර්ග කීපයක්ම නියාමනය කිරීමට පනත හරහා ප්‍රතිපාදන සලසා ඇත.

පරිපාලනමය හා සිවිල් සිට අපරාධමය දණ්ඩන දක්වා විහිදෙන පුළුල් බලාත්මක කිරීමේ උපකරණ මාලාවක් සඳහාද පනත මගින් ප්‍රතිපාදන සලසා ඇත. සුරුකුම්පත් කොමිෂන් ජාත්‍යන්තර සංවිධානයෙහි බහුපාර්ශවීය අවබෝධතා ගිවිසුමෙහි අත්සන්කාර පාර්ශවයක් ලෙස උද්ගතවන බැඳීම් ඉටු කිරීම උදෙසා වඩාත් හොඳින් සන්නද්ධ වී සිටීම සඳහා විදේශීය සම ආයතන සමග තොරතුරු හුවමාරු කරගැනීමටද පනත හරහා ඉඩ සලසා ඇත.

සමස්ථයක් වශයෙන් සුරුකුම්පත් කොමිෂන් ජාත්‍යන්තර සංවිධානයෙහි ප්‍රතිපත්ති සමග අනුගත වෙමින් අන්තර්ජාතික නිර්ණායක හා අවශ්‍යතා සපුරාලීමට හැකි වන පරිදි පනත සුසංයෝග කර ඇත.



අයන්ති අබේවික්‍රම මහත්මිය
අධ්‍යක්ෂිකා, නීති හා බලාත්මක



ෂාමිලා පන්ඩිතරත්න මෙනවිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - නීති හා බලාත්මක කටයුතු

කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහීකරණය කිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහීකරණය කිරීමේ පනත වැඩිදුර සංශෝධන හා යම් යම් ප්‍රතිපත්තිමය වෙනස්කම් සඳහා සමාලෝචනය කෙරෙමින් පවතී.

කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් ආයෝජක පැමිණිලි හැසිරවීමට අදාල යෝජිත යාන්ත්‍රණය පිළිබඳ සංකල්ප පත්‍රය

කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් යොමු කරන ලද සංකල්ප පත්‍රය සමාලෝචනය කරනු ලැබූ අතර, සේවාදායකයන් හා කොටස් තැරැවුකරුවන් අතර ආරවුල් මෙන්ම සේවාදායකයන් අතර ආරවුල් හා කොටස් තැරැවුකරුවන් හා ආන්තික සැපයුම් කරුවන් අතර ආරවුල් විසඳීම සඳහා ස්වාධීන විනිශ්චය සභාවක් ස්ථාපනය කිරීමට අදාල ප්‍රතිපත්ති වලට සංශෝධන යෝජනා කරන ලදී.

බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල අධ්‍යක්ෂවරුන් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තොරතුරු ඉල්ලා සිටීම

බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල අධ්‍යක්ෂවරුන් ලෙස හෝ විධායක කාර්‍යන් සිදුකරනු ලබන නිධාරීන් ලෙස පත් කිරීමට යෝජිත හෝ දැනටමත් පත් කර ඇති අය සම්බන්ධව පසුබිම් පරීක්ෂනය දීර්ඝ කිරීමේ වැදගත්කම සලකා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් යථායෝගී ක්‍රියාවලියට පහසුකම් සලසන ලදී. (විධායක කාර්‍යන් සිදුකරන නිලධාරීන් හා අධ්‍යක්ෂ වරුන්ගේ යෝග්‍යතාවය හා නිසිබව තක්සේරු කිරීම 2011 අංක 3 දරන නියමය).

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව එවැනි අයවලුන් එලෙස බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීම වලක්වාගැනීමට ඉඩසලස්වීමට, සිය නියාමන රාමුව අනුව යම් නිරීක්ෂන/අනිසි බවට කරුණු සොයාගැනීම් ඇත්නම් දැනුම්දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇත.

සලකා බලන වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එවැනි නිරීක්ෂණ 132ක් සම්බන්ධව පහසුකම් සලසා ඇත.

අනුමැතිය ලබාදීම

ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් සඳහා අනුමැතිය ලබාදීම

මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමෙහි නිර්දේශ මත, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගත සමාගම් කොටස් වල ආයෝජනය කිරීමට අනුමැතිය ප්‍රධානය කරනු ලබයි. මෙම අනුමැතියන් ප්‍රධානය කරනු ලබන්නේ විණිමය පාලන රෙගුලාසි, 2006 අංක 05 දරණ මුදල් විශුද්ධීකරණය වැලැක්වීමේ පනත 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත සහ සුරැකුම්පත් වලට අදෙල ශ්‍රී ලංකාවේ නීති වලට අනුකූල වීමට යටත්වයි.

2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් 56 ක ට ශ්‍රී ලංකාවේ ලයිස්තුගත සුරැකුම්පත් වල ආයෝජනය කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර නම් වෙනස් කිරීම් 60 ක් වාර්තාගත කරනු ලැබ ඇත.

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති සහ කොටස් තැරැවිකරුවන් පිළබඳ රීති සමාලෝචනය කිරීම.

සලකා බලන වර්ෂය තුලදී පහත ලයිස්තගත කිරීමේ රීති සමාලෝචනය කරනු ලැබූ අතර, 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 24 වන වගන්තිය හා 2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 64 වන වගන්තිය යටතේ ඒවාට අනුමැතිය ලබා දී ඇත.

- හිමිකම් නිකුතු පිළිබඳ රාමුවට අදාල වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීමට කොළඹ කොටස් වෙළෙඳපොලේ ලයිස්තුගත කිරීමේ රීති වල 5.2 රීතියට කොළඹ කොටස් වෙළෙඳපොල විසින් යෝජිත සංශෝධන.
- සියලු කොටස් මිල දර්ශකයේ කොටස් හිමිකාරීත්වය මත පදනම් අනුවාදයක් සම්පාදනය කිරීමට පහසුකම් සැලසීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොලේ ලයිස්තුගත කිරීමේ රීති වල 7.6 (iv) රීතියට හා 7අ හා 8අ උපග්‍රන්ථ වලට කොළඹ කොටස් වෙළෙඳපොල විසින් යෝජිත සංශෝධන.
- භාරදීමට එදිරිව ගෙවීම් පියවීමේ යාන්ත්‍රණය ක්‍රියාවට නැංවීමට කොළඹ කොටස් වෙළෙඳපොලේ ලයිස්තුගත කිරීමේ රීති වලට කොළඹ කොටස් වෙළෙඳපොල විසින් යෝජිත සංශෝධන.

කොළඹ කොටස් වෙළෙඳපොලේ වෙළෙඳ රීති වලට අදාල සංශෝධන

- සලකා බලන වර්ෂය තුළ කොළඹ කොටස් වෙළෙඳපොල විසින් යෝජනා කරන ලද පහත සංශෝධන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කරන ලදී.
- භාරදීමට එදිරිව ගෙවීම් පියවීමේ යාන්ත්‍රණය ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීමට අදාල සංශෝධන හා අනුරූපී ආන්තික අවශ්‍යතා.
- සංයුත ණය සුරැකුම්පත් වල වාණිජ නැවත මිලදී ගැනීම් ගනුදෙනු සඳහා අත්පිට ගනුදෙනු වේදිකාවක් ඇතිකිරීමට අදාල සංශෝධන.
- දේශීය ආස්තිත්වයන් විසින් නිකුත් කරනු ලබන විදේශීය මුදල් මත නම් කරන ලද කොටස් වෙළෙඳාමට පහසුකම් සැලසීමට අදාල සංශෝධන.

කොළඹ කොටස් වෙළෙඳපොල රීති හා මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමට අදාල රීති සමාලෝචනය කිරීම

සලකා බලන වර්ෂය තුළ පහත සඳහන්, මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමේ රීති කොළඹ කොටස් වෙළෙඳපොල රීති හා කොළඹ කොටස් වෙළෙඳපොලේ සාංගමික ව්‍යවස්ථාවලිය සමාලෝචනය කරන ලද අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අනුව ඒවාට අනුමැතිය දෙනු ලැබිනි.

- භාරදීමට එදිරිව ගෙවීම් පියවීමේ යාන්ත්‍රණය ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීම සඳහා වන මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමේ රීති හා කොළඹ කොටස් වෙළෙඳපොල රීති සංශෝධන.
- ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත/සංස්ථාපනය කරන ලද ආස්තිත්වයන් විසින් නිකුත් කරන විදේශ මුදල් මත නම් කර ඇති සුරැකුම්පත් ලයිස්තුගත කිරීම, වෙළෙඳාමට හා පියවීමට පහසුකම් සැලසීමට අදාලව මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමේ රීති සංශෝධන.
- භාරදීමට එදිරිව ගෙවීම් පියවීමේ යාන්ත්‍රණයට අදාල මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමේ රීති මගින් 16 (III) ව්‍යවස්ථාවේ අන්තර්ගත හරය ආමාන්ත්‍රණය කිරීමට, එකතු කරන්නාවූ ආන්තිකයන් උපයෝගී කරගන්නා බවට සහතික වීමට යටත්ව 16 (III) ව්‍යවස්ථාව ඉවත් කිරීම මගින් කොළඹ කොටස් වෙළෙඳපොලේ සාංගමික ව්‍යවස්ථාවලියේ 16 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

ලයිස්තුගත ලේඛනයෙන් ඉවත් කිරීම්

සලකා බලන කාලය තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 4(2) සහ 4(3) රීතින් අනුව ද පහත සමාගම් තුන, කොළඹ කොටස් වෙළෙඳපොලේ නිල ලයිස්තුවෙන් අනිවාර්ය ඉවත් කිරීමට ලක් කෙරිණි.

1. හියුජේ ඉන්ටර්නැෂනල් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී;
2. ආර්පිකෝ ෆයිනෑන්ස් පීඑල්සී; සහ
3. ට්‍රේඩ් ෆයිනෑන්ස් ඇනඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී

මෙහෙයුම් සමාලෝචනය

කොළඹ කොටස් වෙළෙඳපොලේ ලයිස්තුගත කිරීමේ රීති ප්‍රකාරව නිල ලයිස්තුවෙන් ඉවත් කිරීම කල් දැමීම

රටේ පැවති කොවිඩ් 19 ව්‍යවසනය නිසා ඇතිවූ මන්දීකාරක තත්වයන් සලකා බලා එක් ලයිස්තුගත පොදු සමාගමකට අදාලව එම සමාගම නිල ලයිස්තුවෙන් ඉවත් කිරීම කල් දමන ලදී.

සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම්

2021 වසරේ දෙසැම්බර් 31 දින වන විට පහත පවරාගැනීමේ අර්පණ ක්‍රියාත්මක වීම ආරම්භ වී තිබිනි. (සංඛ්‍යා සටහන 02)

සංඛ්‍යා සටහන 02 : සමාගම් අත්පත් කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ සිදුකළ අර්පන

අර්පණකරු	අර්පණ ලාභියා	අර්පණයේ ස්වභාවය	පවතින තත්වය
හේවාවසම්ගේ රවින්ද්‍රනාත් ශ්‍රීලාල් විජේරත්න	ඒස්ඒම්බී ලීසිං පීඑල්සී	අනිවාර්ය අර්පණයක්	අවසන් වී ඇත
පීජීපී ග්ලාස් ප්‍රයිවට් ලිමිටඩ්	පිරාමල් ග්ලාස් සිලෝන් පීඑල්සී	අනිවාර්ය අර්පණයක්	අවසන් වී ඇත
ආර් අයි එල් ප්‍රොපටි පී.එල්.සී	පෑන් ඒශියන් පවර් පී. එල්. සී.	අනිවාර්ය අර්පණයක්	අවසන් වී ඇත
ලන්කෙම් සිලෝන් පී.එල්.සී	ඇක්මී ප්‍රින්ටින්ග් ඇන්ඩ් පැකේජින්ග් පී.එල්.සී	අනිවාර්ය අර්පණයක්	අවසන් වී ඇත
ෂෝවොලස් ඇන්ඩ් හෙජස් ලිමිටඩ්	ගාර්ඩියන් කැපිටල් පාර්ට්නර්ස් පී.එල්.සී	අනිවාර්ය අර්පණයක්	අවසන් වී ඇත

අවම මහජන කොටස් හිමිකාරිත්වය සමග අනුකූල වීමට සමාගම් සඳහා කාල දිගුවන් ලබාදීම

අදාල අවශ්‍යතා සපුරාලීමට අසමත් වීම හේතුවෙන් යම් යම් ලයිස්තුගත පොදු සමාගම් සඳහා අවම මහජන කොටස් හිමිකාරිත්වය හා අනුකූල වීමට කාල දිගුවක් ලබාදීමට කොළඹ කොටස් වෙළෙඳපොල හට ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟතාවය ලබාදෙන ලදී.

ලබාදී ඇති කාල දිගුවේ කා සීමාව ඇතුළත අවම මහජන කොටස් හිමිකාරිත්වය පිළිබඳ අවශ්‍යතා සපුරාලනු ඇතැයි අදාල සමාගම් වලින් අපේක්ෂා කෙරේ. එසේ කිරීමට අසමත් වුවහොත් එවැනි සමාගම් කොළඹ කොටස් වෙළෙඳපොලේ දෙවන පුවරුව වෙත මාරු කරනු ලැබේ. එසේ දී තිබූ කාල දිගුව ඇතුළත අනුකූල වීමට අසමත් වූ එක් සමාගමක් කොළඹ කොටස් වෙළෙඳපොල විසින් දෙවන පුවරුවට මාරු කරනු ලැබීය.

යෝග්‍යතාවය හා උචිතභාවය පිළබඳ මාර්ගොපදේශ

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමිත කාර්යයන් සඳහා මූල්‍ය සේවා සැපයීමේදී සේවාදායකයින් සමග කටයුතු කරන පුද්ගලයින් සහ මූලික කළමණාකාරක අයවලුන් ගේ යෝග්‍යතාවය හා උචිතභාවයට අදාලව රීති හා නියාමන ප්‍රමිතීන් කෙටුම්පත් නීති සහ බලාත්මක කිරීම් අංශය විසින් සකස් කරනු ලැබුවේය

කොළඹ කොටස් වෙළෙඳපොලේ මූලික කාර්යයන් ඩිජිටල්කරණය කිරීමට පහසුකම් සැලසීම

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ එක්ව කොළඹ කොටස් වෙළෙඳපොලේ අන්තර් ආන්තික මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම උදෙසා සහ ජාතික හදිසි තත්වයකදී කිසිදු බාධාවකින් තොරව මෙහෙයුම් පවත්වාගෙන යාමට ඉඩ සැලැස්වීම සඳහා ප්‍රගතිශීලී ජාතික මූලපිරීමක් ආරම්භ කරන ලදී. මෙම මූලපිරීම, පොදු සේවා සපයන ආයතන වල සියළු මූලික ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය කිරීමේ රජයේ මූලපිරීම හා අනුකූල වේ.

කොළඹ කොටස් වෙළෙඳපොළ සහ එහි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම (CDS) ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟතාවය, මගපෙන්වීම හා නියාමනය ඇතිව, අනාගතයේ CDS ගිණුම් හිමියන් වීමට බලාපොරොත්තු වන අයට, කොටස් තැරැව්කරුවකුගේ ශාඛා කාර්යාලයකට යාමට හෝ භෞතිකව අයදුම්පත්‍රයක් පිරවීමට නොමැතිව

කොළඹ කොටස් වෙළෙඳපොළ සහ එහි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම (CDS) ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟතාවය, මගපෙන්වීම හා නියාමනය ඇතිව, අනාගතයේ CDS ගිණුම් හිමියන් වීමට බලාපොරොත්තු වන අයට, කොටස් තැරැව්කරුවකුගේ ශාඛා කාර්යාලයකට යාමට හෝ භෞතිකව අයදුම්පත්‍රයක් පිරවීමට නොමැතිව ඩිජිටල් ලෙස CDS ගිණුම් විවෘත කිරීම සඳහා වේදිකාවක් හදුන්වාදෙන ලදී.

ඩිජිටල් ලෙස CDS ගිණුම් විවෘත කිරීම සඳහා වේදිකාවක් හදුන්වාදෙන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොලේ එයට අදාල රීති සඳහා සංශෝධන වලට අනුමැතිය ලබාදීමට පහසුකම් සැලසීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

කොටස් පැවරීම තහනම් කිරීමේ දැනුම්දීම්

යම් යම් පුද්ගලයන් හා සංස්ථාපිත ආස්තිත්වයන් කොටස් හිමිකාරිත්වයන් පැවරීම වලක්වමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාගත් කොළඹ මහාධිකරණය මගින් නිකුත් කරනු ලැබූ යම් තහනම් නියෝග පිළිබඳව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම මත ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ මහාධිකරණයේ එම තීන්දු කොළඹ කොටස් වෙළෙඳපොළ හා මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම වෙත දැනුම් දීමට පියවර ගන්නා ලදී.

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) / 81 වගන්තිය යටතේ පිරි නමනු ලැබූ අනුමැතියන්

ලැයිස්තුගත සමාගමක් විසින් ලැයිස්තුගත නොකළ සුරුකුම්පත් නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) / 81 වගන්තිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව පහත සඳහන් ආයතන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (සංඛ්‍යා සටහන 03)

සංඛ්‍යා සටහන 03 : ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ)/81 නව පනත යටතේ පිරිනමනු ලැබූ අනුමැතීන්

නිකුත් කළ ආයතනයේ නම	නිකුතුවේ ස්වභාවය	අනුමත කරන ලද මුදල	කාලසීමාව
එල් වී එල් එනර්ජි ෆන්ඩ් පී එල් සී	ලැයිස්තුගත නොකළ, වගකීම් සහිත, පරිවර්තනය කළ නොහැකි බහුල ලෙස වට්ටම් කළ බැඳුම්කර	රුපියල් මිලියන 750	අවුරුදු 5 යි
නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී	ලැයිස්තුගත නොකළ, පරිවර්තනය කළ හැකි ණයකර	රුපියල් මිලියන 350	අවුරුදු 20 යි
ලංකා බැංකුව	බාසල් කකක අනුකූල, ස්ථර 2, ලැයිස්තුගත නොකළ වගකීම් රහිත, අප්‍රධාන, නිදහස් කළ හැකි, ශක්‍ය නොවන විට පෞද්ගලික නිකුතුවක් හරහා කපා හල හැකි ණයකර	රුපියල් බිලියන 12	A සහ B: වර්ගය අවුරුදු 5 යි C සහ D: වර්ගය අවුරුදු 8 යි
එල් ඕ එල් සී හෝල්ඩිංග්ස් පී එල් සී	ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ, වගකීම් රහිත, ප්‍රග්ධාන, පෞද්ගලික නිකුතුවක් හරහා නිදහස් කළ හැකි බැඳුම්කර	රුපියල් බිලියන 2	වර්ගය A අවුරුදු 5 යි වර්ගය B අවුරුදු 5 යි වර්ගය C අවුරුදු 10 යි
ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පී එල් සී	ලැයිස්තුගත නොකළ, පරිවර්තනය කළ හැකි වරණීය කොටස්	N/A	N/A
ලංකා බැංකුව	බාසල් III අනුකූල, ස්ථර 2, ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ, වගකීම් රහිත, අප්‍රධාන, නිදහස් කළ හැකි, ශක්‍ය නොවන විට කපා හල හැකි ලක්ෂණ සහිත ණයකර	රුපියල් බිලියන 8	අවුරුදු 5 සහ අවුරුදු 8
ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පී එල් සී	සාමාන්‍ය කොටස්	ඇමරිකන් ඩොලර් මිලියන 50	N/A
	ගණුදෙනු කළ නොහැකි/ හුවමාරු කළ නොහැකි මනාප යෝජනා ක්‍රම (මනාප යෝජනා ක්‍රම)	ඇමරිකන් ඩොලර් මිලියන 50	ඇමරිකන් ඩොලර් මිලියන 30 දායක දින සිට මාස 12 ක් ඇතුළත
		එකතුව ඇමරිකන් ඩොලර් මිලියන 80	

වෙළෙඳ භූමියෙන් බැහැර ගණුදෙනු

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (1) වගන්තිය ප්‍රකාරව සහ 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අංක 84 වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක ලැයිස්තුගතව ඇති පොදු සමාගමක සුරැකුම්පත් දරන පුද්ගලයෙකු විසින් එබඳු බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළ විසින් අනුගමනය කරනු ලබන ගණුදෙනු පටිපාටියට අනුකූල නොවන පරිදි එකී සුරැකුම්පත් මිලදී ගැනීම, විකිණීම, තෑගි කිරීම හෝ වෙනත් ආකාරයකින් ගනුදෙනු කිරීම කොමිෂන් සභාවේ පුරවා අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුයි.

පසුගිය අවුරුදු 5 පුරාවට විශේෂිත තත්ත්වයක් යටතේ සිදුකළ පැවරීම් (Transfers) වල ප්‍රමාණාත්මක බව සහ සාර්ව ආර්ථික තත්වයන්ගේ වෙනස්වීම් සැළකිල්ලට ගෙන වෙළෙඳ භූමියෙන් බැහැර ගණුදෙනු සඳහා අදාළ ගාස්තු සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් පන නැගිණි. එලෙසින් 2006 ජූලි 01 වන දින සිට අවුරුදු 15 ක් පුරාවට සංශෝධනය නොවී තිබූ වෙළෙඳ භූමියෙන් බැහැර පැවරීම් සඳහා අදාළ පරිපාලන ගාස්තු 2021ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරන ලදී.

මෙහෙයුම් වර්ෂය තුළදී විශේෂිත පැවරීම් 1867 ක් සහ කොටස් ත්‍යාග කිරීම් 84 ක් කොමිෂන් සභාවේ අවධානය සඳහා යොමු කරන ලදී.

ආන්තික ගණුදෙනු, තනි පුද්ගල ගිණුම් හවුල් ගිණුම් බවට හැරවීම, හවුල් ගිණුම් වෙනත් හවුල් ගිණුම් බවට හැරවීම, මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා, විශේෂිත ත්‍යාග පැවරීම්, භාරකරු වෙනස් කිරීම්, සමාගම් ඒකාබද්ධ කිරීම් වලට අදාළ පැවරීම්, ස්වෙච්චා සහ අනිවාර්ය අර්පණ, ප්‍රතිව්‍යුහගත කිරීම් සඳහා අදාළ පැවරීම් ඇතුළු විශේෂිත පැවරීම් සාංගමික කටයුතු අංශය මගින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (අ) /80 වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනුමැතීන්

කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමට අපේක්ෂා කරනු ලබන පොදු සමාගමක් ලැයිස්තුගත වන දිනට පෙර වසරක කාලසීමාවක් තුළදී, යම් පුද්ගලයෙකු හට කොටස් විභජනය කර ඇත්නම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලිඛිත අවසරයක් මත හැර එම සමාගමෙ කොටස් හෝ කොටස් වලට පරිවර්තනය කළ හැකි සුරැකුම්පත්, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කළ නොහැක. වර්ෂය තුලදී ලබාදුන් අනමතීන් හා සිදු කරන ලද ඇගයීම් පහත දැක්වෙන පරිදි වේ. (සංඛ්‍යා සටහන 04)

මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන 04 : ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (අ)/නව පනතේ 80 වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනුමැතීන්

සමාගමේ නම	ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිසිනස් ෆයිනෑන්ස් ලිමිටඩ්	අනුමැතිය දෙන ලදී
අබාන්ස් පී එල් සී	අනුමැතිය දෙන ලදී
සර්වෝදය ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්	අනුමැතිය දෙන ලදී
කෝපරෙටිව් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ්	අනුමැතිය දෙන ලදී
එල් ඕඑල් සී ජෙනරාල් ඉන්ෂුවරන්ස් පී එල් සී	අනුමැතිය දෙන ලදී
එව්සෙනිඩ් බිස්නස් සොලුෂන්ස් ලිමිටඩ්	අනුමැතිය දෙන ලදී
හෙලා ඇපරල් හෝල්ඩින්ස් ලිමිටඩ්	අනුමැතිය දෙන ලදී
මයිලැන්ඩ් ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්	අනුමැතිය දෙන ලදී
ලුමිනෙක්ස් ලිමිටඩ්	අනුමැතිය දෙන ලදී
එක්ස්ටමිනේටර් (පුද්) සමාගම	අනුමැතිය දෙන ලදී

කොළඹ කොටස් වෙළෙඳපොළේ බලාත්මක රීති සඳහා තාවකාලිකව කල්තබා ගැනීම

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම වසර තුළ කොළඹ කොටස් වෙළෙඳපොළේ බලාත්මක රීති සම්බන්ධව තාවකාලික කල්තබා ගැනීම් උදෙසා වන අයදුම්පත් 3 ක් සමාලෝචනය කරන ලදී. මෙම තාවකාලික කල්තබා ගැනීම් බ්ලූ ඩයමන්ඩ් ජුවලරි වර්ල්වයිඩ්, මල්ටි ෆිනෑන්ස්, නේෂන් ලංකා ෆිනෑන්ස් යන සමාගම්වලට ලැයිස්තුගත රීති 7.5 ඩී (II) අනුව ලබා දෙන ලදී.

අධීක්ෂණය සහ අනුකූලතාව

ආයෝජකයින්ගේ තීරණ ගැනීම් හැකියාව ඉහළ නංවන තොරතුරු පූර්ණ ලෙස හෙළිදරව් කිරීම, ආයෝජකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වඩාත්ම වැදගත් මාධ්‍යයයි. ආයෝජකයින්ට, එමගින්, ඔවුන්ගේ ආයෝජනවල ඇති විය හැකි අවදානම් සහ මිල තක්සේරු කිරීමටත්, ඒ අනුව, ඔවුන්ගේම අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමටත් හැකි වේ. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හෙළිදරව් කිරීමේ රෙගුලාසි උල්ලංඝනය කිරීම් අනාවරණය කරගත් විට, ඒවා ලැයිස්තුගත සමාගම් වෙත පූර්වයෙන් දැනුම් දෙනු ලැබේ. එවැනි ප්‍රයත්නයන් හෙළිදරව් කිරීමේ රෙගුලාසි උල්ලංඝනය කිරීම් ඇතිවීම සහ නැවත ඇතිවීම වැළැක්වීම සඳහා දායක වේ.

සුරුකුම්පත් නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සාධාරණ සහ ක්‍රමවත් වෙළෙඳපොළවල්වල මෙන්ම ආයෝජකයින්ගේ ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය පදනමේ කොටසකි. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන ආයතන තම ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කරන සහ වෙළෙඳපොළ අඛණ්ඩතාව ආරක්ෂා කරන ආකාරයෙන් හැසිරිය යුතුය.



මනුරි වීරසිංහ මෙනවිය
සහකාර අධ්‍යක්ෂිකා, සාංගමික කටයුතු



මේබලා ජයපාල
කළමනාකාරිනී - සාංගමික කටයුතු

ලැයිස්තුගත සමාගම්

සියලුම ලැයිස්තුගත සමාගම් මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස 5 ක ඇතුළත වාර්ෂික වාර්තා ඔවුන්ගේ කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කළ යුතුය. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලැයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා සමාලෝචනය කර අනුකූල නොවීම සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් සමාගම් සමඟ සන්නිවේදනය කරයි. මෙම ප්‍රයත්නයේදී ලැයිස්තුගත සමාගම්වල ප්‍රතිචාර අතීශයින්ම ධනාත්මක විය. මෙම අභ්‍යාසයේ පරමාර්ථය වන්නේ ලැයිස්තු ගත සමාගම් විසින් කරනු ලබන මූල්‍ය වාර්තාකරණයේ සහ තොරතුරු බෙදාහැරීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. සුරුකුම්පත් වෙළෙඳපොළේ විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීම සහ ව්‍යාත්තීය ප්‍රමිතීන් පවත්වාගෙනයාම තහවුරු කිරීම සඳහා ලැයිස්තුගත සමාගම් විසින් ප්‍රමාණාත්මක තොරතුරු කඩිනමින් බෙදාහැරීම අවශ්‍ය වේ.

වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීමේදී සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහත සඳහන් අංගයන් කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ රීති, ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතීන් සහ සමාගම් පනතේ අදාළ විධිවිදානවලට අනුකූල වීම
- සාංගමික යහපාලනයට අදාළ පරිච්ඡේදයන්
- මූල්‍යමය අවධාරණයන්
- සභාපතිගේ වාර්තාව
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
- ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව
- කොටස් හිමියන් සහ ආයෝජන තොරතුරු
- මූල්‍යමය දත්ත
- අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනුකමිටු පිළිබඳ වාර්තා

කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ රීති සහ අදාළ රෙගුලාසිවලට අනුකූලව වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී සමාගම් වෙත පැවරී ඇති වගකීම් පිළිබඳවබ සමාගම් අතර පවතින දැනුවත්භාවයේ මට්ටම වැඩිදියුණු ක්‍රියාවලිය අඛණ්ඩව දායක වනු ඇත.

මෙහෙයුම් වසර තුළදී, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා 147 සමාලෝචනය කරන ලද අතර එකී සමාගම්හි අදාළ නීතිරීති සහ විධිවිධාන කෙරෙහි වූ අනුකූලතාවයන් වැඩි දියුණු කිරීම සහ හෙළිදරව් කිරීම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහිත ලිපි 157ක් නිකුත් කර ඇත.

මෙයට අමතරව මෙහෙයුම් වර්ෂය තුළදී ණය නිකුතු සංස්ථා ප්‍රකාශන 12 ක් සහ හිමිකම් නිකුතු සංස්ථා ප්‍රකාශන 21 ක් සමාලෝචනය කරන ලදි.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාගම් 8ක් වත්මන් කොටස් හිමියන්ගෙන් අතිරේක අරමුදල් රැස්කිරීමේදී නිකුත් කරන ලද කොටස් හිමියන්ගේ චක්‍රලේඛයන් පිළිබඳ මූලික සමාලෝචනයන් කොට හෙළිදරව් කිරීම සඳහා අදාළ ප්‍රතිපෝෂණයන් සපයා ඇත.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ස්වාධීන උපදේශකයන්ගේ වාර්තා 8ක් සමාලෝචනය කළ අතර හෙළිදරව් කිරීමේ අන්තර්ගතය වැඩි දියුණු කිරීම සඳහා නියාමන නිරීක්ෂණයන් ලබාදෙන ලදි.

හෙළිදරව් කිරීම් සහ ආයතනික කටයුතු සම්බන්ධයෙන් ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග

මෙහෙයුම් වර්ෂය තුළදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම් විසින් වෙළෙඳපොළ දැනුම්දීම් හරහා සිදුකල හෙළිදරව් කිරීම් සමාලෝචනය කළ අතර අවස්ථා 93 කට අදාළව කොළඹ කොටස් වෙළෙඳපොළ වෙතින් පැහැදිලි කිරීම් ඉල්ලා සිටින ලදි. එවැනි පැහැදිලි කිරීම් අදාළ වූයේ: (සංඛ්‍යා සටහන 05)

සංඛ්‍යා සටහන 05 : ලයිස්තුගත පොදු සමාගම්වල හෙළිදරව් කිරීම් සහ ආයතනික කටයුතු සම්බන්ධයෙන් ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග

ලැයිස්තුගත ආයතන	අවස්ථා ගණන
අවදානම් පුවරුව සහ දෙවන පුවරුවෙහි සිටින ලැයිස්තුගත සමාගම් හී අධ්‍යක්ෂකවරුන් විසින් කරනු ලැබූ ගණුදෙනු	2
අධ්‍යක්ෂකවරුන් විසින් කරනු ලැබූ ගණුදෙනු ප්‍රමාද වූ අනාවරණයන්	27
අධ්‍යක්ෂකවරුන් විසින් කරනු ලැබූ ගණුදෙනු තහනම් කරනු ලැබූ කාල පරාසය තුළ කරනු ලැබූ ගණුදෙනු	10
ප්‍රමාද වූ හෙළිදරව් කිරීම්	
අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්කම්	34
වෙනත් ආයතනික ක්ෂණික අනාවරණය කිරීමේ අවශ්‍යතා	20

අනෙකුත් නියාමන ආයතන වෙත යොමු කරන ලද කාරණා

පහත සඳහන් කාරණා ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය, කොළඹ කොටස් හුවමාරුව, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට පැහැදිලි කිරීම් ලබා ගැනීමට යොමු කරන ලදී. (සංඛ්‍යා සටහන 06)

සංඛ්‍යා සටහන 06 : අනෙකුත් ආයතන වෙත යොමුකරන ලද කාරණා

නියාමන ආයතනය	සමාගම් ගණන	කුමන කරුණක් සම්බන්ධ ගැටළුවක්ද යන වග සහ එහි ප්‍රතිඵලය
ශ්‍රී ලංකා ගිනුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය	1	රේඩියන්ට් ජෙම්ස් ඉන්ටර්නැෂනල් පී එල් සී කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වෙබ් අඩවියෙහි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කරුණු/තොරතුරු සහ අනපේක්ෂිත ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයට අදාළ පියවර ගැනීම සඳහා සන්නිවේදනය කරන ලදි.
කොළඹ කොටස් වෙළෙඳපොළ	1	ටෙස් ඇග්‍රෝ පී එල් සී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොඹ කොටස් වෙළෙඳපොළෙහි සොයාගැනීම් පදනම් කොට වහාම වෙළෙඳපොළ හෙළිදරව්වක් කිරීමට සමාගමට අවශ්‍ය විය.
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව	1	ස්ටරස් ලෙෂර් ලී එල් සී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු පදනම් කර, එවකට විසඳී නොතිබූ ජනතා පැමිණිල්ලක් යෝග්‍ය ලෙස විසඳන ලදි.

කොටස් තැරැව්කරුවන් අධීක්ෂණය කිරීම අවදානම පදනම් ප්‍රවේශයක් මත සිදු කෙරෙන අතර එමගින් සමාගම්වල සාපේක්ෂ අවදානම් තත්ත්වය තක්සේරු කිරීම සිදුකරනු ලබයි. එහිදී ඇතිවිය හැකි අවදානමේ බලපෑම සහ සම්භාවිතාව යන දෙකම සැළකිල්ලට ගැනේ.

වෙළෙඳපොළ අතරමැදි ආයතන අධීක්ෂණය

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අනුව, කොටස් තැරැව්කරුවන්, කොටස් වෙළෙඳුන්, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන, ආයෝජන කළමනාකරුවන්, ඒකක භාර කළමනාකරණ සමාගම්, ආන්තික ණය සැපයුම්කරුවන්, ප්‍රාරක්ෂකයින්, සාංගමික මූල්‍ය උපදේශකයින්, ව්‍යුත්පන්න තැරැව්කරුවන්, ව්‍යුත්පන්න අලෙවිකරුවන් සහ වෙළෙඳපොළ සාදන්නන් ඇතුළු වෙළෙඳපොළ අතරමැදියන් කාණ්ඩ එකොළහක් සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීමට සහ නියාමන අධීක්ෂණයන් කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බලය ලබා දී ඇත.

කොටස් තැරැව්කරුවන්

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සහ ඒ යටතේ සාදන ලද රීති සහ රෙගුලාසිවල නියම කර ඇති පරිදි, කොටස් තැරැව්කරුවන්ට බලපත්‍ර ලබා දීම සහ අධීක්ෂණය කිරීමේ කාර්යය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පවරා ඇත. අධීක්ෂණයේ පරමාර්ථය වන්නේ කොටස් තැරැව්කරුවන්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ශක්‍යතාව සහතික කිරීම සහ එමගින් ආයෝජකයන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ කෙරෙහි ආයෝජක විශ්වාසය වර්ධනය කිරීමයි.

කොටස් තැරැව්කරුවන් අධීක්ෂණය කිරීම අවදානම පදනම් ප්‍රවේශයක් මත සිදු කෙරෙන අතර එමගින් සමාගම්වල සාපේක්ෂ අවදානම් තත්ත්වය තක්සේරු කිරීම සිදුකරනු ලබයි. එහිදී ඇතිවිය හැකි අවදානමේ බලපෑම සහ සම්භාවිතාව යන දෙකම සැළකිල්ලට ගැනේ. කොටස් තැරැව්කරුවන් සම්බන්ධයෙන් ඇතිවිය හැකි අවදානම් තත්වයන් විචක්ෂණ, ද්‍රවශීලතා, ප්‍රතිපාර්ශව, මූල්‍ය, ණය, මෙහෙයුම්, තත්ත්ව සහ නෛතික අවදානම් ලෙස හඳුනාගත හැකිය.

මෙහෙයුම් සමාලෝචනය

විතැන් පරීක්ෂාවන් (off-site inspection) සඳහා මූල්‍ය ප්‍රකාශන, ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ, ඉලෙක්ට්‍රොනික දත්ත ගොනු කිරීමේ පද්ධතියට ඇතුළත් කරන ලද වාර්තා සහ කොටස් තැරැව්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් වාර්තා සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ඇතුළත් වේ. විතැන් පරීක්ෂා වලදී නිරීක්ෂණය වූ කිසියම් නොගැලපීම් සහ අනුගත නොවීම් නිවැරදි කිරීම් සඳහා අදාළ සමාගම් වලට දැනුම් දෙන ලදී.

2021 වර්ෂයේ Covid-19 වසංගතය තිබියදීත්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආයතනවල අනුකූලතාවය සහතික කිරීම සඳහා ඵලදායී බලාත්මක කිරීමක් සාක්ෂාත් කර ගැනීමට කොටස් තැරැව්කරුවන් සම්බන්ධ එතැන් පරීක්ෂා (on-site inspection) සහ විතැන් පරීක්ෂා කටයුතු සිදු කරන ලදී.

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, කඩඉෂ19 වසංගතය තත්ත්වය හමුවේ ඇති වූ අතිරේක බලපෑම් හේතුවෙන් කොටස් තැරැව්කරුවන් දෙදෙනෙකු විසින් සිය ව්‍යාපාර මෙහෙයුම් නැවත සක්‍රීය කිරීමේ කාලසීමාව දීර්ඝ කරන ලෙස ඉදිරිපත් කරන ලද අභියාචනා සැළකිල්ලට ගනිමින් එම තැරැව්කරුවන් වෙත දීර්ඝ කිරීම් ලබාදෙන ලදි. මෙම කොටස් තැරැව්කරුවන් දෙදෙනා කොළඹ කොටස් හුවමාරුවේ කොටස් තැරැව්කරුවන්ගේ නීතිවල 12 වගන්ති ප්‍රකාරව සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය අනුව වසර දෙකක් (2) සඳහා එහි ව්‍යාපාර මෙහෙයුම් අක්‍රිය කර තිබුණි. තවද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව කොටස් තැරැව්කරුවන් දෙදෙනෙකු සිය නම් වෙනස් කරනු ලැබීය.

සමාලෝචිත වර්ෂය තුළ කොටස් තැරැව්කරුවන්ගේ මුළු පිරිවැටුම පෙර වසරට සාපේක්ෂව 215% කින් වැඩි විය. 2020 දී වාර්තා වූ රුපියල් මිලියන 1,751 ක බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය හා සසඳන විට 2021 දී බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය රුපියල් මිලියන 6,308 කි. මෙයට බොහෝ දුරට හේතු වූයේ වසර තුළ පැවති අඩු බැංකු පොලී අනුපාත හේතුවෙන් ආයෝජකයින් විශාල සංඛ්‍යාවකගේ වඩාත් ආකර්ෂණීය තේරීම කොටස් වෙළෙඳපල ආයෝජනය බවට පත්වීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා රජය සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලැබූ අනෙකුත් ප්‍රගතිශීලී පියවරයි. මීට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් පත් කරන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ කම්ටුව විසින් කොළඹ කොටස් හුවමාරුවේ මෙහෙයුම් කටයුතු පූර්ණ ලෙස ඩිජිටල්කරණය කිරීම ද මෙම සමස්ත වර්ධනයට දායක විය.

කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්ය සාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යාලේඛනක් පහත දැක්වේ. (සංඛ්‍යා සටහන 07)

සංඛ්‍යා සටහන 07 : අරූපය: කොටස් තැරැව්කරණ කර්මාන්තයේ කාර්යසාධනය 2021

	2021 (රු '000)	2020 (රු '000)	වෙනස %
පිරිවැටුම	13,555,296	4,303,668	215%
ශුද්ධ තැරැව්කාර ගාස්තුව	12,764,289	3,929,094	225%
වෙනත් ආදායම්	2,015,305	851,656	137%
මෙහෙයුම් ලාභ/අලාභය	8,162,762	2,113,479	286%
බදු වලට පෙර ශුද්ධ ලාභය/අලාභය	7,723,787	1,905,233	305%
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය/ පාඩුව	6,307,940	1,751,330	260%
මුළු වත්කම්*	36,490,460	19,893,383	83%
සම්පූර්ණ වගකීම්*	23,956,798	12,943,874	85%
කොටස් හිමියන්ගේ අරමුදල්*	12,533,662	6,949,509	80%

*දෙසැම්බර් 31 වන විට

මූලාශ්‍රය: කොටස් තැරැව්කරුවන් විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන

ඒකක භාර කර්මාන්තය

කඩඉෂ19 වසංගතයෙන් පැන නගින ලද පෙර නොවූ විරූ තත්ත්වය හේතුවෙන් ඇති වූ මෙහෙයුම් අභියෝග සැලකිල්ලට ගත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව,ඒකක භාර කළමනාකරණ සමාගම් (Unit Trust Managing Companies-UTMC) අධීක්ෂණයේදී අවදානම් පදනම් කරගත් ප්‍රවේශය ශක්තිමත් කළේය.

ඒකකභාර කළමනාකරණ සමාගම්වල මූල්‍ය ශක්තිය සහ අදාළ නීති රීති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා එම සමාගම්වල විචක්ෂණ, ක්‍රියාකාරී, ද්‍රවශීලතාව, කළමනාකරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණවත් බව වැනි ක්ෂේත්‍රවල ප්‍රධාන අවදානම් අවධාරණය කරමින් මෙම වසර තුළදී එතැන් හා විතැන් පරීක්ෂා අවදානම් පාදක ප්‍රවේශයකින් සිදු කරන ලදී.

අදාළ නියාමන අවශ්‍යතා සමඟ එහි අනුකූලතා මට්ටම තහවුරු කර ගැනීම සඳහා වසර තුළ ඇතැම් සමාගම් මත සිදු කරන ලද අවදානම් මත පදනම් වූ එතැන් පරීක්ෂා මගින් ඒවායේ ව්‍යාපාර මෙහෙයුම්, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය කෙරෙහි අවධානය යොමු කරන ලදී. වසංගතය හේතුවෙන් එම එතැන් පරීක්ෂාවන් දුරස්ථව සිදු කරන ලදී.

නියාමන ලිපිගොනු කිරීම් වල ඇතුළත් තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විතැන් පරීක්ෂා කටයුතු සිදු කරන ලදී. ඒකක භාර අරමුදල්වල මූල්‍ය ස්ථායිතාව සහ නියමිත නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම තහවුරු කර ගැනීම සඳහා අප ඒකක භාර අරමුදල්වල භාරකරුවන් සහ ඒකක භාර කළමනාකරණ සමාගම් සමඟ නිරන්තරයෙන් සම්බන්ධතා පවත්වමු.

තවද, ඒකක භාර කළමණාකාර සමාගම් සම්බන්ධයෙන් සිදුකරන ලද විතැන් පරීක්ෂා සමාලෝචන හරහා ඒකක භාර කළමනාකරණ සමාගම්වල මූල්‍ය ශක්තිය, අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාශීලී අවදානම් කළමනාකරණ පරිචයන්වල ප්‍රමාණවත් බව පවත්වාගෙන යාම තහවුරු කරන ලද අතර එමගින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ස්ථාවරත්වය සහතික කිරීමට අපට හැකි විය. අදාළ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා ඔවුන්ට සහාය වීමට අප ඒකක භාර කළමනාකරණ සමාගම් වෙත කාලෝචිත මාර්ගෝපදේශ ද ලබා දී ඇත.

විතැන් පරීක්ෂා මගින් ඒකක භාර කළමනාකරණ සමාගම්වල මාසික විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන සහ ප්‍රතිලාභ තත්ත්වය සම්බන්ධ ඉදිරිපත් කිරීම් විශ්ලේෂණය කිරීම සිදු කරන ලද අතර එමගින් එම සමාගම්වල මූල්‍ය තත්ත්වයන්හී ස්ථාවර බව සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියම කර ඇති අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම කරන ලදී. මීට

අමතරව ඒකක භාර සංග්‍රහයේ සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිකුත් කරන ලද නියෝගවල දක්වා ඇති පරිදි අවම ඒකක දරන්නන් සංඛ්‍යාව, ආයෝජන පරාමිතීන් සහ ඒකක භාර අරමුදල්වල ද්‍රවශීලතා අවශ්‍යතාවයට අනුකූල වීම පරීක්ෂා කරන ලදි. එමගින් පිළිගත හැකි සීමාවන් තුළ එම අරමුදල් පවතින බවට සහතික වුණෙමු.

ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ඒකක භාර අරමුදල් සම්බන්ධ වෙළෙඳ දැන්වීම් සහ ප්‍රවර්ධන මෙවලම් සමාලෝචනය කිරීමේදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ඒකක භාර වෙළෙඳ දැන්වීම් සහ ප්‍රවර්ධන කටයුතුවලට අදාළ මාර්ගෝපදේශවලට අනුකූල නොවන අවස්ථා හඳුනාගන්නා ලදි. පසුව එම විධානයේ දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව එම විෂමතා නිවැරදි කිරීමට ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් පියවර ගෙන ඇත.

වසර තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නව ඒකක භාර අරමුදල් දෙකක් ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දීමට බලපත්‍ර අනුමත කරන ලද අතර ඒවා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍ය අනුමැතිනට යටත්ව ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ඩොලර් මත පදනම් වූ බැඳුම්කරවල ප්‍රධාන වශයෙන් ආයෝජනය කිරීමට අපේක්ෂා කරයි.



සුනෙත් පෙරේරා
සහකාර අධ්‍යක්ෂ, අධීක්ෂණ



සෞම්‍ය කොඩිප්පිලි මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - සුපරීක්ෂණ

ඒකක භාර අරමුදල්වල ශුද්ධ වත්කම් වටිනාකම 2021 දෙසැම්බර් 31 වන දිනට රුපියල් බිලියන 194 (ආසන්න වශයෙන්) වූ අතර පෙර වසරට සාපේක්ෂව ඒකක හිමියන් සංඛ්‍යාව 13.4% කින් වැඩි වී ඇත. (සංඛ්‍යා සටහන 08, රූප සටහන 01)

සංඛ්‍යා සටහන 08 : ඒකක භාර අරමුදල් සම්බන්ධ සමස්ත තත්ත්වය 2021දෙසැම්බර් 31 දිනට

	2021 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට	වෙනස %
අනුමත ඒකක භාර අරමුදල් ගණන	75	75	
ඒකක භාරවල ශුද්ධ වත්කම් වටිනාකම (රු. බිලියන දළ වශයෙන්.)	194.00	201.00	(3.4)
ඒකක දරන්නන් සංඛ්‍යාව	59,426	52,402	13.40
නිකුත් කරන ලද ඒකක ගණන (ඒකක මිලියන. දළ වශයෙන්)	7,835	8,014	(2.2)
කොටස්වල ආයෝජනය (රු. මිලියන දළ වශයෙන්)	17,586	14,019	25.4
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය (රු. මිලියන දළ වශයෙන්)	28,755	28,803	(0.2)
වෙනත් උපකරණ සඳහා ආයෝජනය* (රු. මිලියන. දළ වශයෙන්)	148,907	158,656	(6.1)

*වාණිජ පත්‍රිකා, භාර සහතික, ණයකර, බැංකු තැන්පතු ආදිය
මූලාශ්‍රය: ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් සිදුකළ නියාමන ඉදිරිපත් කිරීම්

රූප සටහන 01 : 2021 දෙසැම්බර් 31 දින වන විට ඒකක භාර කළමනාකරණ සමාගම්වල වෙළෙඳපොළ කොටස



අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන්

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන භූමිකාවට ප්‍රාග්ධන වෙළෙඳපොළ අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් සුපරීක්ෂණය සහ අධීක්ෂණය ද ඇතුළත් වන අතර එමගින් සියලුම බලපත්‍රලාභී ආයතන මූල්‍යමය වශයෙන් ස්ථාවර, මෙහෙයුම් ශක්‍යතාව සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සහ පියවරයන්ගෙන් සමන්විත බව සහතික කරයි.

ඵලදායී සහ ශක්තිමත් රාමුවක් අනුගමනය කරමින් වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම, අවම කිරීම සහ කළමනාකරණය කිරීම මගින් එතැන් සහ විතැන් පරීක්ෂා සිදු කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ කඩඩසා19 වසංගතය නොතකා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන් සම්බන්ධ එතැන් සහ විතැන් පරීක්ෂා සිදු කරන ලදී.

2021 වර්ෂය තුළදී, ආයෝජන කළමණාකරණ සමාගම් සඳහා බලපත්‍ර තුනක් (3), ප්‍රාරක්ෂණ සමාගම් සඳහා බලපත්‍ර දෙකක්, (2) ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයක් සඳහා බලපත්‍රයක් (1) සහ එක් කොටස් වෙළෙඳ සමාගමක් (Stock Dealer) සඳහා බලපත්‍රයක් (1) ප්‍රදානය කරන ලද අතර, ආන්තික ණය සපයන්නන් හතරක් (4) ස්වේච්ඡාවෙන් ඔවුන්ගේ බලපත්‍ර භාරදී එහි මෙහෙයුම් කරගෙන යාම අවසන් කරන ලදි. (සංඛ්‍යා සටහන: 09)

මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන 09 : අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන් සම්බන්ධ විශේෂ මූල්‍ය තොරතුරු (රු. මිලියන වලින්)

වර්ගය	මුළු ආදායම්	බදු වලට පෙර ශුද්ධ ලාභය	මුළු වත්කම්	මුළු වගකීම්
ආන්තික ණය සපයන්නන්	68,572	28,389	687,456	556,899
ආයෝජන කළමනාකරුවන්	2,694	1,709	4,268	729
ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන	233	81	325	84
නිෂ්කාශන ආයතන	614	484	2388	1281
බහුකාර්ය ආයතන*				
ආන්තික ණය සැපයුම්කරු / ප්‍රාරක්ෂක	209,060	125,172	6,359,981	5,712,235
ආයෝජන කළමණාකරු/ ප්‍රති ප්‍රාරක්ෂක	292,515	44,802	3,800,921	3,595,267
ආන්තික ණය සැපයුම්කරු / ප්‍රාරක්ෂක / ආයෝජන කළමනාකරු	5,525	882	34,047	29,937

*සුරුකුම්පත් සහ විනිමය කොමිසම විසින් ලබා දී ඇති බහු බලපත්‍ර සහිත ආයතන

ආවේක්ෂණය, විමර්ශනය සහ බලාත්මක කිරීම

ප්‍රාග්ධන වෙළෙඳපොළේ අඛණ්ඩතාව පවත්වා ගෙන යනු ලබන්නේ ආවේක්ෂණ, විමර්ශන සහ අදාළ නීති රීති බලාත්මක කිරීම යන සංකලනය මගිනි. ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ඇති විය හැකි අවදානම් අපේක්ෂා කිරීමේදී වෙළෙඳපොළ සුපරීක්ෂණය, විශේෂයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සුරුකුම්පත් නීති උල්ලංඝනය කළ හැකි අවස්ථා තිබේ නම්, ඒවා පසුව තවදුරටත් විමර්ශනය කර අවශ්‍ය විටදී බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ආවේක්ෂණය

සාධාරණ, ක්‍රමවත් , කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුක්ත සුරුකුම්පත් වෙළෙඳපොළක් නිර්මාණය කිරීමේ හා පවත්වාගෙන යාමේ මූලික නියාමන අරමුණ පෙරදැරිව සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ. එමනිසා ප්‍රාග්ධන වෙළෙඳපොළ ආරක්ෂාව සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා වෙළෙඳපොළ ආවේක්ෂණ කාර්යය ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. මෙම කාර්යය සඳහා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළෙහි අසාමාන්‍ය විචලනයන් සහ ගනුදෙනු රටාවන් පිළිබඳ දෛනික නිරීක්ෂණ සහ විශ්ලේෂණ තුළින් තහනම් හැසිරීම් අධීක්ෂණය සඳහා පුරවා ක්‍රියාකාරී ප්‍රවේශයක් පවත්වාගෙන යයි. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විෂය පථයට යටත් වන වෙළෙඳපොළ වැරදි 2021 අංක 19 දරන සසරි ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ පස් වන කොටසෙහි දක්වා ඇත. ආයෝජක ප්‍රජාවගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා වෙළෙඳපොළ නියාමනයන් සහ වෙළෙඳපොළ ගතිකත්වයන් අතර සමබරතාවය පවත්වා ගැනීමට වෙළෙඳපොළ ආවේක්ෂණය කැප වී ඇත. ඵලදායී ආවේක්ෂණයේ මූලික අංග වන හඳුනාගැනීම, බුද්ධි තොරතුරු සහ වැළැක්වීම ගැන සළකා බලමින් වෙළෙඳපොළ වැරදි හඳුනාගැනීම සඳහා උපාය මාර්ග ස්ථාපිත කර ඇත. (රූප සටහන 2)

රූප සටහන 02: ඵලදායී ආවේක්ෂණයේ මූලික අංග



ආයෝජක ප්‍රජාවගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා වෙළෙඳපොළ නියාමනයන් සහ වෙළෙඳපොළ ගතිකත්වයන් අතර සමබරතාවය පවත්වා ගැනීමට වෙළෙඳපොළ ආවේක්ෂණය කැප වී ඇත.

සුරුකුම්පත් ගනුදෙනු කිරීමේදී සිදුවිය හැකි අයථා වෙළෙඳපොළ හැසිරීම් වැළැක්වීමේ අරමුණින් මිල හා ප්‍රමාණයන්හි අසාමාන්‍ය විචලයන් නිරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තත්කාලීන දත්ත නිරීක්ෂණය කරනු ලබයි. අවශ්‍ය අවස්ථාවන්හිදී සැක සහිත වෙළෙඳපොළ ක්‍රියාකාරකම් අනාවරණය කර ගැනීමෙන් පසු අයථා වෙළෙඳපොළ හැසිරීම් පැහැදිළිව හඳුනාගැනීම සඳහා සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරනු ලබන අතර ආවේක්ෂණ වාර්තා හෝ සටහන් සුදුසු ක්‍රියාමාර්ග සඳහා යොමු කළ හැක. එමගින් ගනුදෙනුවල ස්වභාවය සහ පවතින වෙළෙඳපොළ තත්වයන්ට ඇති වන බලපෑම සැළකිල්ලට ගනිමින් තහනම් හැසිරීම් සම්බන්ධයෙන් කාලානුරූපි සහ වඩාත් ගැළපෙන ක්‍රියාමාර්ග ගනු ලැබේ. ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වැඩි දියුණු කරන ලද නව ක්‍රියාවලි ගැලීම් සටහන 2021 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර එමගින් ඵලදායී නිරීක්ෂණයක් සඳහා අනුගමනය කළ යුතු පියවර අනු පිළිවෙලින් සඳහන් කර ඇත.

ගනුදෙනු කටයුතු ඩිජිටල්කරණය වීම හේතුවෙන් තරුණ ප්‍රජාවගේ ක්‍රියාකාරී සහභාගීත්වයක් සමඟ වෙළෙඳපොළෙහි අඛණ්ඩ සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබිණි. වෙළෙඳපොළ තුළ විශේෂයෙන්ම වයස අවුරුදු 18 ත් 39 ත් අතර පිරිසෙහි ක්‍රියාකාරී සහභාගීත්වයක් පෙන්නුම් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේදී අන්තර්ජාල මාධ්‍ය හරහා ගණුදෙනු කටයුතු වල සැළකිය යුතු ප්‍රවණතාවයක් ඇති විය. (රූප සටහන 3)

රූප සටහන 03: වයස අනුව වෙළෙඳපොළෙහි සහභාගීත්වය

(%)



ගණුදෙනු කටයුතු ඩිජිටල්කරණය වීම නිසා නිර්බාධක ගණුදෙනු පහසුකම් හරහා රටේ විවිධ ප්‍රදේශවලින් ආයෝජකයන් වෙළෙඳපොළට පිවිසීම වෙළෙඳපොළ වර්ධනයට තවදුරටත් දායක විය. මෙම ආයෝජකයින් වසර පුරා ක්‍රියාකාරීව ගණුදෙනු කටයුතුවල නිරත විය. (රූප සටහන 04)

රූප සටහන 04: දිස්ත්‍රික්කය අනුව වෙළෙඳපොළෙහි සහභාගීත්වය

(පුද්ගලයින් සංඛ්‍යාව)



වෙළෙඳපොළෙහි ඇති වූ නව සහභාගීත්වයේ බලපෑමට ප්‍රතිචාර දැක්වීම සඳහා සමාජ මාධ්‍ය සහ අනෙකුත් පොදු මාධ්‍ය තොරතුරු අධීක්ෂණය දක්වා එහි විෂය පථය පුළුල් කරමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කරන ලදී. මීට අමතරව සුදුසු අවස්ථාවන් වලදී කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් යොමු කරනු ලබන ආවේක්ෂණ වාර්තා හෝ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනෙකුත් අංශ වල අභ්‍යන්තර සොයාගැනීම් හෝ බාහිර පාර්ශවයන්ගෙන් ලද පැමිණිලි මත පදනම්ව ඒවා වෙළෙඳපොළ විෂමාචාර පිළිබඳ සහ ඇති කරන්නේද යන්න තීරණය කිරීම සඳහා මූලික විශ්ලේෂණයන් ද සිදු කරන ලදී.

පූර්වා ක්‍රියාකාරී ආවේක්ෂණය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආයෝජන ප්‍රජාවගේ විශ්වාසය නැවත ඇතිකරන පූර්වාරක්ෂාකාරී ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කරයි. සිදුකරන ලද නිරීක්ෂණවල බරපතලකම අනුව, පූර්ව ක්‍රියාකාරී ආවේක්ෂණ අරමුණට අදාලව 2021 වර්ෂයේදී සිද්ධීන් 35 කට අදාළව ආයෝජන උපදේශකවරුන්, අනුකූලතා නිලධාරීන් සහ ආයෝජකයින්ගෙන් දුරකථන ඇමතුම් ඔස්සේ පැහැදිළි කිරීම් වහාම ලබාගත් අතර ආයෝජකයින්ගෙන් සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලිපි 37 ක් මගින් පැහැදිළි කිරීම් ලබාගන්නා ලදී. වෙළෙඳපොළ නිරවද්‍යතාවය පවත්වාගැනීමේ දී වෙළෙඳපොළ තුළ ඇතිවිය හැකි විෂමාචාර සහ එවන් උත්සාහයන් පාලනය කිරීම සඳහා මෙම පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශය උපකාරී වේ. (රූප සටහන 05)

රූප සටහන 05: සැක කටයුතු කොටස් වෙළෙඳපොළ වැරදි

(සැකකටයුතු වැරදි ගණන)



ආවේක්ෂණ වාර්තා සහ සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ සොයාගැනීම්/කොළඹ කොටස් හුවමාරුවෙන් යොමු කරනු ලබන ආවේක්ෂණ වාර්තා සහ බාහිර පාර්ශවයන් විසින් යොමු කරනු ලබන පැමිණිලි මත පදනම් වෙමින් බරපතල සැකසහිත වෙළෙඳපොළ අක්‍රමිකතා හඳුනාගෙන ඒවා සමාලෝචනය කිරීමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම ආවේක්ෂණ වාර්තා සහ සටහන් ලෙස ආවේක්ෂණ හා විමර්ශන කමිටුව වෙත පහත ආකෘතිය යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

1. සමාගමක අභ්‍යන්තර තැනැත්තන් විසින් එම සමාගමේ සුරැකුම්පත් ප්‍රසිද්ධියට පත් නොකළ මිල සංවේදී තොරතුරු මත පදනම්ව එහි කොටස් වල ගනුදෙනු කිරීම.

2. සක්‍රීය ගනුදෙනු කිරීම් මගින් හෝ වෙළෙඳපොළේ ව්‍යාජ හෝ නොමඟ යවන සුළු තත්ත්වයක් නිර්මාණය කිරීම හෝ නිර්මාණයවීම සඳහා හේතු විය හැකි මොනයම් හෝ කටයුත්තක් සිදු කිරීම.

2021 වසර තුළදී ආවේක්ෂණ වාර්තා/ සටහන් 21ක් සාර්ථකව නිම කරන ලද අතර එම වාර්තා හා සටහන් වෙළෙඳපොළ කෘතිමව හැසිරවීම සම්බන්ධ සිදුවීම්, පෙර විකුණුම් හා අවසාන ප්‍රතිලාභ අයිතියෙහි වෙනස්වීමක් ඇති නොවන ගණුදෙනු වලින් සිදු වූ සේ සැළකෙන වෙළෙඳපොළ වැරදි වලින් සමන්විත වේ.

මෙහෙයුම් සමාලෝචනය

විශ්ලේෂණය සඳහා තාක්ෂණය භාවිතය

ආවේක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා ධාරිතාව ඉහළ දැමීම හා පවතින ක්‍රියාපටිපාටි විධිමත් කිරීම සහතික කිරීම සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘතියක් වන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ පළපුරුදු උපදේශකයකුගේ සහාය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ලබා ගන්න ලදී. විශේෂඥ උපදේශන මත පදනම්ව නව ආවේක්ෂණ මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු කරමින් සිටින අතර එමගින් පවතින පද්ධතියේ ක්‍රියාකාරකම් වල වැඩිදියුණුවීමක් අපේක්ෂා කරයි.

2021 වසරේදී ආවේක්ෂණ ක්‍රියාවලිය තුළ තාක්ෂණික වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මූලික අවධානයක් ලබාදෙන ලදී. නව තාක්ෂණයෙන් යුත් විශ්ලේෂණ මෙවලම් හරහා ආවේක්ෂණ අංශයේ කාර්යසාධනය වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර මෙමගින් විශ්ලේෂණ සහ වාර්තා කිරීමේ ක්‍රියාවලියේ ඒකාකාරී බව, සංසන්දනාත්මක බව, පුරෝකථන හැකියාව සහ අනුකූලතාව වැඩි දියුණු වේ.

තාක්ෂණික යාන්ත්‍රණ ආයෝජනය කිරීම මගින් විශාල දත්ත ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීමේ පහසුව සලසන අතර එවැනි අධිතාක්ෂණික මෙවලම් තුළින් සැක සහිත ගණුදෙනු ඉක්මනින් හඳුනාගැනීමටත්, වෙළෙඳපොළ අනාවරණයන් සමඟ ගනුදෙනු දත්ත නිවැරදිව විශ්ලේෂණය කිරීමටත් හඳුනාගත් සැක සහිත ගණුදෙනු කටයුතු වලට අදාළ කරුණු කාර්යක්ෂමව ලේඛනගත කිරීමටත් සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.



ප්‍රභාෂ් වනිගතුංග මහතා
අධ්‍යක්ෂ, ආවේක්ෂණ කටයුතු

විමර්ශනය

යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සඳහන් නියෝග, නීති සහ රීති කඩකිරීමක් හෝ උල්ලංඝණය කිරීමක් සම්බන්ධයෙන් වන චෝදනා කෙරෙහි විමර්ශණ පැවැත්වීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වගකීම වේ. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ අංශයෙන් යොමුකරන ලද ආවේක්ෂණ වාර්තාවක් හෝ ලැබුණු පැමිණිල්ලක් පදනම් කර ගනිමින් සාමාන්‍යයෙන් විමර්ශණයක් ආරම්භ කරයි. එලෙස ආවේක්ෂණ වාර්තාවක් යොමු වූ විට ඒ වෙනුවෙන් විමර්ශනයක් අවශ්‍ය වේද යන්න තීරණය කිරීම සඳහා එකී ආවේක්ෂණ වාර්තාව "ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට" (Surveillance and Investigation Committee) භාර දෙයි. විමර්ශනයක් සිදුකිරීමෙන් අනතුරුව, එකී විමර්ශන වාර්තාව අධ්‍යයනය කිරීම සඳහා මෙන්ම කොමිසම වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ආවේක්ෂණ හා විමර්ශන කිමිටුවට භාර දෙයි.



අයන්ති අබේවික්‍රම මහත්මිය
අධ්‍යක්ෂිකා, නීති හා බලාත්මක සහ වැඩබලන අධ්‍යක්ෂිකා, විමර්ශන



මධුගයනි බලපිටිය මෙනවිය
සහකාර අධ්‍යක්ෂිකා, විමර්ශන කටයුතු



ඩී එම් ජී ප්‍රියන්ත මහතා
සහකාර අධ්‍යක්ෂ, විමර්ශන කටයුතු

සොයාගනු ලැබූ සාධක හා සාක්ෂි සම්බන්ධයෙන් අවසන් ඇගයීමේදී ඒ වෙනුවෙන් කමිටුවට සහාය දැක්වීම සඳහා උපදේශකයින් ලෙස කටයුතු කරන නීතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ටද ආරාධනා කරයි. පසුව ආවේක්ෂණ හා විමර්ශන කමිටුවේ නිර්දේශ සමඟ අදාළ විමර්ශන වාර්තාව කොමිසම වෙත භාර දෙයි. එකී වාර්තා සහ නිර්දේශ පුළුල්ව සාකච්ඡා කිරීමෙන් පසුව කොමිසමේ සාමාජිකයින් විසින් ආවේක්ෂණ හා විමර්ශන කමිටුව විසින් ලබාදුන් නිර්දේශ පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම, හෝ වෙනස් කිරීම සිදු කරනු ලබයි. ඉන් පසුව කොමිසම විසින් ලබාදුන් තීරණය ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධි විධාන අනුව යම් වරදක් කර ඇති බැව් අනාවරණය වූ විට, එකී වරද සිදුකළ පාර්ශවයට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන්නේ අදාළ විමර්ශන වාර්තාව මත කොමිසම විසින් ගනු ලැබූ තීරණ පරිදිය.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටේ පවතින අභියෝගකාරී වාතාවරණය යටතේ පවා, 2020 වසර තුළදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශන 11 ක් අවසන් කරන ලදි. අවසන් කරන ලද විමර්ශන අතුරින්, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සහ/හෝ වෙනත් නියාමන අවශ්‍යතා සඳහා යොමුකිරීමට කොමිසම විසින් තීරණය කරන ලද විමර්ශන සංඛ්‍යාව හතකි. විමර්ශනයට ලක් වූ පුද්ගලයින් විසින් වරදක් කර ඇති බැව් සොයා ගනු ලැබූ සාක්ෂි මගින් සනාථ කිරීමට නොහැකිවීම හේතුවෙන් ඉතිරි විමර්ශන හතර බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග නොමැතිව අවසන් කරන ලදි.

සළකා බලන වසර තුළ පහත සඳහන් ක්‍රියාමාර්ගද ගන්නා ලදි.

ව්‍යාජ සහ නොමඟ යවනසුළු වෙළෙඳපොළක් (Market Manipulation) ඇති කිරීම සම්බන්ධයෙන් වූ චෝදනාවක් වෙනුවෙන් පවත්වන ලද විමර්ශනයත් පාදකව, නියමිත බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට පෙරාතුව අදාළ පුද්ගලයින් පස් දෙනෙකුට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) යොමු කරන ලදි.

විමර්ශනයක් සම්බන්ධයෙන් සාක්ෂි ලබාදීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටි පුද්ගලයන් දෙදෙනෙකුට එරෙහිව නඩු කටයුතු ගොනු කරන ලදි. තවද, මහබැංකුව යටතේ අදාළ නිරීක්ෂණ යොමු කරන ලද්දේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහාය. එසේම, නියමිත පරීක්ෂණයකින් පසුව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා තැරැව්කරුවන් දෙදෙනෙකු සම්බන්ධ නිරීක්ෂණ

කොළඹ කොටස් හුවමාරුව වෙත යොමු කරන ලදි. ඊට අමතරව, පෙර විකුණුම් (Front Running) නැමති චෝදනාව මත සිදුකරන ලද විමර්ශනයක් පාදකව යම් ආයෝජකයෙකුට ඔහුගේ ආචාර සම්පන්න නොවන හැසිරීම සම්බන්ධයෙන් අනතුරු හඟවන (Cautioned) ලදි. එසේ සිදු කරන ලද්දේ ඔහුගේ විශ්වාසනීය යුතුකම (Fiduciary Duties) උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන අතර, ඔහුගේ සේවායෝජකයාවද ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන ලදි.

බලාත්මක කිරීමේ ක්‍රියා

කොමිසමේ නිර්දේශ සහ තීරණ මත ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි.

නඩුකර පැවරීමේ ලිපි හා හේතු දැක්වීමේ ලිපි නිකුත් කිරීම

- අදාල පාලක සමාගම අයත් සමාගම් සමූහයට සම්බන්ධ ගිණුම් කීපයක් මගින් ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 13 හා 14 රීතීන් උල්ලංඝණය කරමින් සිදුකර ඇති යම් යම් අයුතු ලෙස හැසිරවීමේ වෙළෙඳාම් සම්බන්ධව ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තමාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග නොගත යුත්තේ ඇයිද යන්න පැහැදිලි කරන ලෙසට, එක්තරා පාලක සමාගමක සභාපති/ප්‍රධාන විධායක නිලධාරී වෙත හේතු දැක්වීමේ ලිපියක් නිකුත් කෙරිනි.
- ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, අස්වාභාවික හැසිරීමක් ලෙස සලකනු ලැබූ හා එක්තරා ලයිස්තුගත සමාගමක කොටස් වල මිලෙහි සැලකිය යුතු ඉහළයාමක් ඇති කිරීමට හේතුවූ ආකාරයේ අසාමාන්‍ය වෙළෙඳාම් රටාවක් සම්බන්ධයෙන් තම තමාට විරුද්ධව ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග නොගත යුත්තේ ඇයිද යන්න පැහැදිලි කරන ලෙස හඳුනාගත් ආයෝජකයන් නම දෙනෙකුට නඩුකර පැවරීමේ ලිපි/හේතු දැක්වීමේ ලිපි නිකුත් කෙරිනි.

අවවාද ලිපි නිකුත් කිරීම

එක් කොටසේ සිට 100 ට අඩු කොටස් සංඛ්‍යාවක් දක්වා ඇතුළත් වන මිළදී ගැනීමේ ඇණවුම් යොදාගනිමින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කොටස් වල මිලෙහි අයුතු ලෙස අස්ථාවරභාවයන්/වෙනස්කම් ඇතිවීමට සැලැස්වීම් වලට එරෙහිව හඳුනාගත් ආයෝජකයන් නම දෙනෙකුට අවවාද කිරීමේ ලිපි නිකුත් කෙරිනි.

නීති කෘත්‍ය

(අ) ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව එම්. අයි. සම්සුදීන් සහ එම්. බී. නිසාර් - MC S/5322/17

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළෙඳපොල/මිළ හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ වෙළෙඳපොල/මිළ හැසිරවීමට ක්‍රියා කිරීම සම්බන්ධව එම්. ඉමිතියාස් සම්සුදීන් සහ බාෆික් නිසාර් යන අයට එරෙහිව ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදී.

මෙම නඩුව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතී.

(ආ) තාලිබ් තවුෆික් අල් නකීබ් එරෙහිව ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොල - WP/HCCA/LA/158/2017 / WP/HCCA/CCL 175/2017(F)

ලයිස්තුගත නොකළ සමාගමක කටයුතු සම්බන්ධව විමර්ශනයක් කිරීමට ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොලට එරෙහිව නියෝගයක් ලබා ගැනීම සඳහා පෙත්සම්කරු විසින් කොළඹ දිසා අධිකරණයේ ඉල්ලීමක් ගොනු කරනු ලැබීය.

ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොලට එරෙහිව තාලිබ් තවුෆික් අල් නකීබ් විත් ගොනු කළ DSP/20/2016 යන නඩුවට අදාලව ගරු කොළඹ දිසා විනිසුරු වරයා විසින් ලබාදුන් තීන්දුවට එරෙහිව පෙත්සම්කරු විසින් මහාධිකරණයේ ඉල්ලීමක් ගොනු කර ඇත.

(ඇ) මැග්පෙක් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් එරෙහිව ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව - HCMCA 217/2007

ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති උල්ලංඝනය කරමින් යම් වැදගත් කරුණු වහාම හෙළි නොකිරීම සම්බන්ධව වරදකරුවන් කෙරුන මෙම නඩුවේ චූදිතයන්ගෙන් හතර දෙනෙක් ගරු මහේස්ත්‍රාත් වරයා විසින් ලබාදුන් තීන්දුව සහ සිරදඬුවමට එරෙහිව පළාත්බද මහාධිකරණයට අභියාචනා කර ඇත. අභියාචනයේදී, චූදිතයන් තුන්දෙනෙකුට අදාලව අධිකරණය විසින් ලබාදී තිබූ තීන්දු නැවත තහවුරු කෙරූ නමුත් දණ්ඩනය ලිහිල් කරන ලදී. හයවන චූදිත අභියාචනාකරු වරදකරු කිරීම සහ දඬුවමට ට එරෙහිව අභියාචනය කොළඹ මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

(ඈ) ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව ලංකා කන්නංගර, කපිල සෙනරත්, ෆාරික් ෆුර්කාන් සහ රවීන්ද්‍ර මල්ලවආරච්චි MC/කොටුව/13736/19

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදවල් වන වෙළෙඳපොළ අයතා හැසිරවීම, වෙළෙඳපොළ අයතා හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම හා ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශක වරුන් හතර දෙනෙක්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී.

මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

(ඉ) ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව ඩබ්.කේ.එච්. වැගපිටිය, තිලක් ද සිල්වා හා තක්ෂිල හුලන්ගමුව MC/ කොටුව /16967/20

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළෙඳපොල අයතා හැසිරවීම, වෙළෙඳපොල අයතා හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ ආධාර හා අනුබල දීම සම්බන්ධව ඉහත සඳහන් පුද්ගලයන්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී.

මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

මෙහෙයුම් සමාලෝචනය

(ඊ) ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව සේන යද්දෙහිගේ සහ එස්. තිනාමනි - MC/කොටුව/12639

සේන යද්දෙහිගේ එරෙහිව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව CA/රිට්/417/2017

සේන යද්දෙහිගේ එරෙහිව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව SC/SPL/LA 100/19

දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 36 දරණ සංශෝධිත ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 32 වන වගන්තිය උල්ලංඝණය කරමින් අභ්‍යන්තරික වෙළඳාම සිදුකිරීම සහ එයට ආධාර සහ අනුබල දීම සම්බන්ධයෙන් පිළිවෙලින් ආචාර්ය සේන යද්දෙහිගේ හා සුබ්‍රමණියම් තිනාමනි යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබිනි. ගරු මහේස්ත්‍රාත් වරයා විසින් එකී පුද්ගලයන් වෙත සිතාසි නිකුත් කරන ලදී. අනෙකුත් දෑ අතර මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩු කටයුතු අත්හිටුවීමට ඉල්ලමින් පළමු චූදිතයා විසින් ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව අභියාචනාධිකරණයේ රිට් අයදුම්පතක් ගොනු කරන ලදී.

එහිදී අභියාචනාධිකරණය තීන්දුව ලබා දෙමින් මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පැවැත්වෙන නඩු කටයුත්ත අත්හිටුවීම ප්‍රතික්ෂේප කළ අතර නොතීසි නිකුත් කිරීම මත ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේය.

ඉන් අනතුරුව චූදිතයා විසින් රිට් අයදුම්පත සම්බන්ධව අභියාචනාධිකරණය ලබාදුන් තීන්දුව අභියෝගයට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට අයදුම් කිරීමට විශේෂ අවසරයක් ඉල්ලන ලදී. මෙහිදී පෙත්සම්කරු විසින්, දිවුරුම් සහ තහවුරු කිරීමේ ආඥා පනත හා 1981 කොන්සල් කාර්‍යයන් පිළිබඳ පනතට අනුව අදාල දිවුරුම් ප්‍රකාශය නිසි පරිදි ගොනු කර නැතැයි යන පදනමින් ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මූලික විරෝධතාවයක් දක්වන ලදී.

12 වන වගන්තිය අනුව සහ අනුව ආචාර්ය යද්දෙහිගේ විසින් වලංගු දිවුරුම් ප්‍රකාශයක් අධිකරණයට ගොනු කර නැති බවට වන විරෝධතාවය දක්වන ලදී. ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තවදුරටත් පෙන්වා සිටියේ අනුකූල නොවන බවයි. ඒ අනුව ඉදිරිපත් කෙරුනේ අදාල අවසරය ලබාදීමට අධිකරණය හමුවේ නිසි අයදුම්පතක් ගොනුවී නොමැති බවයි. ඉදිරිපත් වූ මූලික විරෝධතාවය සම්බන්ධයෙන් නියෝගය අධිකරණය නියෝගය කල් තැබූ අතර මහේස්ත්‍රාත් අධිකරණයේ හා අභියාචනාධිකරණයේ පවතින නඩු කටයුතු, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ලැබෙන තෙක් අත්හිටුවන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව තවමත් ලැබීමට ඇත.

(උ) ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව දනුශ්‍රා ගුලාම්හුසෙයින් - MC කොටුව/17599/20

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව සන්දනම් රාජු MC කොටුව /17600/20

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන විමර්ෂණයක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා සටහන් කරගැනීමට කැඳවූ විට ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටීම හේතුවෙන් ඉහත සඳහන් පුද්ගලයින්ට එරෙහිව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නඩු පවරන ලදී.

අදාල නඩු අධිකරණයේ විභාග වෙමින් පවතී.

(ඌ) නාගරික සංවර්ධන අධිකාරිය එදිරිව ඔනාල් හෝල්ඩින්සි පීඒල්සී - HC (සිවිල්)/11/2021/CO

මෑතකදී ඔනාලි හෝල්ඩින්සි ලයිස්තුගත පොදු සමාගමේ අයිත්ය අත්පත්කරගනු ලැබූ වෙනත් ලයිස්තුගත පොදු සමාගමක කොටස් අයිතිය හේතුවෙන් සිදුවී ඇති ඔනාල් සමාගමේ පාලනයේ සැලකිය යුතු වෙනස්කම් නිසා ඔනාලි සමාගමේ කටයුතුල සමාගමට අගතිදායී අන්දමින් සිදුකෙරෙන බවට චෝදනා කරමින් ඔනාලි සමාගමේ බහුතර කොටස් හිමියෙක් වන නාගරික සංවර්ධන අධිකාරිය විසින්, සමාගම් පනතේ 226, 520 හා 521 වගන්ති සමගද එක්ව සලකමින් එම පනතේ 225 වන වගන්තිය යටතේ ඔනාලි සමාගමට එරෙහිව මෙම නඩුව ගොනු කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඔනාලි හෝල්ඩින්සි ලයිස්තුගත පොදු සමාගම, ලංකා රියැලිටි ඉන්වෙස්ට්මන්ට්ස් ලයිස්තුගත පොදු සමාගම, රේණුකා කැපිටල් ලයිස්තුගත පොදු සමාගම, පී. ඩබ්ලිව්. කෝපරේටි සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම පිලිවෙලින් මෙම නඩුවේ 1 සිට 5 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම්කර ඇති අතර ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි 6 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇත. කෙසේ වෙතත් මෙහිදී ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව කිසිදු සහනයක් ඉල්ලා නැත.

මෙහිදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනිකුත් කරුණුද අතර පහත ඉල්ලීම් සිදුකර තිබේ;

අ. දෙවනි වගඋත්තරකාර සමාගම විසින් පළමු වගඋත්තරකාර සමාගමෙහි කොටස් 50.8% ක් මිළදීගැනීම නිසා සමාගමේ පාලනයේ ඇතිවී තිබෙන සැලකිය යුතු වෙනස හේතුවෙන් පළමු වගඋත්තරකාර සමාගමේ කටයුතු එම සමාගමට අගතිදායී ලෙස දැනටත් සිදුකෙරෙන /හෝ ඉදිරියේදී සිදුවීමට ඉඩ ඇති බවට ප්‍රකාශය කරවාගැනීම.

ආ. පෙත්සම්කරු විසින් කරනලද පැමිණිල්ලෙන් පසු ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් සිදුකරන විමර්ෂණ අවසන් වනතෙක් පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් හිමියන්ගේ මහ සභා රැස්වීමකදී පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් 43.82 ක ට වැඩියෙන් කොටස් සම්බන්ධව කිසිදු අයිතිවාසිකමක් භාවිතා කිරීමට දෙවන වගඋත්තරකාර සමාගමට අයිතියක් නොමැති බවට ප්‍රකාශය කරවාගැනීම.

ඇ. පළමු වගඋත්තරකාර සමාගම මහජන කොටස් හිමිකාරිත්වට අදාලව කොළඹ කොටස් වෙළෙඳපොළේ අඛණ්ඩ ලයිස්තුගත කිරීමේ අවශ්‍යතා සමග අනුකූල වනතුරු පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් හිමියන්ගේ මහ සභා රැස්වීමකදී පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් 43.82 ක ට වැඩියෙන් කොටස් සම්බන්ධව කිසිදු අයිතිවාසිකමක් භාවිතා කිරීමට දෙවන වගඋත්තරකාර සමාගමට අයිතියක් නොමැති බවට ප්‍රකාශය කරවාගැනීම.

ඈ. පෙත්සම්කරුගේ පැමිණිලි සම්බන්ධව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් සිදුකරන විමර්ෂණ අවසන් වනතෙක් පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් හිමියන්ගේ මහ සභා රැස්වීමකදී පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් 43.82 කට වැඩියෙන් කොටස් සම්බන්ධව කිසිදු අයිතිවාසිකමක් භාවිතා කිරීමෙන් දෙවන වගඋත්තරකාර සමාගමට වලක්වමින් අතුරු නියෝගයක් ලබාගැනීම.

ඉ. පළමු වගඋත්තරකාර සමාගම මහජන කොටස් හිමිකාරිත්වට අදාලව කොළඹ කොටස් වෙළෙඳපොළේ අඛණ්ඩ ලයිස්තුගත කිරීමේ අවශ්‍යතා සමග අනුකූල වනතුරු පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් හිමියන්ගේ මහ සභා රැස්වීමකදී පළමු වගඋත්තරකාර සමාගමේ කොටස් 43.82 ක ට වැඩියෙන් කොටස් සම්බන්ධව කිසිදු අයිතිවාසිකමක් භාවිතා කිරීමෙන් දෙවන වගඋත්තරකාර සමාගමට වලක්වමින් අතුරු නියෝගයක් ලබාගැනීම.

ඊ. පළමු වගඋත්තරකාර සමාගමේ ඕනෑම වත්කමක් බැහැර කිරීම හා/හෝ රඳවාතබාගත් යම් ඉපයීම් බෙදාහැරීමට, පළමු වගඋත්තරකාර සමාගමේ මහ සභා රැස්වීමකදී යෝජනා කිරීම, ඉල්ලීම් කිරීම හා/හෝ ඡන්දය භාවිතා කිරීමෙන් දෙවන වගඋත්තරකාර සමාගම වලක්වමින් අතුරු නියෝගයක් ලබාගැනීම.

මෙම නඩුව වාණිජ මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

(එ) SCFR අයඳුම්පත් අංක 182/2021 - ඉංජිනේරු ජී. කපිල රේණුක පෙරේරා එදිරිව නීතිපති සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඇතුළු 32 ක්

අනිකුත් කරුණුද අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ (සියළු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේද ඇතුලුව) මූලික අයිතිවාසිකම් එකක් හෝ කීපයක් උල්ලංඝණය වීමට ආසන්න බවට ප්‍රකාශයක් නිකුත් තරවා ගැනීම සඳහා සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් හා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවද (7වන වගඋත්තරකරු ලෙස) ඇතුළුව පාර්ශව 32 ක ට එරෙහිව පෙත්සම්කරු විසින් ශේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකර ඇත.

තවද, සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් (මෙය, සුදුසු ප්‍රතිව්‍යුහගතකිරීම් තුළින් රජයට අයත් සත්කාරක කළඹ ප්‍රගස්ත කාර්ය සාධන මට්ටමට පත්කිරීමේ මූලික අරමුණ ඇතිව පිහිටවනු ලැබූ නව රාජ්‍ය දේපළ සංවර්ධන සමාගමකි) පිහිටුවනු ලැබූ 2020 මාර්තු 06 දිනැති කැබිනට් තීන්දුව ශූන්‍ය හා බලරහිත බවට ප්‍රකාශනයක් ලබාගැනීමට පෙත්සම්කරු ඉල්ලුම් කරඇත.

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමට ඉඩදීමෙන් ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වලක්වමින් ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අතුරු නියෝගයක් නිකුත්කරන මෙන්ද මෙහිදී ඉල්ලා ඇත.

මෙම නඩුව ශේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී.

(ඒ) C.A. (රිට්) අයඳුම්පත් අංක 148/2021 - එම්. ඒ. සී. ඊ. මන්ත්‍රීරත්න එදිරිව ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා තවත් 14 ක්

මෙහිදී, පෙත්සම්කාරියට උසස්වීමක් ලබාදීමට, නැතිනම් විකල්ප ලෙස දැනට කළමණාකාර තනතුරට උසස් කර ඇති සේවකයාට ඉහළින් පෙත්සන්කාරිය තබමින් කළමණාකාර තනතරට උසස්කරන ලෙසට ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නියම කිරීම ඉල්ලමින් සහ එක් සේවකයෙක්ට උසස්වීමක් ලබාදීමට ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගත් තීරණයක් අවලංගු කරන ලෙස ඉල්ලමින් සර්ෂි යොරාරි හා මැන්ඩාමුස් රිට් ආඥා ලබාදෙන ලෙස අභියාචණාධිකරණයෙන් ඉල්ලමින් පෙත්සම්කාරිය විසින් අභියාචණයක් ගොනුකර ඇත.

මෙම නඩුව අභියාචණාධිකරණයේ විභාග වෙමින් පවතී.

(ඔ) SC (SPL) LA අයඳුම්පත් අංක 177/2021

පෙත්සම්කාර පන්චලිංගම් ඇසෝසියේෂන් (පුද්ගලික) සමාගම විසින්, හැටන් නැෂනල් බැංකුව ලයිස්තුගත පොදු සමාගමෙහි තම සමාගම සතුව තිබූ කොටස් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනලද යම් නියෝගයන්ට එරෙහිව සර්ෂි යොරාරි රිට් ආඥා ලබාදෙන ලෙස අභියාචණා කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩවරුන් දෙදෙනෙක් හා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඇතුළුව පාර්ශව 4 ක් මෙහි වගඋත්තරකරුවන් ලෙස නම්කර ඇත. අභියාචණාධිකරණය විසින් අදාල රිට් ආඥා ප්‍රත්ක්ෂේප කිරීමෙන් අනතුරුව පෙත්සම්කාර සමාගම විසින් ශේෂ්ඨාධිකරණයට අභියාචනා කිරීමට විශේෂ අවසරයක් ලබාගැනීමට ඉල්ලුම් කර ඇත. ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් මෙහිදී කිසිදු සහනයක් ඉල්ලා නැත.

මෙම නඩුව ශේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී.

පැමිණිලි විසඳීමේ ක්‍රමය

ලයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සහ එයට ලබාදුන් විසඳුම් පහත දක්වා ඇත. (සංඛ්‍යා සටහන 10)

සංඛ්‍යා සටහන 10: ලයිස්තුගත සමාගම්වලට අදාළ පැමිණිලි සහ කාරණා පිළිබඳ කටයුතු

පැමිණිල්ලේ ස්වභාවය	පැමිණිලි ගණන	ගනු ලැබූ පියවර/වත්මන් තත්ත්වය
ලයිස්තුගත පොදු සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩල සම්බන්ධව	3	කාරණා යෝග්‍ය පරිදි විසඳන ලදි
ලයිස්තුගත සමාගම් සම්බන්ධව	6	කාරනා 6 ක් යෝග්‍ය පරිදි විසඳන ලදි
ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි නීති/රීතීන්ට අනුකූල නොවීම	3	කාරනා 6 ක් යෝග්‍ය පරිදි විසඳන ලදි
වෙනත් පරිපාලන කාරණා සම්බන්ධව	5	කාරනා 5 ක් යෝග්‍ය පරිදි විසඳන ලදි
අදාළ මූල්‍ය වාර්තාකරන රාමුවලට අනුකූල නොවීම සම්බන්ධව	1	එක් කාරණාවක් යෝග්‍ය පරිදි විසඳන ලදි.
එකතුව	18	කාරනා 18 ක් යෝග්‍ය පරිදි විසඳන ලදි

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

ප්‍රාග්ධන වෙළෙඳපොළ යනු ආර්ථිකයේ දිගුකාලීන අරමුදල් සම්පාදනයට සහ වෙන් කිරීමට එක්ව ක්‍රියා කරන ආයතන සහ යටිතල පහසුකම් වලින් සමන්විත අත්‍යවශ්‍ය නියෝජිතයෙකි. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රධාන වශයෙන් වෙළෙඳපොළ සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීම සහ වෙළෙඳපොළ සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම හරහා ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීමේ නිරත වේ. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පහසුකම් සපයන ලද ප්‍රධාන වෙළෙඳපොළ සංවර්ධන කාර්යයන් පහත දක්වා ඇත.

මෙහෙයුම් සමාලෝචනය



ප්‍රභාෂ් වනිගතුංග මහතා
අධ්‍යක්ෂ, ආවේක්ෂණ සහ වැඩබලන අධ්‍යක්ෂ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන



තක්ෂිලා ෆ්‍රැන්සිස් මහත්මිය
කළමනාකාරිනී - ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන

කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ඩිජිටල් පරිවර්තනය

සෑම කෙනෙකුටම ඕනෑම තැනක සිට ප්‍රාග්ධන වෙළෙඳපොළවල් වෙත ළඟා විය හැකි පුළුල් ප්‍රවේශයක් සහිත ඩිජිටල් වෙළෙඳපොළ ස්ථාන බවට පරිණාමය වෙමින් පවතින අතර අනාගත ආයෝජකයින් සඳහා වැඩි පහසුවක් ලබා දෙයි. මේ අනුව, කොටස් වෙළෙඳපොළ මෙහෙයුම්වල අවසානය දක්වා ඩිජිටල්කරණය කිරීම පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ කොටස් හුවමාරුවෙහි නියෝජිතයන්ගෙන් සමන්විත ඒකාබද්ධ කමිටුවක් පත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ඩිජිටල් පරිවර්තනය ආරම්භ වූ අතර එය අදියර තුනකින් නිම කිරීමට බලාපොරොත්තු වේ. එහි පළමු අදියර අවසන් කර 2020 සැප්තැම්බර් 17 වන දින ගරු අග්‍රාමාත්‍ය තුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

අදියර 2: 2021 ජූලි 7 වැනි දින සම්පූර්ණ කරන ලදී

ඩිජිටල්කරණ වැඩසටහනේ පළමු අදියර සාර්ථකව දියත් කිරීමත් සමඟ, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව දෙවන අදියර ආරම්භ කරන ලද අතර එය 2021 ජූලි 7 වන දින අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී දියත් කරන ලදී.

දෙවන අදියර අවසන් වීමත් සමඟ, කොටස් තැරැව්කරුවන් හරහා දේශීය සමාගම්වලට CDS ගිණුම් විවෘත කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ජංගම යෙදුම (CSE Mobile App) භාවිතා කිරීම, CDS E-connect, විද්‍යුත් මූලික කොටස් නිකුතු - E-Initial Public Offerings (E-IPOs) වැනි නව විශේෂාංග රැසක් සක්‍රීය කර ඇත. ගිණුම් විවෘත කිරීම සහ ආයෝජන කළඹ තොරතුරු සහාය ලබා දීමෙන් පරිශීලක අත්දැකීම වැඩි දියුණු කිරීමට අළුතින් හඳුන්වාදුන් "chatbot" සහ "google Assistant" වැනි විශේෂාංග හරහා හැකියාව ලැබී ඇත. අදියර 2 යටතේ සම්පූර්ණ කරන ලද ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුළින් වැඩි පහසුවක් ලබා දීමෙන් ආයෝජකයින්ට ප්‍රධාන වශයෙන් ප්‍රතිලාභ ලබා දෙන අතර CDS E-connect ආයෝජකයින්ට වෙනත් ප්‍රතිලාභ රැසක් සමඟින් ලොව ඕනෑම තැනක සිට ඔවුන්ගේ ආයෝජන කළඹ අන්තර්ජාලය හරහා නැරඹිය හැකිය. මීට අමතරව, IPO සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කිරීමේ හැකියාව, පර්යේෂණ වෙබ් පිටුව හරහා පර්යේෂණ වාර්තා වෙත ප්‍රවේශය සහ අනෙකුත් ආර්ථික දර්ශක වැනි පාර්ශවකරුවන්ට තවත් බොහෝ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබී තිබේ.

අදියර 3:

අදියර 2 සාර්ථකව නිම කිරීමෙන් පසු, ඩිජිටල්කරණ ක්‍රියාවලියේ 3 වන අදියර සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ ඩිජිටල් දියුණුව ඇති කිරීමට උත්සාහ දරා ඇත.

ඩිජිටල්කරණ ක්‍රියාවලියේදී අදියර 3 හි කොටසක් ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත සඳහන් පරිදි වේ:

- විදේශීය පුද්ගලයින් සහ විදේශීය සමාගම් (කොටස් තැරැව්කාර සමාගම් සහ භාරකාර බැංකු හරහා) ඇතුළත් කිරීම
- E-Connect විශේෂාංග:
  - වාර්තා ඉල්ලා සිටීමේ පහසුකම
  - මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS)/කොටස් තැරැව්කරුවන් වෙත තොරතුරු ඉල්ලීම් යැවීම (පණිවිඩ යැවීම)
  - ලාභාංශ/අයිතිවාසිකම් නිකුතු සහ අනෙකුත් ආයතනික ක්‍රියා වැනි ආයතනික ක්‍රියා ඇඟවීම්
  - පුද්ගලික කොටස් පැවරීම් (අර්ථලාභී අයිතිය වෙනස්වීම් / තෑගි / ආන්තික වෙළෙඳාම්)
- විද්‍යුත් හිමිකම් නිකුතුව
- විද්‍යුත් නැවත මිලදී ගැනීම/අනිවාර්ය අර්පණයන්
- "ප්‍රතිචාර කාර්යක්ෂමතාව" මත තැරැව්කාරුවන් ශ්‍රේණිගත කිරීම
- ආන්තික වෙළෙඳාම (පාරිභෝගිකයින් ඇතුළත් කිරීම/වත්කම් පන්ති අතර බාධාවකින් තොරව අරමුදල් මාරු කිරීම)

ගෙවීම් වලට එදිරිව පියවීමේ හා (DVP) සහ වැඩිදියුණු කළ ආන්තික පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම

වෙළෙඳපොළේ පවතින පශ්චාත් වෙළෙඳ අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුවෙහි ගෙවීම් වලට එදිරිව පියවීමේ යාන්ත්‍රණයක් සහ වැඩිදියුණු කළ ආන්තික ආකෘතියක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසා ඇත. ඒ සඳහා අනුමැතිය ලබා ගත් අතර, එම ආකෘතිය ක්‍රියාත්මක කිරීමට කොළඹ කොටස් වෙළෙඳපොළට උපදෙස් දෙන ලදී. මෙම ක්‍රියාවලිය තිබෙන ඉහළ තාක්ෂණික ස්වභාවය සැළකිල්ලට ගනිමින්, ක්‍රියාවලියට උපදේශන සේවා සැපයීම සඳහා ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ විශේෂඥයෙකු පත් කරන ලදී.

පසුව, ආන්තික ආකෘතියට සංශෝධන සිදු කරන ලෙස තැරැව්කාර සමාගම් සහ කොළඹ කොටස් හුවමාරුව විසින් ඉල්ලීමක් කරන ලද අතර විශේෂඥයා සමඟ සාකච්ඡා කර යෝජිත සංශෝධන සමාලෝචනය කර විශ්ලේෂණය කරන ලදී. ගෙවීම් වලට එදිරිව පියවීමේ යාන්ත්‍රණයට විශේෂඥයා විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව සහ නිෂ්කාශනය සහ නිරවුල් කිරීම සඳහා අදාළ වන ජාත්‍යන්තර හොඳම භාවිතයන් සැළකිල්ලට ගනිමින්, සංශෝධිත ආන්තික ආකෘතිය සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, කොළඹ කොටස් හුවමාරුවය විසින් ගෙවීම් වලට එදිරිව පියවීමේ යාන්ත්‍රණයක් සහ ආන්තික ආකෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. 2021 අගෝස්තු 16 වැනි දින මෙම ගෙවීම් වලට එදිරිව පියවීමේ පද්ධතිය සහ ආන්තික ආකෘතිය සජීවීව ක්‍රියාත්මක වූ අතර කොළඹ කොටස් හුවමාරුව වෙත ප්‍රතිපත්ති මට්ටමේ මග පෙන්වීමක් සපයමින් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වේගයෙන් නිරීක්ෂණය කළේය.

සිදුවිය හැකි පියවීම් අසාර්ථක වීම සඳහා කොටස් තැරැව්කාර සහභාගිවන්නෙකු විසින් ක්‍රියාත්මක කළ යුතු අතුරු යාන්ත්‍රණය සිදුවිය හැකි පියවීම් අසාර්ථක වීමේ අවදානම කළමනාකරණය කිරීමේ අතුරු පියවරක් ලෙස, පියවීම් සහතික කිරීමේ අරමුදලේ (SGF) භාරකරුවන් එකඟ වූ තැරැව්කාර සමාගම් සඳහා එක් දින ණය පහසුකමක් ලබා දීමට කොළඹ කොටස් හුවමාරුව යෝජනා කළේය. කොමිෂන් සභාව විසින් ද එය අනුමත කරන ලදී.

කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළින් බැහැර ගණුදෙනු පුවරුව හරහා (OTC) කඩදාසි රන් (PG) හඳුන්වාදීම

රත්‍රන් සුරක්ෂිතම ආයෝජන වත්කම් පන්තියක් ලෙස සලකනු ලබන අතර කඩදාසි රත්‍රන් වෙළෙඳාම් කිරීම පහසු කිරීම සඳහා පාර්ශවකරුවන්ගෙන් යෝජනා ලැබී ඇත. කොළඹ කොටස් හුවමාරුවෙහි OTC පුවරුව හරහා කඩදාසි රත්‍රන් වෙළෙඳාම් කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දුන්නේය. වර්තමානය වන විට කඩදාසි රත්‍රන් ගණුදෙනු කිරීමේ පුවරුවක් හඳුන්වාදීමේ ක්‍රියාවලිය කොළඹ කොටස් හුවමාරුව විසින් අවසන් කරමින් පවතින අතර එමගින් නව ආයෝජන වත්කම් පන්තියක් සැපයීමට සහ රජයට නව බදු ආදායම් මූලාශ්‍රයක් උත්පාදනය කිරීමට අපේක්ෂා කරයි.

විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීමේ යෝජනාව (SPACs)

වෙළෙඳපොළට තුළ නව ලැයිස්තුගත කිරීම් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැළසීම අරමුණු කර ගනිමින් තවදුරටත් පුළුල් පදනම් සහිත ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා හඳුන්වා දෙමින්, කොළඹ කොටස් හුවමාරුව සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් ලයිස්තුගත කිරීමට පහසුකම් සැළසීම සක්‍රීය කිරීමේ ප්‍රතිපත්ති රාමුව අවසන් කර ඇත.

විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් යනු දැනට පවතින මෙහෙයුම් හෝ ඒ යටතේ පවතින ව්‍යාපාර කටයුතු නොමැති අලුතින් සංස්ථාපිත සමාගමක් වන අතර එය එක් අයෙකු හෝ අනුග්‍රාහකයින් කණ්ඩායමක් විසින් ආරම්භ කරන ලද, ප්‍රසිද්ධ ව්‍යවසායකයින්, පුද්ගලික කොටස් හිමියන් හෝ කර්මාන්තයේ ප්‍රවීණයන් වන අතර අත්පත් කර ගැනීම් එකක් හෝ කිහිපයක් සිදු කිරීමේ අරමුණ ද ඇත. අපේක්ෂිත සමාගම අත්පත් කර ගැනීමෙන් පසු, සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම සමඟ ඒකාබද්ධ කෙරෙන අතර ඒකාබද්ධ කරන ලද ආයතනය කොළඹ කොටස් හුවමාරුවෙහි සාමාන්‍ය ලයිස්තුගත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් ලැයිස්තුගත කිරීම පහසු කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇති අතර කොළඹ කොටස් හුවමාරුව විසින් විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් හඳුන්වාදීම සඳහා වන නියාමන ප්‍රතිපත්තිය දැනට අවසන් කරමින් සිටී.

කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළින් බැහැර ගණුදෙනු පුවරුව හරහා (OTC) සාංගමික ණය සුරුකුම්පත් මත ප්‍රතිම්ලදී ගැනීමේ ගිවිසුම (REPO) ගනුදෙනු පුළුල් කිරීම

කොළඹ කොටස් හුවමාරුව හරහා සාංගමික ණය වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා, ඒකක භාර සංගමය සහ ඇතැම් වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් කොළඹ කොටස් හුවමාරුවෙහි OTC පුවරුව හරහා සාංගමික ණය සුරුකුම්පත් සඳහා ප්‍රතිම්ලදී ගැනීම් සම්බන්ධ ගනුදෙනු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලෙස කොළඹ කොටස් හුවමාරුව වෙතින් ඉල්ලා සිටියේය. ඒ අනුව, කොළඹ කොටස් හුවමාරුව විසින් OTC පුවරුව හරහා සාංගමික ණයකරවල ප්‍රතිම්ලදී ගැනීම් සඳහා පහසුකම් සැළසීමේ යෝජනාවක් ඉදිරිපත් කරන ලද අතර එය සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචනය කර තවදුරටත් වැඩිදියුණු කරන ලදී. එය පුළුල් කිරීමේ අවසාන ප්‍රතිපත්තිය කොළඹ කොටස් හුවමාරුව සමඟ ඒකාබද්ධව අවසන් කරන ලද අතර එවැනි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව වෙත ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙන ලදී. පසුව, එයට පහසුකම් සැළසීම සඳහා මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි නීති සංශෝධන අනුමත කරන ලදී. එනිසා, OTC පුවරුවේ සාංගමික ණයකරවල ප්‍රතිම්ලදී ගැනීමේ වෙළෙඳාම් ලියාපදිංචිය පුළුල් කර ඇත.

සුරුකුම්පත් ණයට ගැනීම සහ ණයට දීම හරහා ආවරණය කරන ලද කෙටි විකුණුම් හඳුන්වාදීමට පහසුකම් සැලසීම

කොළඹ කොටස් හුවමාරුවෙහි ගෙවීම් වලට එදිරිව පියවීමේ (DVP) ක්‍රමයක් සහ වැඩි දියුණු කළ ආන්තික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව, කාර්යක්ෂම මිල සොයාගැනීම්, ඉහළ වෙළෙඳපොළ ද්‍රවශීලතාවය සහ වඩා හොඳ හෙජින් අවස්ථා සඳහා සුරුකුම්පත් ණයට ගැනීම සහ ණය දීම හරහා ආවරණය කරන ලද කෙටි විකුණුම් හඳුන්වාදීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. කොමිෂන් සභාව මෙම කාර්යය සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇති අතර දැනට, සුරුකුම්පත් ණයට ගැනීම සහ ණයට දීම හරහා ආවරණය කරන ලද කෙටි විකුණුම් සක්‍රීය කිරීමේ ප්‍රතිපත්තිය ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය (FSMP) යටතේ පත් කරන ලද ගෙවීම් වලට එදිරිව පියවීමේ (DVP) ක්‍රමයෙහි විශේෂඥයාගේ තාක්ෂණික යෙදවුම් යටතේ කොළඹ කොටස් හුවමාරුව සමඟ ඒකාබද්ධව අවසන් වෙමින් පවතී.

හරිත බැඳුම්කර හඳුන්වාදීමට පහසුකම් සැලසීම

හරිත බැඳුම්කර යනු පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂමතාව, තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණය, තිරසාර ඉඩම් භාවිතය (වන වගාව සහ කෘෂිකර්මය), ජෛව විවිධත්වය, පිරිසිදු ප්‍රවාහනය, පිරිසිදු ජලය සහ දේශගුණික හෝ වෙනත් පාරිසරික ප්‍රතිලාභ ජනනය කරන හරිත ව්‍යාපෘති සඳහා පමණක් ආයෝජනය කරන නව මූල්‍ය උපකරණ වේ. සමස්ත ප්‍රාග්ධන වෙළෙඳපොළට ප්‍රතිලාභ සැලසීමට අමතරව, පාරිසරික ආරක්ෂාව සහ රටේ තිරසාර ආර්ථික සංවර්ධනය සඳහා ද මෙම හඳුන්වාදීම දායක වනු ඇත. කොමිෂන් සභාව මෙම කාර්යය සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇති අතර ඒ සඳහා සහාය වීමට අප ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින් තාක්ෂණික සහාය ලබාගෙන ඇත. කොළඹ කොටස් හුවමාරුව විසින් හරිත බැඳුම්කර හඳුන්වාදීම පිළිබඳ නියාමන ප්‍රතිපත්ති පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර එය සමාලෝචනය කර තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන හඳුන්වාදීම

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් සැකසීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර එමගින් ආයෝජකයින්ට ඉස්ලාමීය මූලධර්මවලට අනුකූලව නිකුත් කරන ලද සහ සාධාරණ ප්‍රතිලාභ බෙදාහැරීමේ උපකරණවල ආයෝජනය කිරීමෙන් ඔවුන්ගේ ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීමට හැකියාව ලැබෙ.

- තවද, මෙම මූලපිරීම ඉස්ලාමීය මූලධර්මවලට අනුකූලව අරමුදල් රැස් කිරීමට උනන්දුවක් දක්වන නිකුත් කරන්නන්ට ඔවුන්ගේ නිකුත් කිරීම් ඉදිරියට ගෙන යාමට අවස්ථාව සලසා දෙනු ඇත.
- මේ සම්බන්ධයෙන්, ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් සකස් කිරීම සඳහා අපි ADB වෙතින් තාක්ෂණික සහාය ලබාගෙන ඇත.
- ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති සලකා බැලීම් ආවරණය වන පරිදි හරස් නීති විශ්ලේෂණයක් සිදු කර ඇත.
- ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඒ සඳහා ප්‍රතිපත්ති රාමුවක් සකස් කරන ලෙස කොළඹ කොටස් හුවමාරුවෙන් ඉල්ලා සිටි අතර ට පිළිබඳව කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් පසු වේ.
- ADB වෙතින් ආරක්ෂිත තාක්ෂණික සහාය ලබාගෙන පවරා ඇති උපදේශකයින් සමඟ වැඩ ආරම්භ කිරීම.

මෙහෙයුම් සමාලෝචනය

- පාර්ශවකරුවන්ගේ රැස්වීම් සඳහා පහසුකම් සැළසීම සහ මූලික තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු, එය සමාලෝචනය කර ආසියානු සංවර්ධන බැංකුව සමඟ අදහස් හුවමාරු කර ගන්නා ලදී.
- උපදේශකයින්ගෙන් හඳුනාගත් ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන සම්බන්ධයෙන් නීති කෙටුම්පත් බලාපොරොත්තුවෙන් සිටී.

ව්‍යුහගත බලපත්‍ර හඳුන්වාදීම

සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ව්‍යුත්පන්න වෙළෙඳපොළේ දියුණුව සඳහා විය හැකි පළමු පියවරක් ලෙස ව්‍යුහගත බලපත්‍ර හඳුන්වාදීම සඳහා වන ප්‍රතිපත්ති සහ නියාමන රාමුව සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියෙහි ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යෙදී සිටී. ව්‍යුහගත බලපත්‍ර මඟින් දැනට පවතින ආයෝජන උපකරණ කළඹ පුළුල් කිරීම ඇතුළු විවිධ ප්‍රතිලාභ ගෙන ඒම සඳහා ආයෝජකයින්ට තම මුදල් ආයෝජනය කළ හැකි නිෂ්පාදන පරාසයක් ඇත. මෙය වෙළෙඳපොළ තුළ දේශීය හා විදේශීය ආයතනික ආයෝජකයන්ගේ විවිධ තෝරාගැනීම් සඳහා දායක වනු ඇත.

මේ සම්බන්ධයෙන්, ව්‍යුහගත බලපත්‍ර හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් සකස් කිරීම සඳහා අපි ADB වෙතින් තාක්ෂණික සහාය ලබාගෙන ඇත. එබැවින්, මෙවැනි උපකරණ සඳහා වෙළෙඳපොළ අවශ්‍යතාවය මෙන්ම වෙළෙඳපොළ සූදානම තක්සේරු කිරීම සඳහා මූලික වටයේ පාර්ශ්වකරුවන්ගේ උපදේශන සාකච්ඡාවක් පවත්වන ලදී. උපදේශන අතරතුර විවිධ පාර්ශ්වකරුවන් විසින් ලැබුණු ධනාත්මක ප්‍රතිපෝෂණ මත පදනම්ව, ව්‍යුහගත වරෙන්තු හඳුන්වාදීම සඳහා කෙටුම්පත් මාර්ගෝපදේශ සකස් කරන ලද අතර එයම කොළඹ කොටස් හුවමාරුව සමඟ බෙදාගෙන ඇත. කොළඹ කොටස් හුවමාරුව වෙතින් අදහස් ලැබීමෙන් පසු, පාර්ශ්වකරුවන්ගේ අදහස් සඳහා එම උපදේශ කර්මාන්තය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කොළඹ කොටස් හුවමාරුවෙහි ශ්‍රී ලංකාවේ ස්ථාපිත/සංස්ථාපිත ආයතන විසින් නිකුත් කරන ලද විදේශ මුදල් වටිනාකම් සහිත සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම, වෙළෙඳාම් කිරීම සහ පියවීම සඳහා පහසුකම් සැළසීම.

විදේශ මුදල් වලින් යුත් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම, ගණුදෙනු කිරීම සහ බේරුම්කරණයන් සිදු කිරීම සඳහා පහසුකම් සැළසීමේ යෝජනාව කොළඹ කොටස් හුවමාරුව වෙතින් ලැබීමත් සමඟ මුදල් අමාත්‍යාංශය (MoF) සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සමඟ සාකච්ඡා කිරීමට අදාළ කරුණු ඉස්මතු කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීමට පියවර ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියේය. එබැවින්, කොළඹ කොටස් හුවමාරුවේ යෝජනාව තුළින් මතු වී ඇති කරුණු විසඳීමට සහ ක්‍රියාවලිය පහසු කිරීමට මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සක්‍රීය කර ඇත. ඒ අනුව, ඒ අනුව විදේශ මුදල් වටිනාකම් සහිත සුරැකුම්පත් සම්බන්ධයෙන් අදාළ නීතිරීති, ටික් ප්‍රමාණය සහ ගනුදෙනු ගාස්තු ව්‍යුහයට සංශෝධන යෝජනා කර ඇති අතර ඒවා සමාලෝචනය ලක් කර තවදුරටත් වැඩිදියුණු කිරීම් ද සිදු කර ඇත. යෝජිත ටික් ප්‍රමාණය සහ ගනුදෙනු ගාස්තු ව්‍යුහය සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

කොටස් සම්බන්ධයෙන් වන සමූහ අරමුදල් පුවරුව හරහා අරමුදල් රැස් කිරීමට පහසුකම් සැළසීම

ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) සඳහා පවතින ප්‍රාග්ධන රැස් කිරීමේ මාර්ග පුළුල් කිරීමේ අරමුණ ඇතිව, කොටස් සම්බන්දයෙන් වන සමූහ අරමුදල් රැස්කිරීමේ පුවරුවකට (Crowdfunding) පහසුකම් සැළසීමට අපේක්ෂා කෙරේ. කොටස් සම්බන්දයෙන් වන සමූහ අරමුදල් රැස්කිරීමේ ක්‍රමයක් යනුවෙන් හැඳින් වෙනුයේ විශේෂිත ව්‍යාපෘතියකි. ව්‍යාපාර ආයෝජන (Venture Capital) සඳහා කුඩා ප්‍රමාණයේ අරමුදල් රැස්කර ගැනීමට වෙබ් පාදක පුවරුවක් හෝ සමාජ ජාල වෙබ් අඩවියක් හරහා බහුවිධ ආයෝජකයින් ගෙන් අරමුදල් (කුඩා ප්‍රමාණවලින්) ඉල්ලා සිටීමක් මෙමගින් විස්තර කෙරේ. කොමිෂන් සභාව මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇති අතර ආසියානු සංවර්ධන බැංකුවෙන් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගෙන ඇත. වර්තමානය වන විට ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම සඳහා පවරා ඇති විශේෂඥයින්ගේ සහාය ඇතිව කොටස් සම්බන්ධයෙන් වන සමූහ අරමුදල් රැස්කිරීමේ පුවරුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති රාමුව අවසන් වෙමින් පවතී.

ආයෝජක පදනම පුළුල් කිරීමට සහ ඉහළ නැංවීමට ඩිජිටල් පුවරු පහසුකම් සැළසීම

ඩිජිටල් පුවරු ක්‍රියාකරුවන්ට තම ග්‍රාහකයින්/සාමාජිකයන් වෙත පහසුකම් ලබා දීමෙන් කොටස් වෙළෙඳපොළේ පුළුල් ආයෝජක පදනමක් ඇති කිරීමට හැකියාව ලැබේ. ආයෝජක පදනම පුළුල් කිරීම සඳහා එවැනි ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම තුළින් කොටස් වෙළෙඳපොළට ලැබිය හැකි ප්‍රතිලාභ සලකා බැලීමෙන් අනතුරුව, එවැනි ක්‍රියාමාර්ග පහසු කිරීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. එවැනි ඩිජිටල් පුවරු හරහා ඔවුන්ගේ පහසුකම් ව්‍යාප්ත කිරීමට හැකියාව ලබා දීමෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) සඳහා පවතින ප්‍රාග්ධන රැස් කිරීමේ මාර්ග පුළුල් කිරීමේ අරමුණ ඇතිව, කොටස් සම්බන්දයෙන් වන සමූහ අරමුදල් රැස්කිරීමේ පුවරුවකට (Crowdfunding) පහසුකම් සැළසීමට අපේක්ෂා කෙරේ.

අපේක්ෂා කරන්නේ කොටස් වෙළෙඳපොළේ පවතින ආයෝජන අවස්ථා පිළිබඳව සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය සහ අධ්‍යාපන මට්ටම් පුළුල් කිරීම වන අතර ඕනෑම ආයෝජකයෙකුට තම ආයෝජන අරමුණු සඳහා කොටස් වෙළෙඳපොළට බාධාවකින් තොරව ප්‍රවේශ වීමට ද හැකියාව ලැබේ.

ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ගය 2021-2025

වෙළෙඳපොළ සංවර්ධනය සඳහා උපායමාර්ගික මග පෙන්වීමක් ලබා දීම සඳහා, ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ගය 2021-2025 සකස් කරන ලද අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයේ මීළඟ මට්ටමට ගෙනයාමට මග සැළසෙන ප්‍රධාන සංවර්ධන සහ නියාමන උපාය මාර්ග එහි ඇතුළත් වේ.

ප්‍රදානයන් ලබාදීමේ නියෝජිතායතන ව්‍යාපෘති සම්බන්ධීකරණය

සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ මඟපෙන්වීම යටතේ, 2020 ආරම්භයේ සිට, ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන් සහ ලෝක බැංකුවේ මූල්‍ය අංශයේ නවීකරණ ව්‍යාපෘතිය යන දෙකම වේගවත්ව නිරීක්ෂණය කර ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. උපදේශන සේවා සහ භාණ්ඩ මිලදී ගැනීම. මේ වන විට එම ව්‍යාපෘතිවලින් සැලකිය යුතු කොටසක් නිම කිරීමට මෙය හේතු වී ඇත.

ප්‍රාග්ධන වෙළෙඳපොළ උපදේශක සභාව (CMAC) නැවත කැඳවීම

මුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් CMAC යලි කැඳවනු ලැබුවේ උපාය මාර්ගික මට්ටමේ මග පෙන්වීමක් සැපයීම, අන්තර් නියෝජිතායතන ප්‍රතිපත්ති සම්බන්ධීකරණයට පහසුකම් සැළසීම, ක්‍රියාවට නැංවීමට සහය දැක්වීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම යන අරමුණ ඇතිවය. ආසියානු

සංවර්ධන බැංකුව (ADB) විසින් දිගුකාලීන ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන. CMAC හි නියාමකයින්, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), SEC, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL), ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති නියෝජනය කරන සාමාජිකයින් ඇතුළත් වේ. අධීක්ෂණ මණ්ඩලය (SLAASMB) සහ සේවක සපයන අරමුදල (EPF), CSE යනාදී අනෙකුත් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතන. මේ වන විට CMAC විසින් ප්‍රාග්ධන වෙළෙඳපල සංවර්ධන මූලපිරීම්වල ප්‍රගතිය සාකච්ඡා කර ඇති රැස්වීම් 3 ක් පවත්වා ඇත.

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන (CMDP)

CMDP යනු ADB විසින් ශ්‍රී ලංකා රජයට ප්‍රතිපත්ති පදනම් කරගත් ණය සහ තාක්ෂණික ආධාර ලබාදීමේ වැඩසටහනකි. CMDP යටතේ, සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) සංග්‍රහයක් කෙටුම්පත් කිරීම, කොළඹ කොටස් හුවමාරුව අසාමුහිකරණය, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කිරීම, මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සහ ඒකක භාර සඳහා ව්‍යාප්තිය වැනි මුල පිරීම් ගණනාවක් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තාක්ෂණික සහාය ලබාගෙන ඇත. මීට අමතරව, ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ, ව්‍යුහගත බලපත්‍ර, හරිත බැඳුම්කර සහ කොටස් හා සම්බන්ධ සමූහ අරමුදල් සැපයීමේ වේදිකාවක් ඇතුළුව 2021 ජූනි මාසයේ නව සංවර්ධන ක්‍රියාවලීන් සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගෙන ඇත..

ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය

ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය (FSMP) යටතේ ප්‍රධාන නියාමන සහ සංවර්ධන කාර්යයන් කිහිපයක් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත අරමුදල් ලබා දෙන ලදී.

2021 දෙසැම්බර් මාසයට වන විට පහත උපදේශන කටයුතු සහ භාණ්ඩ ප්‍රසම්පාදන අවසන් කර ඇත.

තාක්ෂණික සහාය ලබා ගැනීම

- DVP ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශනය සහ CCP ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව (එක් උපදේශකවරයෙක්)
- අධ්‍යාපනය සහ දැනුවත් කිරීම් ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා උපදේශනය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (SEC) / ප්‍රාග්ධන වෙළෙඳපොළ පුහුණු/ ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය (CMET/CMIC) යන වෙබ් අඩවි සංවර්ධනය.
- සාංගමික තොරතුරු තාක්ෂණ උපාය මාර්ගයක්/ක්‍රියාත්මක කිරීමේ නිරීක්ෂණ සංවර්ධනය සඳහා උපදේශනය
- වෙළෙඳපොළ නිරීක්ෂණ සඳහා උපදේශනය

යටිතල පහසුකම් සම්පාදනය

- වසර 3 ක නඩත්තුවක් සහිත Microsoft Terminal Server බලපත්‍රය
- ආවේක්ෂණ අංශය සඳහා දත්ත විශ්ලේෂණ මෙවලම වගුව

හඳුනාගත් තවත් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සම්පාදන කිහිපයක් මේ වන විට සිදුවෙමින් පවතී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සුරක්ෂිත කර ඇත

මීට අමතරව, ලෝක බැංකුව වෙත ඉදිරිපත් කර ඇති පරිදි, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පුහුණු සැළැස්මක් මත පදනම්ව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා අරමුදල් වෙන් කරන ලදී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පුහුණු සැළැස්ම ලෝක බැංකුව විසින් අනුමත කර ඇත.

සාංගමික මූල්‍ය උපදේශකයින් සඳහා වෙළෙඳපොළ අතරමැදි නීති

2021 අංක 19 දරන නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීමත් සමඟ, සාංගමික මූල්‍ය උපදේශකයින් නව වෙළෙඳපොළ අතරමැදියෙකු ලෙස සුරැකුම්පත් සහවිනිමය කොමිෂන් සභාවේ නියාමනය යටතට පත් විය. මෙම සාංගමික මූල්‍ය උපදේශකයින් සඳහා නීති කෙටුම්පත් කරන ලද අතර ඒවා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අභ්‍යන්තරව සමාලෝචනය කරමින් පාර්ශ්වකරුවන්ගේ උපදේශන සඳහා ඒවා ඉදිරිපත් කරන ලදී.

2022 ජාතික අයවැයට ඉදිරිපත් කළ යෝජනා

නව ලැයිස්තුගත කිරීම් සඳහා බදු දිරිගැන්වීම්, "බලගැන්වීම් මණ්ඩලයේ" ලැයිස්තුගත සමාගම්වලට අදාළ වන ආදායම් බදු මත තවදුරටත් සහන සහ "හරිත බැඳුම්කර" නිකුත් කිරීම සඳහා බදු සහන පිළිබඳ 2022 අයවැය තුළ ඇතුලත් වූ නව ලැයිස්තුගත කිරීම් සඳහා බදු සහන අයවැය යෝජනා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

ප්‍රාග්ධන වෙළෙඳපොළ දියුණු කිරීමේ ක්‍රියාමාර්ග

- ලැයිස්තුගත සමාගම් වලට අදාළ සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය, ලැයිස්තුගත කිරීම් සහ ලේඛණයෙන් ඉවත් කිරීම වැනි නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් ලයිස්තුගත ආයතන වල කොටස් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම.
- සාගමික පරිපාලනය සඳහා වූ ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන ආයතනයේ මූලධර්ම (OECD Principles), ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (IOSCO) සහ ජාත්‍යන්තර ආචාරධර්ම වලට (International best Practices) අනුකූල වන පරිදි සාංගමික පරිපාලන සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම.
- විවිධ විදේශ මුදල්වල ණය, දේශීය ආයතනවලට ලයිස්තුගත කිරීමේ හැකියාව ලබාදීම හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ණය ලයිස්තුගත කිරීමේ හැකියාව ලබාදීම උදෙසා වන නව ලයිස්තුගත කිරීමේ පුවරුවක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය වන මෙහෙයුම් රාමුව, අවදානම් හඳුනා ගැනීම, නීති උපදේශන සහ මිනුම් සළකුණු පිළිබඳ පුළුල් සමාලෝචනයක් පැවැත්වීම.
- නිරවද්‍ය තොරතුරු හෙළිදරව් වන ලෙස හා පාර්ශවකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා වන ලෙසත් පවත්නා අවශ්‍යතා සපුරාලන අයුරිනුත් වන, ලයිස්තුගත සමාගම්වල විගණකවරුන්ගේ වගකීම් සඳහා අදාළ වන පුළුල් මාර්ගෝපදේශ නිර්මාණය කිරීම උදෙසා වන රාමුවක් නිර්මාණය කිරීමේ හැකියාව පිළිබඳ සළකා බැලීම.
- ලැයිස්තුගත නොකළ ආයතන විසින් සිදුකරන මහජන නිකුතු සඳහා, නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 75 (1) වන වගන්තිය යටතේ අවශ්‍ය අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම.
- අවදානම මත පදනම් වූ තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රවේශයක් සහිත වූ මූල්‍ය සම්ක්ෂණ (Financial Surveillance) රාමුවක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමත්, ඒ සඳහා සුදුසු වන ලෙස අභ්‍යන්තර පුද්ගලන්ගේ ධාරිතාවය වර්ධනය කිරීම.
- ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා ප්‍රමිතිගත මූල්‍ය වාර්තා කරණ ක්‍රමයක් හඳුන්වාදීමේ හැකියාව ඇගයීමට ලක් කිරීම.

ලෝක බැංකුවේ "Doing Business" දර්ශකය

සුළුතර ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අනු දර්ශකයෙහි ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගතකිරීම ඉහළ නංවා ගැනීමට අවශ්‍ය කරුණක් ලෙස හඳුනාගත්, සුළුතර ආයෝජකයන් ආරක්ෂා කිරීමේ 2022 "Doing Business" දර්ශකයට අදාළ ප්‍රශ්නාවලියට පිළිතුරු සකස් කිරීමේ කාර්යයට නීති හා බලාත්මක කිරීමේ අංශය සහභාගී විය.

මෙහෙයුම් සමාලෝචනය

"Doing Business" වාර්තාව යනු ලොව පුරා ආර්ථිකයන් 190 ක මිණුම් දණ්ඩක් ලෙස සලකණු ලබන ලෝක බැංකු සමූහයේ ප්‍රධාන ප්‍රකාශනයකි. සුළුතර ආයෝජකයන් ආරක්ෂා කිරීම පිළිබඳ දර්ශකය මගින් දේශීය සමාගම් වල සුළුතර කොටස් හිමියන්ට ලබා දී ඇති නෛතික ආරක්ෂාවන් මනිණු ලබන අතර එය "Doing Business" වාර්තාව මගින් ප්‍රකාශයට පත් කරන දර්ශක කට්ටල 11 න් එකකි.

ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුවත්භාවය සහ බාහිර සම්බන්ධතා

දක්ෂ, විශ්වාසදායක සහ හොඳින් දැනුවත් ආයෝජකයින් පිරිසක් සිටීම ශක්තිමත් ප්‍රාග්ධන වෙළෙඳපොළක අත්‍යවශ්‍ය අංගයකි. ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සහ වෙළෙඳපොළ සහභාගිත්වය ඉහළ නැංවීමට මහජනතාව දිරිමත් කිරීම සඳහා මෙන්ම ඔවුන්ගේ මූල්‍ය යහපැවැත්ම ශක්තිමත් කිරීම සඳහා භාෂා තුනෙන්ම විවිධ පැති ආවරණය වන ආකාරයෙන් රට පුරා ආයෝජක අධ්‍යාපනික වැඩසටහන් පවත්වනු ලබයි.



තුෂාර ජයරත්න මහතා
අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන

ද්විතීයික පාසල් විෂය මාලාවට ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂයය අන්තර්ගතය ඇතුළත් කිරීම

කුඩා කාලයේදීම ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම දරුවන්ට ලබා දීමෙන් ඔවුන්ගේ ජීවිතයේ විවිධ අවස්ථා වලදී නැණවත්ව ආයෝජනය කිරීමටත් කුසලතා සහ දැනුම ලබා ගැනීමටත් මූල්‍ය සංකල්ප පිළිබඳ විශ්වාසය වැඩි කිරීමටත් තීරණ ගැනීම වැඩිදියුණු කිරීමටත් ඔවුන්ට හැකියාව ලැබේ. මෙම කරුණ මනසෙහි තබාගෙන, හය ශ්‍රේණියේ සිට නවවන ශ්‍රේණිය දක්වා "ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව" යන නව විෂයය යටතේ ප්‍රාග්ධන වෙළෙඳපොළ අන්තර්ගතය 2023 වසරේ සිදුකිරීමට නියමිත පාසල් විෂයමාලා සංශෝධනයට ඇතුළත් කිරීමට ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය සමඟ කටයුතු කළේය.

SEC වෙබ් අඩවිය

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, සිය වෙබ් අඩවිය පරිශීලනය කරන්නන්ට හිතකාමී විශේෂාංග ඇතුළුව වෙබ් අඩවියට වැඩිදියුණු කිරීම් ගණනාවක් සිදු කළේය. ආයෝජකයින් දැනුවත් කිරීමට සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ වඩාත් විශ්වාසදායක සහභාගිවන්නන් වීමට ඔවුන්ට හැකිවන පරිදි ඒ වෙනුවෙන්ම වෙන් වූ වෙබ් පිටුවක්ද "ආයෝජක කෝනර්" නමින් දියත් කළෙමු. නවක සහ පළපුරුදු ආයෝජකයින් සඳහා විශ්වාසදායක සහ නිවැරදි ආයෝජක අධ්‍යාපනික මෙවලම් සැපයීම මගින් ආයෝජකයින් සවිබල ගැන්වීම සහ ආයෝජක ආරක්ෂණ ප්‍රයත්නයන් ඉහළ නැංවීමට සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම වෙබ් අඩවිය තුළින් තවදුරටත් අපේක්ෂා කරයි.

සමාජ මාධ්‍යය හරහා දැනුවත් කිරීම් වර්ධනය කිරීම

කොවිඩ් 19 වසංගතයත් සමඟ වැඩ කිරීමට සහ ඉගෙනීමට පුද්ගලයින් වැඩි වැඩියෙන් ඩිජිටල් මෙවලම් භාවිතා කිරීම සහ මූල්‍ය අධ්‍යාපනය ඩිජිටල් ආකාරයෙන් බෙදාහැරීම වර්ධනය වී ඇති අතර එහි අදාළ බවද ඉහළ ගොස් තිබේ. සාම්ප්‍රදායික දැනුවත් කිරීමේ ක්‍රම හරහා ළඟා විය නොහැකි විවිධ ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත රූපරාමු ආකෘතියකින් සහ නම්‍යශීලී, සිත්ගන්නා සුළු ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට මූල්‍ය අධ්‍යාපනයේ ඩිජිටල් ක්‍රමවේද තුළින් අපට අවස්ථාව ලබා දී ඇත. සලකා බලන වසර තුළ, අපි නැණවත්ව ආයෝජනය කරන ආකාරය, ආයෝජන ඉඟි මෙන්ම වංචාවලින් වැළකී සිටීමේ ක්‍රම පිළිබඳව විවිධ අන්තර්ගතයන් සහිත ප්‍රදර්ශක දැන්වීම් පළ කළෙමු. සමාජ මාධ්‍යය අන්තර්ගතයන් ආයතනය විසින්ම නිර්මාණය කරන අතර දිනකට අවම වශයෙන් එක් පළ කිරීමක් වෙබ් අඩවියට ඇතුළත් කෙරේ.

ඩුබායි හි පැවති "ඉන්වෙස්ට් ශ්‍රී ලංකා" ආයෝජන සම්මන්ත්‍රණය

කොළඹ කොටස් හුවමාරුවෙහි සුවිශේෂී කාර්ය සාධනය සහ සංචාරක සීමාවන් ලිහිල් කිරීමේ පසුබිම තුළ, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් 2021 නොවැම්බර් 5 වන දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඩුබායි සහ උතුරු එමිරේට්ස්හී ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය සමඟ එක්ව 'ඉන්වෙස්ට් ශ්‍රී ලංකා' ආයෝජක සම්මන්ත්‍රණයක් ඩුබායි හි ඔරටන් ග්‍රෑන්ඩ් හෝටලයේදී සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට විවිධ කර්මාන්තයන්හි නියැලී සිටින ඩුබායි හි ප්‍රමුඛ පෙළේ ශ්‍රී ලාංකිකයන්ගෙන් ප්‍රබල සහභාගීත්වයක් ලැබුණු අතර සම්මන්ත්‍රණයේ ප්‍රධාන කථිකයා වූයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතායි. අනෙකුත් කථිකයන් ලෙස එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපති කාර්යාලයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් එච්.ඊ මල්රාජ් ද සිල්වා මහතා, ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් චින්තක මෙන්ඩිස් මහතා, කොළඹ කොටස් හුවමාරුවේ සභාපති දුමිත් ප්‍රනාන්දු මහතා සහ ඩුබායි හී ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ කොන්සල් ජනරාල් නලින්ද විජේරත්න මහතා සහභාගී විය.

CT CLSA හි පර්යේෂණ සහ උපායමාර්ගික විධායක අධ්‍යක්ෂ සංජීව ප්‍රනාන්දු මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රධානී උපායමාර්ගික උදීෂාන් ජොනාස් මහතා සහ SC සෙකියුරිටීස් සමාගමේ පර්යේෂණ ප්‍රධානී චරිත ගුණසේකර මහතා විසින් ඉදිරිපත් කළ විශ්ලේෂණාත්මක දේශණය තුළින් වෙළෙඳපොළ ඉදිරි දැක්ම සහ ක්ෂේත්‍ර කාර්යසාධනය පිළිබඳව ආවරණය කරන ලදි. කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහතා කොටස් තැරැව්කරුවන්ගේ නියෝජිතයන් සමඟ ආකර්ෂණීය විද්වත් මණ්ඩල සාකච්ඡාවකට එක් විය. ඩුබායි ආයෝජක සම්මන්ත්‍රණයෙන් පසුව රුපියල් මිලියන 5.6 ක් ව පැවති ශුද්ධ ගලා යාම්, රුපියල් මිලියන 89 ක ශුද්ධ ගලා ඒම් දක්වා ඉහළ ගොස් ඇත.

ශ්‍රී ලංකාව විදේශ ආයෝජන සඳහා ආකර්ශනීය ගමනාන්තයක් ලෙස පෙන්නුම් කිරීම

කොවිඩ් වසංගත සංචාරක සීමාවන් සමඟ, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විදේශ කටයුතු අමාත්‍යාංශය (MFA) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ පවතින වර්ධන හැකියාවන් සහ ආයෝජන අවස්ථා පිළිබඳව විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ රැස්වීම් මාලාවක් ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාකාරකම් මගින් විදේශ දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලයට සිය රටවල ආයෝජක ප්‍රජාව අතර ශ්‍රී ලංකාවෙහි සිදුකරන ආයෝජන ප්‍රවර්ධනය කිරීමට සහ අනාගත විදේශ සම්මන්ත්‍රණ සංවිධානය කිරීමේදී සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට සහ කොළඹ කොටස් හුවමාරුවට සහාය වීමට ද හැකි විය.

මේ අනුව එක්සත් රාජධානිය, සිංගප්පූරුව, ස්විඩනය, අබුඩාබි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ වොෂින්ටනය යන තානාපති කාර්යාල/මහ කොමසාරිස් කාර්යාලවල කාර්ය මණ්ඩලය සඳහා විදේශ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

ඉන් අනතුරුව, මෙම ක්‍රියාවලියෙහි දෙවන අදියර ආරම්භ කරමින් සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2021 සැප්තැම්බර් මාසයේදී

ජපානයේ විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව සඳහා ඔන්ලයින් සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබීය.

සම්මන්ත්‍රණ සහ වැඩමුළු මගින් සිදුකළ දැනුවත් කිරීම්

මූල්‍ය දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුවෙහි කුරුණෑගල සහ අම්බලන්තොට ශාඛාවන් සමඟ සම්බන්ධ වී ඔන්ලයින් සම්මන්ත්‍රණ හරහා ආයෝජකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ඊට අමතරව අප මහනුවර දිස්ත්‍රික්කයේ සමුපකාර නිලධාරීන් සඳහා ඔන්ලයින් සම්මන්ත්‍රණයක් පැවැත්විය. ඊට අමතරව වෙළෙඳපොළ පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහාද අප සම්මන්ත්‍රණ පවත්වනු ලැබීය.

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ සාකච්ඡාවක්

2021 අංක 19 දරන නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විශේෂාංග පිළිබඳව ලැයිස්තුගත සමාගම්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2021 ඔක්තෝබර් 6 සහ 2021 දෙසැම්බර් 6 වැනි දින සම්මන්ත්‍රණ දෙකක් සංවිධානය කළේය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා විසින් නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විශේෂයෙන් ලැයිස්තුගත පොදු සමාගම් සම්බන්ධයෙන් කැපී පෙනෙන කරුණු ඇතුළත් ප්‍රධාන දේශනය පවත්වන ලද අතර ඉන් අනතුරුව විද්වත් මණ්ඩල සාකච්ඡාවක් ද පවත්වන ලදී. සම්මන්ත්‍රණය සඳහා 1000 කට අධික සහභාගිවන්නන් පිරිසක් එක්රැස් විය.

ලයිස්තුගත වීමට හැකියාවක් ඇති සමාගම්වල ප්‍රධාන මූල්‍ය නිළධාරීන් සඳහා වැඩමුළුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෞද්ගලික සමාගම් කිහිපයක ප්‍රධාන මූල්‍ය නිලධාරීන් සඳහා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමට ඔවුන් දිරිමත් කිරීම සඳහා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ ලැයිස්තුගත කර නොමැති සමාගම් වෙත ළඟාවීම සහ ලැයිස්තුගත වීමේ ප්‍රතිලාභ පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සහ 2021 දෙසැම්බර් 31 ට පෙර ලැයිස්තුගත කර ඇති සමාගම්වලට යම් යම් බදු නිදහස් කිරීම් ලබා දී ඇති 2021 සඳහා රජයේ අයවැයේ ඇතුළත් ප්‍රධාන යෝජනා පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමයි.

එපමණක් නොව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෑතකදී සමාගම් ලැයිස්තුගත

ආයෝජකයින් දැනුවත් කිරීමට සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ වඩාත් විශ්වාසදායක සහභාගිවන්නන් වීමට ඔවුන්ට හැකිවන පරිදි වී වෙනුවෙන්ම වෙන් වූ වෙබ් පිටුවක්ද ''ආයෝජක කෝනර්'' නමින් දියත් කළෙමු.

කිරීම සඳහා නව රාමුවක් අනුමත කරන ලදී. එමෙන්ම ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලියේදී කොළඹ කොටස් හුවමාරුව වෙත පූර්ණ ස්වයං පාලනයක් ලබා දෙන අතර තවත් සමාගම් ලැයිස්තුගත කිරීම දිරිමත් කිරීම සඳහා ලැයිස්තුගත කිරීමේ නීති ලිහිල් කර ඇත.

කොටස් වෙළෙඳපොළ හරහා ලයිස්තුගත වෙමින් නව ප්‍රවේශයකට ළඟාවීමට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් පවුලේ ව්‍යාපාර සඳහා වැඩමුළුවක්

ශ්‍රී ලංකා සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව, කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ දී 'පවුලට ආරම්භකයා මහජනතාව අතරට යාමේ වාසි' යන තේමාව යටතේ කොටස් නිකුත් කරන්නන් සඳහා 2021 වසරේ පවත්වන ලද පළමු සම්මන්ත්‍රණය හරහා ශ්‍රී ලංකාවේ පවුල් ව්‍යාපාරික ප්‍රජාව සම්බන්ධ කර ගන්නා ලදී. මෙම සම්මන්ත්‍රණය සංවිධානය කර තිබුණේ පවුලේ පාලනය ආරක්ෂා කරගැනීම සහතික කර ගනිමින් පවුලේ ව්‍යාපාරයක් මහජනතාව අතරට යාමෙන් ප්‍රයෝජන ගත හැකි ආකාරය විස්තර කිරීමටයි. තවද, මෙම සම්මන්ත්‍රණය හරහා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම පිළිබඳ ව්‍යාපාරික ප්‍රජාව අතර පවතින වැරදි සංකල්ප නිවැරදි කිරීමද කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා සහ කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති දුමිත් ප්‍රනාන්දු මහතා සභාව ඇමතූහ.

මෙම වැඩසටහනට විද්වත් මණ්ඩල සාකච්ඡාවක්ද ඇතුළත් වූ අතර එහිදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජික මනිල් ජයසිංහ මහතා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් චින්තක මෙන්ඩිස් මහතා, කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන නියාමන නිලධාරී රේණුක විජයවර්ධන මහතා සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මූලාරම්භය සහ නිකුත් කරන්නන් සම්බන්ධතා ප්‍රධානී පුරසිසි ජිනදාස මහතා සම්බන්ධ විය. සාකච්ඡා.

අධ්‍යාපනික සහ අලෙවිකරණ ව්‍යාපාරය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව වෙළෙඳපොළට අවතීර්ණවීමෙන් පසුව වගකීමෙන් ආයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ආයෝජකයින් දැනුවත් කිරීම සඳහා ආයෝජකයින් දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යාපනික වැඩසටහන භාෂා තුනෙන්ම ක්‍රියාත්මක වන අතර ඩිජිටල් මාධ්‍යවලින් එනම් සමාජ මාධ්‍යය පළ කිරීම්, වීඩියෝ, බ්ලොග් පළ කිරීම් සහ කොළඹ කොටස් හුවමාරුවේ මොබයිල් ඇප් පහසුකම තුළින් සිදුකෙරෙන ප්‍රචාරණයන් ඊට ඇතුළත් වේ.

ජාතික මූල්‍ය අන්තර්ගත කිරීමේ උපාය මාර්ගය (NFIS)

NFIS 2021-2024 මගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගත කිරීම් වැඩිදියුණු කිරීම සඳහා සියලුම පාර්ශවකරුවන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඇතුළුව ප්‍රමිතිගත සහ සම්බන්ධීකරණ ප්‍රවේශයක් සපයයි. මෙමගින් උපාය මාර්ගයේ අරමුණු නියමිත වේලාවට සාක්ෂාත් කර ගත හැකි ආකාරය දක්වා ඇති අතර මූල්‍ය අන්තර්ගත කිරීම් වැඩිදියුණු කිරීම සඳහා නව ක්‍රියාමාර්ග නිර්මාණය කිරීමට දැනට සිටින සහ නව පාර්ශවයන් දිරිමත් කරයි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහ මූල්‍ය අන්තර්ගත කිරීම් වැඩිදියුණු කිරීමට සම්බන්ධීකරණ සහ ඒකාබද්ධ උත්සාහයක් දරයි.

CORE (Coherant, Open, Responsive and Effective) Justice වැඩසටහන

නීති හා බලාත්මක කිරීමේ අංශය විසින්, ශ්‍රී ලාංකීය නීති ආඥාපතියේ පාලනය, සුදුසුකම් හා විවිධත්වය වැඩිදියුණු කිරීම උදෙසා රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ තෝරාගත් සිසුවියන් සඳහා දේශීයකරණය කළ අධ්‍යයන චාරිකා දෙකක් සඳහා පහසුකම් සලසන ලදී.

USAID සමඟ එකතුව සිදුකෙරුණ මෙම වැඩසටහන පැවැත්වුනේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වැනි ආයතන (මෙම අධ්‍යයනයේ අවධානය යොමු කෙරෙන ප්‍රධාන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තෝරාගෙන තිබීම නිසා) වල කාර්යයන් දැකබලාගෙන ඒවායේ නීති ක්ෂේත්‍රයේ ඇති රැකියා අවස්ථා පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට සිසුන් බලගැන්වීම සඳහායි.

මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපනය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් පවත්වනු ලබන අතර සාමාන්‍ය ජනතාවට ආයෝජනය කිරීමේ මූලික න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබා දීම සඳහා ව්‍යුහගත වැඩසටහන් ද පවත්වාගෙන යනු ලබයි.

කොටස් තැරැව්කාර සමාගම්වල පුහුණු වන ආයෝජන උපදේශකයින් සඳහා අවම මට්ටමේ වෘත්තීය ප්‍රවීණතාවයක් ලබා දීමේ අරමුණින් 2019 දී හඳුන්වා දුන් සංශෝධිත ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළදී ද අපි අඛණ්ඩව ක්‍රියාත්මක කළෙමු. එකී රාමුව වත්කම් පන්ති එකක් හෝ කිහිපයක් සඳහා සහතික කළ ආයෝජන උපදේශකයින්ගෙන් සමන්විත වේ. එනම් හිමිකම් සුරැකුම්පත්, ණය සුරැකුම්පත්, ව්‍යුත්පන්න සහ ඒකක භාර යි.

සුරැකුම්පත් කර්මාන්තයේ සියලුම වත්කම් පන්ති ඇතුළත් කරමින් ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) සුදුසුකම ඉහළම සුදුසුකම් රාමුවක් දක්වා වැඩි දියුණු කරන ලදී. (රූප සටහන: 6)

රූප සටහන 06: වත්කම් සුදුසුකම් රාමුව



තවද, සංශෝධිත සුදුසුකම් රාමුව යටතේ කොටස් තැරැව්කාර සමාගම්වල ආයෝජන උපදේශකයින් සඳහා දැනට පවතින රාමුවට සමාන ව්‍යූහාත්මක සුදුසුකම් රාමුවක් ඒකක භාර කර්මාන්තයේ නිරතවූවන් සඳහා ද හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලදී. මෙම අනිවාර්ය අවශ්‍යතාවය සඳහන් කරමින් මේ හා සම්බන්ධ නියෝගයක් 2020 අගෝස්තු 14 වන දින ඒකක භාර කර්මාන්තයට බෙදා හරින ලදි. ඒ අනුව කිසියම් අපේක්ෂකයෙකු සහතිකලත් ඒකක භාර උපදේශක (CUTA) සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් අනිවාර්ය විෂයයන් හතරක් සමත් විය යුතුය. සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ (අදියර 1), ඒකක භාර (අදියර 5), මූල්‍ය සැලසුම්, උපදේශන සහ අලෙවිකරණ (අදියර 6) සහ සුරැකුම්පත් නියාමනය සහ ආචාර ධර්ම (අදියර 7) යනු එම අනිවාර්ය විෂය ඒකක 4යි. මෙම සහතිකය සම්පූර්ණ කිරීමෙන් පසු මාස 6 ක අදාළ කර්මාන්තයේ පළපුරුද්ද සහිත අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට (VIVA VOCE) මුහුණ දිය යුතු අතර සුදුසුකම් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ සංවර්ධන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අවම වශයෙන් වසරකට ඝණ සම්මන්ත්‍රණ ලකුණු 4ක් වත් ලබා ගත යුතුය.



තුෂාර ජයරත්න මහතා
අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන



සජීවනී බක්මීදෙණිය මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන

වසංගතය විසින් ඇති කරන ලද වෙනස්කම් වලට අනුවර්තනය වීමේ වැදගත්කම හඳුනාගෙන අවබෝධ කරගත් සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අඛණ්ඩ දේශන සැපයීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM) සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ ඩිප්ලෝමා පාඨමාලාව (DCM) ඔන්ලයින් ක්‍රමයට අඛණ්ඩව පවත්වාගෙන ගියේය. දීප ව්‍යාප්ත අගුලු දැමීම් (Lockdown) සහ මහජන ඒකරාශී වීම් සඳහා රජය විසින් පනවා ඇති සීමා කිරීම් හේතුවෙන් මෙම වැඩසටහන් වලට අදාළ විභාග පළමු කාර්තුවට සහ හතරවන කාර්තුවට සීමා විය.

එහි බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස, බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම්වල ආයෝජන උපදේශකයෙකු ලෙස රාජකාරි කිරීමට අනිවාර්ය වන ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) සහ සහතිකලත් හිමිකම් සුරකුම්පත් උපදේශක (CESA) සහතික පත්‍ර ප්‍රදානය කිරීම සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යනු ලබයි. එබැවින්, වසංගත තත්ත්වය මධ්‍යයේ වත්කම් පන්ති හතරටම ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය අපේක්ෂා කරන සිසුන් සඳහා උදාහරණ ලෙස, හිමිකම් සුරකුම්පත්, ණය සුරකුම්පත්, ඒකක භාර සහ ව්‍යුත්පන්න සුරකුම්පත් සඳහා අඛණ්ඩව VIVA VOCE විභාග වසර පුරා පැවැත්වුණු අතර තනි වත්කම් පංතියක් වන හිමිකම් සුරකුම්පත් සඳහා ආයෝජන උපදේශක තනතුර (CESA) බලපත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන සිසුන් සඳහා ද VIVA VOCE විභාග පවත්වන ලදී. ඇතැම් සීමා කිරීම් හේතුවෙන් ඉහත විභාග බොහෝ දුරට අන්තර්ජාලය හරහා (ඔන්ලයින් ක්‍රමයට) පැවැත් වූ නමුත් 2021 අග භාගයේදී සාමාන්‍ය පරිදි VIVA VOCE විභාග පවත්වන ලදී. මීට අමතරව, වෙළෙඳපොළ වෘත්තිකයන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වැදගත් වන්නා වූ CPD වැඩසටහන් ද අන්තර්ජාල වැඩසටහන් (webinars) ආකාරයෙන් පවත්වන ලදී.

තවද, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන අංශය විසින් 2021 වර්ෂය තුළ දැනට ආයෝජනයෙහි නිරත සහ ඉදිරියේදී ආයෝජනය කිරීමට අපේක්ෂාවෙන් සිටින ආයෝජකයින් සඳහා "ආයෝජක වැඩසටහනක්"(PI) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලදී. මෙම ආයෝජක වැඩසටහන ද අන්තර්ජාල පහසුකම් හරහා ඔන්ලයින් ආකාරයෙන් පවත්වන ලදී.

2020 සහ 2021 දී වෙළෙඳපොළ තුළ දක්ණට ලැබුණු ඉහළ කාර්ය සාධනය හේතුවෙන්, සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ අපගේ සියලුම වැඩසටහන් සඳහා වැඩි උනන්දුවක් සහ සහභාගීත්වයක් දක්නට ලැබුණි. ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයන්ට අමතරව කර්මාන්තයට පරිබාහිර පුද්ගලයින් ලෙස හැඳින්විය හැකි උපාධි අපේක්ෂකයින්, පාසල් හැර ගිය අය සහ වෙනත් අංශවල නිරත වෘත්තිකයන් ලැබුණු ඉහළ ඉල්ලුම හේතුවෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM) සඳහා බඳවා ගැනීම්වල වැඩි වීමක් පෙන්නුම් කරමින් සහභාගී වූවන්ගේ සංඛ්‍යාව දෙගුණ විය. ආයෝජක වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ ආයෝජකයින්ගේ වර්ධනයක් 2021 වර්ෂයේදී දක්නට ලැබිණි. එපමණක් නොව, ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වන සිසුන්ගේ වැඩිවීමක් ද දැක ගත හැකි වූ අතර ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපනය කෙරෙහි සාමාන්‍ය ජනතාව දක්වන දැඩි උනන්දුව ඉන් පෙන්නුම් කරයි.

ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM), හිමිකම් සුරකුම්පත් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CES), ණය සුරකුම්පත් සහතික පත්‍ර පාඨමාලාව (CDS) සහ ඒකක භාර පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (CUT)

ඉහත පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද අතර ඒවා 2021 වර්ෂයේදී ආරම්භ කරන ලදී. සාමාන්‍ය කාලසීමාවට වඩා අඩුකාලසීමාවකින් එනම් කඩිනම් පාඨමාලාවක් ලෙස පැවැත් වූ 24 වන කණ්ඩායම 2021 පෙබරවාරි මාසයේදී පැවැත් වූ අතර 25 වන කණ්ඩායම 2021 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කරන ලදී. මෙම පාඨමාලා සඳහා සිසුන් 132 ක් ලියාපදිංචි වී සිටි අතර බඳවා ගැනීම්වල 78% ක වැඩිවීමක් එයින් පෙන්නුම් කළේය. (සංඛ්‍යා සටහන: 11)

සංඛ්‍යා සටහන 11: සංඛ්‍යා දත්ත කාර්ය සාධනය

සිසුන් සංඛ්‍යාව						
ලියාපදිංචි මුළු ගණන	සුරකුම්පත් වෙළෙඳපොළවල් සහ උපකරණ අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව	හිමිකම් සුරකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව	ණය සුරකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව	ඒකක භාර අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව	මූල්‍ය සැළසුම්කරණය, උපදේශනය හා අලෙවිකරණය අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව	සුරකුම්පත් නියාමනය හා ආචාරධර්ම අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව
132	60	29	32	61	68	53

ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA), සහතික ලත් හිමිකම් සුරකුම්පත් උපදේශක (CESA) සහ නැවත ස්ථාපිත කිරීම්

සළකා බලන වසර තුළ, RIA බලපත්‍රය, CESA බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන සිසුන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා සහ වාර්ෂික අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා (CPD) අවශ්‍යතාවයට අනුකූල නොවීම හේතුවෙන් බලපත්‍රය කල් ඉකුත් වූ ආයෝජන උපදේශකයින් නැවත සේවයේ පිහිටුවීම සඳහා VIVA VOCE විභාග 8 ක් පවත්වන ලදී.

මෙහෙයුම් සමාලෝචනය

ඒ අනුව මෙම VIVA VOCE විභාග සඳහා සිසුන් 27 දෙනෙකු සහභාගී වූ අතර සාමාන්‍ය සමත් ප්‍රතිශතය 85% කි. සාර්ථක සිසුන් අතරින් සිසුන් 6 දෙනෙකු RIA බලපත්‍රය ලබාගෙන 86% ක සාමාර්ථයක් පෙන්නුම් කළ අතර සිසුන් 2 දෙනෙකු CESA බලපත්‍රය ලබාගෙන ඇති අතර එය 67% සාමාර්ථයක් පෙන්නුම් කරයි. 88% ක සමත් අනුපාතයක් පෙන්නුම් කරමින් වසර තුළ ආයෝජන උපදේශකයින් 15 දෙනෙකු ගෙන් බහුතරයක් නැවත සේවයේ පිහිටුවන ලදී (සංඛ්‍යා සටහන: 12)

සංඛ්‍යා සටහන 12 : VIVA VOCE විභාග සම්බන්ධ සංඛ්‍යා දත්ත කාර්ය සාධනය

VIVA VOCE පාඨමාලාව	සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් ප්‍රතිශතය %
ලියාපදිංචි ආයෝජන උපදේශක /සහතිකලත් හිමිකම් සුරුකුම්පත් උපදේශක/ නැවත ප්‍රතිස්ථාපන කළ සංඛ්‍යාව	27	85%

ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DCM)

2021 දී, එක්සත් රාජධානියේ සුරුකුම්පත් සහ ආයෝජන සඳහා වූ වරලත් ආයතනය (CISI), සමඟ ඒකාබද්ධව පිරිනැමෙන ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව-DCM ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදි. සිසුන් 17 දෙනෙකු සමඟින් ආරම්භ කරන ලද එහි 14 වන පාඨමාලාව 2020 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර එය 2021 වසර තුළ නිම කරන ලදී. එහි 15 කණ්ඩායම 2021 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර ඊට ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව 9 කි.

අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා

සමාලෝචිත වර්ෂය තුළ, කොටස් තැරැව්කාර සමාගම්වල දැනට සිටින ආයෝජන උපදේශකයින් සඳහා දේශීය සහ ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළේ නවතම ප්‍රවණතා පිළිබඳව නිරන්තර අවබෝධයක් ලබා ගැනීම සහ යාවත්කාලීන කිරීමට හැකිවන පරිදි CPD වැඩසටහන් 7 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් 7 න්, වැඩසටහන් 3 ක් 2021 අගෝස්තු 21 වන දින පවත්වන ලද අතර ඒවා සියලුම ආයෝජන උපදේශකයින් සඳහා අනිවාර්ය විය. මෙම වැඩසටහන් සඳහා කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකයින් සහ විශ්ලේෂකයින් ඇතුළු 1100 කට අධික පිරිසක් සහභාගී වූහ. සියලුම CPD වැඩසටහන් ඔන්ලයින් සම්මන්ත්‍රණ (webinars) ලෙස පවත්වන ලදී

දැනට සිටින ආයෝජන උපදේශකයින් හට ඊළඟ වසර සඳහා ඔවුන්ගේ RIA තත්ත්වය යාවත්කාලීන කිරීම සඳහා වසරකට අවම වශයෙන් CPD සම්මන්ත්‍රණ ලකුණු 4 ක් ලබා ගැනීම අනිවාර්ය කර ඇති අවශ්‍යතාවය ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තවදුරටත් පවත්වා ගෙන ගියේය. (සංඛ්‍යා සටහන 13)

සංඛ්‍යා සටහන 13 : CPD වැඩසටහන් වල සාරාංශය: 2021 වර්ෂය

වැඩසටහනේ මාතෘකාව	සහභාගීකරුවන් සංඛ්‍යාව
මූල්‍ය සැළසුම්කරණය, උපදේශණය සහ අලෙවිකරණය	176
කොටස් තැරැව්කරුවන්ගේ මට්ටමින් වෙළෙඳපොළ ආවේක්ෂණය සහ ස්වයං නියාමනය	316
ක්‍රියාකාරී ගණුදෙනු උපායමාර්ග සමඟ වෙළෙඳපොළට අවතීර්ණවීම	266
සුරුකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ ඒකක භාර මූල්‍ය සැළසුම්කරණය, උපදේශණය සහ අලෙවිකරණය	204
තාක්ෂණික විශ්ලේෂණ ක්‍රම සමඟ ඔබගේ වෙළෙඳ ගණුදෙනු දියුණු කර ගැනීම	194

ආයෝජක පාඨමාලාව (PI)

ආයෝජක පාඨමාලාව (PI) ආරම්භ කරන ලද්දේ දැනට ආයෝජනයෙහි නිරත හා ඉදිරියේදී ආයෝජනයට ප්‍රවිශ්ඨ වීමට අපේක්ෂාවෙන් සිටින ආයෝජකයින්ට අවශ්‍ය කොටස් වෙළෙඳාමේ මූලික න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම සැපයීමේ අදහසිනි. සළකා බලන වසර තුළ සති හයකින් යුත් එවැනි ඉංග්‍රීසි මාධ්‍ය ආයෝජක වැඩසටහන් දෙකක් පවත්වන ලදී. ඒ අනුව එහි 26 වන කණ්ඩායම සහ 27 වන කණ්ඩායම 2021 ජනවාරි සහ ජූලි මාසවලදී ආරම්භ කරන ලදී. වර්ෂය තුළ මෙම වැඩසටහන් සඳහා සහභාගිවන්නන් 36 දෙනෙකු ලියාපදිංචි විය.

රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ව්‍යාපෘතිය

විශ්වවිද්‍යාල තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආශ්‍රිත විෂයයන් හැදෑරීමට උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතිය අප සමාලෝචනයට ලක් කරන වර්ෂය තුළදී අඛණ්ඩව පවත්වාගෙන ගියෙමු. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ හොඳම දස්කම් දක්වන උපාධි අපේක්ෂකයින් සඳහා රන් පදක්කමක් සහ මුදල් ත්‍යාගයක් පිරිනැමේ. ඉහත ව්‍යාපෘතියට අදාළව ජාතික විශ්වවිද්‍යාල එකොළහක් සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) අත්සන් කර ඇත.

කොවිඩ් 19 වසංගතයේ බලපෑම් කිහිපයක් හේතුවෙන් බොහෝ ජාතික විශ්ව විද්‍යාලවලට විභාග සාර්ථකව පැවැත්වීමට නොහැකි වූ අතර එම නිසා 2021 වර්ෂය තුළ රන් පදක්කම් සහ මුදල් ත්‍යාග පිරිනමන ලද්දේ පහත ජාතික විශ්ව විද්‍යාලවලට පමණි.

- කැලණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය

ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය (CMIC)

ප්‍රාග්ධන වෙළෙඳපොළේ නියාමකයා ලෙස සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සෑම විටම රට තුළ මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමට උත්සාහ දරන්නේ දැනුම පදනම් කරගත්, දැනුම මූලික කරගත් කර්මාන්තයක් නිර්මාණය කිරීම ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බව අපි තරයේ විශ්වාස කරන බැවිනි. ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය ප්‍රචලිත කිරීමේ සහ පර්යේෂණ දිරිගැන්වීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථාන (CMIC) පිහිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර, ඒ හරහා විද්‍යුත් ඉගෙනුම් පරිසරයක් ලබාදීමට අප අපේක්ෂා කරන බැවින් එය අඛණ්ඩව යාවත්කාලීන කරන ලදී. එමෙන්ම ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන කටයුතුවල නිරත ශාස්ත්‍රඥයින්ට සහ උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය ප්‍රාග්ධන වෙළඳෙපොළ තොරතුරු, දත්ත සහ අනෙකුත් අධ්‍යාපනික මෙවලම් සැපයීම තුළින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඔවුන්ගේ අවබෝධය තවදුරටත් වර්ධනය කිරීමට මෙන්ම ආයෝජනය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරයි. වර්තමාන තත්ත්වය තුළ එවැනි ක්‍රියාවලියක වැදගත්කම ඉස්මතු වන අතර දැනට අප ඊට අදාළ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවල යෙදී සිටිමු.

කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි ලැයිස්තුගත කිරීමේ වාසි ගැන පහදයි

"ආන්තික ණය (Broker Credit) කප්පාදු කිරීමට කිසිසේත්ම අපේක්ෂාවක් නැහැ"

- විනිමය කොමිෂන් සභාවේ සභාපති ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න

CSE to Introduce DVP mechanism to the Stock Market

The Securities and Exchange Commission of Sri Lanka (SEC) and the Colombo Stock Exchange (CSE) are set to introduction a Delivery vs Payment (DVP) system for stock market transactions. The Go Live is scheduled for 26 July 2021 subject to a final round of testing and industry-wide mock runs.

The objective of introducing a DVP system for the stock market in Sri Lanka is to minimize the Asset concentrant risk of sellers. Under the DVP system the physical custody of shares will be transferred to buyers only on settlement date.

Presently the delivery of shares occurs immediately upon the execution of the transaction, while fund settlement takes place three market days after the transaction date (T+3), thus exposing the seller to a three-day settlement risk. Although stringent measures had been introduced to reduce settlement risk and the CSE has never experienced a settlement failure, the globally accepted mechanism for minimising settlement risk is through a DVP system where the securities and funds are exchanged simultaneously on the settlement date.

The implementation of DVP, a much-needed market infrastructure enhancement, will increase the overall credibility and integrity of the Sri Lankan stock market. Furthermore, the adaptation of the DVP settlement mechanism by CSE will be an additional qualification in obtaining the emerging market classification on international market indices.

The SEC has granted the necessary regulatory approvals for the amendments to the CDS Rules, ATS Rules, Listing Rules and Stockbroker Rules of the CSE to facilitate the implementation of the DVP Settlement Mechanism and enhanced margining model. Subsequent to the successful completion of the User Acceptance Testing (UAT) on the system changes, the CSE completed Market wide testing (Mock runs). The CSE will shortly commence the final round of Market wide testing which is due to be completed by 15 July 2021.

SEC to introduce mechanism for investor-stock broker disputes


SEC Chairman Viraj Dayaratne PC

The Securities and Exchange Commission (SEC) is in the process of introducing a new mechanism for the resolution of disputes between investors and broker firms in a bid to further enhance investor protection.

Releasing SEC's annual report for the year 2020, Chairman Viraj Dayaratne PC noted that the mechanism that is being finalised will strengthen the independence and impartiality of the process as well as make it quicker.

"We are in the process of revising market intermediary rules in order to bring in more clarity, predictability, and consistency. Steps will also be taken to introduce a new take-overs and mergers code in order to align our regulatory regime pertaining to this sphere with emerging trends," he further added.

Dayaratne stated that since May 2020, the market witnessed a high level of activity with a record number of new investor accounts being opened.

"We have, therefore, stepped up our surveillance activities to detect any market abuse. Our surveillance capabilities will be further strengthened with the acquisition of a sophisticated surveillance system in the near future."

The SEC took steps to streamline the regulatory framework to ensure a smooth listing experience for companies by introducing a slew of measures such as relaxing the eligibility criteria, corporate governance norms, and reporting requirements. The CSE has been given complete autonomy with regard to the process of granting approval for listings.



The SEC's expert panel briefed potential market entrants on the benefits of getting listed

SEC conducts workshop for CFOs of potential listed companies

The Securities and Exchange Commission of Sri Lanka (SEC) recently conducted a forum for the Chief Financial Officers (CFOs) of several private companies with the view of encouraging them listing a company was not as cumbersome or expensive as is generally perceived. He requested them to take the message to their respective boards.

ESG reporting extremely important - SEC Chairman


SEC Chairman Viraj Dayaratne

SEC Chairman Viraj Dayaratne underscored the importance of transparent disseminating their Environmental, Social, and Governance (ESG) related data in their annual reports.

Dayaratne further linked such information to potentially being part of the material information that could be the duty of companies to report to all stakeholders through market disclosures.

Dayaratne was speaking as chief guest on 9 December at the CA Sri Lanka's Annual Report Awards ceremony held at the BMICH.

Dayaratne noted that in the coming years the Annual Report Awards was to incorporate to a larger scope ESG factors into the assessment criteria.

Dayaratne was of the view that the annual report to terms of documentation was one of the most important things that a company has in its communication with all stakeholders. He was of the view that good corporate governance was reflected in the annual report

Dayaratne said, "In the long-run good corporate governance pays off."

Dayaratne highlighted that in an increasingly complex and technologically evolving world the need for companies to stay ahead of the risks posed by public concerns of ESG was paramount. He noted that investors were more likely to invest in companies where the ESG data was disclosed in the marketplace.

Dayaratne noted that in the increasingly conscientious society investors would look at the ESG data as a measure of the potential risk a prospective investor would face when investing in a company.

Dayaratne highlighted that stakeholders were looking to assess ESG indices to be able to compare companies. ESG reporting would also help act as a check and balance on companies thereby bringing discipline and accountability in their dealings. Dayaratne was of the view that the corporate sector would be welcoming of more widespread ESG reporting.

කොළඹ කොටස් වෙළෙඳ පොළ ඩිජිටල්කරණයේ දෙවැනි අදියර ආරම්භ වෙයි






SEC Chairman Viraj Dayaratne PC


CSE Chief Executive Officer (CEO) Rajeeva Randaranaika


High Commissioner of Sri Lanka to Singapore Sashikala Premawardhana

SEC to promote SL for portfolio investment

The Securities and Exchange Commission (SEC), along with the Foreign Ministry and the Colombo Stock Exchange (CSE), has commenced a series of virtual meetings to educate staff of Sri Lankan Missions overseas on the growth potential and investment opportunities available in the capital market of Sri Lanka.

This initiative will enable the respective staff of Missions overseas to promote portfolio investments to Sri Lanka among the investor community in the respective countries and assist the SEC and the CSE in organising future overseas forums.

"Portfolio investment will act as a catalyst for economic growth and is a top priority for the Government, particularly in the context of post-Covid economic recovery. These forums will offer the Sri Lankan diaspora the opportunity to understand the investment prospects available in the capital market of Sri Lanka as well," remarked SEC Chairman Viraj Dayaratne PC.

The CSE has performed exceptionally well in the past 12 months, with the All Share Price Index (ASPI) appreciating more than 55% and the S&P SL20 Index appreciating more than 44%.

Contd. on page 3

"ආන්තික ණය (Broker credit) කප්පාදු කිරීමට කිසිසේත්ම අපේක්ෂාවක් නැහැ"

New SEC Act comes into force

THE new Act of the Securities and Exchange Commission (SEC) came into force on Tuesday following the certification by the Speaker Mahinda Yapa Abeywardena.

The development follows the SEC Bill being passed by Parliament earlier this month without a vote.

The new law, which will replace the Securities and Exchange Commission of Sri Lanka Act No. 36 of 1987 and aims to regulate the capital market in keeping with current international best practices.



මෙහෙයුම් සමාලෝචනය

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමාජ මාධ්‍ය තුළින් දැනුවත් කිරීම


















உங்களுக்கு
தெரியுமா?
முதலீடு செய்யும் போது
முதலீட்டாளர் தன்னால் முகாமை
செய்ய இயலுமான ஆபத்தை
மட்டுமே எடுத்துக்கொள்வது
முதலீட்டில் மிகமுக்கியமான
ஒன்றாகும்.


உங்களுக்கு தெரியுமா?
உங்களது முதலீட்டு தீர்மானங்கள்
ஆதாரமற்ற வதந்திகள்/உதவிக்
குறிப்புகள் மற்றும் போலியான சமூக
ஊடக பதிவுகளை அடிப்படையாக
கொண்டல்லாமல் நம்பகரமான
ஆதாரங்களை அடிப்படையாக
கொண்டதாக இருக்கவேண்டும்.
FAKE NEWS


ඔබ දැන සිටියාද?
READ CAREFULLY


உங்களுக்கு தெரியுமா?
இலங்கையில் மூலதனச் சந்தை தொடர்பான சேவைகளை வழங்குவதற்கு அந்நிறுவனங்கள் இலங்கை நிறுவனங்களை மற்றும் பிரிவுகளை ஆணைக்குழுவின் அனுமதிப்பத்திரத்தினை அல்லது ஆணைக்குழுவில் பதிவு செய்திருக்க வேண்டும்.
LICENSED


SEC
Risk comes from not knowing what you're doing


DID YOU KNOW ?
The Securities and Exchange Commission of Sri Lanka
DOES NOT grant licences to agents to operate in other jurisdictions or to act as agents of international stockbroker firms.
SEC
SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA


Do you know that your 'Stockbroker' WILL NOT carry out transactions on behalf of you if you do not submit your Email Address and Mobile Number to your Stockbroker on or before 10th September 2020


Investing starts with a plan, and an investment plan starts with defining your financial goals.
Here's what to ask yourself:
What goals do I want to achieve with my investments?
How much do I need to invest to achieve my goals?
How much can I afford to invest?
What is my risk tolerance?
How can I be educated on Market Malpractices?
Have I checked my investment professional's background on www.sec.gov.lk?

මෙහෙයුම් සමාලෝචනය

මානව සම්පත්

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ මූලික විශ්වාසයන් සහ මූලික වටිනාකම් ආරක්ෂාකර ගනිමින්, නිරන්තරයෙන් වෙනස් වන බාහිර පරිසරයකට හැඩගැසීමට අපේක්ෂා කරන හැකියාවන් පෙන්නුම් කර ඇත. එවැනි පසුබිමක් තුළ, ආයතනයේ සෑම සේවකයෙකුටම හෙට දවසේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගොඩනැගීම සඳහා තනි පුද්ගල මෙන්ම එකිනෙක හා බැඳුණු කාර්යභාරයක් ඇත.

මානව සම්පත් ගතිකත්වය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට වඩාත් ශක්තිමත්ව වර්ධනය විය හැක්කේ විවිධ වයස්, ජාතිකත්වයන්, ජාතීන්, අත්දැකීම් සහ ධූරාවලී මට්ටම්වලින් යුත් විවිධ පරාසයක සේවකයින් සිටීම සහ ඔවුන් එකිනෙකාගේ වෙනස් වූ වටිනාකම් පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුත් හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීමෙන් පමණි.

තවද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාර්ථකත්වය අපගේ කැපවූ සේවක මඩුල්ලේ නිර්මාණශීලිත්වය, දැනුම, කුසලතා සහ අඛණ්ඩතාව සමඟ සෘජුවම බැඳී ඇත. තනතුරු වෙනස්කම් නොතකා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, මධ්‍යම කළමනාකරිත්වය, ලේකම් ශ්‍රේණිය සහ විධායක නොවන ශ්‍රේණියට අයත් සියල්ලන්ම සාමූහිකව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එක පවුලක් ලෙස නියෝජනය කරයි. දක්ෂතාවය සැමවිටම අපගේ ප්‍රමුඛතාවය වී ඇති අතර අපගේ දැක්ම වන්නේ අපගේ මිනිසුන්ට මුල් තැන දෙන මානුෂීය සේවා ස්ථානයක් පවත්වාගෙනයාමයි.



ප්‍රශාන්ති සබේසන් මහත්මිය
අධ්‍යක්ෂිකා, මානව සම්පත්



අශෝතා දයාරත්න මහත්මිය
කළමනාකාරිනී - මානව සම්පත්

කොවිඩ්-19 වසංගතයට මුහුණ දීම

සැළකිලිමත් ආයතනයක් ලෙස, කොවිඩ් 19 වසංගතය අතරතුර, මනුෂ්‍යත්වය වැලඳ ගැනීම සහ අවබෝධයෙන් සහ සැළකිල්ලෙන් සිටීම කෙතරම් තීරණාත්මකද යන්න සේවකයින්ට පෙන්වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දැඩි ස්ථාවරයක කටයුතු කළේය. මෙම පෙර නොවූ විරූ අභියෝග කාල පරිච්ඡේදය තුළ සෞඛ්‍යය සහ යහපැවැත්ම අපගේ සේවකයින් අතර ප්‍රමුඛතාවය බවට පත්විය. එබැවින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සහතික කිරීම සඳහා ලේකම් කාර්යාලය විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද, මූලික/ප්‍රධාන කාර්යයන් හඳුනා ගනිමින් කාර්ය මණ්ඩලය යොදවා ගැනීමට උපාය මාර්ග සකස් කරන ලදී. දත්ත ආරක්ෂාව සහතික කරමින් වඩා තීරණාත්මක රැකියා භූමිකාවන් සහිත කාර්ය මණ්ඩලය දුරස්ථව වැඩ කිරීම සඳහා අනුයුක්ත කරන ලද අතර එහිදී ඔවුන්ට ලැප්ටොප්, ඩොන්ගල් සහ දුර සිට වැඩ කිරීමේ ප්‍රවේශය ලබා දී සාමාන්‍ය වැඩවලට ඇති බාධා අවම කිරීම සඳහා කටයුතු කරන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයන් බාහිර පරිසරයට නිරාවරණය වීම අවම කිරීම සඳහා, වසංගත කාල සීමාව තුළ ප්‍රවාහන පහසුකම් ද සපයන ලදී. පසුව, කොවිඩ් 19 කොන්දේසි වල බරපතලකම අනුව, දෛනික සහ තීරණාත්මක රැකියා භූමිකාවන් ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලය සේවයට වාර්තා කිරීම සඳහා වැඩ වාර පදනම මත (Roster) ආයතනය වෙත කැඳවීම සඳහා උපාය මාර්ග සකස් කරන ලදී. එමගින් ගැබිනි මව්වරුන්ට සහ කුඩා දරුවන් සිටින මව්වරුන්ට නිවසේ සිට වැඩ කිරීමට තවදුරටත් අවසර ලබා දී ඇත.

කාර්ය මණ්ඩලය

ප්‍රාග්ධන වෙළෙඳපොළේ අභියෝගවලට මුහුණ දීම සඳහා උද්‍යෝගීමත් සහ රාජකාරී සඳහා කැපවූ කාර්ය මණ්ඩලයක් අත්‍යවශ්‍ය වේ. එබැවින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය බඳවා ගැනීමේ මෙහෙයුම අබන්ධව සිදු කරගෙන ගිය අතර, ප්‍රධාන මෙහෙයුම් අංශ සඳහා එක් අධ්‍යක්ෂවරයෙකුගේ සහ සහකාර කළමනාකරුවන්ගේ තනතුරු දාහතරක තනතුරු පිරවීම සඳහා දක්ෂතා සහ සුදුසුකම් ලත් පළපුරුදු පුද්ගලයන් බඳවා ගැනීමට ලේකම් කාර්යාලයට හැකි විය. තවද, ඉදිරි වර්ෂය තුළ තවත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු කිහිපයක් පිරවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සඵලතාවය වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචනයට ලක් කළ වර්ෂය තුළ ස්ථාවර කාලීන කොන්ත්‍රාත් පදනමක් මත උපදේශකයෙකු ද බඳවා ගන්නා ලදී. (සටහන්: 7, 8, 9, 10, 11)

රූප සටහන 7: සේවා තොරතුරු



රූප සටහන 08 : කාර්ය මණ්ඩලයේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විශ්ලේෂණය



රූප සටහන 09: කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී/පුරුෂ සංයුතිය



රූප සටහන 10: කාර්ය මණ්ඩලයේ වයස් විශ්ලේෂණය



රූප සටහන 11 : පවත්නා ස්ථිර රැකියා තනතුරුවල තත්ත්වය



අධ්‍යාපනය සහ සංවර්ධනය

පරිසරයේ පවතින නව ප්‍රවණතා සහ අභියෝග සහ ඒවාට මුහුණ දීමට අවශ්‍ය කුසලතා ඇතුළත් කර ගැනීම සඳහා පුහුණු ක්‍රමවේදයන් සහ උපාය මාර්ග පිළිබඳව කලින් කලට නැවත සොයා බැලිය යුතු බව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විශ්වාස කරයි. ආයතනික අවශ්‍යතා සපුරාලීමට මෙන්ම පුද්ගල වර්ධනයට පහසුකම් සැලසීමටත්, එමඟින් සේවකයින්ට අභියෝගාත්මක වෘත්තීන් ලබා දීමටත්, සියළුම කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කුසලතා සහ නිපුණතා උපරිම කිරීමට හැකි වන පරිදි පුහුණු අවස්ථා පුළුල් කර ඇත. ඒ අනුව දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබාදීමේ සම්මිශ්‍රණයක් ජනවාරි මාසයේදී ආරම්භ විය.

සමාලෝචිත වර්ෂය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කාර්ය මණ්ඩලට විදේශ පුහුණුව ලබාදීම සඳහා රුපියල් මිලියන 25 ක් වෙන් කරන ලදි. අවාසනාවකට, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිසන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOSCO), ආසියා පැසිෆික් කලාපීය ආර්ථික සහයෝගීතාව පිළිබඳ සංවිධානය (APEC), වෙනත් රටවල සුරැකුම්පත් නියාමන කොමිෂන් සභා සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතන වැනි සංවිධානවලට වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත්, IOSCO, ජපන් සුරැකුම්පත් අලෙවිකරුවන්ගේ සංගමය (JSDA), සිංගප්පූරුවේ මුදල් අධිකාරිය, මැලේසියා සුරැකුම්පත් භුවමාරුව සහ IOSCO/PIFS - හාවඩ් නීති විද්‍යාලය ආදී ආයතන සහ සංවිධාන විසින් සංවිධානය කරන ලද මාර්ගගත සම්මන්ත්‍රණ කිහිපයක් සඳහා සම්බන්ධවීමට ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අවස්ථාව සලසා දෙන ලදී.

මීට අමතරව, සමාලෝචිත වර්ෂය තුළදී, ජාතික නීති සම්මන්ත්‍රණය 2021, බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද, "නිර්මාණශීලී ආර්ථිකය": අනාගත ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය සඳහා උපාය මාර්ගය', නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (New SEC Act.) පිළිබඳව සාංගමික නීති උපදේශකයින් විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ, 20 වන ආසියා පැසිෆික් කලාපීය ගණකාධිකාරීවරුන්ගේ සමුළුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ 42 වන සමුළුව සහ 2021 ශ්‍රී ලංකා ආර්ථික සමුළුව වැනි දේශීය පුහුණු වැඩසටහන් කිහිපයකට ද කාර්ය මණ්ඩලය සහභාගී විය.

කාර්ය මණ්ඩලය තුළ අධ්‍යාපනය සඳහා වූ කැපවීම පෙන්නුම් කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පුහුණු අංශය විසින් කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන පාඨමාලා හැදෑරීමට අඛණ්ඩව අවස්ථාව ලබා දෙයි. වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය (CFA) කාර්ය මණ්ඩලයට වට්ටම් කළ අයකිරීම් සහිත පාඨමාලා හැදෑරීමට ශිෂ්‍යත්ව ලබා දෙයි. මීට අමතරව, පාඨමාලාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු ලේකම් කාර්යාලයට සේවය කිරීම සඳහා වසර දෙකක බැඳුම්කරයකට යටත්ව පශ්චාත් උපාධි ඇතුළු උසස් අධ්‍යයන කටයුතු සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අනුග්‍රහය ලබා දීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කටයුතු යොදනු ලබයි.

ආයතනය තුළ සිදු වන අදාළ පුහුණු වැඩසටහන් පිළිබඳව සේවකයින් දැනුවත් කිරීමට සහ දැනුම සහ කුසලතා අතින් ඉදිරියෙන් සිටීමට අවශ්‍ය පුහුණු අවස්ථා සෙවීමට සේවකයින් කැපවී සිටින බව සහතික කිරීමට ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව උපකාර කර ඇත.
එම ක්‍රියාවලියේ එක් කොටසක් ලෙස, ඔවුන්ගේ අංශ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර පුහුණු අවස්ථා සඳහා අයදුම් කිරීමට සේවකයින් දිරිමත් කරනු ලැබීය. අපගේ සේවකයින්ට ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ඇති තරඟකාරී වාසි ලබා දීම වැදගත් බව අපි විශ්වාස කරමු. අපගේ සේවකයින් හට අයෝගවලට මුහුණ දෙමින් ආයතනය සාර්ථකත්වය කරා ගෙන යාමට අවශ්‍ය නිපුණතාවයන් ලබාදීමට හැකි පරිසරයක් සකස් කර ඇති බවට අපි සහතික වෙමු.

සම්පත් යොදා ගැනීම

සේවයේ නියැලීම යනු සුවිශේෂී කාර්යසාධනය අවබෝධ කර ගැනීම සහ දිරිගැන්වීම සඳහා වටිනා සංකල්පයකි. මනා පෙළඹවීමක් සහිත, ස්ථිර සහ විශ්වාසවන්ත සේවකයින්ගේ වැදගත්කම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දිගු කලක් තිස්සේ හඳුනාගෙන ඇත. එබැවින්, පුහුණු හා සංවර්ධන සහ සුබසාධන කටයුතු සේවක නියැලීම ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙනයාම සඳහා යොදා ගැනේ. සේවකයින්ගේ සහභාගීත්වය සහ කාර්යසාධනය දිරිගැන්වීම සඳහා සංස්කෘතිය ද තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ලේකම් කාර්යාලයේ සෑම සේවකයෙක්ම බොහෝ මට්ටම් සහ විවිධ පැතිවලින් දායකත්වයන් සපයයි.

මීට අමතරව, දිගුකාලීන සේවක කැපවීම වර්ධනය කිරීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය අර්නස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ උපදේශකයින් සමඟ සම්බන්ධ වී වන්දි සහ ප්‍රතිලාභ පිළිබඳ වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදු කරගෙන යනු ලබයි. එම ව්‍යාපෘතියේ පරමාර්ථය වූයේ වන්දි ව්‍යුහයේ පවතින විෂමතා අධ්‍යයනය කිරීම සහ එම විෂමතා නිවැරදි කිරීම සහ වෙළෙඳපොළ සමීක්ෂණ සොයාගැනීම්වලට අනුකූලව සංශෝධන සඳහා විකල්ප ලබා දීමයි.

ඉලක්කගත සංවර්ධන ක්‍රියාකාරකම් මෙන්ම ඊට ගැළපෙන සේවා පරිසරයක් නිර්මාණය කිරීම තුළින් අභියෝගාත්මක ප්‍රාග්ධන වෙළෙඳපොළක් තුළ ක්‍රියාත්මකවීමට මෙන්ම විශිෂ්ටත්වයේ ඉහළ මට්ටම් කරා ළඟා වීමට ලේකම් කාර්යාලයට උත්තේජනයක් ලබා දී ඇත. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ දීර්ඝ කාලයක් සේවය කළ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව ලේකම් කාර්යාලය සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ස්ථාපිත කර නියාමනය කිරීමට මූලික පියවර ගෙන ඇත. මෙම පියවර තුළින් කාර්යමණ්ඩලයේ කැපවීමේ මට්ටම පිළිබිඹු කරන අතර, කාර්ය මණ්ඩල

මෙහෙයුම් සමාලෝචනය

සාමාජිකයින් දිගු කාලීනව ආයතනයේ කොටසක් වීමට ලේකම් කාර්යාලයට අවශ්‍ය බව පෙන්නුම් කරයි. තවද, එමඟින් ආයතනය වෙත වැඩි පක්ෂපාතිත්වයක් අපේක්ෂා කරයි.

සමාජ සුභසාධනය

කොවිඩ් 19 වසංගතය මධ්‍යයේ, මානව සම්පත් අංශය සේවක නියැලීමේ මට්ටම් ඉහළ නැංවීම, එකිනෙකා තේරුම් ගැනීමට අවස්ථාව ලබා දීම, රැකියා තෘප්තිය වැඩි කිරීම සහ සේවකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් සේවකයින් සඳහා විවිධ සමාජ ක්‍රියාකාරකම් සංවිධානය කළේය.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වසරේ පළමු වැඩ කරන දිනයේ අලුත් අවුරුදු සැමරීම, සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව, සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුම සහ සුපුරුදු පරිදි වසර අවසානයේ නත්තල් උත්සවය පැවැත්වීම වැනි අංග ඇතුළත් ක්‍රියාකාරී සමාජ දින දර්ශනයක් පවත්වාගෙන ගියේය.

තවද, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දරුවන් අතර කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මගපෙන්වීම ඇතිව මානව සම්පත් අංශය ජාතික සාක්ෂරතා මාසය සැමරීමේ කොටසක් ලෙස කියවන්නෙකු බිහි කිරීම් නමින් කියවීමේ වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වූයේ කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ සේවකයින්ට තම දරුවන්ට සාක්ෂරතා සංස්කෘතියක් නිර්මාණය කිරීමට උපකාර කිරීමයි. එමඟින් කොවිඩ් 19 තත්ත්වය යටතේ දූ දරුවන්ට පොත් තෝරා ගැනීම සහ පහසුවෙන් පොත් ලබා ගැනීම සහ ජීවිත කාලය පුරාම කියවීම රුචිකත්වයක් ඇති කිරීම බලාපොරොත්තු විය. මීට අමතරව චිත්‍ර හා රචනා තරඟ, කෙටිකතා තරඟ ද පැවැත්විණි. ජයග්‍රාහකයන්ට සරසවි පොත්හලෙන් තෑගි වවුචර ප්‍රදානය කෙරිණි.

මෙම ක්‍රියාකාරකම්වලින් පැහැදිලිවම පෙන්නුම් කරන්නේ සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය සේවකයින්ගේ යහපැවැත්ම ගැන සොයා බැලීම සඳහා ඇති කැපවීම කොතෙක්ද යන්නයි.

විශිෂ්ටත්වය සඳහා උත්සාහ කිරීම

මානව සම්පත් ක්‍රියාකාරකම් තුළින් අභියෝග කාරී වසරක ඉලක්ක සහ කාර්ය සාධන ප්‍රමිති නැවත ඇගයීමට ලක් කරන බැවින් නම්‍යශීලී බව අත්‍යවශ්‍ය ගුණාංගයක් වී ඇත. 2021 වසර තුළ ගෙන ආ වෙනස්කම්, ඊළඟ වසර තවත් පරිවර්තනයේ වසරක් බවට පත් කරයි. විශේෂයෙන් වසංගතයේ පහවයාමත් සමඟ සිදුවෙමින් පවතින වේගවත් වර්ධනයන් සමඟ වේගයෙන් ගමන් කිරීම සඳහා කර්මාන්තයන්හී වර්ධනීය තත්ත්වයන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. ඒ අනුව, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විශ්වාස කරනුයේ 2022 වර්ෂය ආයතනයේ සංවර්ධනය සහ අනාගතයේ වැඩ කටයුතු හැඩගැස්වීම කෙරෙහි අවධානය යොමු කරනු ලබන වැදගත් වසරක් වනු ඇති බවයි.

ව්‍යවස්ථාපිත අරමුදල්

සෙස් අරමුදල

1991 අංක 26, 2003 අංක 18, 2009 අංක 47 දරන පනත් මඟින් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (පැරණි සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත) 14 බී යන වගන්තිය යටතේ පිහිටු වන ලද ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (සෙස් අරමුදල) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (නවව සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත) අංක 156 (1) වගන්තිය මඟින් ප්‍රතිස්ථාපනය කරන ලදී. 2021 සැප්තැම්බර් 21 සිට නව පනත ක්‍රියාත්මක වේ.

පැරණි සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14A සහ 14B වගන්තිවලට අනුව සෙස් අරමුදලේ ක්‍රියා පටිපාටිය සහ අරමුණු පහත පරිදි වේ.

14A (1) බලපත්‍රලාභී කොටස් හුවමාරුවක සටහන් කර ඇති හෝ එහි නීතිරීති යටතේ ඒ වෙත දැනුම් දී ඇති සෑම සුරුකුම්පත් මිලදී ගැනීමක් සහ විකිණීමක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් මඟින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති අනුපාත යටතේ සෙස් බද්දක් නියම කිරීම්, අයකිරීම් හා ගෙවීම් කිරීම් සිදු කළ යුතුය. ගැනුම්කරු සහ විකුණන්නා යන දෙකම විසින් විවිධ වර්ගයේ සුරුකුම්පත් සම්බන්ධයෙන් විවිධ අනුපාත නියම කළ හැක.

(2) මෙම වගන්තිය යටතේ පනවා ඇති සෙස් බද්ද වෙනත් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් බදු හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

14B (1) 14A වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් බැර කළ යුතු සෙස් අරමුදල නමින් අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) පහත අරමුණු වෙනුවෙන් සෙස් අරමුදලින් ගෙවීම් කිරීමට අනුමැතිය ලබාදීමට කොමිෂන් සභාවට බලය පවරා ඇත.

(අ) සුරුකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම;

(ආ) 38 වගන්තිය යටතේ පිහිටුවා ඇති වන්දි අරමුදලට බැර වී ඇති මුදල් වැඩ කිරීම; හා

(ඇ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි බලතල, යුතුකම් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

(3) සෙස් අරමුදලට බැර වී ඇති මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ හැකිය.

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 155 (1) සහ (2) සහ 156 (1), (2) සහ (3) යන වගන්තිවලට අනුව සෙස් අරමුදලේ ක්‍රියාකාරිත්වය සහ අරමුණු පහත ආකාරයෙන් සඳහන් කොට ඇත.

155 (1) බලපත්‍රලාභී කොටස් හුවමාරුවන සටහන් වී ඇති හෝ එහි නීතිරීති යටතේ දැනුම් දෙන ලද ගැනුම්කරු සහ විකුණුම්කරු යන දෙදෙනාම විසින් සිදුකරනු ලබන සෑම සුරුකුම්පත් මිලදීගැනීමක් සහ විකිණීමක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයන් මඟින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුපාතයකට අනුව වූ සෙස් බද්දක් නියම කිරීම්, අයකිරීම් හා ගෙවීම් කිරීම් සිදු කළ යුතුය. විවිධ වත්කම් පන්ති වෙනුවෙන් විවිධ අයකිරීමේ අනුපාතයන් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

156 (1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු වන අතර 156 වගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කළ යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නා වූ මුදල් ප්‍රමාණයන් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය.

(අ) සුරුකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටු වනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම.

(ඇ) එහි කාර්යය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේදී, සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියළු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සළකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාසට අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්යය සඳහා ණය ලබාදීම.

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ එහි නිළධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පිරිදි යෝග්‍යතාවය පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිළධරයන් සහ සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුළදී හෝ විදේශීය රටකදී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීම.

(3) සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

හිමිකම් සුරකුම්පත් සඳහා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බදු ගෙවීම්

කොළඹ කොටස් වෙළෙඳපොළ මාර්ගෝපදේශයන්ට අනුව, සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හිමිකම් සුරකුම්පත් සඳහා අය කරන ලද සෙස් බද්ද දෙවන වරටත් 2010 අගෝස්තු 1 දින සිට බලපැවැත්වෙන පරිදි එක් ගනුදෙනුවකට 0.09% සිට 0.072% දක්වා අඩු කර ඇත. පසුව අඩු කිරීම 2003 දෙසැම්බර් 1 දින සිට ක්‍රියාත්මක වූ අතර ඒ අනුව ගනුදෙනුවකට අදාළ සෙස් බද්ද 0.1% සිට 0.09% දක්වා අඩු ලරන ලදී.

තවද, 2017 ජූනි 27 දින සිට බලපැවැත්වෙන පරිදි එම ගනුදෙනු පරාසය රු. මිලියන 100ක් දක්වා වන ගනුදෙනු වලට අදාළ වන ලෙස වෙනස් විය. මීට පෙර එය පැවතියේ , 2011 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් මිලියන 50 ක් හා රුපියල් මිලියන 50 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු ලෙස වන අතර



නිරෝෂා කොඩිකාර මහත්මිය
අධ්‍යක්ෂිකා, මූල්‍ය හා පරිපාලන



ලක්ෂ්මී වික්‍රමායක මහත්මිය
කළමනාකාරිනී, මුදල් සහ පරිපාලන

අයකරනු ලැබූ සෙස් බද්ද පිළිවෙලින් 0.072% ක, හා 0.045% ක විය. අනතුරුව, 2017 ජූනි 27 න් පසුව රු.මිලියන 100 ක් දක්වා සහ රු. මිලියන 100 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු පරාසයන් සඳහා අයකරනු ලබන සෙස් බද්ද පිළිවෙලින් 0.072% ක, හා 0.045% ක විය.

ඊට අමතරව, ගනුදෙනුකරුවෙකු විසින් එකම තැරැව්කරුවකු හරහා එකම සුරකුම්පත (හෝ ඊට පටහැනිව) මිලදී ගෙන විකුණන එක්දින දින වෙළෙඳාමේදී සුරකුම්පත් විනිමය කොමිෂන් සභාවට ගෙවිය යුතු ගනුදෙනු ගාස්තුව 2006 පෙබරවාරි 15 සිට බලපැවැත්වෙන පරිදි ගනුදෙනුවේ එක් පැත්තකින් අය නොකෙරේ.

මිලදී ගත් මුළු කොටස් ප්‍රමාණය විකුණන ලද මුළු කොටස් ප්‍රමාණයට සමාන නොවන්නේ නම්, ඉහත විස්තර කර ඇති පරිදි ගනුදෙනු ගාස්තු මිලදී ගත් හෝ විකුණන ලද අඩු කොටස් ප්‍රමාණයෙන් අය නොකෙරේ. මිලදී ගත් මුළු ප්‍රමාණය විකුණන ලද මුළු ප්‍රමාණයට සමාන වන අවස්ථාවක දී, විකුණුම් ගනුදෙනුවෙන් ගාස්තු අය නොකෙරේ. එසේම සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ගනුදෙනු ගාස්තුවෙන් නිදහස් කිරීම තීරණය කිරීම සඳහා එකම සුරකුම්පත මත ගනුදෙනුකරුවෙකුගේ මුළු මිලදී ගැනීම් සහ විකිණීම් සලකා බලනු ඇත. කෙසේ වෙතත්, ගණුදෙනු වල දෙපැත්තෙන්ම 0.30% ක රජයේ කොටස් ගනුදෙනු බද්ද අය කෙරේ.

සෙස් අරමුදලේ හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් එයට බැර කරන ලදී. එමෙන්ම 2009 සහ 2010 වසරවලදී වසරකට රු.මි.50 බැගින් සෙස් අරමුදලින් රුපියල් මිලියන 100ක් පියවීම් සහතික කිරීමේ අරමුදලට පවරන ලදී.

තවද රු.මිලියන 276ක්, රු.මිලියන 380ක්, රු.මිලියන 94ක්, රු.මිලියන 52ක් හා රු. මිලියන 312 ක් වශයෙන් අවස්ථා 5 දී පිළිවෙලින් 2010, 2012 ,2013, 2019 හා 2020 යන වර්ෂයන්හි දී ඒකාබද්ද අරමුදලට බැර කරන ලදී.

2021 දෙසැම්බර් 31 දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් මිලියන 3,884.3 ක් වන අතර එයින් රු. මිලියන 355.7 ක් මාස දොළහක් තුළ කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. 3,159.1 ක් මාස දොළහකට පසු කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. මිලියන 452.2 ක් සුරකුම්පත් ප්‍රති මිලදී ගැනීම් (රිපෝහි) ආයෝජනය කර ඇත.

2012 වසරේ සිට 2021 වසර දක්වා සෙස් අරමුදලෙහි වෙනස්වීම පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 12)

රූප සටහන 12: සෙස් අරමුදල



වන්දි අරමුදල

1987 දී සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීමත් සමග වන්දි අරමුදල ක්‍රියාත්මක විය. 2021 සැප්තැම්බර් 20 දක්වා බලපැවැත්වෙන 1987 අංක 36 දරන සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ (පැරණි සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත) 38 වැනි වගන්තිය යටතේ, වන්දි අරමුදලක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත වගකීමකි.

පැරණි සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 38 සහ 39 වගන්තිවලට අනුව වන්දි අරමුදල පවත්වාගෙන යාමේ අරමුණ සහ මාර්ගෝපදේශ පහත පරිදි වේ

මෙහෙයුම් සමාලෝචනය

38 (1) බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු තම ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මුදල් අලාභයකට ලක්වන ඕනෑම ආයෝජකයෙකුට වන්දි ලබා දීම සඳහා වන්දි අරමුදල නමින් අරමුදලක් ස්ථාපිත කළ යුතුය.

(2) වන්දි අරමුදල සමන්විත විය යුත්තේ;

(අ) අරමුදලේ අරමුණ සඳහා පාර්ලිමේන්තුව විසින් ඡන්දය ප්‍රකාශ කළ හැකි අරමුදලක් විය යුතුය.

(ආ) එවැනි මුදල් 51A වගන්තිය යටතේ අරමුදලට බැර කළ හැක; (51A වගන්තිය යනු වරදවල් නිවැරදි කිරීම්වලට අදළ දඩ මුදල් සම්බන්ධව වේ).

(ඇ) එවැනි මුදල්, සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14B වගන්තිය යටතේ සෙස් අරමුදලෙන් බැර කළ හැක.

(3) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වන්දි අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ හැක.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 39(1) වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් අතරින් වින්දි කමිටුවෙන් සමන්විත සාමාජිකයින් තිදෙනෙකු පත් කිරීමට අවශ්‍ය වේ.

2021 සැප්තැම්බර් 20 දින සිට බලපැවැත්වෙන පරිදි 2021 අංක 19 දරන සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (නව සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනතේ) 158 වගන්තිය යටතේ, වන්දි අරමුදලක් පිහිටුවීම සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 සහ 159 වගන්තිවලට අනුව වන්දි අරමුදල පවත්වාගෙන යාමේ අරමුණ සහ මාර්ගෝපදේශ පහත පරිදි වේ.

158. (1) බලපත්‍රලාභී කොටස් තරව්කරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයකුට වන්දි ප්‍රදානය කිරීම සඳහා මෙම වන්දි අරමුදල පිහිටුවන ලදී.

(2) එම වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) වන්දි අරමුදලෙහි කාර්යය සඳහා පර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල්.

(ආ) මෙම පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කළ හැකි මුදල්; හා

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සෙස් අරමුදලෙන් බැර කළ හැකි මුදල්.

(3) වන්දි අරමුදලෙහි බැරට ඇති මුදල්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ හැකිය.

සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 159 වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය.

පත් කරන ලද කමිටුව යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් කමිටුව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය මෙන්ම මෙම පනතේ අරමුණු සඳහා තීරණාත්මක වේ.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධි විධාන සලසා ඇත. පනත අනුව ඉල්ලුම්කරුවෙකු විසින් හිමිකම් පෑමට සහාය වන පරිදි ඉදිරිපත් කරන ලද ලේඛන සහ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසු හෝ එවැනි නඩු විභාගයක නිගමනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වූ ඕනෑම අවස්ථාවක කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසරදීම හෝ නොදීමට ඉඩ ඇත. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

වන්දි අරමුදලෙහි හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50 ක් වන්දි අරමුදලට බැර කරන ලදී.

2021 වර්ෂය අවසානය වන විට වන්දි අරමුදලේ ශේෂය රුපියල් මිලියන 561.6 ක් වූ අතර එයින් රු. මිලියන 113.6 ක් මාස දොළහකින් කල් පිරෙන ණ්ඩාගාර බැඳුම්කරවල ද මාස 12 කට පසු කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල රුපියල් මිලියන 394.2 ක් ද ආයෝජනය කර ඇති අතර මිලියන 40 ක් සුරුකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල (රිපෝ හි) ආයෝජනය කර ඇත.

2012 සිට 2021 දක්වා කාලය තුළ වන්දි අරමුදලේ සංචලනය පහත දැක්වේ. (රූප සටහන 13)

රූප සටහන 13: සටහන: වන්දිඅරමුදල



පියවීම් සහතික කිරීමේ අරමුදල

මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස 22 ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගීකරුවන් අතර ගනුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ක්‍රියාකාරිත්වය පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.

- කොටස් ගනුදෙනුවක් වූ සැනින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් බෙරුම් කිරීම කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී, එනම් ගැනුම්කරු විසින් ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් සිදු කළ යුතු අතර විකුණුම්කරුට ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් කොටස් අයිතිය පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන් සුරක්ෂිත නොවන පියවීම් අවදානමක් ඇතිවන නිසා මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාව ඇතිවිය.

- මෙම අරමුදලේ භාරකරුවන් නිළ බලයෙන් ඊට පත් වන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති, කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති, මහා භාණ්ඩාගාරයෙහි නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන විධායක නිලධාරී යන අය ඊට ඇතුළත් වේ.
- ශ්‍රී ලංකා රජය මෙම අරමුදල ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 50 ක මුදලක් ප්‍රදානය කර ඇත. මෙම අරමුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. මෙම අරමුදලට ප්‍රතිපූරක වශයෙන් පරිත්‍යාග තෑගී සහ ප්‍රදානයක් ලබාගත හැකි වේ. වර්තමානයේදී කොටස් තැරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායකවීමෙහි අවශ්‍යතාවක් නොමැත.
- කෙසේ වෙතත්, පියවීම් සහතික කිරීමේ අරමුදල, පියවීම් අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගෙන තිබේ. පියවීම් සහතික කිරීමේ අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි හැසිරීම

අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වර්ෂයන්හිදී රුපියල් මිලියන 50 බැගින් වූ සමාන ප්‍රමාණ දෙකකින් රු. මිලියන 100 ක් සෙස් අරමුදලෙන් පියවීම් සහතික කිරීමේ අරමුදලට බැර කරන ලදී. පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාර ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මාසයේදී කොළඹ කොටස් හුවමාරුව විසින් ද අරමුදල ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් ලබා දෙන ලදී.

2021 දෙසැම්බර් අවසානය වන විට පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ශේෂය රුපියල් මිලියන 1065.9 ක් වූ අතර එයින් රු. මිලියන 278.7 ක් මාස දොළහකින් කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇති ඇත. මාස දොළහකට පසු කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇති මුදල රුපියල් මිලියන 194.8 කි. රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු සඳහා රුපියල් මිලියන 300 ක් ආයෝජනය කර ඇති අතර සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල ආයෝජනය කර ඇති මුදල රු. මිලියන 242.9 කි.

2012 සහ 2021 කාලය තුළ පියවීම් සහතික කිරීමේ අරමුදලේ සංචලනය පහත දැක්වෙන ප්‍රස්ථාරයේ දක්වා ඇත. (රූප සටහන 14)

රූප සටහන 14: පියවීම් සහතික කිරීමේ අරමුදල



තොරතුරු තාක්ෂණය

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ, ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (ඊඑෂ) යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තුළ සුරක්ෂිත තොරතුරු තාක්ෂණ පරිසරයක් ඇති කිරීම අරමුණු කර ගනිමින්, ඉදිරි වසර 5 සඳහා ආයතනික තොරතුරු තාක්ෂණ උපාය මාර්ගයක් සහ ඉදිරි ගමන් මග ඇතුළත් සැළැස්මක් සකස් කිරීම සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව කේ පී එම් ජී ශ්‍රී ලංකා (ණජඑඨ්රස බ්බන්) සහ ඒ ඒ එම් කළමනාකාරණ උපදේශන සේවාව (හංගේරියා) ('එ ඒබ්ටැපැබඑ ෂබදෙරප්එසදබ ඤබ්මකඑසබට (ඨමබට්රහ)) වෙත ප්‍රදානය කරන ලදී.

එබැවින්, මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉහත උපදේශන සහය ඉතා වැදගත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර එය මෙහෙයුම් කාර්යක්ෂමතාව ද වැඩිදියුණු කරනු ඇත.

ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කෙරේ. පළමු අදියර වන්නේ ඉදිරි වසර පහ සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා ආයතනික තොරතුරු තාක්ෂණ උපාය මාර්ගයක් සහ ඉදිරි ගමන් මග පිලිබඳ සැළැස්මක් සකස් කිරීම වන අතර දෙවන අදියර වන්නේ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත කිරීමේ පහසුකම්/අධීක්ෂණ සහාය සැපයීම සහ තොරතුරු තාක්ෂණ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා ලංසු ලේඛන සකස් කිරීම සඳහා සහාය ලබා දීමයි.

පත් කරන ලද ව්‍යාපෘති සමාලෝචන කමිටුව විසින් දැනට පවතින පද්ධති, ව්‍යාපාර ක්‍රියාවලි, තොරතුරු පද්ධති ගෘහ නිර්මාණ ශිල්පය, තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සමාලෝචනය සහ අන්තර්ජාතික ආචාරධර්ම නිර්නායක වලට අනුව පවතින දුර්වලතා/අඩුපාඩු හඳුනා ගැනීමෙන් පසු මූලික වාර්තාවක් සහ හඳුනාගැනීමේ වාර්තාවක් සකස් කර අවසන් කිරීමට සමත් විය.

තවද, හඳුනාගත් පද්ධතිවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය කිරීමට ද පියවර ගෙන ඇත.

අතිරේක තොරතුරු

වෙළෙඳපොළ අතරමැදියන්

ආන්තික ණය සැපයුම්කරුවන් යන යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ඇක්විටි පාර්ට්නර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
2. ඇසෙට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ්
3. බෙන්සෙයි සෙකියුරිටීස් කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ්
4. කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් ප්‍රයිවට් ලැමිටඩ්
5. සිටිසන් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී
6. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
7. ඩී එෆ් සි සී බෂෘන්ක් පී එල් සී
8. ඩයලොග් ෆයිනෑන්ස් පී එල් සී (පෙර කලම්බු ට්‍රස්ට් ෆයිනෑන්ස් පී එල් සී)
9. හැටන් නැෂනල් බැන්ක් පී එල් සී
10. ජේ බී ක්‍රෙඩිට් පී එල් සී
11. එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී
12. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
13. නේෂන් ලංකා කැපිටල් ලිමිටඩ්
14. නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී
15. පෑන් ඒෂියා බැන්කිත් කෝපරේෂන් පී එල් සී
16. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
17. පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී එල් සී
18. රිචර්ඩ් පීරිස් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයවට් ලිමිටඩ්
19. සම්පත් බැන්ක් පී එල් සී
20. සෙලාන් බැන්ක් පී එල් සී

ආයෝජන කළමනාකරුවන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. අමානා ඇසෙට් ලිමිටඩ් ෆෆ
2. ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
3. ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
4. ඇසෙට්ලයින් කැපිටල් (පුද්ගලික) සමාගම
5. ලංකා බැංකුව
6. කැපිටල් එලයින්ස් ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ්
7. කැපිටල් ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් සමාගම
8. සී බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම
9. කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම
10. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම
11. ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් සමාගම
12. ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම
13. හෙලියස් වෙන්චර්ස් (පුද්ගලික) සමාගම
14. ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්ගලික) සමාගම
15. ජේ බී ෆයිනෑන්ෂල් (පුද්ගලික) සමාගම
16. ලීනියර් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
17. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
18. නැෂනල් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්
19. එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
20. ඔරියන් ෆන්ඩ් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
21. ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
22. සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
23. සොෆ්ට් ලොජික් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
24. වොල්ඩොක් මැකෙන්සි ලිමිටඩ්

ප්‍රරක්ෂකයන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ලංකා බැංකුව
2. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
3. ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
4. හැටන් නැෂනල් බැන්ක් පී එල් සී
5. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
6. නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ඔෆ් පී එල් සී
7. සම්පත් බැන්ක් පී එල් සී
8. සෙලාන් බැන්ක් පී එල් සී

ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ෆිච් රේටිංග්ස්
2. ඉක්රා ලංකා ලිමිටඩ්
3. ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ්

කොටස් තැරැව්කරුවන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) ලිමිටඩ්
2. ආශා සෙකියුරිටීස් ලිමිටඩ්
3. ඒෂියා කැපිටල් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගමෆ
4. ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) ලිමිටඩ්
5. ඇසෙට්ලයින් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
6. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
7. කැන්ඩර් ඉක්විටිස් ලිමිටඩ්
8. කැපිටල් එලායන්ස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)
9. කැපිටල් එලායන්ස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
10. කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
11. සී. ටී. සී. එල්. එස්. ඒ. සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
12. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පුද්ගලික) සමාගම
13. ෆස්ට් කැපිටල් ඉක්විටීස් (පුද්ගලික) සමාගම
14. ෆස්ට් ගාඩියන් ඉක්විටීස් (පුද්ගලික) සමාගම
15. ජේ.බී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
16. ජෝන් කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම
17. ලංකා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
18. LOLC සෙකියුරිටීස් සමාගම
19. නේෂන් ලංකා ඉක්විටීස් (පුද්ගලික) සමාගම
20. NDB සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
21. නෙස්ටර් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම
22. NSB අරමුදල් කළමනාකරණ සමාගම (ණය සුරැකුම්පත්)
23. රිචඩ් පීරිස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
24. SC සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
25. සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්) සමාගම
26. සමර්විල් කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම
27. තැප්‍රොබේන් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
28. ටී.කේ.එස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
29. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)

කොටස් වෙළෙඳුන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
2. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම (ණය)
3. කැපිටල් එලායන්ස් ලිමිටඩ් (ණය)
4. සී. ටී. සී. එල්. එස්. ඒ. සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
5. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පුද්ගලික) සමාගම
6. ජේබී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
7. නේෂන් ලංකා ඉක්විටීස් (පුද්ගලික) සමාගම
8. නෙස්ටර් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම
9. සීමාසහිත NSB අරමුදල් කළමනාකරණ සමාගම (ණය)
10. සෙලාන් බැන්ක් පීඑල්සී (ණය)

11. සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්) සමාගම
12. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය)

ඒකක භාර කළමනාකරණ සමාගම් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ආර්පිකෝ අටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්
   I. ආර්පිකෝ අටරාසියා කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ් (කඑඔ)
   II. ආර්පිකෝ අටරාසියා ඉක්විටි ඉන්කම් ෆන්ඩ්
   III. ආර්පිකෝ අටරාසියා රිපෝ ඉන්වෙස්ට්මන්ට් ෆන්ඩ්
   IV. ආර්පිකෝ අටරාසියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ්
   V. ආර්පිකෝ අටරාසියා ෂීෘ ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
2. ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්
   I. ඒෂියා සෙකියුරිටීස් මනි මාර්කට් ෆන්ඩ්
3. ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   I. ඇස්ටෘ ඇක්ටිව් ඉන්කම් ෆන්ඩ්
   II. ඇස්ටෘ ඇල්ෆා ෆන්ඩ්
4. ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
   I. ඇසෙට්ලයින් ඉන්කම් ෆන්ඩ්
   II. ඇසෙට්ලයින් ඉන්කම් ප්ලස් ග්‍රෝත් ෆන්ඩ්
5. කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
   III. කැපිටල් එලයන්ස් බැලන්ස්ඩ් ෆන්ඩ්
   IV. කැපිටල් එලයන්ස් කෝපරේටි ඩෙබ්ට් ඇන්ඩ් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්
   V. කැපිටල් එලයන්ස් කෝපරේටි ට්‍රෙෂරි ෆන්ඩ්
   VI. කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ්
   VII. කැපිටල් එලයන්ස් ගිල්ට් මනි මාර්කට් ෆන්ඩ්
   VIII. කැපිටල් එලයන්ස් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්
   IX. කැපිටල් එලයන්ස් හයියිල්ඩ් ෆන්ඩ්
   X. කැපිටල් එලයන්ස් ඉන්කම් ෆන්ඩ්
   XI. කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ග්‍රේඩ් ෆන්ඩ්
   XII. කැපිටල් එලයන්ස් මීඩියම් රිස්ක් ඩෙබ්ට් ෆන්ඩ්
   XIII. කැපි කැපිටල් එලයන්ස් කොන්ටේටිවූ ඉක්විටි ෆන්ඩ්
   XIV. කැපිටල් එලයන්ස් ශ්‍රී ලංකා ඩොලර් ෆන්ඩ්
6. සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   I. සීබෑන්ක් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ්
   II. සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ී සීරිස්)
   III. සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ඊ සීරිස්)
   IV. සීබෑන්ක් හයියිල්ඩ් ෆන්ඩ්
   V. සීබෑන්ක් සේවින්ග්ස් ප්ලස් ෆන්ඩ් මනි මාර්කට් ෆන්ඩ්
   VI. සීබෑන්ක් සුරැකුම් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   VII. සීබෑන්ක් යුනිට් ට්‍රස්ට් ෆන්ඩ්
7. සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
   I. සිලෝන් ඩොලර් බොන්ඩ් ෆන්ඩ්
   II. සිලෝන් ෆයිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ්
   III. සිලෝන් ඉන්කම් ෆන්ඩ්
   IV. සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ්
   V. සිලෝන් අයි පී ඕ ෆන්ඩ්
   VI. සිලෝන් මනි මාර්කට් ෆන්ඩ්
   VII. සිලෝන් ටුවරිසම් ෆන්ඩ්
   VIII. සිලෝන් ට්‍රෙෂරි ඉන්කම් ෆන්ඩ්
8. කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   I. කොම්ට්‍රස්ට් ඒ ඩී එල් මුදරබා ෆන්ඩ්
   II. කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ්
   III. කොම්ට්‍රස්ට් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   IV. කොම්ට්‍රස්ට් මනි මාර්කට් ෆන්ඩ්
9. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   I. ෆස්ට් කැපිටල් ඉක්විටි ෆන්ඩ්
   II. ෆස්ට් කැපිටල් ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
   III. ෆස්ට් කැපිටල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   IV. ෆස්ට් කැපිටල් මනි මාර්කට් ෆන්ඩ්
   V. ෆස්ට් කැපිටල් වෙල්ත් ෆන්ඩ්
10. ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   I. ගාර්ඩියන් ඇක්විටි ඉක්විටි ෆන්ඩ්
   II. ගාර්ඩියන් ඇක්විටි මනි මාර්කට් ෆන්ඩ්
   III. ගාර්ඩියන් ඇක්විටි ඉන්කම් ෆන්ඩ්
11. ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
   I. ජේ බී වැන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ්
   II. ජේ බී වැන්ටේජ් ෂෝර්ට් ටර්ම් ගිල්ට් ෆන්ඩ්
   III. ජේ බී වැන්ටේජ් වැලූ ඉක්විටි ෆන්ඩ්
12. නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   I. නාමල් බෑන්ක් ෆන්ඩ්
   II. නාමල් ග්‍රෝත් ෆන්ඩ්
   III. නාමල් හයියිල්ඩ් ෆන්ඩ්
   IV. නාමල් ඉන්කම් ෆන්ඩ්
   V. නැෂනල් ඉක්විටි ෆන්ඩ්
13. එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
   I. එන් ඩී බී වෙල්ත් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   II. එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ්
   III. එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ෆන්ඩ්
   IV. එන් ඩී බී වෙල්ත් ඉන්කම් ෆන්ඩ්
   V. එන් ඩී බී වෙල්ත් ඉන්කම් ප්ලස් ෆන්ඩ්
   VI. එන් ඩී බී වෙල්ත් ඉස්ලාමික් මනි ප්ලස් ෆන්ඩ්
   VII. එන් ඩී බී වෙල්ත් මනි ෆන්ඩ්
   VIII. එන් ඩී බී වෙල්ත් මනි ප්ලස් ෆන්ඩ්
14. ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
   I. ප්‍රිමියර් ග්‍රෝත් ෆන්ඩ්
   II. ප්‍රිමියර් මනි මාර්කට් ෆන්ඩ්
15. සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   I. සෙන්නේ ඩයනමික් ඉන්කම් ෆන්ඩ්
   II. සෙන්ෆින් ඩිවිඩන්ඩ් ෆන්ඩ්
   III. සෙන්ෆින් ග්‍රොත් ෆන්ඩ්
   IV. සෙන්ෆින් ෂාරියා බැලන්ස්ඩ් ෆන්ඩ්
   V. සෙන්ෆින් ෂාරියා ඉන්කම් ෆන්ඩ්
16. සොෆ්ට්ලොජික් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   I. සොෆ්ට්ලොජික් ඉක්විටි ෆන්ඩ්
   II. සොෆ්ට්ලොජික් මනි මාර්කට් ෆන්ඩ්

වෙළෙඳපොළ ආයතන

1. කොළඹ කොටස් හුවමාරුව
2. සීමාසහිත මධ්‍යම තැන්පතු ක්‍රම (පුද්ගලික) සමාගම

අතිරේක තොරතුරු

වර්ෂය	2017	2018	2019	2020	2021
වාර්ෂික කොටස් පිරිවැටුම (රුපියල් මිලියන)	220,591	200,069	171,408	396,882	**1,173,157**
දේශීය (රුපියල් මිලියන)	117,135	111,378	109,003	318,354	**1,112,817**
විදේශීය (රුපියල් මිලියන)	103,456	88,691	62,405	78,527	**60,340**
වෙළෙඳපොළ දින (සංඛ්‍යාව)	241	240	241	209	**240**
දෛනික සාමාන්‍ය කොටස් පිරිවැටුම (රුපියල් මිලියන)	915	834	711	3,217	**4,888**
ගනුදෙනු වූ කොටස් සංඛ්‍යාව (සංඛ්‍යාව මිලියන)	8,468	6,001	9,855	21,349	**59,772**
දේශීය (රුපියල් මිලියන)	6,529	4,821	7,091	19,808	**57,905**
විදේශීය (රුපියල් මිලියන)	1,939	1,180	2,764	1,541	**1,866**
කොටස් ගනුදෙනු සංඛ්‍යාව	981,977	885,657	1,197,205	3,070,021	**8,131,508**
දේශීය	928,276	838,784	1,150,486	2,968,092	**8,009,816**
විදේශීය	53,701	46,873	46,719	101,929	**121,692**
නව ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව	3	3	2	1	**17**
ලේඛනයෙන් බැහැරවීම් සංඛ්‍යාව	2	2	10	7	**3**
ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව	296	297	289	283	**296**
ගනුදෙනුවූ සමාගම් සංඛ්‍යාව	279	279	279	266	**240**
වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපියල් බිලියන)	2,899.29	2,839.45	2,851.31	2,960.65	**5,489.17**
වසර අවසානයේ වෙළෙඳපොළ මිල ඉපයුම් අනුපාතය (වාර ගණන)	10.60	9.65	10.83	11.3	**13.6**
වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ ප්‍රතිශතයක් ලෙස මුළු පිරිවැටුම (%)	7.6	7.0	6.01	13.4	**21.4**
වසර අවසානයේ ලාභාංශ ඵලදාව (%)	3.19	3.09	3.2	2.7	**2.17**
වසර අවසානයේ මිල පොත් අගය (වාර ගණන)	1.31	1.18	1.1	1.1	**1.67**
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (%)	24%	21%	21%	19%	**37%**
මිල දර්ශක					
සියලු කොටස් මිල දර්ශකය (ASPI)	6,369.26	6,052.37	6,129.21	6,774.22	**12,226.01**
වාර්ෂික වෙනස්වීම් %	2.3	(5.0)	1.3	10.52	**80.48**
එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20	3,671.72	3,135.18	2,936.96	2,638.10	**4,233.25**
වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%)	5.0	(14.6)	(6.32)	(10.18)	**60.47**
මුළු ප්‍රතිලාභ දර්ශක					
සියලු කොටස් මුළු ප්‍රතිලාභ මිල දර්ශකය (ASTRI)	8,457.09	8,066.97	8,203.82	9,078.65	**16,423.75**

වර්ෂය	2017	2018	2019	2020	2021
වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%)	2.7	(4.6)	1.70	10.7	**80.91**
එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය	5,259.85	4,686.71	4,603.57	4,332.84	**7,241.29**
වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%)	8.6	(10.9)	(1.8)	(5.9)	**67.13**
විදේශීය ක්‍රියාකාරකම්					
වාර්ෂික පිරිවැටුම (රුපියල් මිලියන)	103,456	88,691	62,405	78,527	**60,340**
මිලදී ගැනුම් (රුපියල් මිලියන)	112,285	77,067	56,537	52,889	**34,016**
විකුණුම් (රුපියල් මිලියන)	94,627	100,315	68,272	104,165	**86,665**
ශුද්ධ විදේශීය ගලා ඒම	17,657.4	(23,247.5)	(11,735)	(51,276)	**(52,649)**
ගනුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන)	1,939	1,180	2,764	1,541	**1,866**
මිලදී ගැනුම් (මිලියන)	2,062	1,060	3,896	928	**1,308**
විකිණුම් (මිලියන)	1,817	1,299	1,631	2,154	**2,425**
ගනුදෙනු සංඛ්‍යාව	53,701	46,873	46,719	101,929	**121,692**
මිලදී ගැනුම් (සංඛ්‍යාව)	56,643	37,855	25,759	42,134	**74,172**
විකිණුම් (සංඛ්‍යාව)	50,760	55,892	67,680	161,725	**169,213**
ණයකර වෙළෙඳපොළ					
සාංගමික ණයකර					
මුළු පිරිවැටුම (රුපියල් 000)	3,592,905.5	4,540,599	5,677,080	5,856,002	**1,244,587**
ගනුදෙනු සංඛ්‍යාව	529	293	234	243	**93**
ගනුදෙනු වූ ණයකර ප්‍රමාණය (000)	35,696	44,024	55,643	54,230	**11,439**
ඒකක භාර					
ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල් මිලියන)	128,804	64.22	104.79	201	**194**
ඒකක හිමියන් සංඛ්‍යාව	41,037	42,093	46,481	52,402	**59,426**
නිකුත් කර ඇති ඒකක සංඛ්‍යාව (No. 000)	7,639	3,368	4,769	8,014	**7,835**
කොටස් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන)	12,466	9,416	9,841	14,019	**17,586**
භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන)	24,386	3,379	9,150	28,803	**28,755**
අනෙකුත් උපකරණවල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රු. මිලියන)	91,732	50,601	84,542	158,656	**148,907**

තොරතුරු: කොළඹ කොටස් වෙළෙඳපොළ, ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් සිදුකරනු ලබන නියාමන ඉදිරිපත් කිරීම්.

* වාණිජ පත්‍ර, තැන්පතු සහතික,ණයකර සහ බැංකු තැන්පතු.

නව
ඉදිරි දර්ශනයක්

මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව - 77 විගණකාධිපති වාර්තාව | 80 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 81 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
82 සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 83 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 85 මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව - 99 විගණකාධිපති වාර්තාව
101 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 102 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 103 සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
104 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 105 මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව - 110 විගණකාධිපති වාර්තාව
112 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 113 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 114 වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
115 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 116 මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව- 121 විගණකාධිපති වාර්තාව
123 මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය | 124 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 125 ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
126 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 127 මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් | පිට කවරයේ ඇතුළු පැත්ත - සාංගමික තොරතුරු

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/G/SEC/FA/2021/2
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date ২৭March 2022

සභාපති
ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

1.4 මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මුල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මුල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය අගයනු ලැබේ.
- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මුල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මුල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීන් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂනයෙන් පෙනී යන ආකාරයට නිසි මුල්‍ය වාර්තා කොමිෂන් සභාවේ පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව

අත්සන් කළේ:

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	7	64,954,716	75,447,839
ජංගම වත්කම්			
තොග	8	3,005,873	2,033,967
ලැබිය යුතු දෑ	9	226,209,609	47,213,119
ස්ථාවර තැන්පතු ආයෝජන	10	642,737	639,895
තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම්	11	62,548,982	64,685,096
මුදල් හා මුදල් සමාන දෑ	12	109,037,723	103,007,105
මුළු වත්කම්		466,399,640	**293,027,021**
අරමුදල් හා වගකීම්			
යෙදවූ අරමුදල් සහ සංචිත			
සමුච්චිත අරමුදල	13	0	0
ජංගම නොවන වගකීම්			
ප්‍රදාන ප්‍රාග්ධන ව්‍යයදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම්	14	58,702,817	69,195,940
සේවක ප්‍රතිලාභ වගකීම	15	59,054,227	50,378,208
ජංගම වගකීම්			
ගෙවිය යුතු ආදායම් බදු	16	323,018,972	23,339,815
ණය හිමියෝ සහ උපචිත ව්‍යයදම්	17	19,436,181	145,547,211
උපචිත ව්‍යයදම් මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති	18	68,134	558,060
පූර්ව ලැබීම්		6,119,309	4,007,787
මුළු අරමුදල් හා වගකීම්		466,399,640	**293,027,021**

85 සිට 98 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්:

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

විරාජ් දයාරත්න - ජනාධිපති නීතීඥ
සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

කොළඹදී
2022 මැයි 15 වන දින දීය

මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2021 රු.	2020 රු.
ආදායම්			
තැරව්කාර බලපත්‍ර ගාස්තු		2,793,194	3,610,706
පරිපාලන බදු		6,360,039	1,172,909
අධ්‍යාපන වැඩසටහන්		5,542,684	3,480,239
පොලී ආදායම්		1,820,617	5,360,805
අනෙකුත් ආදායම්		448,073	78,755
කාර්ය මණ්ඩල ණය පොලී අදායම්		818,946	738,471
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ)		0	(44,525)
රාජ්‍ය ප්‍රදාන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති		104,804,128	11,720,560
ප්‍රදාන හඳුනා ගැනීම	14	21,735,241	23,631,788
මුළු ආදායම		144,322,923	**49,749,708**
වියදම			
කාර්ය මණ්ඩල පිරිවැය	19	(269,419,695)	(236,519,212)
පරිපාලන හා ආයතනික පිරිවැය	20	(172,148,244)	(166,024,494)
ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන පිරිවැය	21	(55,241,934)	(32,367,005)
මූල්‍ය ගාස්තු	22	(103,030)	(40,887)
මුළු වියදම		(496,912,903)	**(434,951,598)**
ආදායම් බදු වියදම්		0	0
වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම		(352,589,980)	**(385,201,890)**
ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම්		352,589,980	**385,201,890**

85 සිට 98 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

සංචිතවල වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සමුච්චිත අරමුදල රු.	එකතුව රු.
2020 ජනවාරි 01 දිනට ශේෂය	0	0
වර්ෂය තුල ආදායමට වැඩි අතිරික්ත වියදම	(385,201,890)	(385,201,890)
ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම්	385,201,890	385,201,890
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**0**	**0**
2021 ජනවාරි 01 දිනට ශේෂය	0	0
වර්ෂය තුල ආදායමට වැඩි අතිරික්ත වියදම	(352,589,980)	(352,589,980)
ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම්	352,589,980	352,589,980
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**0**	**0**

85 සිට 98 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
සෙස් අරමුදලෙන් මාරුකිරීමෙන් පසු ශුද්ධ අඩු වීම/(වැඩි වීම)		0	0
ගැලපීම්:			
ක්ෂයවීම්	7	21,735,241	23,631,788
දේපල, පිරියත හා උපකරණ විකිනීමෙන් ලද ලාභ/(අලාභ)		0	44,525
ප්‍රදානයන් හඳුනාගැනීම	14	(21,735,241)	(23,631,788)
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	15	9,591,504	11,027,205
කාරක ප්‍රාග්ධයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		9,591,504	11,071,730
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම			
තොග (වැඩිවීම)/අඩුවීම		(971,906)	(553,314)
ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		(178,996,490)	(39,297,046)
තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම		2,136,114	(49,240,164)
පූර්ව ලැබීම් වැඩිවීම/(අඩුවීම)		2,111,522	658,691
ගෙවිය යුතු අදායම් බදු වැඩිවීම/(අඩුවීම)		299,679,157	(9,976,390)
ණය හිමියන් හා උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම)		(126,111,030)	25,705,503
ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)		(489,926)	558,060
කාරක ප්‍රාග්ධයේ ශුද්ධ වෙනස්වීම වැඩිවීම/(අඩුවීම)		(2,642,559)	(72,144,660)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට භාවිත වූ මුදල්		6,948,945	(61,072,930)
වර්ෂය තුල ගෙවූ පාරිතෝෂික		(915,485)	(4,113,265)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය		6,033,460	**(65,186,195)**
ආයෝජය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම්	7	(11,242,118)	(11,255,932)
ස්ථාවර තැන්පතු ආයෝජන		(2,842)	(573,052)
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්		0	53,277
ආයෝජය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය		(11,244,960)	**(11,775,707)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
වර්ෂය තුල සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	14	11,242,118	11,255,932
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය		11,242,118	**11,255,932**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2021 රු.	2020 රු.
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		6,030,618	(65,705,970)
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)		103,007,105	168,713,075
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ)		109,037,723	**103,007,105**
සටහන අ			
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ			
ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජන		64,610,002	167,595,925
බැංකුවේ ඇති මුදල්		38,357,103	1,077,150
අතැති මුදල්		40,000	40,000
		103,007,105	**168,713,075**
සටහන ආ			
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ			
ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජන	12	74,999,999	64,610,002
බැංකුවේ ඇති මුදල්	12	33,997,724	38,357,103
අතැති මුදල්	12	40,000	40,000
		109,037,723	**103,007,105**

85 සිට 98 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (ශ්‍රී.ල.සු.වි.කොා.ස) ලාභ නොලබන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 සැප්තැම්බර් 21 වන දින සිට බලාත්මක, 2021 අංක 19 දරන නව ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත මගින් අවලංගු කරන ලද පෙර පැවති 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කර ඇත.

ශ්‍රී.ල.සු.වි.කොා.ස. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 සැප්තැම්බර් 20 වන දින දක්වා බලාත්මක වූ ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 12 වන වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා සු.වි.කොා.ස. හි අරමුණු වන්නේ:

(අ) පිළිවෙලට සහ සාධාරණ ආකාරයට සුරකුම්පත් නිකුත් කිරීම හා වෙළඳාම් කිරීම කළහැකි වෙළඳපොලක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම;

(ආ) ආයෝජකයන්ගේ උනන්දුව ආරක්ෂා කර ගැනීම;

(ඇ) බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් හා වෙළෙන්දන් විසින් ගිවිසුම්ගත වගකීම් ඉටුකිරීමට නොහැකිවීම හේතුවෙන් සිදුවන මුල්‍යමය අලාභයන්ගෙන් ආයෝජකයන් ආරක්ෂා කර ගැනීම සඳහා වන්දි අරමුදලක් පවත්වාගෙන යාම;

(ඈ) සුරකුම්පත් වෙළඳපොල නියාමනය කිරීම සහ එම වෙළඳපොල තුල වෘත්තීමය තත්වයන් පවත්වාගෙන යාම සහතික කිරීම;

2021 සැප්තැම්බර් 21 වන දින සිට බලාත්මක වූ නව ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 03 වන වගන්තියට අනුකූලව, මෙම පනතේ පරමාර්ථය සහ අරමුණු වනුයේ:

(අ) ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පිහිටුවීම.

(ආ) සාධාරණ, විධිමත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සුරකුම්පත් වෙළඳපොළක් ඇති කිරීම, පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ආයෝජකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම; සහ

(ඈ) සුරකුම්පත් වෙළඳපොළවල් වලට අදාලව සපයනු ලබන සේවාවන්හි උසස් වෘත්තීමය ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට වග බලා ගැනීම.

1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය,, සංචිත වල වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තින් හා සටහන් වලින් සමන්විත වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත.පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මෙහෙයුම් කටයුතු ඈවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇති අතර, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරීව අනුගමනය කර ඇත.

1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට, සෙස් අරමුදල හා වන්දි අරමුදල සඳහා වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී.

එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, සංචිත වල වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තින් හා ඒවාට අදාළ සටහන් වලින් පමණක් සමන්විත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නම රුපියලට වටයා ඇත.

වර්තමාන අගය මත පදනම් වූ නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම හැරුණුකොට, මූල්‍ය ප්‍රකාශන, උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. වර්ෂය අවසානයේ නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී පොලී පිරිවැය, ප්‍රවර්තන සේවා පිරිවැය, ආයු ගණක (ලාභ)/අලාභ, වර්ෂය තුල ඉවත් වූ සේවකයන් හට ගෙවූ/ගෙවිය යුතු පාරිතෝෂික සඳහා නියමිත ගැලපීම් කර ඇත. එමෙන්ම ඒ හා යෝග්‍ය ගිනුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් මගින් හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කර ඇති අතර සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරීව අනුගමනය කර ඇත.

1.7 ගිනුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සහ ඒ

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

හා අදාළ හෙළිදරව් කිරීම් මෙන්ම අස්පෘශ්‍ය වගකීම් සම්බන්ධ හෙළිදරවුකිරීම් ද සිදු කිරීමට කළමනාකරණයට සිදු වේ.

මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතභාවය ඉදිරි කාලපරිච්ඡේදවල දී අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති කල හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තු වලට අදාළ සංශෝධනයන් හි බලපෑම අදාළ අතීත කාලපරිච්ඡේදවලට බලාත්මක වන පරිදි හඳුනා ගැනීම සිදු කරයි.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතා කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගත් අගයන් වලට වඩාත් ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන විනිශ්චයන් පිලිබඳ තොරතුරු නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීමට අදාළ සටහනේ පැහැදිලි කර ඇත. නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීමෙහි පිරිවැය නීර්ණය කරනුයේ ආයුගණක තක්සේරුව භාවිතා කිරීමෙනි. ආයු ගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වර්ධක අනුපාතිකය, මරණ අනුපාතිකය ආදී උපකල්පනයන් උපයෝගී කරගැනේ. . මෙම සැලැස්මේ ඇති දිගුකාලීන ස්වභාවය හේතුවෙන් ඉහත සඳහන් උපකල්පනයන් සැලකියයුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. ආයුගණක තක්සේරුව සඳහා යොදාගන්න උපකල්පනයන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 15 හි හෙළිදරව් කර ඇත.

1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිදු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

1.9 ප්‍රමානත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කොා.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

1.12 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

2.1 දේපල, පිරියත හා උපකරණ

හිමිකම් සහිත දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් හා ඒ හා සම්බන්ධ අනුශාංගික වියදම් පිරිවැයට වාර්තා කරන අතර ඒවායෙහි ඵලදායී ජීව කාලය පුරා ක්ෂය/ක්‍රම ක්ෂය සිදු කරයි. ප්‍රදානයන් ලෙස ලැබුණු වත්කම් පිරිවැයට වාර්තා කරන අතර ඒවායෙහි ක්ෂය/ක්‍රම ක්ෂය අදාළ සංචිත ගිණුම් වලට අය කරනු ලැබේ.

ක්ෂය/ක්‍රම ක්ෂය වීම සරල රේඛීය පදනම යොදා ගනිමින් සිදු කරනු ලැබේ. මෝටර් වාහන, ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ, කාර්යාල උපකරණ හා මෘදුකාංග ඇතුළු විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ සහ පුහුණු කිරීමේ උපකරණ වල ක්ෂය/ක්‍රම ක්ෂය ඒවායෙහි ඵලදායී ජීව කාලය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් අනුපාතිකයන් යොදා ගනිමින් සිදු කර ඇත.

මෝටර් වාහන	10.00%
ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ	12.50%
පුහුණු කිරීමේ උපකරණ	20.00%
විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ (මෘදුකාංග ඇතුළුව)*	
විද්‍යුත් දත්ත සැකසුම් දෘඩාංග	20.00%
විද්‍යුත් දත්ත සැකසුම් මෘදුකාංග	20.00 – 33.33%
විද්‍යුත් දත්ත සැකසුම් ජංගම දුරකථන	33.33%
විද්‍යුත් දත්ත සැකසුම් අනෙකුත්	20.00 – 25.00%

මිලදී ගත් සියලුම වත්කම් සඳහා, භාවිතා කිරීමට අපේක්ෂිත දිනයේ සිට ක්ෂය/ ක්‍රම ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලැබේ. වත්කම විකුණන වර්ෂයේදී එය විකුණන දිනය දක්වා ක්ෂය/ ක්‍රම ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් සඳහා වන පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය සම්බන්ධිත වත්කමෙහි අනාගත ඵලදායී ප්‍රතිලාභ ඉහල යන්නේ නම් පමණි. අනෙකුත් සියලුම වියදම් ඒවා දරනු ලබන අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

* පරිගණක දෘඩාංග වලට අන්තර්ගත නොවන පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස පෙන්වන අතර එය පිරිවැයට හඳුනා ගනු ලැබේ. මුලික හඳුනා ගැනීමෙන් පසුව මෙම අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රම ක්ෂය අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ.

2.2 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

2.3 තොග

තොගවල අගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකෙන් අඩු අගය යටතේය. තොග පිරිවැය ගණනය කිරීම පෙර පිවිසුම් පෙර නිකුතු පදනම මත සිදු කෙරේ.

ලෝකයේ වේගයෙන් වෙනස් වෙමින් පවතින වෙළඳපොල තත්වයන් හේතුකොටගෙන ප්‍රාග්ධන වෙළඳපොළට අදාළ නීති රීති ද වේගයෙන් වෙනස්වීමට භාජනය වන බැවින් ප්‍රතිපත්තියක් ලෙස පුස්තකාල පොත්වලට අදාළ අගයන් කපා හැර තිබේ.

2.4 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

3. වගකීම් හා ප්‍රතිපාදන

3.1.1 නිශ්චිත දායකත්ව සැලසුම සේවක අර්ථ සාධක අරමුදල

ආයතනයේ සියලුම සේවකයින් සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබන අතර ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සේවකයාගේ වාහන හා ඉන්ධන දීමනාව හැර චේතනයෙන් 12% හා 3% ක් මේ සඳහා දායක කරනු ලැබේ.

3.1.2 නිශ්චිත ප්‍රතිලාභ වගකීම පාරිතෝෂිත

පාරිතෝෂිත යනු ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ එහි සේවකයන් හට ගෙවිය යුතු පසු සේවා නියුක්ති ප්‍රතිලාභයකි. ආයතනය හට මෙම වගකීම සේවකයෙකු වෙත පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පමණි. කෙසේ වුවද 2018 ජනවාරි 01 වන දින සිට බලාත්මක වූ ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. 19 සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි නිර්දේශයන්ට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීමෙන් නිරූපනය වනුයේ, වාර්තා කරන දිනට නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගය වේ. එම වගකීම බාහිර ලෙස මූල්‍යනය කර නැත. හඳුනා නොගත් ආයු ගණන ලාභ හෝ අලාභ, හඳුනා නොගත් අතීත හා ප්‍රවර්තන සේවා පිරිවැය මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශයෙහි එසැනින්ම හඳුනා ගනු ලැබේ. 2021 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ වගකීමට අදාළ ශුද්ධ වගකීම්, ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. 19 සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි නිර්ණායකයන්ට අනුකූලව, සුදුසුකම්ලත් ආයුගණඥයෙකු විසින් "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිත කර නිර්ණය කර ඇත.

3.2 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

3.3 ප්‍රදාන

සෙස් අරමුදලෙන් මාරු කරනු ලැබූ ප්‍රාග්ධන වියදම් ප්‍රදානයන් වශයෙන් සලකා ක්‍රමවත් පදනමක් මත අදාළ වත්කමෙහි ඵලදායී ආයු කාලය පුරා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

4. මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

4.1 ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ආදායම තැරැව්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු, පරිපාලන අයබදු, ප්‍රකාශන අලෙවි කිරීම්, අධ්‍යාපන වැඩසටහන් වලට අදාළ සම්මන්ත්‍රණ ආදායම් යනාදියෙන් සමන්විත වේ. ඉහත සඳහන් සේවාවන්/ගාස්තු වලින් වන ආදායම අදාල සේවාවන් ඉටු කරනු ලබන කාල පරිච්ඡේදය තුලදීම හඳුනා ගැනේ.

4.2 පොළී ආදායම හා වියදම

ආයෝජන වල පොළී අදායම හා පොළී වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.3 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.4 දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ හෝ අලාභ

දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශන හඳුනා ගනු ලබන්නේ අදාළ විකුණුමෙන් ලැබෙන මුදලෙන් අදාළ වත්කමෙහි ධාරණ අගය හා එම විකුණුම් වියදම් අඩු කිරීමෙනි.

5. වියදම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

6. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනුම් මත ආයෝජනවලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

7 දේපල, පිරියත හා උපකරණ

	මෝටර් වාහන	ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ	කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ	පුහුණු කිරීමේ උපකරණ	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය					
2021 ජනවාරි 01 දිනට ශේෂය	45,165,786	47,974,894	158,365,815	4,326,348	255,832,843
වර්ෂය තුල මාරු කිරීම්	0	0	0	0	0
වර්ෂය තුල එකතුවීම්	0	2,343,304	8,898,813	0	11,242,118
වර්ෂය තුල විකුණුම්	0	0	0	0	0
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**45,165,786**	**50,318,199**	**167,264,628**	**4,326,348**	**267,074,961**
සමුච්චිත ක්ෂය					
2021 ජනවාරි 01 දිනට ශේෂය	28,891,714	35,217,840	112,214,715	4,060,735	180,385,004
වර්ෂය තුල මාරු කිරීම්	0	0	0	0	0
වර්ෂය සඳහා ක්ෂය	3,090,076	3,344,008	15,162,698	138,458	21,735,241
විකුණන ලද වත්කම් වල සමුච්චිත ක්ෂය	0	0	0	0	0
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**31,981,791**	**38,561,849**	**127,377,413**	**4,199,192**	**202,120,245**
2021 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය	**13,183,995**	**11,756,350**	**39,887,215**	**127,156**	**64,954,716**
2020 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය	**16,274,072**	**12,757,054**	**46,151,099**	**265,614**	**75,447,839**
2021 දෙසම්බර් 31 වන විට පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද වත්කම් (ඉහත සඳහන් පිරිවැයේ අඩංගු වී ඇති)	16,552,286	22,593,951	100,871,204	3,660,805	143,678,246
ප්‍රයෝජනවත් ආයු කාලය (වසර ගණන)	10	8	3-5	5	

		සටහන්	2021 රු.	2020 රු.
8	තොග			
	ලිපි ද්‍රව්‍ය, මුද්දර සහ විද්‍යුත් දත්ත සැකසුම්		3,005,873	2,033,967
	එකතුව		3,005,873	**2,033,967**
9	ලැබිය යුතු දෑ			
	විවිධ ණයගැතියෝ		1,903,896	339,601
	උත්සව අත්තිකාරම්		2,055,000	2,100,000
	ප්‍රතිමිලදී ගැනීම් හා ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලී		27,079	7,719
	කාර්යමණ්ඩල ණය		17,690,604	20,437,628
	දුරකථන අත්තිකාරම්		68,046	208,367
	ලැබියයුතු රක්ෂණ වන්දි		37,875	16,375
	සෙස් අරමුදලෙන් ලැබිය යුතු දෑ		193,356,762	0
	වන්දි අරමුදලෙන් ලැබිය යුතු දෑ		5,845,532	18,890,614
	සේවක අර්ථසාධක අරමුදලෙන් ලැබිය යුතු දෑ		12,000	0
	වැඩ තහනම් කෙරූ සේවකයෙකුගෙන් ලැබිය යුතු දෑ		5,212,815	5,212,815
	එකතුව		226,209,609	**47,213,119**

10 ස්ථාවර තැන්පතු ආයෝජන

ස්ථාවර තැන්පත් ආයෝජන තුලින් නිරූපනය වන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් මෙහෙයුම් කටයුතු සඳහා ලංකා බැංකුවෙහි තබා ගනු ලබන ස්ථාවර තැනපතු හි අගය වේ.

		සටහන්	2021 රු.	2020 රු.
11	තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම්			
	ඉන්ධන තැන්පතු		78,000	78,000
	මොබිටෙල් ආයතනික දත්ත පැකේජ		15,000	15,000
	මොබිටෙල් පසු ගෙවුම් වින්ගල්ස්		12,000	12,000
	ටෙලිකොම් සමාගම වෙත ඇති තැන්පතු		23,125	23,125
	ඩයලොග් සමාගම වෙත ඇති තැන්පතු		8,500	8,500
	ෆ්‍රොස්ට් - උණු සහ ශීත ජලය ලැබෙන ස්වංක්‍රීය යන්ත්‍රය		12,899	12,899
	ශ්‍රී ලංකා සේවා යෝජකයන්ගේ සංගමය		62,500	62,500
	ඩී.එච්.එල්. කුරියර් සේවා ගාස්තු		30,000	0
	ඕවර්සීස් රියල්ටි සමාගම - කළමනාකරණ සංස්ථා සහාධිපත්‍ය සැලසුම් 1824		44,522,736	44,522,736
	සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම්		17,784,222	19,950,336
	එකතුව		62,548,982	**64,685,096**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

		සටහන්	2021 රු.	2020 රු.
12	මුදල් හා මුදල් සමාන දෑ			
	ප්‍රති මිලදීගැනීම් මත ආයෝජන		74,999,999	64,610,002
	බැංකුවේ ඇති මුදල්		33,997,724	38,357,103
	අතැති මුදල්		40,000	40,000
	එකතුව		109,037,723	**103,007,105**
13	සමුච්චිත අරමුදල			
	වර්ෂය ආරම්භයේ ශේෂය		0	0
	වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම		(352,589,980)	(385,201,890)
	වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම්		352,589,980	385,201,890
	වර්ෂය අවසානයේ ශේෂය		0	**0**
14	ප්‍රදානයන් - සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම්			
	වර්ෂය ආරම්භයේ ශේෂය		69,195,940	81,571,796
	වර්ෂය තුල සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්		11,242,118	11,255,932
	ප්‍රදානයන් හඳුනා ගැනීම්		(21,735,241)	(23,631,788)
	වර්ෂය අවසානයේ ශේෂය		58,702,817	**69,195,940**
	සටහන:			
	ප්‍රදානයන් හඳුනා ගැනීම			
	පහත සඳහන් අනුපාතයන් යටතේ ප්‍රදානයන් හඳුනා ගැනේ			
	මෝටර් වාහන		10.00%	10.00%
	ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ		12.50%	12.50%
	කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ		20.00% to 33.33%	20.00% to 33.33%
	පුහුණු කිරීමේ උපකරණ		20.00%	20.00%
15	සේවක ප්‍රතිලාභ වගකීම			
	වර්ෂය ආරම්භයේ ශේෂය		50,378,208	43,464,268
	පොළී පිරිවැය		4,030,257	4,346,427
	ප්‍රවර්තන සේවා පිරිවැය		4,488,982	4,365,013
	වර්ෂය තුල ගෙවීම්		(915,485)	(4,113,265)
	ආයු ගණක (ලාභ)/අලාභ		1,072,265	2,315,765
	වර්ෂය අවසානයේ ශේෂය		59,054,227	**50,378,208**

සේවක ප්‍රතිලාභ වගකීම, ස්වාධීන ආයුගනඥයෙකු විසින් සිදු කරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ඇත. ආයු ගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වර්ධක අනුපාතිකය, මරණ අනුපාතිකය ආදී උපකල්පනයන් උපයෝගී කරගැනේ. මෙම සැලැස්මේ ඇති දිගුකාලීන ස්වභාවය හේතුවෙන් ඉහත සඳහන් උපකල්පනයන් සැලකියයුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. මෙම සියලුම උපකල්පනයන් සෑම වාර්තාකරණ දිනකදීම සමාලෝචනය කරනු ලැබේ.

සේවක ප්‍රතිලාභ පිරිවැය නීර්ණය කිරීමේදී යොදාගනු ලැබූ මූලික උපකල්පනයන් වනුයේ:

	2021	2020
විශ්‍රාමික වයස	අවුරුදු 60	අවුරුදු 60
වට්ටම් අනුපාතිකය	වාර්ෂික 11.5%	වාර්ෂික 8%
අනාගත වැටුප් වර්ධක අනුපාතිකය	වාර්ෂික 10%	වාර්ෂික 7%

15.1 යොදාගත් උපකල්පන වල සංවේදීතාවය

උපකල්පනයන්ගේ 1% ක් වෙනස්වීමෙන් ඇති වනු ලබන බලපෑම:

	වට්ටම් අනුපාතිකය රු.	අනාගත වැටුප් වර්ධක අනුපාතිකය රු.
1% වැඩි වීම	55,621,780	62,828,224
1% අඩු වීම	62,890,484	55,633,914

2021 දෙසැම්බර් 31 දිනට, සේවක ප්‍රතිලාභ වගකීමෙහි ආයුගණක තක්සේරුව වෘත්තීමය ආයුගණඥයෙකු වන ඇකචුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් සිදු කරන ලදී. මෙම ආයුගණඥයන් විසින් සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ හි නිර්දේශිත "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කර ඇත.

		සටහන්	2021 රු.	2020 රු.
16	ගෙවිය යුතු ආදායම් බදු			
	2019/2020 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු		0	14,315,868
	2020/2021 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු		(2,912,946)	9,023,947
	2021/2022 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු		325,931,918	0
	එකතුව		323,018,972	**23,339,815**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

		සටහන්	2021 රු.	2020 රු.
17	ණයහිමියන් සහ උපචිත වියදම්			
	ගෙවිය යුතු මුද්දර ගාස්තු		58,375	59,000
	විද්‍යුත් සන්නිවේදන, දත්ත සැකසුම්, දුරකථන සහ අන්තර්ජාල		679,632	818,428
	විදුලිය		363,744	325,327
	කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය		1,267,183	1,037,439
	නිවාඩු වෙනුවට ගෙවන මුදල්		2,836,791	2,912,175
	අතිකාල		177,653	118,583
	බාහිර විගණන ගාස්තු		900,000	1,060,000
	අභ්‍යන්තර විගණන ගාස්තු		598,620	1,500,000
	වෘත්තීය ගාස්තු		2,049,390	165,000
	නීති වියදම්		1,320,000	0
	මහජන දැනුවත් කිරීම්		6,535,418	51,773
	ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය		0	915,833
	වෙළඳපොළ ආවේක්ෂණ පිරිවැය		0	1,670,625
	කුරියර් ගාස්තු		0	9,860
	ගමන් වියදම් - දේශීය		0	20,100
	විධායක යැපුම		12,500	12,500
	කාර්ය මණ්ඩල සුභසාධනය		0	102,914
	ගෙවිය යුතු කුලී තැන්පතු		1,536,792	1,536,792
	පොදු වියදම් - මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති		0	216,945
	සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු ගෙවීම්		0	2,217,897
	පුවත්පත් හා වාර ප්‍රකාශන		0	23,680
	බඳවා ගැනීම් වියදම්		0	323,163
	මෝටර් වාහන ඉන්ධන		0	66,422
	ඊෆියුචර්ස් මාසික නඩත්තු ගාස්තු		71,280	0
	ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා		16,667	0
	ණය පොලී සහනාධාර		68,857	
	අනෙකුත් ගෙවිය යුතු දෑ		27,794	50,794
	ගෙවිය යුතු පාරිතෝෂික		915,485	0
	සෙස් අරමුදල සඳහා ගෙවිය යුතු ගෙවීම්		0	130,331,961
	එකතුව		19,436,181	**145,547,211**
18	ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති			
	උපචිත වියදම් මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති		68,134	558,060
	එකතුව		68,134	**558,060**

ලෝක බැංකුවේ මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතින්හී, ව්‍යාපෘති සංවර්ධන අරමුණු ඉටු කරගැනීම සඳහා මූල්‍ය වෙළඳපොල යටිතල පහසුකම් නවීකරණය, මූල්‍ය වෙළඳපොල හා අදාළ නීතිමය හා නියාමන රාමුව වැඩි දියුණු කිරීම සහ ප්‍රධාන මූල්‍ය වෙළඳපොල නියාමන ආයතන වන ශ්‍රී ලංකා මහා බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම යන ආයතන වල ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම යන ක්‍රමවේදයන් යොදා ගනු ලැබේ. මීට අමතරව මුදල් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ

ඒකකයක් පිහිටුවා ව්‍යාපෘති සම්බන්ධීකරණය සඳහා සහාය වනු ලැබේ. එමෙන්ම මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතිහි ඇතුලත් අංගයක් ලෙස සු.වි.කොා.ස. විසින් ප්‍රධාන මුල පිරීම් කිහිපයක් සඳහාම අවශ්‍ය තාක්ෂණික සහ ආයෝජන අරමුදල් සහය සහතික කර ඇත. ඒ අනුව සු.වි.කොා.ස. වෙත දල වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 10ක් ලැබීමට නියමිත අතර, එයින් ඇ.ඩො. මිලියන 2ක් ප්‍රතිඵල පාදක මූල්‍ය සංරචකය යටතේ සහ ඇ.ඩො. මිලියන 8ක් හඳුනාගත් භාණ්ඩ හා උපදේශන ප්‍රතිසම්පාදන සඳහා ආයෝජන පාදක මූල්‍ය සංරචක යටතේ වේ.

2021 දෙසැම්බර් 31 දිනට, සු .වි.කොා.ස. වෙත මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතියේ ප්‍රතිඵල පාදක මූල්‍ය සංරචකය යටතේ ඇ.ඩො. 1,038,515.90ක් (රු.197,648,942.32 ට සමාන මුදලක්) ලැබී ඇත. ඊට අමතරව ඇ.ඩො. 367,000ක් ලෝක බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත ආයෝජන පාදක මූල්‍ය සංරචකය යටතේ ලබා දී ඇති අතර එයින් 2021 දෙසැම්බර් 31 දින වන විට සු .වි.කොා.ස. විසින් ඇ.ඩො. 34,100ක මුදලක් ශ්‍රී ලංකා රුපියල් වලින් දේශීය සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා ද, ඇ.ඩො.16,024.39 ක මුදලක් විදේශීය සැපයුම්කරුවන් වෙත කරන ඍජු ගෙවීම් සඳහා ද ඉවත් කරගෙන ඇත.

		සටහන්	2021 රු.	2020 රු.
19	**කාර්ය මණ්ඩල පිරිවැය**			
	කාර්ය මණ්ඩල වැටුප්		148,971,963	132,419,676
	සභාපතිවරයාගේ දීමනා		1,200,000	1,030,000
	ප්‍රතිපූර්ණ පිරිවැය නීතිපති දෙපාර්තමේන්තුව		6,245,252	5,814,518
	අතිකාල දීමනා		2,454,684	1,669,163
	සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල		22,657,813	20,241,694
	කාර්යමණ්ඩල පාරිතෝෂික	15	9,591,504	11,027,205
	විශේෂ ගෙවීම්		18,085,294	16,606,045
	නිවාඩු වෙනුවට ගෙවන මුදල්		2,973,891	2,767,429
	කාර්යමණ්ඩල වෛද්‍ය වියදම් හා රක්ෂණ		15,350,619	7,914,882
	කාර්යමණ්ඩල හදිසි අනතුරු රක්ෂණ ආවරණ		0	667,100
	කාර්යමණ්ඩල නිවාස ණය පොලී සහනාධාර		2,266,022	2,341,631
	කාර්යමණ්ඩල සුභසාධන වියදම්		7,335,081	4,052,758
	විධායක යැපුම්		85,000	137,500
	කාර්යමණ්ඩල වාහන දීමනා		26,662,653	23,298,500
	විදෙස් ගමන් වියදම් හා පුහුණුවීම් වියදම්		0	2,309,872
	කාර්යමණ්ඩල පුහුණු වීම් වියදම් - දේශීය		705,210	397,250
	සාමාජිකත්ව දායක වියදම්		1,413,666	1,410,345
	අධ්‍යයන සඳහා අනුග්‍රාහකත්වයන්*		503,063	795,545
	බඳවා ගැනීම් සඳහා දැන්වීම් ගාස්තු		838,399	1,343,099
	ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා		2,079,583	275,000
	එකතුව		269,419,695	**236,519,212**

* ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු. 250,000/ ක උපරිමයකට යටත් වූ මුදලක් වසර තුනකට වරක් ආයතනයේ විධිවිධාන වලට යටත්ව ලබාදෙන අතර, එසේ ලබාගත් සේවකයින් අදාළ පාඨමාලාව සහ විභාග සාර්ථකව සම්පූර්ණ කල පසු අවුරුදු 2ක කාලයක් ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට බැඳී සිටී. වෙනයම් හේතුවක් හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් පාඨමාලාව සම්පූර්ණ කිරීමට නොහැකි වූ සේවකයින් ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතු වේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළද, එකඟ වූ සම්පූර්ණ කාලය ආයතනයට සේවය කිරීමට අසමත් වූ සේවකයින් සම්පූර්ණ කල යුතු ඉතිරි සේවා කාලය සඳහා ගෙවිය යුතු මුදල සමානුපාතිකව ගණනය කර ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආපසු ගෙවිය යුතු වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

		සටහන්	2021 රු.	2020 රු.
20	පරිපාලන හා ආයතනික පිරිවැය			
	කුලී හා රථවාහන ගාල් කුලී		101,143,670	96,216,435
	විදුලි ගාස්තු		4,027,541	3,688,801
	කාර්යාල නඩත්තු		154,900	501,455
	කාර්යාල උපකරණ නඩත්තු හා රක්ෂණ		7,896,974	11,365,646
	දුරකථන, අන්තර්ජාල, ඊමේල් සහ වෙබ්		694,479	697,283
	විද්‍යුත් සන්නිවේදන හා දත්ත සැකසුම්		7,761,880	7,894,251
	මෝටර් වාහන ඉන්ධන, නඩත්තු, බලපත්‍ර හා රක්ෂණ		4,699,751	3,002,346
	වෘත්තීමය ගාස්තු		3,202,982	2,015,000
	රැස්වීම් ගාස්තු		750,000	1,532,000
	රැස්වීම් වියදම්		953,363	964,110
	පුස්තකාල පොත්		3,000	9,600
	පුවත්පත් හා වාරප්‍රකාශන		330,276	360,964
	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය		4,314,634	3,582,116
	දේශීය ගමන් වියදම්		7,030,161	3,176,561
	රක්ෂණ සියලු අවදානම්, පොදු වගකීම්, මාර්ගස්ථ මුදල් සහ ගිනි		254,726	1,653,300
	තැපැල් හා මුද්දර ගාස්තු		1,129,186	688,711
	කුරියර් ගාස්තු		151,038	97,225
	නීති ගාස්තු		2,803,360	1,643,885
	විගණන ගාස්තු - අභ්‍යන්තර		1,762,980	1,539,580
	විගණන ගාස්තු - බාහිර		344,000	1,290,000
	පොදු වියදම්		999,101	445,040
	වෙළඳ බදු		5,000	5,000
	එකතු කල අගය මත බදු		0	23,397
	ක්ෂය වීම්	7	21,735,241	23,631,788
	එකතුව		172,148,244	**166,024,494**

		සටහන්	2021 රු.	2020 රු.
21	ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන වියදම්			
	ප්‍රාග්ධන වෙළඳපල සහ නිෂ්පාදිත සංවර්ධන		14,862,714	16,920,166
	මහජන දැනුවත් කිරීමේ වැඩසටහන්		24,840,257	1,354,648
	අධ්‍යාපන වැඩසටහන්		1,802,431	1,609,193
	අන්තර්ජාතික සමාජික ගාස්තු - IOSCO		4,210,388	3,684,862
	ප්‍රචාරණ හා දැන්වීම් ගාස්තු		146,664	0
	වෙළඳපොල ආවේක්ෂණ පිරිවැය		9,349,152	8,795,002
	විමර්ශන හා පරීක්ෂණ වියදම්		30,329	3,134
	එකතුව		55,241,934	**32,367,005**

		සටහන්	2021 රු.	2020 රු.
22	මුල්‍ය වියදම්			
	බැංකු ගාස්තු		103,030	40,887
	එකතුව		103,030	**40,887**

		තත්‍ය 2021 රු.	අයවැය 2021 රු.	විචලනය රු.
23	තත්‍ය ආදායම හා වියදම අයවැය ලේඛනය සැසඳීම			
	ආදායම			
	තැරැව්කාර බලපත්‍ර ගාස්තු	2,793,194	3,415,000	(621,806)
	පරිපාලන බදු	6,360,039	3,000,000	3,360,039
	අධ්‍යාපන වැඩසටහන්	5,542,684	4,995,000	547,684
	පොලී ආදායම්	1,820,617	600,000	1,220,617
	අනෙකුත් ආදායම්	448,073	0	448,073
	කාර්යමණ්ඩල ණය පොලී ආදායම්	818,946	924,000	(105,054)
	රාජ්‍ය ප්‍රදාන - මු.ක්.න.ව්‍යා.	104,804,128	97,500,000	7,304,128
	දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ)	0	9,500,000	(9,500,000)
	ශ්‍රී.සු.වි.කොා.ස. මගින් උපයාගත් මුළු ආදායම	122,587,682	119,934,000	**2,653,682**
	අඩු කළා: වියදම්			
	කාර්යමණ්ඩල පිරිවැය	(269,419,695)	(294,929,730)	25,510,035
	පරිපාලන හා ආයතනික පිරිවැය	(150,413,003)	(162,403,707)	11,990,704
	ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන පිරිවැය	(55,241,934)	(82,920,557)	27,678,623
	මුල්‍ය ගාස්තු	(103,030)	(44,976)	(58,054)
	මුළු අයබාර වියදම	(475,177,662)	(540,298,970)	**65,121,308**
	අඩු කළා: ආදායම් බදු වියදම	0	0	0
	ආදායමට වැඩි අයබාර වියදම	(352,589,980)	(420,364,970)	**67,774,990**

24. ප්‍රාග්ධන බැඳීම්

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නැත.

25. අසම්භාව්‍ය වගකීම්

2021 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

26. වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්

මුල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදු කිරීමට අවශ්‍ය කරනු ලබන ආකාරයේ සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව සිදු වී නොමැත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

27. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස පත්කරන ලද අතර, එම මහතා 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.

පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින් 2021 වර්ෂය තුලදී පහත පරිදි ධුරයන් හොබවන ලදී.

- සංජය බණ්ඩාර මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2021 දෙසැම්බර් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික.
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් 2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික
- එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2021 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සිසිර රත්නායක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සුනිල් ලංකාතිලක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- නරේෂ් අබේසේකර මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- මනිල් ජයසිංහ මහතා - 2020 ජනවාරි 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර, 2020 දෙසැම්බර් 21 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර 2021 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා	පියවීම් සහතික කිරීමේ අරමුදල	2020 ජනවාරි 08 වන දින සිට බලපැවෙත්වන පරිදි භාරකරුවකු ලෙස පත් කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.	නැත
සංජය බණ්ඩාර මහතා	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	2021 දෙසැම්බර් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි සභාපති ධුරයට පත්වන ලදී	නැත
	මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී.	2012 පෙබරවාරි සිට 2021 පෙබරවාරි දක්වා කාලය තුල අධ්‍යක්ෂ/සභාපති ධුරයන් හොබවනු ලැබේ.	නැත
	ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්සීස් පී.එල්.සී.	2021 මාර්තු සිට අධ්‍යක්ෂ ධුරය හොබවනු ලැබේ	නැත
	බී.ආර්. ද සිල්වා සහ සමාගම	හවුල්කරු	නැත
සංජීව දිසානායක මහතා	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ගිණුම්කරණ ප්‍රමිත කමිටුව	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
ආර්.එම්.පී. රත්නායක මහතා	මහා භාණ්ඩාගාරය	2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය ලේකම්	නැත
	ලංකා බැංකුව	2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත	2021 සැප්තැම්බර් 06 වන දින දක්වා නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	දේශීය ණය සහ සංවර්ධන අරමුදල	2020 සැප්තැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජික සහ සභාපති	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	021 ජනවාරි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	පියවීම් සහතික කිරීමේ අරමුදල	2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකරු	නැත
එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා	ශ්‍රී ලංකා මහා බැංකුව	2020 දෙසැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය අධිපති	නැත
ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා	නැත	නැත	නැත
සිසිර රත්නායක මහතා	නැත	නැත	නැත
සුනිල් ලංකාතිලක මහතා	මුදල් අමාත්‍යාංශය	2021 පෙබරවාරි 01 වන දින සිට වර්ෂ තුනක් සඳහා, 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතෙහි පරීක්ෂණ මණ්ඩල සාමාජික	නැත
	එල්.ඕ.එල්.සී. ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී.	2021 අගෝස්තු 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂක	නැත
නරේෂ් අබේසේකර මහතා	නැත	නැත	නැත

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

වර්ෂය තුලදී කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ ධුර කාලය අවසන් කල කොමිෂන් සභා සාමාජිකයින් විසින් වසර තුලදී දරණ ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
මනිල් ජයසිංහ මහතා	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	2021 දෙසැම්බර් දක්වා සභාපති	නැත
	අර්න්ස්ට් අන්ඩ් යන්ග්	කළමනාකරණ හවුල්කරු - ශ්‍රී ලංකාව සහ මාලදිවයින	නැත
ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	2021 ජනවාරි 01 දින දක්වා සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් පහ පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

ජංගම ගිණුමේ නම	ගිණුම් අංකය	2021.12.31 දිනට ශේෂය	2020.12.31 දිනට ශේෂය
ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	0000001694	23,794,693	32,730,612
	0009919753	10,146,896	4,777,980
	83810081	56,134	856,470

2021 වර්ෂය තුලදී පහත දැක්වෙන ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදුවිය.

ආයෝජන වර්ගය	වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.)	2020 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.)
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	599,782,566	75,000,000
ස්ථාවර තැන්පතු	640,563	642,737
එකතුව	**600,423,129**	**75,642,737**

වැටුප් සමීක්ෂණයක් සිදු කිරීමටත් එහි අන්තර්ගත වූ අමතර කර්තව්‍යක් ලෙස ආයතනය තුල වර්තමානයේ පවතින වැටුප් විෂමතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් සිදු කිරීමටත් කොමිෂන් සභා සාමාජිකයින් විසින් 2020 දෙසැම්බර් 18 වන දින පැවැත්වූ කොමිෂන් සභාවේදී ස්වාධීන විගණන ආයතනයක හෝ වෘත්තීමය නියෝජිතයෙකුගේ සේවාව ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව, නියමිත ප්‍රසම්පාදන පටිපාටීන් අනුගමනය කරමින් වැටුප් සමීක්ෂණය සිදු කිරීමෙහි පැවරුම, පුර්ණ ලෙස අනුකූල වූ සේවා සැපයුම්කරුවෙකු ලෙස රු. 1,380,000.00 (බදු රහිත) ක පිරිවැයකට ශ්‍රී ලංකා අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය වෙත පවරන ලදී. ශ්‍රී ලංකා අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය විසින් 2021 වර්ෂයේදී වැටුප් සමීක්ෂණය අරඹන ලද අතර 2021 වර්ෂය තුලදී මෙම ආයතනය වෙත කිසිදු ගෙවීමක් සිදු කර නොමැත.

මීට අමතරව, කොමිෂන් සභා සාමාජිකයින් විසින් පාලක මණ්ඩලහි සාමාජිකත්වය දරණ ආයතන සමග සලකා බලන වර්ෂය තුල සිදු වූ ගනුදෙනු පහත සඳහන් වගුවේ සඳහන් කර ඇත.

ආදායකයාගේ නම	ගෙවීම පිලිබඳ විස්තරය	ගෙවූ දිනය	ගෙවූ අගය (රු.)
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	පුහුණු ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සමාජිකත්වය 2021 වර්ෂය සඳහා අලුත් කිරීම	3/9/2021	17,500.00
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ 2021 වාර්ෂික ජාතික සමුළුව වෙනුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් සහභාගී කිරීම නිමිත්තෙන් කරන ලද ගෙවීම	9/27/2021	113,500.00
	ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය දරන කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා සමාජිකත්ව අලුත් කිරීම සඳහා කරන ලද ගෙවීම්	12/20/2021	184,000.00
ලේකම්, මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය	කොළඹ වරාය නගර සඳහා රජය විසින් සිදු කරන ලද ව්‍යාපෘතිය වෙනුවෙන් කල දායකත්වය	7/1/2021	8,821,948.32
මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය	සු.වි.කොෝ.ස. හි ප්‍රාග්ධන වෙළඳපොල අධ්‍යාපන අංශය විසින් විභාග පැවැත්වීම සඳහා ශාලා ගාස්තු	10/18/2021	90,000.00
		11/23/2021	95,000.00
		12/27/2021	65,000.00
		12/27/2021	65,000.00

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/G/CESS/FA/21/3
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 29 March 2022

සභාපති
ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මුල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ ("අරමුදල") 2021 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශනය, සෙස් අරමුදලේ වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මුල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මුල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.4 මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මුල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබනුයේ මෙම මුල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය අගයනු ලැබේ.
- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මුල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මුල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

අත්සන් කළේ:

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන		3,159,199,611	969,902,655
ජංගම වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන		355,702,975	204,156,542
ලැබිය යුතු පොලී ආදායම භාණ්ඩාගාර බැඳුම්කර		76,520,029	46,794,137
ලැබිය යුතු පොලී ආදායම ප්‍රතිමිලදී ගැනුම්		146,132	183,599
ලැබියයුතු සෙස් මුදල්		27,289,951	11,266,847
ලැබිය යුතු දෑ - ශ්‍රී.සු.වි.කොා.ස.		0	130,331,961
මුදල් හා මුදල් සමාන දෑ	7	459,076,390	1,437,680,052
මුළු වත්කම්		4,077,935,087	2,800,315,793
අරමුදල් සහ වගකීම්			
යොදවා ඇති අරමුදල් සහ සංචිත			
සමුච්චිත අරමුදල		3,884,378,325	2,800,315,793
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ - සු.වි.කොා.ස.		193,356,762	0
විගණන ගාස්තු		200,000	0
මුළු අරමුදල් සහ වගකීම්		4,077,935,087	2,800,315,793

105 සිට 109 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල වෙනුවෙන්;

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න
සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

කොළඹ දී
2022 මැයි 15 දින දී ය.

මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2021 රු.	2020 රු.
ආදායම			
වර්ෂය තුල ලද සෙස් මුදල්		1,554,518,067	528,483,025
පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර		144,908,971	167,565,413
පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත්		0	5,724,385
පොලී ආදායම - භාණ්ඩාගාර ප්‍රතිමිලදී ගැනුම්		91,940,659	46,017,563
මුළු ආදායම		1,791,367,697	**747,790,386**
වියදම			
මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා ශ්‍රී.සු.වි.කොා.ස.ට මාරු කල අරමුදල		(363,832,098)	(396,457,822)
විගණන ගාස්තු		(398,000)	0
බැංකු ගාස්තු		(18,442)	(13,796)
මුළු වියදම		(364,248,540)	**(396,471,618)**
ආදායම් බදු වියදම	8	(343,056,625)	(28,434,785)
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම		1,084,062,532	**322,883,983**

105 සිට 109 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

සෙස් අරමුදලේ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021 රු.	2020 රු.
සමුච්චිත අරමුදල		
වර්ෂය ආරම්භයේ ශේෂය	2,800,315,793	2,789,763,682
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම	1,084,062,532	322,883,983
ඒකාබද්ධ අරමුදලට මාරු කල අරමුදල්	0	(312,331,872)
වර්ෂය අවසානයේ ශේෂය	3,884,378,325	2,800,315,793

105 සිට 109 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම	1,084,062,532	322,883,983
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	1,084,062,532	322,883,983
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම		
කාර්ය මණ්ඩල ණය (වැඩි වීම)/අඩුවීම	0	21,347,330
ලැබිය යුතු සෙස් අරමුදල් (වැඩි වීම)/අඩු වීම	(16,023,104)	(8,035,772)
ශ්‍රී.සු.වි.කොෝ.ස.න් ලැබිය යුතු දෑ (වැඩි වීම)/අඩු වීම	130,331,961	(46,180,984)
භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම	(29,725,892)	16,710,292
ප්‍රතිමිලදීගනුම් මත ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම	37,467	187,976
කල්බදු කුලී තැන්පතු (වැඩි වීම)/අඩු වීම	0	42,985,944
ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	193,556,762	0
	278,177,195	27,014,786
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල්	1,362,239,726	349,898,769
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		
රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි ආයෝජන	0	306,607,487
ඒකාබද්ධ අරමුදලට මාරු කල අරමුදල්	0	(312,331,872)
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන	(2,340,843,389)	738,949,681
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	(2,340,843,389)	733,225,296
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(978,603,662)	1,083,124,065
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඇ)	1,437,680,052	354,555,986
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඇ)	459,076,390	1,437,680,052
සටහන (ඇ)		
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	1,425,824,301	350,000,000
බැංකුවේ ඇති මුදල්	11,855,751	4,555,986
	1,437,680,052	354,555,986
සටහන (ඇ)		
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	452,265,729	1,425,824,301
බැංකුවේ ඇති මුදල්	6,810,660	11,855,751
	459,076,390	**1,437,680,052**

105 සිට 109 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල (සෙස් අරමුදල), 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 සැප්තැම්බර් 21 වන දින සිට බලාත්මක, 2021 අංක 19 දරන නව ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත මගින් අවලංගු කරන ලද පෙර පැවති 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14B (1) වගන්තිය යටතේ ස්ථාපිත කර ඇත.

පෙර පනතෙහි 14B (1) වගන්ති ප්‍රකාරව 'සෙස් බදු අරමුදලි යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතු අතර 14A වගන්තිය යටතේ සඳහන් සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතුයි යන්න යටතේ පිහිටුවා ඇත.

නව පනතෙහි 156 (1) වගන්ති ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන "සෙස් බදු අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතු අතර, 155 වන වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

සෙස් අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 සැප්තැම්බර් 20 වන දින දක්වා බලාත්මක වූ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14B (2) වන වගන්තියට අනුකූලව, කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන මුදල් ප්‍රමාන සෙස් බදු අරමුදලෙන් පහත දැක්වෙන කාර්යන් සඳහා ගෙවිය යුතුය:

(අ) සුරුකුම්පත් වෙළඳපොල දියුණු කිරීම

(ආ)38 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වන්දි අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම; සහ

(ඇ)කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා එහි බලතල, කාර්ය හා කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

තව දුරටත්, පෙර පනතෙහි 14B (3) වගන්තිය යටතේ, සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයට, ආයෝජනය කල හැකිය.

2021 සැප්තැම්බර් 20 වන දින සිට බලාත්මක වූ නව ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156 (2) වන වගන්තියට අනුකූලව සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය:

(අ) සුරුකුම්පත් වෙළඳපොල දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටුවනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම;

(ඇ) එහි කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාස, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්ය සඳහා ණය ලබා දීම;

(ඉ) අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම ; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාවය පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයින් විසින් ශ්‍රී ලංකාව තුලදී හෝ විදේශීය රටකදී නිරත වනු ලබන අධ්‍යනයන්ට අදාළ වියදම් පියවීම.

තවදුරටත්, නව පනතෙහි 156 (3) වගන්ති ප්‍රකාරව, සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සෙස් අරමුදලේ වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් වලින් සමන්විත වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා සෙස් අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස සෙස් අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් සෙස් අරමුදල මෙහෙයුම් කටයුතු ඈවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව සෙස් අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කිරීම සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට, සෙස් අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරකුපත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලෙහි මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, සෙස් අරමුදලේ වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා ඒවාට අදාළ සටහන් වලින් පමණක් සමන්විත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන, උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථාවන්හිදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන්වල හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇති අතර සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාලපරිච්ඡේදය පුර ඒකාකාරීව අනුගමනය කර ඇත.

1.7 ගිනුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සහ ඒ හා අදාළ හෙළිදරව් කිරීම් මෙන්ම අස්පෘශ්‍ය වගකීම් සම්බන්ධ හෙළිදරවුකිරීම් ද සිදු කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බලපැවෙත්වන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ.

1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ සෙස් අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිදු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

1.9 ප්‍රමානත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කොා.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

1.12 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

3 වගකීම් හා ප්‍රතිපාදන

3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලු විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

4 මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

5 වියදම් හඳුනා ගැනීම

සෙස් අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

7. මුදල් හා මුදල් සමාන දේ

	2021 රු.	2020 රු.
ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජන	452,265,729	1,425,824,301
බැංකුවේ ඇති මුදල්	6,810,660	11,855,751
එකතුව	459,076,390	**1,437,680,052**

8 ආදායම් බදු වියදම්

	2021 රු.	2020 රු.
තක්සේරු වර්ෂ 2019/2020 සඳහා ආදායම් බදු වියදම	0	14,315,868
තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම	(2,905,438)	14,118,917
තක්සේරු වර්ෂ 2020/2022 සඳහා ආදායම් බදු වියදම	345,962,063	0
එකතුව	343,056,625	**28,434,785**

ආදායම් බදු වගකීම, 2017 අංක 24 දරන ආදායම් බදු පනත (සංශෝධිත) ප්‍රකාරව ගණනය කර ඇත.

9 ප්‍රාග්ධන බැඳීම්

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

10 අසම්භාව්‍ය වගකීම්

2021 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

11 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි. ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස 2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.

පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින් 2021 වර්ෂය තුලදී පහත පරිදි ධුරයන් හොබවන ලදී.

- සංජය බණ්ඩාර මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2021 දෙසැම්බර් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික.
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් 2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික
- එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2021 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- ජනාධිපති නීතීඥ සුහද ගම්ලත් මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සිසිර රත්නායක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සුනිල් ලංකාතිලක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- නරේෂ් අබේසේකර මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- මනිල් ජයසිංහ මහතා 2020 ජනවාරි 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර, 2020 දෙසැම්බර් 21 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර 2021 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා	පියවීම් සහතික කිරීමේ අරමුදල	2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකරුවකු ලෙස පත් කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.	නැත
සංජය බණ්ඩාර මහතා	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	2021 දෙසැම්බර් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි සභාපති ධුරයට පත්වන ලදී	නැත
	මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී.	2012 පෙබරවාරි සිට 2021 පෙබරවාරි දක්වා කාලය තුල අධ්‍යක්ෂ/සභාපති ධුරයන් හොබවනු ලැබේ.	නැත
	ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්සීස් පී.එල්.සී.	2021 මාර්තු සිට අධ්‍යක්ෂ ධුරය හොබවනු ලැබේ	නැත
	බී.ආර්. ද සිල්වා සහ සමාගම	හවුල්කරු	නැත
සංජීව දිසානායක මහතා	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ගිණුම්කරණ ප්‍රමිත කමිටුව	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
ආර්.එම්.පී. රත්නායක මහතා	මහා භාණ්ඩාගාරය	2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය ලේකම්	නැත
	ලංකා බැංකුව	2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත	2021 සැප්තැම්බර් 06 වන දින දක්වා නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	දේශීය ණය සහ සංවර්ධන අරමුදල	2020 සැප්තැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජික සහ සභාපති	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	2021 ජනවාරි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	පියවීම් සහතික කිරීමේ අරමුදල	2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකරු	නැත
එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා	ශ්‍රී ලංකා මහා බැංකුව	2020 දෙසැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය අධිපති	නැත
ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා	නැත	නැත	නැත
සිසිර රත්නායක මහතා	නැත	නැත	නැත
සුනිල් ලංකාතිලක මහතා	මුදල් අමාත්‍යාංශය	2021 පෙබරවාරි 01 වන දින සිට වර්ෂ තුනක් සඳහා, 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතෙහි පරීක්ෂණ මණ්ඩල සාමාජික	නැත
	එල්.ඕ.එල්.සී. ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී.	2021 අගෝස්තු 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂක	නැත
නරේෂ් අබේසේකර මහතා	නැත	නැත	නැත

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
මනිල් ජයසිංහ මහතා	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	2021 දෙසැම්බර් දක්වා සභාපති	නැත
	අර්න්ස්ට් අන්ඩ් යන්ග්	කළමනාකරණ හවුල්කරු - ශ්‍රී ලංකාව සහ මාලදිවයින	නැත
ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	2021 ජනවාරි 01 දින දක්වා සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් පහ පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

ජංගම ගිණුමේ නම	ගිණුම් අංකය	2021.12.31 දිනට ශේෂය	2020.12.31 දිනට ශේෂය
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල	0009834430	2,784,645	1,862,994

2021 වර්ෂය තුලදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී

ආයෝජන වර්ගය	වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.)	2021 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.)
භාණ්ඩාගාර බැඳුම්කර	2,544,999,931	3,218,095,441
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	16,680,238,374	436,000,000
එකතුව	19,225,238,305	**3,654,095,441**

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/G/COM/FA/21/4
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date ২9March 2022

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මුල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ ("අරමුදල") 2021 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මුල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත්ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මුල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.4 මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මුල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබනුයේ මෙම මුල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය අගයනු ලැබේ.
- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මුල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මුල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

අත්සන් කළේ:

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන		394,240,378	242,875,161
ජංගම වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන		113,632,425	39,606,748
ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර		13,002,217	9,308,709
ලැබිය යුතු පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම්		13,406	32,027
මුදල් හා මුදල් සමාන දෑ	7	40,728,226	248,820,908
මුළු වත්කම්		561,616,651	**540,643,553**
අරමුදල් හා වගකීම්			
යොදවා ඇති අරමුදල් සහ සංචිත			
සමුච්චිත අරමුදල		555,571,118	521,752,939
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ - ශ්‍රී.සු.වී.කොා.ස.		5,845,532	18,890,614
විගණන ගාස්තු		200,000	0
මුළු අරමුදල් හා වගකීම්		561,616,651	**540,643,553**

116 සිට 120 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිලිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන්;

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න
සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

කොළඹදී
2022 මාර්තු 15 වන දින දීය

මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2021 රු.	2020 රු.
ආදායම			
පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර		33,305,523	33,778,140
පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම්		11,583,114	8,602,751
වර්ෂය තුලදී වැරදි සමතයකට පත් කිරීමෙන් ලද වන්දි		0	36,300,000
මුළු ආදායම		44,888,637	**78,680,891**
වියදම			
විගණන ගාස්තු		(398,000)	0
බැංකු ගාස්තු		(2,912)	(1,282)
මුළු වියදම		(400,912)	**(1,282)**
ආදායම් බදු වියදම	8	(10,669,546)	(18,890,614)
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම		33,818,179	**59,788,995**

116 සිට 120 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

වන්දි අරමුදලේ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021 රු.	2020 රු.
සමුච්චිත අරමුදල		
වර්ෂය ආරම්භයේ ශේෂය	521,752,939	461,963,944
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම	33,818,179	59,788,995
වර්ෂය අවසානයේ ශේෂය	555,571,118	521,752,939

116 සිට 120 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම	33,818,179	59,788,995
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	33,818,179	**59,788,995**
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම		
භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම	(3,693,508)	1,091,126
ප්‍රතිමිලදීගනුම් මත ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම	18,621	41,462
ශ්‍රී.සු.වී.කොා.ස.ට ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම)	(13,045,081)	18,890,614
අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම)	200,000	0
	(16,519,968)	20,023,202
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල්	17,298,211	79,812,197
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන	(225,390,894)	98,973,250
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	(225,390,894)	98,973,250
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(208,092,682)	178,785,447
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඉ)	248,820,908	70,035,461
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඊ)	40,728,226	248,820,908
සටහන (ඉ)		
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	248,721,328	69,852,733
බැංකුවේ ඇති මුදල්	99,580	**182,728**
	248,820,908	70,035,461
සටහන (ඊ)		
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	40,000,000	248,721,328
බැංකුවේ ඇති මුදල්	728,226	99,580
	40,728,226	**248,820,908**

116 සිට 120 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 සැප්තැම්බර් 21 වන දින සිට බලාත්මක, 2021 අංක 19 දරන නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත මගින් අවලංගු කරන ලද පෙර පැවති 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 38 (1) වගන්ති ප්‍රකාරව 'බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දෙකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙකු සිය ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයෙකුට වන්දි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා වන්දි අරමුදල නම් වූ අරමුදලක් පිහිටවිය යුතුය' යන්න යටතේ පිහිටුවා ඇත.

නව පනතෙහි 158 (1) වගන්ති ප්‍රකාරව යම් බලපත්‍රලත් කොටස් තරැව්කරුවෙකුට හෝ කොටස් වෙළෙන්දෙකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයෙකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින්, "වන්දි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.

වන්දි අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 සැප්තැම්බර් 20 වන දින දක්වා බලාත්මක වූ පෙර පැවති ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 38(1) වන වගන්තියට අනුකූලව වන්දි අරමුදල පිහිටුවීමේ අරමුණ වන්නේ, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දෙකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙකු සිය ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයෙකුට වන්දි ප්‍රදානය කිරීමයි.

තවද, පෙර පනතෙහි 38 වගන්තියට අනුව වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) අරමුදලේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල් ප්‍රමාන වලින්

(ආ) 51අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලබන මුදල් ප්‍රමාන වලින්;

(ඇ) 14ආ වගන්තිය යටතේ සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි මුදල් ගණන්

ඊට අමතරව පෙර පනතෙහි 38 (3) වගන්ති ප්‍රකාරව වන්දි අරමුදල අයත් මුදල් කොමිෂන් සභාව විසින් තමන් තීරණය කරන ආකාරයට ආයෝජනය කරනු ලැබිය හැකිය.

2021 සැප්තැම්බර් 20 වන දින සිට බලාත්මක වූ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වන වගන්තියට අනුකූලව යම් බලපත්‍රලත් කොටස් තරැව්කරුවෙකුට හෝ කොටස් වෙළෙන්දෙකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයෙකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින්, "වන්දි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.

තවද, නව පනතෙහි 158 (2) වගන්ති ප්‍රකාරව එම වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්

ඊට අමතරව නව පනතෙහි 158 (3) වගන්ති ප්‍රකාරව, වන්දි අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකිය.

1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වන්දි අරමුදල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් වලින් සමන්විත වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා වන්දි අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත.පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස වන්දි අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් වන්දි අරමුදල මෙහෙයුම් කටයුතු ඈවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව වන්දි අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කිරීම සිදු කරයි.

1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට වන්දි අරමුදල සඳහා වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලෙහි මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, වන්දි අරමුදල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය , මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා ඒවාට අදාළ සටහන් වලින් පමණක් සමන්විත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නම රුපියලට වටයා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළයෙල කර ඇති අතර සහ ගිණුම්කරණ ප්‍රතිපතීන් කාලපරිච්ඡේදය පුර ඒකාකාරිව අනුගමනය කර ඇත.

1.7 ගිනුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බලපැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ.

1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ වන්දි අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිදු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

1.9 ප්‍රමානත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කොා.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

1.12 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

3 වගකීම් හා ප්‍රතිපාදන

3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලු විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

4 මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.2 වන්දි මුදල් ලැබීම්

ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව වන්දි අරමුදලට ලැබෙන වන්දි මුදල්, 'මුදල් පදනම' මත හඳුනා ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

4.3 අනෙකුත් ආදායම්
අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

5 වියදම් හඳුනා ගැනීම
වන්දි අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

7 මුදල් හා මුදල් සමාන දේ

	2021 රු.	2020 රු.
ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජන	40,000,000	248,721,328
බැංකුවේ ඇති මුදල්	728,226	99,580
එකතුව	40,728,226	**248,820,908**

8 ආදායම් බදු වියදම්

	2021 රු.	2020 රු.
තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම	(7,508)	18,890,614
තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ආදායම් බදු වියදම	10,677,054	0
එකතුව	10,669,546	**18,890,614**

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

9 ප්‍රාග්ධන බැඳීම්
2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසවක් නොවීය.

10 අසම්භාව්‍ය වගකීම්
2021 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

11 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම
අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි. ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස 2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.

පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින් 2020 වර්ෂය තුලදී පහත පරිදි ධුරයන් හොබවන ලදී.

- සංජය බණ්ඩාර මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2021 දෙසැම්බර් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික.
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් 2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික.
- එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2021 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- ජනාධිපති නීතීඥ සුහද ගම්ලත් මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සිසිර රත්නායක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සුනිල් ලංකාතිලක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- නරේෂ් අබේසේකර මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- මනිල් ජයසිංහ මහතා - 2020 ජනවාරි 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර, 2020 දෙසැම්බර් 21 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර 2021 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා	පියවීම් සහතික කිරීමේ අරමුදල	2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකරුවකු ලෙස පත් කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.	නැත
සංජය බණ්ඩාර මහතා	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	2021 දෙසැම්බර් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි සභාපති ධුරයට පත්වන ලදී	නැත
	මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී.	2012 පෙබරවාරි සිට 2021 පෙබරවාරි දක්වා කාලය තුල අධ්‍යක්ෂ/සභාපති ධුරයන් හොබවනු ලැබේ.	නැත
	ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්සීස් පී.එල්.සී.	2021 මාර්තු සිට අධ්‍යක්ෂ ධුරය හොබවනු ලැබේ	නැත
	බී.ආර්. ද සිල්වා සහ සමාගම	හවුල්කරු	නැත
සංජීව දිසානායක මහතා	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ගිණුම්කරණ ප්‍රමිත කමිටුව	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
ආර්.එම්.පී. රත්නායක මහතා	මහා භාණ්ඩාගාරය	2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය ලේකම්	නැත
	ලංකා බැංකුව	2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත	2021 සැප්තැම්බර් 06 වන දින දක්වා නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	දේශීය ණය සහ සංවර්ධන අරමුදල	2020 සැප්තැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජික සහ සභාපති	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	2021 ජනවාරි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	පියවීම් සහතික කිරීමේ අරමුදල	2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකරු	නැත
එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා	ශ්‍රී ලංකා මහා බැංකුව	2020 දෙසැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය අධිපති	නැත
ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා	නැත	නැත	නැත
සිසිර රත්නායක මහතා	නැත	නැත	නැත

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
සුනිල් ලංකාතිලක මහතා	මුදල් අමාත්‍යාංශය	2021 පෙබරවාරි 01 වන දින සිට වර්ෂ තුනක් සඳහා, 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතෙහි පරීක්ෂණ මණ්ඩල සාමාජික	නැත
	එල්.ඕ.එල්.සී. ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී.	2021 අගෝස්තු 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂක	නැත
නරේෂ් අබේසේකර මහතා	නැත	නැත	නැත

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
මනිල් ජයසිංහ මහතා	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	2021 දෙසැම්බර් දක්වා සභාපති	නැත
	අර්න්ස්ට් අන්ඩ් යන්ග්	කළමනාකරණ හවුල්කරු ශ්‍රී ලංකාව සහ මාලදිවයින	නැත
ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	2021 ජනවාරි 01 දින දක්වා සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත
	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික	නැත

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් පහ පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

ජංගම ගිණුමේ නම	ගිණුම් අංකය	2021.12.31 දිනට ශේෂය	2020.12.31 දිනට ශේෂය
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල	75433985	728,226	99,580

2021 වර්ෂය තුලදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී

ආයෝජන වර්ගය	වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.)	2021 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.)
භාණ්ඩාගාර බැඳුම්කර	264,997,642	423,797,061
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	1,940,806,368	40,000,000
එකතුව	**2,205,804,010**	463,797,061

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/G/SGF/1/20/5

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date ২৭ March 2022

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ ("අරමුදල") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1998 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ලෙස අරමුදල පිහිටුවීමට සම්බන්ධ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන හාර ඔප්පුවේ 11 (ඩී) ඡේදයෙහි විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.4 මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මුල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබනුයේ මෙම මුල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය අගයනු ලැබේ.
- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මුල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මුල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

අත්සන් කළේ:

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන		194,860,375	473,635,565
ස්ථාවර තැන්පතුවල ආයෝජන		300,000,000	300,000,000
ජංගම වත්කම්			
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන		278,775,190	155,151,060
ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර		18,034,969	18,480,637
ලැබිය යුතු පොලී ආදායම - ස්ථාවර තැන්පතු		30,780,824	9,780,823
ලැබිය යුතු පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම්		81,429	3,926
මුදල් හා මුදල් සමාන දෑ	5	243,458,440	30,725,513
මුළු වත්කම්		1,065,991,227	**987,777,524**
අරමුදල් සහ වගකීම්			
යොදවා ඇති අරමුදල් සහ සංචිත			
ප්‍රදාන - මහා භාණ්ඩාගාරය		50,000,000	50,000,000
ප්‍රදාන - සෙස් අරමුදල		100,000,000	100,000,000
ප්‍රදාන - කොළඹ කොටස් හුවමාරුව		100,000,000	100,000,000
සමුච්චිත අරමුදල		806,487,080	732,213,570
ජංගම වගකීම්			
ගෙවිය යුතු අදායම් බදු	6	9,397,147	5,453,954
විගණන ගාස්තු		107,000	110,000
මුළු අරමුදල් සහ වගකීම්		1,065,991,227	**987,777,524**

127 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකරුවන් සතු වගකීමකි.

පියවීම් සහතික කිරීමේ අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන්,

චින්තක මෙන්ඩිස
භාරකරු - පියවීම් සහතික කිරීමේ අරමුදල

ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න
භාරකරු - පියවීම් සහතික කිරීමේ අරමුදල

කොළඹ දී
2022 මැයි 15 වන දින දී ය.

මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2021 රු.	2020 රු.
ආදායම්			
ආයෝජන මත පොලී ආදායම් - ප්‍රතිමිලදී ගැනීම්		3,363,641	6,316,460
ආයෝජන මත පොලී ආදායම් - භාණ්ඩාගාර බැඳුම්කර		66,380,973	75,022,727
ආයෝජන මත පොලී ආදායම් - ස්ථාවර තැන්පතු		21,000,001	9,780,823
මුළු ආදායම		90,744,615	**91,120,010**
වියදම්			
විගණන ගාස්තු		(165,000)	(176,000)
බැංකු ගාස්තු		(2,164)	(750)
මුළු වියදම		(167,164)	**(176,750)**
ආදායම් බදු වියදම	7	(16,303,941)	(16,593,802)
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම		74,273,510	**74,349,458**

127 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

ශුද්ධ වත්කම් වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021 රු.	2020 රු.
සමුච්චිත අරමුදල		
වර්ෂය ආරම්භයේ ශේෂය	732,213,570	657,864,112
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම	74,273,510	74,349,458
වර්ෂය අවසානයේ ශේෂය	806,487,080	732,213,570

127 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම	74,273,510	74,349,458
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	74,273,510	74,349,458
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම		
අනෙකුත් ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(20,631,836)	(6,271,072)
ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	3,940,192	(30,408,206)
	(16,691,643)	(36,679,278)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල්	57,581,867	37,670,180
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන	155,151,060	217,524,480
ස්ථාවර තැන්පතුවල ආයෝජන	0	(300,000,000)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	155,151,060	(82,475,520)
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	212,732,926	(44,805,340)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)	30,725,513	75,530,853
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ)	243,458,440	**30,725,513**
සටහන (අ)		
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	30,486,575	75,100,000
බැංකුවේ ඇති මුදල්	238,938	430,853
එකතුව	30,725,513	**75,530,853**
සටහන (ආ)		
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	242,950,000	30,486,575
බැංකුවේ ඇති මුදල්	508,440	238,938
එකතුව	243,458,440	**30,725,513**

127 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මුල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදල යනු 1998 වර්ෂයේ 1376 අංක දරන සංශෝධිත භාර ඔප්පුවේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ලාභ නොලබන භාරයකි. එහි මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කරනු ලැබේ.

1.2 මුල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම පියවීම සහතික කිරීමේ අරමුදලේ භාරකාර මණ්ඩලය සතු වේ.

1.3 පිළියෙළ කිරීමේ පදනම

පියවීම් සහතික කිරීමේ අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. එම මුල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ඓතිහාසික පිරිවැයට පිළියෙළ කර ඇත. එමෙන්ම උචිත අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඉදිරි සටහන් වල දක්වා ඇත.

1.4 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මුල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

1.5 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මුල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

1.6 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මුල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

2. වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

2.1 ආයෝජන

අරමුදලේ ආයෝජන සිදු කරනු ලබන්නේ රජයේ භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථාවර තැන්පතුවල හා බලපත්‍රලාභී රාජ්‍ය බැංකුවල ප්‍රතිමිලදීගැනුම් ආයෝජනවලය. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

2.2 ලැබියයුතු දෑ

ලැබිය යුතු දෑ ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට දක්වා ඇත.

3. වගකීම් සහ ප්‍රතිපාදන

3.1 විශ්‍රාමික ප්‍රතිලාභ

අරමුදලෙහි සියලුම කටයුතු භාරකරුවෙකු හරහා සිදු කරන බැවින් සහ අරමුදලේ සේවයේ නියුක්ත පූර්ණ කාලීන සේවකයින් නොමැති බැවින්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත් ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

3.2 ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ පිරිවැය යටතේ දක්වා ඇත.

4. මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

4.1 ආදායම් හඳුනා ගැනීම

ආයෝජන මත පොලී ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

4.2 වියදම් හඳුනාගැනීම

පියවීම් සහතික කිරීමේ අරමුදල පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම ගෙවීම් උපචිත පදනම මත හඳුනා ගනු ලබන අතර මුල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ඒවා ආදායමට අය කරනු ලැබේ.

4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, මුදල් හා මුදල් සමාන දෑ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකුවේ ඇති මාස තුනට අඩු කල් පිරීමක් ඇති ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන වලින් සමන්විත වේ.

5. මුදල් හා මුදල් සමාන දෑ

	2021 රු.	2020 රු.
ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන	242,950,000	30,486,575
බැංකුවේ ඇති මුදල්	508,440	238,938
එකතුව	243,458,440	30,725,513

6. ගෙවිය යුතු ආදායම් බදු

	2021 රු.	2020 රු.
තක්සේරු වර්ෂ 2019/2020 සඳහා ගෙවිය යුතු ආදායම් බදු	0	224,015
තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ගෙවිය යුතු ආදායම් බදු	(101,382)	5,229,939
තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ගෙවිය යුතු ආදායම් බදු	9,498,528	0
එකතුව	9,397,147	5,453,954

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

7. ආදායම් බදු වියදම්

	2021 රු.	2020 රු.
තක්සේරු වර්ෂ 2019/2020 සඳහා ආදායම් බදු වියදම	0	224,015
තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම	0	16,369,787
තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ආදායම් බදු වියදම	16,303,941	0
එකතුව	16,303,941	**16,593,802**

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

8. ප්‍රාග්ධන බැඳීම්

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

9. අසම්භාව්‍ය වගකීම්

2021 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

10. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

භාරකරුවන් විසින් සියලුම සිදුවීම් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර යෝග්‍ය පරිදි වර්තමාන මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් හෝ හෙළිදරවු කිරීම් සිදු කරනු ලැබේ.

11. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

අරමුදලේ භාරකරුවන් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්වරයාත්, කොළඹ කොටස් හුවමාරුවේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම්වරයාත් ක්‍රියා කරනු ලැබේ.

2021 වර්ෂය තුලදී පහත නම් සඳහන් භාරකරුවන් පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවන් ලෙස ධුරයන් දරන ලදී.

- ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති (2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.)
- දුමිත් ප්‍රනාන්දු මහතා - කොළඹ කොටස් හුවමාරුවේ සභාපති (2020 ජුලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලදී.)
- රජීව බණ්ඩාරනායක මහතා - කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන විධායක නිලධාරි
- ආර්.එම්.පී. රත්නායක මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජික සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි.)
- චින්තක මෙන්ඩිස් මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් (2020 මාර්තු 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලදී.)

අරමුදලේ භාරකරුවන් විසින් වර්ෂය තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතා	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.	නැත
දුමිත් ප්‍රනාන්දු මහතා	කොළඹ කොටස් හුවමාරුව	සභාපති (2020 ජූලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලදී.)	නැත
	මධ්‍යම තැන්පතු ක්‍රමය	අධ්‍යක්ෂ (2017 ජූලි සිට බලපැවැත්වෙන පරිදි)	නැත
	පන්තේරා වෙන්චර්ස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2013 සැප්තැම්බර් සිට බලපැවැත්වෙන පරිදි)	100%
	පී.වී.ගෝල් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2014 ජූනි සිට බලපැවැත්වෙන පරිදි)	100%
	පී.වී. හිල්ටොප් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2014 ජූනි සිට බලපැවැත්වෙන පරිදි)	100%
	ඔමැක් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම	සභාපති (2014 නොවැම්බර් සිට බලපැවැත්වෙන පරිදි)	<10%
	ටෙකිටෙස් පුද්ගලික සමාගම	සභාපති/ අධ්‍යක්ෂ (2015 ජූලි සිට බලපැවැත්වෙන පරිදි)	10.34%
	වන් සීසන් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2014 ජූනි සිට බලපැවැත්වෙන පරිදි)	නැත
	ඩිවූ පැරඩයිස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2014 ජූනි සිට බලපැවැත්වෙන පරිදි)	නැත
	අනීවා පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2016 ජූලි සිට බලපැවැත්වෙන පරිදි)	<11.8%
	ජෙනරේටර් සොලියුෂන් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2015 ඔක්තෝම්බර් සිට බලපැවැත්වෙන පරිදි)	නැත
	ජුවෙලෙක්ස් ඇශ්‍රී කුමාරගම පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2015 නොවැම්බර් සිට බලපැවැත්වෙන පරිදි)	15%
	ඒෂියා සිකියුරිටීස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2015 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි)	76.70%
	ඒෂියා සිකියුරිටීස් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2016 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි)	27.64%
	ඒෂියා සිකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2017 ජූනි සිට බලපැවැත්වෙන පරිදි)	නැත
	ඒසෙක් කැපිටල් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2017 පෙබරවාරි සිට බලපැවැත්වෙන පරිදි)	100%
	ඒෂියා සිකියුරිටීස් ඇඩ්වයිසර්ස් පුද්ගලික සමාගම	අධ්‍යක්ෂ (2018 ඔක්තෝම්බර් සිට බලපැවැත්වෙන පරිදි)	නැත
	සිංගර් ශ්‍රී ලංකා පී.එල්.සී.	අධ්‍යක්ෂ (2017 ඔක්තෝම්බර් සිට බලපැවැත්වෙන පරිදි)	නැත
	යුනියන් ඇෂුවරන්ස් පී.එල්.සී.	අධ්‍යක්ෂ (2018 අගෝස්තු සිට බලපැවැත්වෙන පරිදි)	නැත
රජීව බණ්ඩාරනායක මහතා	කොළඹ කොටස් හුවමාරුව	ප්‍රධාන විධායක නිලධාරි	නැත
	ලංකා මූල්‍ය සේවා කාර්යාංශය	අධ්‍යක්ෂ	නැත

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

නම	ආයතනයේ නම	සම්බන්ධතාවය	කොටස් හිමිකම
ආර්.එම්.පී. රත්නායක මහතා	මහා භාණ්ඩාගාරය	නියෝජ්‍ය ලේකම් 2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි	නැත
	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	නිල බලයෙන් පත් වූ සාමාජික 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි	නැත
	ලංකා බැංකුව	නිල බලයෙන් පත් වූ සාමාජික 2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි	නැත
	මූල්‍ය අධ්‍යන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත සමාගම	නිල බලයෙන් පත් වූ සාමාජික 2021 සැප්තැම්බර් 06 වන දින දක්වා	නැත
	දේශීය ණය සහ සංවර්ධන අරමුදල	කොමිෂන් සභා සාමාජික සහ සභාපති 2020 සැප්තැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි	නැත
	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම	නිල බලයෙන් පත් වූ සාමාජික 2021 ජනවාරි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි	නැත
චින්තක මෙන්ඩිස් මහතා	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	අධ්‍යක්ෂ ජෙනරාල් 2020 මාර්තු 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි	නැත
	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික 2020 මාර්තු 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි	
	ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල	භාරකරු 2020 මාර්තු 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි	

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන්/ආයතන සමඟ වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

පියවීම් සහතික කිරීමේ අරමුදල විසින් ලංකා බැංකුවේ පහත සඳහන් ජංගම ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර ඒ එක් එක් ගිණුමෙහි ශේෂය පහත දක්වා ඇති පරිදි වේ.

ජංගම ගිණුමේ නම	ගිණුම් අංකය	2021.12.31 දිනට ශේෂය	2020.12.31 දිනට ශේෂය
පියවීම් සහතික කිරීමේ අරමුදල ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	1,833	508,440	238,938

2021 වර්ෂය තුලදී පහත දැක්වෙන ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු විය.

ආයෝජන වර්ගය	වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.)	2021 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.)
භාණ්ඩාගාර බැඳුම්කර	0	369,217,775
ප්‍රතිමිලදීගැනුම් මත ආයෝජන	1,159,593,901	242,950,000
එකතුව	**1,159,593,901**	612,167,775

සටහන්

සටහන්

සාංගමික තොරතුරු

කාර්යාලීය ලිපිනය

28 සහ 29 වන මහල
නැගෙනහිර කුළුණ
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව

දුරකථනය

+94 11 2143843

ෆැක්ස්

+94 11 2439149

ඊ-මේල්

mail@sec.gov.lk

වෙබ් අඩවිය

www.sec.gov.lk

ගිණුම්කරණ වර්ෂය

2021 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

විගණකවරු

විගණකාධිපති

බැංකුකරුවන්

ලංකා බැංකුව
සම්පත් බැංකුව
කොමර්ෂල් බැංකුව
හැටන් නැෂනල් බැංකුව

Designed & produced by
emagewise
Printed by Gunaratne Offset (Pvt) Ltd

SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA